# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

## ආගමන

**ශ්‍රී ලංකාවට තැනැත්තන් ඇතුළු වීම සහ ශ්‍රී ලංකාවෙන් තැනැත්තන් පිට වීම පාලනය කිරීම සඳහා ද; ශ්‍රී ලංකාවේ පුරවැසියන් නොවන තැනැත්තන් ශ්‍රී ලංකාව තුළ රැඳී සිටීම පාලනය කිරීම සඳහා ද; ගමන් ලේඛන නිකුත් කිරීම සඳහා ද; (351 වන අධිකාරය වූ) ආගාමික හා විගාමික පනත සහ 1971 අංක 53 දරන විදේශ ගමන් බලපත්‍ර (විධිමත් කිරීමේ) සහ පිට වීමේ අවසර පත්‍ර පනත් ඉවත් කිරීම සඳහා ද; ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි**

මහජන ආරක්ෂක අමාත්‍යතුමා විසින් 2024 ජූනි මස 20 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2024 ජූනි මස 12 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

[266 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : රු. 240.00 තැපැල් ගාස්තුව : රු. 150.00

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

එල්.ඩී.-ඕ. 31/2018

**ශ්‍රී ලංකාවට තැනැත්තන් ඇතුළු වීම සහ ශ්‍රී ලංකාවෙන් තැනැත්තන් පිට වීම පාලනය කිරීම සඳහා ද; ශ්‍රී ලංකාවේ පුරවැසියන් නොවන තැනැත්තන් ශ්‍රී ලංකාව තුළ රැඳී සිටීම පාලනය කිරීම සඳහා ද; ගමන් ලේඛන නිකුත් කිරීම සඳහා ද; (351 වන අධිකාරය වූ) ආගාමික හා විගාමික පනත සහ 1971 අංක 53 දරන විදේශ ගමන් බලපත්‍ර (විධිමත් කිරීමේ) සහ පිට වීමේ අවසර පත්‍ර පනත් ඉවත් කිරීම සඳහා ද; ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

1. (1) මේ පනත 2024 අංක      දරන ආගමන පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දින

(2) මේ වගන්තිය හැර, මේ පනතේ විධිවිධාන, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි යම් දිනයක හෝ දිනවල සිට ක්‍රියාත්මක විය යුතු ය. මේ පනතේ එකිනෙකට වෙනස් කොටස් හෝ එකිනෙකට වෙනස් වගන්ති ක්‍රියාත්මක වීම සඳහා, අමාත්‍යවරයා විසින්, එකිනෙකට වෙනස් දින නියම කරනු ලැබිය හැකි ය.

(3) (2) වන උපවගන්තියේ විධිවිධාන මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ පනතක් බවට පත් වන දින ක්‍රියාත්මක විය යුතු ය.

## I වන කොටස

## මූලික

**2.** මේ පනතේ පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු ය:- — පනතේ පරමාර්ථ

(අ) ජාතික යහපතට අනුකූල වන ආකාරයට ආගමනය සහ විගමනය විධිමත් කිරීම;

(ආ) අනන්‍යතාව සහ ශ්‍රී ලංකාවේ පුරවැසිභාවය පිළිබඳ වූ සාක්ෂියක් ලෙස ශ්‍රී ලංකාවේ පුරවැසියන් වෙත විදේශ ගමන් බලපත්‍ර නිකුත් කිරීම සහ නිකුත් කිරීම පරිපාලනය කිරීම;

(ඇ) ශ්‍රී ලංකාවේ පුරවැසියන් හැර යම් තැනැත්තකු ශ්‍රී ලංකාවට ඇතුළු වීම පාලනය කිරීම;

(ඈ) සෑම තැනැත්තකු ම ශ්‍රී ලංකාවෙන් පිට වීම පාලනය කිරීම; සහ

(ඉ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන යම් තැනැත්තකුගේ ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීම.

පනතේ විධිවිධානවලින් නිදහස් කිරීමේ බලය

3. (1) (අ) ශ්‍රී ලංකාවේ සන්නද්ධ හමුදාවල සාමාජිකයකු වන;

(ආ) වෙනත් යම් රටක රජයක් විසින් ශ්‍රී ලංකා රජයට යථා පරිදි පත් කරන ලද;

(ඇ) වෙනත් යම් රටක රජයක් විසින් විශේෂ දූත මෙහෙවරක් සඳහා ශ්‍රී ලංකාවට එවන ලද;

(ඈ) ශ්‍රී ලංකා ආණ්ඩුව වෙතින් ස්වකීය වැටුප් හෝ ප්‍රධාන සංවේතනය ගෙවනු නොලබන්නා වූ ද, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ යම් විශේෂිත නියෝජිතායතනයක් මාර්ගයෙන් හෝ ඇමරිකා එක්සත් ජනපද ආණ්ඩුවේ චතුර්විධ ආධාර වැඩසටහන යටතේ හෝ කොළඹ ක්‍රමය සංවිධානය (එහි තාක්ෂණික සහාය කාර්යාංශය ඇතුළුව) හෝ අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද වෙනත් සමාන සංවිධානයක් මාර්ගයෙන් ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් ශ්‍රී ලංකාවට රැගෙන එනු ලැබ ඇත්තා වූ ද, විශේෂඥයකු, උපදේශකවරයකු, තාක්ෂණික ශිල්පියකු හෝ යම් සංවිධානයක නිලධරයකු වන;

(ඉ) එක්සත් ජාතීන්ගේ සංවිධානයේ හෝ එහි විශේෂිත නියෝජිතායතනවල හෝ කොළඹ ක්‍රමය සංවිධානයේ හෝ අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද සමාන සංවිධානයක යම් තාක්ෂණික සහයෝගීතා වැඩසටහනක් යටතේ ශ්‍රී ලංකාවට එවනු ලැබ ඇති අභ්‍යාසලාභියකු වන;

(ඊ) ශ්‍රී ලංකා ආණ්ඩුවට සේවය කිරීම සඳහා ගිවිසුමකට එළඹ ඇති හෝ එවැනි ගිවිසුමකට යටත් වන;

(උ) ඉහත (අ) සිට (ඊ) ඡේද කිසිවක සඳහන් යම් තැනැත්තකුගේ නිල කාර්ය මණ්ඩලයේ හෝ ගෘහයේ සාමාජිකයකු වන;

(ඐ) ඉහත (අ) සිට (උ) ඡේද කිසිවක සඳහන් යම් තැනැත්තකුගේ භාර්යාව හෝ ඔහුගෙන් යැපෙන ළමයකු වන; හෝ

(එ) ශ්‍රී ලංකාවේ දේශීය ජල තීරයේ ඇති නෞකාවක සේවක පිරිසේ සාමාජිකයකු වන,

සෑම තැනැත්තකු ම, අමාත්‍යවරයා විසින් සාදනු ලබන ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමයක් මගින් නිශ්චිතව දක්වා ඇති ප්‍රමාණයට හෝ කොන්දේසිවලට හෝ පරිසීමාවලට යටත්ව, මේ පනතේ III වන, IV වන, V වන, VI වන සහ VII වන කොටස් ක්‍රියාත්මක වීමෙන් නිදහස් කරනු ලැබිය යුතු ය.

මේ උපවගන්තිය යටතේ වන නියමයක් මගින් යම් තැනැත්තකු හෝ යම් කණ්ඩායමකට අයත් තැනැත්තන් සම්බන්ධයෙන් වන නියමයක් නැතහොත් යම් පන්තියකට හෝ විස්තරයකට අයත් තැනැත්තන්ට අදාළ වන නියමයක් විය යුතු අතර, එකී කවර අවස්ථාවක දී වුව ද, එකී තැනැත්තන් මේ උපවගන්තියේ සඳහන් තැනැත්තන් විය යුතු ය.

(2) මහජනයාට බලපාන හදිසි අවස්ථා තත්ත්වයක් ඇති වූ අවස්ථාවක, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, අමාත්‍යවරයා විසින්, මහජන යහපත සඳහා අවශ්‍ය යයි ඔහුට පෙනී යන ප්‍රමාණයට හෝ නියම, කොන්දේසි හෝ පරිසීමාවලට යටත්ව, නිශ්චිතව දක්වා ඇති කාලසීමාවක් සඳහා යම් තැනැත්තකු හෝ යම් පන්තියකට හෝ විස්තරයකට අයත් තැනැත්තකු පනතේ යම් විධිවිධාන කිසිවක් අදාළ වීමෙන් නිදහස් කරනු ලැබිය හැකි ය.

## II වන කොටස

## පරිපාලන වැඩපිළිවෙළ

**4.** (1) මේ පනතේ කාර්ය සඳහා- නිලධරයන්

(අ) (මෙහි මින් මතු "පාලක ජනරාල්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) ආගමන පාලක ජනරාල්වරයා ලෙස හෝ එසේ කටයුතු කිරීම සඳහා හෝ සුදුසු සහ යෝග්‍ය තැනැත්තකු;

(ආ) අතිරේක ආගමන පාලක ජනරාල්වරයා ලෙස හෝ එසේ කටයුතු කිරීම සඳහා හෝ සුදුසු සහ යෝග්‍ය තැනැත්තකු;

(ඇ) ආගමන පාලකවරයන් ලෙස හෝ එසේ කටයුතු කිරීම සඳහා හෝ සුදුසු සහ යෝග්‍ය තැනැත්තන්;

(ඈ) නියෝජ්‍ය ආගමන පාලකවරයන් ලෙස හෝ එසේ කටයුතු කිරීම සඳහා හෝ සුදුසු සහ යෝග්‍ය තැනැත්තන්;

(ඉ) සහකාර ආගමන පාලකවරයන් ලෙස හෝ එසේ කටයුතු කිරීම සඳහා හෝ සුදුසු සහ යෝග්‍ය තැනැත්තන්;

(ඊ) ප්‍රධාන ආගමන නිලධරයන් ලෙස හෝ එසේ කටයුතු කිරීම සඳහා හෝ සුදුසු සහ යෝග්‍ය තැනැත්තන්; සහ

(උ) ආගමන නිලධරයන් ලෙස හෝ එසේ කටයුතු කිරීම සඳහා හෝ සුදුසු සහ යෝග්‍ය තැනැත්තන්,

නමින් හෝ නිලයෙන් පත් කරනු ලැබිය හැකි ය.

(2) මේ පනත පරිපාලනය කිරීම සඳහා (1) වන උපවගන්තියේ සඳහන් නිලධරයන්ට සහාය වීම සඳහා අවශ්‍ය විය හැකි වෙනත් නිලධරයන් සහ සේවානියුක්තයන් පත් කරනු ලැබිය යුතු ය.

නිලධරයන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය

**5.** (1) මේ පනත මගින් හෝ මේ පනත යටතේ හෝ පවරන ලද, පිරිනමන ලද, පනවන ලද හෝ භාර දෙන ලද බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී හෝ ඉටු කිරීමේ දී-

(අ) පාලක ජනරාල්වරයා අමාත්‍යවරයාගේ සාමාන්‍ය හෝ විශේෂ විධානවලට යටත් විය යුතු ය; සහ

(ආ) අතිරේක පාලක ජනරාල්වරයා, එක් එක් පාලකවරයකු, එක් එක් නියෝජ්‍ය පාලකවරයකු, එක් එක් සහකාර පාලකවරයකු, එක් එක් ප්‍රධාන ආගමන නිලධරයකු, එක් එක් ආගමන නිලධරයකු සහ මේ පනත යටතේ පත් කරන ලද වෙනත් යම් නිලධරයකු හෝ වෙනත් යම් සේවානියුක්තයකු පාලක ජනරාල්වරයාගේ සාමාන්‍ය හෝ විශේෂ විධානවලට යටත් විය යුතු ය.

(2) පාලක ජනරාල්වරයා විසින්, මේ පනත මගින් හෝ මේ පනත යටතේ හෝ පාලක ජනරාල්වරයා වෙත පවරන ලද හෝ පිරිනමන ලද යම් බලයක්, කර්තව්‍යයක් හෝ කාර්යයක් ක්‍රියාත්මක කිරීම, කිරීම හෝ ඉටු කිරීම සඳහා අතිරේක පාලක ජනරාල්වරයාට,

යම් පාලකවරයකුට, යම් නියෝජ්‍ය පාලකවරයකුට, යම් සහකාර පාලකවරයකුට, යම් ප්‍රධාන ආගමන නිලධරයකුට හෝ යම් ආගමන නිලධරයකුට සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් හෝ බලය දෙනු ලැබිය හැකි ය.

(3) පාලක ජනරාල්වරයා, අතිරේක පාලක ජනරාල්වරයා, සෑම පාලකවරයකු, සෑම නියෝජ්‍ය පාලකවරයකු හෝ සෑම සහකාර පාලකවරයකු විසින් ම, මේ පනත මගින් හෝ මේ පනත යටතේ හෝ ප්‍රධාන ආගමන නිලධරයකු හෝ ආගමන නිලධරයකු වෙත පවරන ලද හෝ පිරිනමන ලද යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් ක්‍රියාත්මක කිරීම, කිරීම හෝ ඉටු කිරීම කරනු ලැබිය හැකි ය.

(4) ප්‍රධාන ආගමන නිලධරයකු විසින්, මේ පනත මගින් හෝ මේ පනත යටතේ හෝ ආගමන නිලධරයකු වෙත පවරන ලද හෝ පිරිනමන ලද යම් බලයක්, කර්තව්‍යයක් හෝ කාර්යයක් ක්‍රියාත්මක කිරීම, කිරීම හෝ ඉටු කිරීම කරනු ලැබිය හැකි ය.

අමාත්‍යවරයා විසින් ඔහු වෙනුවෙන් කටයුතු කිරීමට බලය දීම

**6.** අමාත්‍යවරයා විසින්-

(අ) මේ පනතේ 3 වන වගන්තිය, 7 වන වගන්තියේ (4) වන උපවගන්තිය, 8 වන වගන්තියේ (4) වන උපවගන්තිය, 45 වන වගන්තිය, 99 වන වගන්තිය, 165 වන වගන්තිය, 168 වන වගන්තිය, 172 වන වගන්තිය සහ 176 වන වගන්තියේ (2) වන උපවගන්තිය මගින් පිරිනමන ලද බලතල; හෝ

(ආ) මේ පනත මගින් හෝ මේ පනත යටතේ අමාත්‍යවරයා වෙත පවරන ලද, පනවන ලද හෝ පිරිනමන ලද යම් කාර්යයක් හෝ කර්තව්‍යයක් හැර, වෙනත් බලයක් කාර්යයක් හෝ කර්තව්‍යයක් ක්‍රියාත්මක කිරීම, කිරීම හෝ ඉටු කිරීම සඳහා අමාත්‍යාංශයේ ලේකම්වරයා, අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයා හෝ පාලක ජනරාල්වරයා වෙත සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් බලය දෙනු ලැබිය හැකි ය.

බලයලත් හමුදා සාමාජිකයන්

**7.** (1) අමාත්‍යවරයාගේ ඉල්ලීම මත, ජනාධිපතිවරයා විසින්, මේ පනතේ කාර්ය සඳහා, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්-

(අ) (357 වන අධිකාරය වූ) යුද්ධ හමුදා පනතේ විධිවිධානවලට අනුකූලව රැස්කර පවත්වාගෙන යනු ලබන ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ සාමාජිකයන්;

(ආ) (358 වන අධිකාරය වූ) නාවික හමුදා පනතේ විධිවිධානවලට අනුකූලව රැස්කර පවත්වාගෙන යනු ලබන ශ්‍රී ලංකා නාවික හමුදාවේ සාමාජිකයන්; සහ

(ඇ) (359 වන අධිකාරය වූ) ගුවන් හමුදා පනතේ විධිවිධානවලට අනුකූලව රැස්කර පවත්වාගෙන යනු ලබන ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සාමාජිකයන්,

සියලු දෙනා ම හෝ ඉන් කිසිවෙක් බලයලත් හමුදා සාමාජිකයන් ලෙස නම් කරනු ලැබිය හැකි ය.

(2) (4) වන උපවගන්තිය යටතේ නිශ්චිතව දක්වා ඇති ප්‍රදේශය ඇතුළත, බලයලත් හමුදා සාමාජිකයකු, අපරාධ නඩු විධාන සංග්‍රහය පනතින් සාම නිලධරයකු වෙත පිරිනමන ලද යම් බලයක් ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා පමණක්-

(අ) 46 වන වගන්තිය යටතේ වන යම් වරදක්;

(ආ) 51 වන වගන්තිය යටතේ වන යම් වරදක්;

(ඇ) 124 වන වගන්තිය යටතේ වන යම් වරදක්;

(ඈ) 126 වන වගන්තිය යටතේ වන යම් වරදක්;

(ඉ) 136 වන වගන්තිය යටතේ වන යම් වරදක්;

(ඊ) 137 වන වගන්තිය යටතේ වන යම් වරදක්;

(උ) 138 වන වගන්තිය යටතේ වන යම් වරදක්; සහ

(ඌ) 139 වන වගන්තිය යටතේ වන යම් වරදක්,

සම්බන්ධයෙන් ඒ පනතේ අර්ථානුකූලව සාම නිලධරයකු ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) මේ වගන්තියේ බලයලත් හමුදා සාමාජිකයන් වෙත පිරිනමන ලද සහ පනවන ලද බලතල සහ කාර්ය, (357 වන අධිකාරය වූ) යුද්ධ හමුදා පනතේ, (358 වන අධිකාරය වූ) නාවික හමුදා පනතේ හෝ (359 වන අධිකාරය වූ) ගුවන් හමුදා පනතේ විධිවිධානවලින් ඔවුන් වෙත එකී බලතල සහ කාර්ය පිරිනමා නොමැති වුව ද නැතහොත් පනවා නොමැති වුව ද, එය නොතකා, ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම කරනු ලැබිය යුතු ය.

(4) ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, අමාත්‍යවරයා විසින්, බලයලත් හමුදා සාමාජිකයන් විසින් මේ පනත යටතේ වන

බලතල සහ කාර්ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම කරනු ලැබිය හැකි ප්‍රදේශ නිශ්චිතව දක්වනු ලැබිය හැකි ය.

(5) වරෙන්තුවක් නොමැතිව සිරභාරයට ගැනීමක් සිදු කරන බලයලත් හමුදා සාමාජිකයකු විසින්, නොපමාව-

(අ) එම සිරභාරයට ගැනීම පාලක ජනරාල්වරයා වෙත දැනුම් දීම; සහ

(ආ) එසේ සිරභාරයට ගත් තැනැත්තා පොලිස් නිලධරයකු භාරයට පත් කිරීම,

කරනු ලැබිය යුතු ය.

පනත යටතේ වන ඇතැම් බලතල වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුවේ වෙරළාරක්ෂක නිලධරයන් විසින් ක්‍රියාත්මක කළ හැකි බව

8. (1) අමාත්‍යවරයාගේ ඉල්ලීම මත, ජනාධිපතිවරයා විසින්, මේ පනතේ කාර්ය සඳහා ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් 2009 අංක 41 දරන වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව පනතේ විධිවිධානවලට අනුකූලව රැස් කර පවත්වාගෙන යනු ලබන, වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ වෙරළ ආරක්ෂක නිලධරයන් සියලු දෙනාම හෝ ඉන් කිසිවෙක් වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ බලයලත් වෙරළ ආරක්ෂක නිලධරයන් ලෙස නම් කරනු ලැබිය හැකි ය.

(2) (4) වන උපවගන්තිය යටතේ නිශ්චිතව දක්වා ඇති ප්‍රදේශය ඇතුළත, වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ බලයලත් වෙරළ ආරක්ෂක නිලධරයකු, අපරාධ නඩු විධාන සංග්‍රහය පනතින් සාම නිලධරයකු වෙත පිරිනමන ලද යම් බලයක් ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා පමණක්,-

(අ) 46 වන වගන්තිය යටතේ වන යම් වරදක්;

(ආ) 51 වන වගන්තිය යටතේ වන යම් වරදක්;

(ඇ) 124 වන වගන්තිය යටතේ වන යම් වරදක්;

(ඈ) 126 වන වගන්තිය යටතේ වන යම් වරදක්;

(ඉ) 136 වන වගන්තිය යටතේ වන යම් වරදක්;

(ඊ) 137 වන වගන්තිය යටතේ වන යම් වරදක්;

(උ) 138 වන වගන්තිය යටතේ වන යම් වරදක්; සහ

(ඌ) 139 වන වගන්තිය යටතේ වන යම් වරදක්,

සම්බන්ධයෙන් ඒ පනතේ අර්ථානුකූලව සාම නිලධරයකු ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) මේ වගන්තියේ වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ බලයලත් වෙරළ ආරක්ෂක නිලධරයන් වෙත පිරිනමන ලද සහ පනවන ලද බලතල සහ කාර්ය, 2009 අංක 41 දරන වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව පනතේ විධිවිධානවලින් ඔවුන් වෙත එකී බලතල සහ කාර්ය පිරිනමා නොමැති වුව ද, නැතහොත් පනවා නොමැති වුව ද, එය නොතකා, ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම කරනු ලැබිය යුතු ය.

(4) ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, අමාත්‍යවරයා විසින්, වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ බලයලත් වෙරළ ආරක්ෂක නිලධරයන් විසින් මේ පනත යටතේ වන බලතල සහ කාර්ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම කරනු ලැබිය හැකි ප්‍රදේශ නිශ්චිතව දක්වනු ලැබිය හැකි ය.

(5) වරෙන්තුවක් නොමැතිව සිරභාරයට ගැනීමක් සිදු කරන වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ බලයලත් වෙරළ ආරක්ෂක නිලධරයකු විසින්, නොපමාව,-

(අ) එම සිරභාරයට ගැනීම පාලක ජනරාල්වරයා වෙත දැනුම් දීම; සහ

(ආ) එසේ සිරභාරයට ගත් තැනැත්තා පොලිස් නිලධරයකු භාරයට පත් කිරීම,

කරනු ලැබිය යුතු ය.

III වන කොටස

**වීසා පත්‍රය**

III වන කොටස අදාළ වීම

**9.** මේ කොටස-

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු; හෝ

(ආ) මේ පනතේ I වන කොටස යටතේ සාදන ලද තත්කාලයේ බලපවත්නා යම් නියමයක් ප්‍රකාර මේ කොටසේ විධිවිධානවලින් නිදහස් කරන ලද තැනැත්තකු,

නොවන සෑම තැනැත්තකුට ම අදාළ විය යුතු ය.

ශ්‍රී ලාංකික වීසා පත්‍ර

**10.** (1) මේ පනතේ විධිවිධානවලට යටත්ව, පාලක ජනරාල්වරයා විසින් හෝ ඔහු විසින් බලය දෙන ලද නිලධරයකු විසින්, ශ්‍රී ලංකාවට ඇතුළු වීම සහ නිශ්චිතව දක්වා ඇති කාලසීමාවක් තුළ ශ්‍රී ලංකාවෙහි රැඳී සිටීම සඳහා ("ශ්‍රී ලාංකික වීසා පත්‍රය" යනුවෙන් සඳහන් කරනු ලබන) අවසරයක් ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන යම් තැනැත්තකු වෙත නිකුත් කරනු ලැබිය හැකි ය.

(2) (අ) පාලක ජනරාල්වරයා විසින්, වීසා පත්‍රයේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට යටත්ව, වසර පහක් නොඉක්මවන කාලසීමාවක් සඳහා වීසා පත්‍රයක් නිකුත් කරනු ලැබිය හැකි ය.

(ආ) අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව, පාලක ජනරාල්වරයා විසින්, වීසා පත්‍රයේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට යටත්ව, වසර පහක් ඉක්මවන එහෙත් වසර දහයක් නොඉක්මවන කාලසීමාවක් සඳහා වීසා පත්‍රයක් නිකුත් කරනු ලැබිය හැකි ය.

(3) (2) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති කාලසීමා නොතකා, පාලක ජනරාල්වරයා විසින්, අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි කාලසීමාවක් සඳහා යම් තැනැත්තකු වෙත ස්ථිර වාස වීසා පත්‍රයක් නිකුත් කරනු ලැබිය හැකි ය.

(4) යම් තැනැත්තකු තත්කාලයෙහි ශ්‍රී ලංකාව තුළ රැඳී සිටීම යන කරුණ මගින්, එම තැනැත්තා වෙත වීසා පත්‍රයක් හෝ පිටසනක් ප්‍රදානය කිරීම හෝ නිකුත් කිරීම හෝ තැනැත්තා වෙත නිකුත් කර ඇති වීසා පත්‍රයේ හෝ පිටසනෙහි නිශ්චිතව දක්වා ඇති කාලසීමාව දීර්ඝ කිරීම හෝ වළක්වනු නොලැබිය යුතු ය.

**ශ්‍රී ලංකාවට සංචරණය කිරීම හෝ ශ්‍රී ලංකාව තුළ රැඳී සිටීම සඳහා වීසා පත්‍රයක් අවශ්‍ය බව**

11. (1) ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් 3 වන වගන්තිය යටතේ වන වීසා පත්‍ර නියමයන්ගෙන් ඔහු නිදහස් කර ඇත්නම් මිස, ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන තැනැත්තකු විසින් වලංගු වීසා පත්‍රයක් නොමැතිව ශ්‍රී ලංකාවට සංචරණය කිරීම හෝ ශ්‍රී ලංකාව තුළ රැඳී සිටීම කරනු නොලැබිය යුතු ය.

(2) මේ කොටස අදාළ වන්නා වූ ද, ශ්‍රී ලංකාවට ඇතුළු වන්නා වූ ද, තැනැත්තකු විසින්-

(අ) ඔහු වීසා පත්‍රයක් දරන්නකු නොවේ නම්, ඔහු ශ්‍රී ලංකාව තුළ රැඳී සිටින තාක්කල්, ශ්‍රී ලංකාවට ඇතුළු වන අවස්ථාවේ දී ඔහු වෙත ප්‍රදානය කරන ලද පිටසනෙහි නියම සහ කොන්දේසිවලට අනුකූලව කටයුතු කිරීම; හෝ

(ආ) ඔහු එවැනි වීසා පත්‍රයක් දරන්නකු නම්, ඔහු ශ්‍රී ලංකාව තුළ රැඳී සිටින තාක්කල් වීසා පත්‍රයේ නියම සහ කොන්දේසිවලට අනුකූලව කටයුතු කිරීම,

කරනු ලැබිය යුතු ය.

(3) මේ කොටස සහ IV වන සහ V වන කොටස් අදාළ වන්නා වූ ද, ශ්‍රී ලංකාවට ඇතුළු වන්නා වූ ද, තැනැත්තකු විසින්-

(අ) ඔහු වීසා පත්‍රයක් හෝ විද්‍යුත් සංචරණ අනුමතයක් දරන්නකු නොවේ නම්, ශ්‍රී ලංකාවට ඇතුළු වන අවස්ථාවේ දී ඔහු වෙත ප්‍රදානය කරන ලද පිටසන මගින් ඔහුට ශ්‍රී ලංකාව තුළ රැඳී සිටීම සඳහා අවසර දෙන ලද කාලසීමාව අවසන් වීමෙන් පසු ශ්‍රී ලංකාව තුළ රැඳී සිටීම;

(ආ) ඔහු වීසා පත්‍රයක් හෝ විද්‍යුත් සංචරණ අනුමතයක් දරන්නකු නම්, ඒ වීසා පත්‍රය මගින් හෝ විද්‍යුත් සංචරණ අනුමතය මගින් හෝ ඒ වීසා පත්‍රය දීර්ඝ කිරීමක් ප්‍රකාර ඔහුට ශ්‍රී ලංකාව තුළ රැඳී සිටීම සඳහා අවසර දෙන ලද කාලසීමාව අවසන් වීමෙන් පසු ශ්‍රී ලංකාව තුළ රැඳී සිටීම; හෝ

(ඇ) ඔහු ශ්‍රී ලංකාවට ඇතුළු වී ඇත්තේ IV වන හෝ V වන කොටස්වල විධිවිධාන උල්ලංඝනය කරමින් නම්, ශ්‍රී ලංකාව තුළ රැඳී සිටීම,

කරනු නොලැබිය යුතු ය.

(4) වීසා පත්‍රයක් නිකුත් කිරීම හේතුවෙන් ම පමණක් එම වීසා පත්‍රය දරන්නා මේ පනත යටතේ ඇතුළු වීමේ අවසරයක් ප්‍රදානය කරනු ලැබීමට හිමිකම් නොලැබිය යුතු ය.

(5) වලංගු වීසා පත්‍රයක් දරන ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන තැනැත්තකු හෝ මේ පනතේ 3 වන වගන්තිය යටතේ සාදනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් වීසා පත්‍ර නියමයන්ගෙන් නිදහස් කර ඇති ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන තැනැත්තකු සතුව ශ්‍රී ලංකාවට ඇතුළු වීම සඳහා 49 වන වගන්තිය යටතේ ප්‍රදානය කරන ලද ඇතුළු වීමේ පිටසනක් තිබිය යුතු ය.

(6) යම් තැනැත්තකුට ඇතුළු වීමේ පිටසනක් ප්‍රදානය කරනු ලැබූ අවස්ථාවක, වීසා පත්‍රයක් ඇත්නම්, එම වීසා පත්‍රයේ කොන්දේසිවලට හෝ ඇතුළු වීමේ පිටසනේ කොන්දේසිවලට හෝ අනුකූලව ශ්‍රී ලංකාවට ඇතුළු වීමට සහ ශ්‍රී ලංකාව තුළ රැඳී සිටීමට එකී තැනැත්තා වෙත අවසරය ලැබේ.

යම් තැනැත්තකු විසින් එක් වලංගු වීසා පත්‍රයක් පමණක් දැරිය යුතු බව

**12.** යම් තැනැත්තකු විසින්, යම් නිශ්චිත අවස්ථාවක දී, එක් වලංගු වීසා පත්‍රයක් පමණක් දරනු ලැබිය යුතු ය.

වීසා පත්‍රයක් නිකුත් කිරීමට හෝ නිකුත් කිරීම ප්‍රතික්ෂේප කිරීමට පාලක ජනරාල්වරයාට ඇති බලය

**13.** (1) කිසිදු තැනැත්තකු අයිතිවාසිකමක් වශයෙන් වීසා පත්‍රයකට හිමිකම් නොලැබිය යුතු ය.

(2) මේ පනතේ අන්‍යාකාරයකින් විධිවිධාන සලස්වා ඇත්නම් මිස, වීසා පත්‍රයක් සඳහා වන ඉල්ලීමක් නිශ්චය කිරීමේ දී, පාලක ජනරාල්වරයා විසින්, ඔහුගේ තනි අභිමතය අනුව-

(අ) වීසා පත්‍රයක් නිකුත් කිරීම හෝ නිකුත් කිරීම ප්‍රතික්ෂේප කිරීම;

(ආ) ඉල්ලුම් කරන ලද වීසා පත්‍රයේ පන්තිය සහ කාණ්ඩය කුමක් වුව ද යම් පන්තියකට, උපපන්තියකට, කාණ්ඩයකට හෝ උපකාණ්ඩයකට අයත් වීසා පත්‍රයක් නිකුත් කිරීම;

(ඇ) නිකුත් කරන ලද වීසා පත්‍රය මත යම් කොන්දේසි පැනවීම හෝ කොන්දේසි වෙනස් කිරීම හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීම; හෝ

(ඈ) වීසා පත්‍රයේ කාලය දීර්ඝ කිරීම හෝ කාලය දීර්ඝ කිරීම ප්‍රතික්ෂේප කිරීම,

කරනු ලැබිය හැකි ය.

වීසා පත්‍ර නිකුත් කිරීම

**14.**(අ) තැනැත්තකු විසින් නියම කරනු ලැබූ අවශ්‍යතා සපුරා ඇති අවස්ථාවක;

(ආ) යම් තැනැත්තකු ශ්‍රී ලංකාවට ඇතුළු වීමේ අරමුණ පාලක ජනරාල්වරයා විසින් අනුමත කරනු ලැබූ අවස්ථාවක;

(ඇ) තැනැත්තකු ඔහුට ශ්‍රී ලංකාවට ඇතුළු වීමට ඉඩ සලසන්නා වූ වලංගු විදේශ ගමන් බලපත්‍රයක් හෝ ගමන් ලේඛනයක් දරන්නකු වන අවස්ථාවක;

(ඈ) ශ්‍රී ලංකාව තුළ නඩත්තුව සඳහා සහ ඔහුගේ විදේශ ගමන් බලපත්‍රය හෝ ගමන් ලේඛනය නිකුත් කරන ලද රටට ආපසු යෑම සඳහා වූ ගෙවීම් සිදු කිරීම සඳහා යම් තැනැත්තකු සතුව ප්‍රමාණවත් අරමුදල් ඇති බවට පාලක ජනරාල්වරයා සෑහීමට පත් වූ අවස්ථාවක; සහ

(ඉ) යම් තැනැත්තකු මේ පනතේ 21 වන වගන්තිය යටතේ වන යම් නුසුදුසුකමකට යටත් නොවන අවස්ථාවක,

පාලක ජනරාල්වරයා විසින්, එකී තැනැත්තා වෙත වීසා පත්‍රයක් නිකුත් කරනු ලැබිය හැකි ය.

**වීසා පත්‍රයක් සඳහා වන ඉල්ලුම් පත්‍රය**

**15.** වීසා පත්‍රයක් ලබා ගැනීමට අපේක්ෂා කරන තැනැත්තකු විසින් නියෝග මගින් නියම කරන ලද ආකෘතියට සහ ආකාරයට අනුකූලව පාලක ජනරාල්වරයා වෙත ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

**වීසා පත්‍ර පන්ති**

**16.** (1) මේ පනත යටතේ නිකුත් කරනු ලබන වීසා පත්‍ර පහත දැක්වෙන පන්තිවලට අයත් විය යුතු ය:-

(අ) වාස වීසා පත්‍ර;

(ආ) ස්ථිර වාස වීසා පත්‍ර;

(ඇ) පැමිණීමේ වීසා පත්‍ර; සහ

(ඈ) මාර්ගස්ථ වීසා පත්‍ර.

(2) ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියෝග මගින්, අමාත්‍යවරයා විසින්, යම් වීසා පත්‍ර උපපන්තියක් හඳුන්වා දීම, අවලංගු කිරීම, සංශෝධනය කිරීම හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීම කරනු ලැබිය හැකි ය.

(3) අමාත්‍යවරයා විසින්, විධාන මගින් යම් වීසා පත්‍ර පන්තියක් හෝ උපපන්තියක් යටතේ වීසා පත්‍ර කාණ්ඩයක් හෝ උපකාණ්ඩයක් හඳුන්වා දෙනු ලැබිය හැකි ය.

**වීසා පත්‍රයක වලංගු කාලසීමාව**

**17.** (1) 10 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, පාලක ජනරාල්වරයා විසින්-

(අ) යම් තැනැත්තකුට මාස නවයක් නොඉක්මවන කාලසීමාවක් සඳහා පැමිණීමේ වීසා පත්‍රයක් නිකුත් කිරීම කරනු ලැබිය හැකි ය;

(ආ) ශ්‍රී ලංකාව හරහා ගමන් කරන තැනැත්තකුට එකී වීසා පත්‍රයේ නිශ්චිතව දක්වා ඇති පරිදි දින තිහක් නොඉක්මවන කාලසීමාවක් සඳහා මාර්ගස්ථ වීසා පත්‍රය නිකුත් කිරීම කරනු ලැබිය හැකි ය; හෝ

(ඇ) යම් තැනැත්තකුට වසර දහයක් නොඉක්මවන කාලසීමාවක් සඳහා වාස වීසා පත්‍රයක් නිකුත් කිරීම කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද, වීසා පත්‍රයේ කාලසීමාව වසර පහක් ඉක්මවන්නා වූ අවස්ථාවක, පාලක ජනරාල්වරයා විසින්, 10 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ අමාත්‍යවරයාගේ අනුමතය ලබා ගනු ලැබිය යුතු ය.

(2) මේ වගන්තියේ සඳහන් කිසිවක් මගින්, ශ්‍රී ලංකාවට අනුයුක්ත කර ඇති යම් රාජ්‍යතාන්ත්‍රික නිලධරයකුට, එම රාජ්‍යතාන්ත්‍රික නිලධරයාගේ ධුර කාලය සඳහා පාලක ජනරාල්වරයා විසින් වාස වීසා පත්‍රයක් නිකුත් කිරීම වළක්වනු නොලැබිය යුතු ය.

අන්තර්කාලීන වීසා පත්‍ර

**18.** ඉල්ලුම් පත්‍රය සලකා බලන කාලසීමාව අතරතුර වාස වීසා පත්‍ර ඉල්ලුම්කරුවකු ශ්‍රී ලංකාව තුළ රැඳී සිටීමේ නීත්‍යනුකූලභාවය ආරක්ෂා කිරීමේ කාර්යය සඳහා, පාලක ජනරාල්වරයා විසින්, එක් මාසයක් නොඉක්මවන කාලසීමාවක් සඳහා වලංගු වන අන්තර්කාලීන වීසා පත්‍රයක් නිකුත් කරනු ලැබිය හැකි ය.

සංචරණ සඳහා වූ විද්‍යුත් අනුමතය

**19.** (1) පාලක ජනරාල්වරයා විසින්, ඇතුළු වන ස්ථානයේ දී ආගමන නිෂ්කාශනයට යටත්ව, ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන්නා වූ ද, 3 වන වගන්තිය යටතේ වීසා පත්‍රයක් ලබා ගැනීමේ නියමයෙන් නිදහස් කර නොමැත්තා වූ ද, තැනැත්තකුට විද්‍යුත් සංචරණ අනුමතය යනුවෙන් හඳුන්වනු ලබන අනුමතයක් මත, වීසා පත්‍රයක් ලබා ගැනීමෙන් තොරව කෙටි කාලයක් සඳහා ශ්‍රී ලංකාවට සංචරණය කිරීම සහ ශ්‍රී ලංකාව තුළ රැඳී සිටීම සඳහා අවසර දෙනු ලැබිය හැකි ය.

(2) ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, අමාත්‍යවරයා විසින්, විද්‍යුත් සංචරණ අනුමතයේ කාණ්ඩය සහ වර්ගය සහ එම සංචරණ විද්‍යුත් අනුමතයේ වලංගු කාලසීමාව නිශ්චිතව දක්වනු ලැබිය යුතු ය.

වීසා පත්‍රයකට අදාළ කොන්දේසි

**20.** (1) සෑම වීසා පත්‍රයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි කොන්දේසි කිසිවක් වෙතොත්, එම කොන්දේසිවලට යටත් විය යුතු ය.

(2) වීසා පත්‍රයක කොන්දේසි මගින්-

(අ) තනි පිවිසුමක්, බහුවාර පිවිසුම් හෝ පිවිසුම් කිහිපයක් මත ශ්‍රී ලංකාවට ඇතුළු වීමට අවසර ලබා දීම; හෝ

(ආ) යම් නිශ්චිත කාලසීමාවක් සඳහා හෝ යම් නිශ්චිත කාලසීමාවක් ඇතුළත ශ්‍රී ලංකාවට ඇතුළු වීමට අවසර ලබා දීම; හෝ

(ඇ) ශ්‍රී ලංකාවට තවදුරටත් ඇතුළු වීම ප්‍රකාශිතව ම තහනම් කිරීම,

කරනු ලැබිය හැකි ය.

(3) ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, වීසා පත්‍රයකට අදාළ විස්තර, කොන්දේසි හෝ වීසා පත්‍රවලට අදාළ සුදුසුකම් වෙනස් කිරීම හෝ සංශෝධනය කිරීම කරනු ලැබිය හැකි ය.

(4) ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියෝග මගින්, අමාත්‍යවරයා විසින්, ස්ථිර වාස වීසා පත්‍රයක් නිකුත් කිරීම සඳහා වන නියම සහ කොන්දේසි නියම කරනු ලැබිය හැකි ය.

වීසා පත්‍රයක් සඳහා වන නුසුදුසුකම්

**21.** (1) නියම කරනු ලැබිය හැකි අවස්ථානුගත කරුණුවල දී හැර-

(අ) පාලක ජනරාල්වරයාගේ මතය අනුව තමා සහ තම යැපෙන්නන් නඩත්තු කිරීමට නොහැකි;

(ආ) තමාට සහ අන්‍යයන්ට අනතුරුදායක සිහිවිකල් වූ තැනැත්තකු වන;

(ඇ) නියම කරන ලද වෛද්‍ය නිලධරයකු විසින් වෛද්‍ය හේතු මත ශ්‍රී ලංකාවට ඇතුළු කර ගැනීමට නුසුදුසු තැනැත්තකු බවට සහතික කරන ලද;

(ඈ) අන්තරායදායක ඖෂධ, මාදක ඖෂධ හෝ මනෝ වර්තක, ළමා අපචාර, මිනිස් අවහරණය, මිනිසුන් වෙළෙඳාම් කිරීම, ත්‍රස්තවාදය හෝ මුදල් විශුද්ධිකරණය සම්බන්ධයෙන් වන වැරදිවලට ශ්‍රී ලංකාව තුළ දී හෝ ශ්‍රී ලංකාවෙන් පිටත දී වරදකරු කරනු ලැබ ඇති හෝ අපරාධ නඩු පවරනු ලැබ ඇති;

(ඉ) ශ්‍රී ලංකාවෙහි බලපැවැත්වෙනු ලැබූ හෝ බලපවත්නා උදර්පණයට අදාළ යම් නීතියක අර්ථානුකූලව උදර්පණීය වරදක් සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත දී දඬුවම් පමුණුවනු ලැබ ඇති;

(ඊ) වෛශ්‍යා වෘත්තියේ යෙදීම සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබ ඇති හෝ කුට්ටනකරුවකු වන හෝ වෛශ්‍යා

වෘත්තියේ යෙදෙන අනෙකුන් මත තම ජීවිකාව ගෙන යන තැනැත්තකු වන;

(ඍ) මහජන යහපත පිණිස අමාත්‍යවරයා විසින් තත්කාර්ය සඳහා නිකුත් කරනු ලබන විශේෂ හෝ සාමාන්‍ය විධිවිධාන මගින් පනවනු ලැබිය හැකි වෙනත් අවශ්‍යතා සපුරාලීමට අපොහොසත් වන;

(ඎ) මේ පනත යටතේ බලපවත්නා රටින් පිට කිරීමේ නියමයකට යටත් තැනැත්තකු හෝ රටින් පිට කරනු ලැබූ මාර්ගස්ථ තැනැත්තකු හෝ වෙනත් රටකින් ඉවත් කරන ලද මාර්ගස්ථ තැනැත්තකු වන;

(ඒ) 47 වන වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් කරන ලද නියමයක් මගින් තහනම් ආගාමිකයකු හෝ තහනම් ආගන්තුකයකු ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති;

(ඒ) යම් රෝගයකට එරෙහිව එන්නත්කරණය කර නොමැති හෝ එම එන්නත ලබා ගැනීම ප්‍රතික්ෂේප කර ඇති හෝ මේ පනතේ 56 වන වගන්තිය යටතේ වන වෙනත් යම් අවශ්‍යතාවක් සපුරා නොමැති;

(ඔ) නියෝග මගින් නියම කරනු ලැබිය හැකි හෝ අමාත්‍යවරයා විසින් නිකුත් කරනු ලබන යම් නියමයක හෝ විධානයක නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් නියමයකට හෝ කොන්දේසියකට අනුකූලව කටයුතු කිරීම පැහැර හැර ඇති;

(ඕ) සාධාරණ හේතුවක් නොමැතිව නියමිත කාලය ඉක්මවා ශ්‍රී ලංකාව තුළ රැඳී සිටින තැනැත්තකු වන;

(ක) එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආරක්ෂක සභාවේ අදාළ යෝජනා සම්මතයක් මගින් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ඒකාබද්ධ ලැයිස්තුව යටතේ නම් කරන ලද තැනැත්තකු වන;

(ග) කලින් ශ්‍රී ලංකාවෙන් පිට කර නැතහොත් ඉවත් කර ඇත්තා වූ ද, වීසා පත්‍රය නිකුත් කරනු ලබන හෝ වීසා පත්‍රයේ කාලය දීර්ඝ කරනු ලබන අවස්ථාවේ දී ඔහුට එරෙහිව ගමන් තහනමක් බලාත්මකව පවතින්නා වූ ද තැනැත්තකු වන; හෝ

(ච) ගාස්තු නොගෙවා නැවකින් සැඟවී පලා යන තැනැත්තකු වන,

යම් තැනැත්තකුට කිසිදු වීසා පත්‍රයක් නිකුත් කරනු නොලැබිය යුතු ය; දීර්ඝ කිරීමක් නොකළ යුතු ය.

(2) මේ වගන්තිය උල්ලංඝනය කරමින් නිකුත් කරන ලද නැතහොත් කාලය දීර්ඝ කරන ලද යම් වීසා පත්‍රයක් මේ පනතේ කාර්ය සඳහා ශූන්‍ය සහ බලරහිත ලෙස සලකනු ලැබිය යුතු ය.

ඇතැම් අවස්ථානුගත කරුණුවල දී ආරක්ෂක අමාත්‍යාංශයේ නිර්දේශය ලබා ගත යුතු බව

**22.** අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින්, ආරක්ෂක විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ ඉල්ලීම පරිදි, ජාතික ආරක්ෂාව සහ මහජන යහපතට ඇති යම් තර්ජනයක් සැලකිල්ලට ගනිමින්, ආරක්ෂක විෂයය පවරා ඇති අමාත්‍යවරයා විසින් නිශ්චිතව දක්වනු ලබන රටවල්වලින් පැමිණෙන නිශ්චිතව දක්වා ඇති තැනැත්තකුට හෝ තැනැත්තන්ට වීසා පත්‍රයක් නිකුත් කිරීමට පෙර එම අමාත්‍යවරයාගේ නිර්දේශය ලබා ගන්නා ලෙස පාලක ජනරාල්වරයා වෙත විධාන නිකුත් කරනු ලැබිය හැකි ය.

යම් තොරතුරු සැපයීමේ අවශ්‍යතාව

**23.** පාලක ජනරාල්වරයා විසින්, වීසා පත්‍රයක් නිකුත් කර ඇති හෝ වීසා පත්‍රයක් නිකුත් කිරීම හෝ වීසා පත්‍රයක කාලය දීර්ඝ කිරීම සඳහා ඉල්ලීමක් කර ඇති යම් තැනැත්තකුට එම වීසා පත්‍රය නිකුත් කිරීම හෝ වීසා පත්‍රයේ කාලය දීර්ඝ කිරීම සඳහා ගමන් ලේඛනය සහ අවශ්‍ය යයි පාලක ජනරාල්වරයා විසින් සලකනු ලැබිය හැකි වෙනත් යම් දේවල්, තොරතුරු හෝ ලේඛන සපයන ලෙස නියම කරනු ලැබිය හැකි ය.

හඳුනා ගැනීමේ තොරතුරු සහ ඡායාරූප ඉල්ලා සිටීමේ බලය

**24.** (1) යම් තැනැත්තකු විසින් වීසා පත්‍රයක් සඳහා ඉල්ලීමක් කර ඇති අවස්ථාවක-

(අ) ඔහුගේ ඡායාරූපය සපයන ලෙස; සහ

(ආ) ඔහුගේ හඳුනා ගැනීමේ තොරතුරු ලබා දෙන ලෙස,

පාලක ජනරාල්වරයා විසින් එම වීසා පත්‍රය ඉල්ලුම් කරන තැනැත්තාට නියම කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සපයන ලද සෑම ඡායාරූපයක් ම හෝ හඳුනා ගැනීමේ තොරතුරක් ම අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි ආකාරයෙන් විය යුතු ය.

(3) ඉල්ලුම්කරු විසින් හඳුනා ගැනීමේ තොරතුරු ලබා දීම ප්‍රතික්ෂේප කරනු ලැබූ අවස්ථාවක, පාලක ජනරාල්වරයා විසින්, වීසා පත්‍රයක් සඳහා වන ඉල්ලීම ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය.

යටත් පිරිසෙයින්, ගමන් ලේඛනයේ කාලය අවසන් වන දිනට මාස දෙකකටවත් පෙරාතුව වූ දිනයක දී වීසා පත්‍රයේ කාලය අවසන් විය යුතු බව

**25.** මේ පනත යටතේ යම් තැනැත්තකුට නිකුත් කරනු ලබන වීසා පත්‍රයක්, යටත් පිරිසෙයින්, එම තැනැත්තා විසින් දරනු ලබන ගමන් ලේඛනයේ කාලය අවසන් වන දිනට මාස දෙකකටවත් පෙරාතුව වූ දිනයක දී එම වීසා පත්‍රයේ කාලය අවසන් වන පරිදි නිකුත් කිරීම සිදු කරනු ලැබිය යුතු ය.

වීසා පත්‍රයක් අවලංගු කිරීම, වෙනස් කිරීම හෝ සංශෝධනය කිරීම සඳහා පාලක ජනරාල්වරයා සතු බලය

**26.** (1) පාලක ජනරාල්වරයා විසින්, ස්වකීය පූර්ණ අභිමතය මත, තමාට නිකුත් කර ඇති වීසා පත්‍රයේ යම් නියමයකට හෝ කොන්දේසියකට අනුකූලව කටයුතු කිරීම පැහැර හැර ඇති යම් තැනැත්තකුගේ වීසා පත්‍රය හෝ එහි නිශ්චිතව දක්වා ඇති යම් නියමයක් හෝ කොන්දේසියක් අවලංගු කිරීම, වෙනස් කිරීම හෝ සංශෝධනය කිරීම කරනු ලැබිය හැකි ය.

(2) පාලක ජනරාල්වරයා විසින්, අවස්ථාවෝචිත පරිදි, යම් වීසා පත්‍රයක් අවලංගු කිරීම, වෙනස් කිරීම හෝ සංශෝධනය කිරීම සම්බන්ධයෙන් දැන්වීමක් වීසා පත්‍රය දරන්නාට භාර දීමට කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

අවනිශ්චයනය මගින් ලබා ගත් වීසා පත්‍ර අවලංගු කිරීමේ බලය

**27.** (1) පාලක ජනරාල්වරයා විසින්, මේ පනතේ විධිවිධාන උල්ලංඝනය කරමින් සහ වැදගත් කරුණු අවනිශ්චයනය කරමින් නැතහොත් යටපත් කරමින් යම් තැනැත්තකු විසින් ලබා ගත් වීසා පත්‍රයක් අවලංගු කරනු ලැබිය යුතු ය.

(2) වීසා පත්‍රයක් ලබා ගැනීම සඳහා වැදගත් කරුණු අවනිශ්චයනය කරන හෝ යටපත් කරන යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට අවුරුද්දක් නොඉක්මවන කාලසීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් ලක්ෂයක් නොඉක්මවන දඩයකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

වීසා පත්‍රයක වලංගු කාලසීමාව දීර්ඝ කිරීම

**28.** (1) 25 වන වගන්තියට යටත්ව, පාලක ජනරාල්වරයා විසින්,-

(අ) පැමිණීමේ වීසා පත්‍රයක වලංගු කාලසීමාව පැමිණෙන දින සිට මාස නවයක් නොඉක්මවන කාලසීමාවකට දීර්ඝ කිරීම; හෝ

(ආ) වාස වීසා පත්‍රයක වලංගු කාලසීමාව වරකට වසර පහක කාලසීමාවකට දීර්ඝ කිරීම,

කරනු ලැබිය හැකි ය.

(2) මාර්ගස්ථ වීසා පත්‍රයක කාලය දීර්ඝ කරනු ලැබිය නොහැකි විය යුතු ය.

වීසා පත්‍රයක වලංගුභාවය අවසන් වීම

**29.** සෑම වීසා පත්‍රයක ම වලංගුභාවය-

(අ) 28 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ වන කාලය දීර්ඝ කිරීමට යටත්ව, එම වීසා පත්‍රය නිකුත් කරන ලද කාලසීමාව අවසන් වූ විට;

(ආ) එම වීසා පත්‍රය නිකුත් කරන ලද කාර්ය අවසන් වූ විට;

(ඇ) එම වීසා පත්‍රය නිකුත් කරන ලද්දේ යම් නියමයකට හෝ කොන්දේසියකට යටත්ව ද, එම නියමය හෝ කොන්දේසිය අවසන් වූ විට;

(ඈ) එම වීසා පත්‍රය නිකුත් කරන ලද්දේ යම් නියමයකට හෝ කොන්දේසියකට යටත්ව ද, එම නියමය හෝ කොන්දේසිය ඉටු කරනු නොලැබූ හෝ උල්ලංඝනය කරනු ලැබූ විට; හෝ

(ඉ) වීසා පත්‍රය දරන්නා මිය ගිය විට,

අවසන් විය යුතු ය.

ශ්‍රී ලංකාවේ දී උපන් ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන ළමයකු සඳහා වීසා පත්‍රයක් ලබා ගැනීමේ අවශ්‍යතාව

**30.** (1) (අ) ශ්‍රී ලංකාවේ උපන්; සහ

(ආ) උපන් අවස්ථාවේ දී ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන,

ළමයකුට ශ්‍රී ලංකාව තුළ රැඳී සිටීම සඳහා බලය දෙමින් වීසා පත්‍රයක් නිකුත් කර ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් වීසා පත්‍රයක් එම ළමයා උපන් දින සිට දින හතලිස්දෙකක් සඳහා වලංගු විය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ සඳහන් වීසා පත්‍රයක් ලබා ගැනීම සඳහා හෝ වීසා පත්‍රයක් අලුත් කිරීම සඳහා වන ඉල්ලීමක්-

(අ) පියා, මව හෝ නීත්‍යානුකූල භාරකරු විසින් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය; සහ

(ආ) නියෝග මගින් නියම කරනු ලැබිය හැකි ආකෘතියකින් විය යුතු ය.

(4) (3) වන උපවගන්තිය යටතේ ඉල්ලීමක් කරනු ලැබූ විට, පාලක ජනරාල්වරයා විසින්, ඔහු විසින් සුදුසු යයි සලකනු ලබන පරිදි වීසා පත්‍රයේ කාලය දීර්ඝ කරනු ලැබිය හැකි ය.

(5) (1) වන උපවගන්තිය යටතේ යම් ළමයකුට නිකුත් කරන ලද හෝ (4) වන උපවගන්තිය යටතේ කාලය දීර්ඝ කරන ලද වීසා පත්‍රයක් වලංගු වීම, එම ළමයාගේ දෙමාපියන්ට හෝ නීත්‍යානුකූල භාරකරුවන්ට ප්‍රදානය කරන ලද වීසා පත්‍රයේ වලංගුභාවය අවසන් වීමත් සමඟම අවසන් විය යුතු ය.

(6) (1) වන උපවගන්තියේ සඳහන් ළමයකු වීසා පත්‍රයේ කාලය අවසන් වීමෙන් පසු ශ්‍රී ලංකාව තුළ රැඳී නොසිටින බවට එම ළමයාගේ දෙමාපියන් හෝ නීත්‍යානුකූල භාරකරු විසින් වගබලා ගනු ලැබිය යුතු ය.

(7) (6) වන උපවගන්තිය උල්ලංඝනය කරන යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබන්නේ ය.

කලත්‍රයකුට හෝ යැපෙන්නකුට නිකුත් කරන ලද වීසා පත්‍රයක වලංගුභාවය අවසන් වීම

**31.** යම් තැනැත්තකුට නිකුත් කරන ලද වාස වීසා පත්‍රයක වලංගුභාවය අවසන් වී ඇති අවස්ථාවක, හුදෙක් ම ඒ තැනැත්තා වාස වීසා පත්‍රයක් දරන්නකු වීම හේතුවෙන් ම පමණක් ඒ තැනැත්තාගේ කලත්‍රයාට හෝ යැපෙන්නකුට නිකුත් කරන ලද යම් වීසා පත්‍රයක වලංගුභාවය අවසන් විය යුතු ය.

ළමයකුට නිකුත් කරන ලද වීසා පත්‍රයක වලංගුභාවය අවසන් වීම

**32.** ළමයකුට නිකුත් කරන ලද වාස වීසා පත්‍රයක වලංගුභාවය, ඒ ළමයා වයස අවුරුදු දහඅටට එළඹීමෙන් පසු අවසන් විය යුතු යඃ

එසේ වුව ද, 10 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදයට යටත්ව, තත්කාර්ය සඳහා කරන ලද ඉල්ලීමක් මත, පාලක ජනරාල්වරයා විසින්, එම වාස වීසා පත්‍රයේ කාලසීමාව දීර්ඝ කරනු

30

ලැබිය හැකි අතර, එසේ දීර්ඝ කරනු ලැබූ කාලසීමාව සඳහා එකී වාස වීසා පත්‍රය දිගට ම වලංගු විය යුතු ය.

ශ්‍රී ලංකාවේ පුරවැසියන් වීම අවසන් වන තැනැත්තන් සඳහා වීසා පත්‍ර ලබා ගැනීමේ අවශ්‍යතාව

**33.** (1) (349 වන අධිකාරය වූ) පුරවැසිභාවය පිළිබඳ පනතේ විධිවිධාන යටතේ ශ්‍රී ලංකාවේ පුරවැසියකු වීම අවසන් වූ ද, ඉන් අනතුරුව ශ්‍රී ලංකාව තුළ රැඳී සිටීමට අරමුණු කරන්නා වූ ද තැනැත්තකු විසින්, ඔහුට ශ්‍රී ලංකාව තුළ රැඳී සිටීම සඳහා අවසර ලබා දෙමින් වීසා පත්‍රයක් නිකුත් කිරීම සඳහා නියමිත ආකෘතියෙන් පාලක ජනරාල්වරයා වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ඉල්ලීමක් ඉදිරිපත් කර නියමිත ගාස්තුව ගෙවනු ලැබූ විට, පාලක ජනරාල්වරයා විසින්, ශ්‍රී ලංකාව තුළ රැඳී සිටීමට අවසර ලබා දෙමින් ඉල්ලුම්කරුට වීසා පත්‍රයක් නිකුත් කරනු ලැබිය හැකි ය.

(3) (349 වන අධිකාරය වූ) පුරවැසිභාවය පිළිබඳ පනතේ විධිවිධාන යටතේ ශ්‍රී ලංකාවේ පුරවැසියකු වීම අවසන් වීමෙන් පසු වීසා පත්‍රයක් නොමැතිව ශ්‍රී ලංකාව තුළ රැඳී සිටින තැනැත්තකු වරදක් සිදු කරනු ලබන අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් ලක්ෂයක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

විදේශීය පෙර ශ්‍රී ලාංකිකයන් ලියාපදිංචි කිරීම

**34.** (1) (349 වන අධිකාරය වූ) පුරවැසිභාවය පිළිබඳ පනතේ විධිවිධාන යටතේ ශ්‍රී ලංකාවේ පුරවැසියකු වීම අවසන් වී ඇති තැනැත්තකු විසින් නියමිත ආකාරයෙන් තත්කාර්යය සඳහා ඉල්ලීමක් කරනු ලැබූ විට, එකී තැනැත්තා-

(අ) පූර්ණ වයසින් සහ ශක්නුතාවයෙන් යුතු වේ නම් සහ වෙනත් රටක පුරවැසියකු වේ නම්; හෝ

(ආ) (අ) ඡේදයේ සඳහන් තැනැත්තාගේ බාලවයස්කාර ළමයකු වේ නම්,

නියම කරනු ලැබිය හැකි කොන්දේසිවලට සහ සීමා කිරීම්වලට යටත්ව, අමාත්‍යවරයා විසින්, ඔහු විදේශීය පෙර ශ්‍රී ලාංකිකයකු ලෙස ලියාපදිංචි කරනු ලැබිය හැකි ය. තව ද, ඔහුට ස්ථිර වාස වීසා පත්‍රයක් නිකුත් කරනු ලැබිය හැකි ය.

(2) පාලක ජනරාල්වරයා විසින්, ලියාපදිංචි කරන ලද විදේශීය පෙර ශ්‍රී ලාංකිකයන්ට අදාළ තොරතුරු ඇතුළත් කරනු ලබන්නා වූ ලේඛනයක් තබා ගැනීම සහ පවත්වාගෙන යාම කරනු ලැබිය යුතු ය.

(3) මේ පනතේ III වන කොටසේ කාර්යය සඳහා ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන, විදේශීය පෙර ශ්‍රී ලාංකිකයකුගේ කලත්‍රයකු විදේශීය පෙර ශ්‍රී ලාංකිකයකු හා විවාහ වී සිටින විදේශීය ජාතිකයකු ලෙස සලකනු ලැබිය යුතු අතර, එකී කලත්‍රයා ශ්‍රී ලංකාවේ පුරවැසියකු හා විවාහ වී සිටින විදේශීය ජාතිකයකු වන කලත්‍රයකුට අදාළ වන සියලු වීසා පත්‍ර හිමිකම්වලට ඒ ආකාරයෙන් ම හිමිකම් ලැබිය යුතු ය.

(4) (349 වන අධිකාරය වූ) පුරවැසිභාවය පිළිබඳ පනතේ විධිවිධාන යටතේ ශ්‍රී ලංකාවේ පුරවැසියකු වීම අවසන්ව ඇත්තා වූ ද, විදේශීය පෙර ශ්‍රී ලාංකිකයකු ලෙස ලියාපදිංචි වීමට අරමුණු කරන්නා වූ ද තැනැත්තකු වන, විදේශීය පෙර ශ්‍රී ලාංකිකයකුගේ කලත්‍රයකු විසින්, (1) වන උපවගන්තිය යටතේ වෙනම ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(5) අමාත්‍යවරයා විසින්, එකී විදේශීය පෙර ශ්‍රී ලාංකිකයන් වෙත ස්ථිර වාස වීසා පත්‍ර නිකුත් කිරීම සඳහා වන ගාස්තු, ආකෘති සහ ආකාරය නියම කරනු ලැබිය හැකි ය.

විදේශීය පෙර ශ්‍රී ලාංකිකයන්ගේ වරප්‍රසාද

**35.** වෙනත් යම් නීතියක කුමක් සඳහන් වුව ද, විදේශීය පෙර ශ්‍රී ලාංකිකයකු විසින්,-

(අ) ස්ථිර වාස වීසා පත්‍රයක් සන්තකයේ දැරීම ප්‍රකාර ශ්‍රී ලංකාවට ඇතුළු වීම සහ ශ්‍රී ලංකාව තුළ රැඳී සිටීම;

(ආ) රාජ්‍ය සේවයේ, අධිකරණ සේවයේ සහ පළාත් රාජ්‍ය සේවයේ, පළාත් පාලන සේවයේ හෝ රාජ්‍ය සංස්ථාවක හැර ශ්‍රී ලංකාව තුළ රැකියාවක නිරත වීම;

(ඇ) අදාළ ලිඛිත නීති යටතේ විධිවිධාන සලස්වා ඇති පරිදි ශ්‍රී ලංකාව තුළ දේපළ උරුම කර ගැනීම, පැවරීම හෝ අන්සතු කිරීම; සහ

(ඇ) යම් නීත්‍යානුකූල ව්‍යාපාරයක හෝ වාණිජ කටයුත්තක නිරත වීම,

කරනු ලැබිය හැකි ය.

විදේශීය පෙර ශ්‍රී ලාංකිකයකුගේ තත්ත්වය අත්හැරීම

**36.** (1) වයස් පූර්ණ වූ සහ ශක්නුතාවයෙන් යුත් යම් විදේශීය පෙර ශ්‍රී ලාංකිකයකු විසින් ස්වකීය විදේශීය පෙර ශ්‍රී ලාංකිකයකුගේ තත්ත්වය අත්හැරීම පිළිබඳ ප්‍රකාශයක් නියමිත ආකාරයෙන් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවක, එකී තැනැත්තා විදේශීය පෙර ශ්‍රී ලාංකිකයකු වීම අවසන් විය යුතු ය.

(2) යම් තැනැත්තකු (1) වන උපවගන්තිය යටතේ විදේශීය පෙර ශ්‍රී ලාංකිකයකු වීම අවසන් වූ අවස්ථාවක, විදේශීය පෙර ශ්‍රී ලාංකිකයකු ලෙස ලියාපදිංචි කර ඇති ඒ තැනැත්තාගේ සෑම බාල වයස්කාර ළමයකු ම, ඉන් අනතුරුව, විදේශීය පෙර ශ්‍රී ලාංකිකයකු වීම අවසන් විය යුතු ය.

(3) යම් තැනැත්තකු (1) වන උපවගන්තිය යටතේ විදේශීය පෙර ශ්‍රී ලාංකිකයකු වීම අවසන් වූ අවස්ථාවක, 34 වන වගන්තිය යටතේ පවත්වාගෙන යනු ලබන ලේඛනයට එම තැනැත්තා සම්බන්ධයෙන් සහ ඔහුගේ දරුවන් සම්බන්ධයෙන් ඇතුළත් කරන ලද විස්තර එම ලේඛනයෙන් ඉවත් කරනු ලැබිය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ විදේශීය පෙර ශ්‍රී ලාංකිකයකුගේ තත්ත්වය අත්හැරීමෙන් පසු, ඒ තැනැත්තාගේ ශ්‍රී ලාංකික පුරවැසියකු නොවන කලත්‍රයකුට හුදෙක්ම ඒ තැනැත්තා විදේශීය පෙර ශ්‍රී ලාංකිකයකු හා විවාහ වී සිටීම හේතුවෙන් පමණක් ප්‍රදානය කරන ලද හෝ නිකුත් කරන ලද යම් වීසා පත්‍රයක වලංගුභාවය අවසන් විය යුතු ය.

විදේශීය පෙර ශ්‍රී ලාංකිකයකු ලෙස ලියාපදිංචි කිරීම අවලංගු කිරීම

**37.** (1) පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන් ඔහු සෑහීමට පත් වන්නේ නම්, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, අමාත්‍යවරයා විසින්, 34 වන වගන්තිය යටතේ යම් තැනැත්තකුගේ විදේශීය පෙර ශ්‍රී ලාංකිකයකු ලෙස ලියාපදිංචි කිරීම අවලංගු කරනු ලැබිය හැකි යː-

(අ) වංචාව, වැරදි විස්තර සැපයීම හෝ වැදගත් කරුණු සැඟවීම මගින් විදේශීය පෙර ශ්‍රී ලාංකිකයකු ලෙස ලියාපදිංචි කිරීම ලබා ගෙන ඇති බව;

(ආ) විදේශීය පෙර ශ්‍රී ලාංකිකයා විසින් ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කරමින් කටයුතු කර ඇති බව;

(ඇ) විදේශීය පෙර ශ්‍රී ලාංකිකයා විසින්, ශ්‍රී ලංකාව යෙදී සිටින යම් යුද්ධයක දී එහි සතුරු පාර්ශ්වයක් සමඟ නීති විරෝධී ලෙස ගනුදෙනු කර හෝ සන්නිවේදනය කර ඇති බව හෝ ඔහුගේ දැනීම අනුව ඒ යුද්ධයේ සතුරු පාර්ශ්වයකට සහාය වන ආකාරයකින් කරගෙන යනු ලබන යම් ව්‍යාපාරයක හෝ වාණිජ කටයුත්තක ඔහු යෙදී සිටින බව හෝ ඊට සම්බන්ධ බව;

(ඈ) 34 වන වගන්තිය යටතේ ලියාපදිංචි කිරීමෙන් පසු අවුරුදු පහක් ඇතුළත ශ්‍රී ලංකාව තුළ දී හෝ ශ්‍රී ලංකාවෙන් පිටත දී විදේශීය පෙර ශ්‍රී ලාංකිකයාට අවුරුදු දෙකකට නොඅඩු කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමෙන් දඬුවම් පමුණුවා ඇති බව;

(ඉ) ශ්‍රී ලංකාවේ ස්වාධිපත්‍යයේ සහ භෞමික අඛණ්ඩතාවයේ, ජාතික ආරක්ෂාවේ සහ වෙනත් යම් විදේශීය රටක් සමඟ ශ්‍රී ලංකාව පවත්වාගෙන යනු ලබන මිත්‍රශීලී සම්බන්ධතාවල යහපත සඳහා හෝ මහජන යහපත සඳහා එසේ කිරීම අවශ්‍ය බව; හෝ

(ඊ) මේ පනතේ 47 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ කරනු ලබන නියමයක් ප්‍රකාර එකී තැනැත්තා ශ්‍රී ලංකාවට ඇතුළු වීම සහ නැවත ඇතුළු වීම තහනම් කර හෝ සීමා කර ඇති බව.

(2) යම් තැනැත්තකු, (1) වන උපවගන්තිය යටතේ විදේශීය පෙර ශ්‍රී ලාංකිකයකු වීම අවසන් වූ අවස්ථාවක, විදේශීය පෙර ශ්‍රී ලාංකිකයකු ලෙස ලියාපදිංචි කර ඇති ඒ තැනැත්තාගේ සෑම බාල වයස්කාර ළමයකු ම, ඉන් අනතුරුව, විදේශීය පෙර ශ්‍රී ලාංකිකයකු වීම අවසන් විය යුතු ය.

(3) යම් තැනැත්තකු, (1) වන උපවගන්තිය යටතේ විදේශීය පෙර ශ්‍රී ලාංකිකයකු වීම අවසන් වූ අවස්ථාවක, 34 වන වගන්තිය යටතේ පවත්වාගෙන යනු ලබන ලේඛනයට එම තැනැත්තා සම්බන්ධයෙන් සහ ඔහුගේ දරුවන් සම්බන්ධයෙන් ඇතුළත් කරන ලද විස්තර එම ලේඛනයෙන් ඉවත් කරනු ලැබිය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ විදේශීය පෙර ශ්‍රී ලාංකිකයකුගේ තත්ත්වය අත්හැරීමෙන් පසු, ඒ තැනැත්තාගේ ශ්‍රී ලාංකික පුරවැසියකු

නොවන කලත්‍රයකුට හුදෙක්ම ඒ තැනැත්තා විදේශීය පෙර ශ්‍රී ලාංකිකයකු හා විවාහ වී සිටීම හේතුවෙන් පමණක් ප්‍රදානය කරන ලද හෝ නිකුත් කරන ලද යම් වීසා පත්‍රයක වලංගුභාවය අවසන් විය යුතු ය.

**මාර්ගස්ථ වීසා පත්‍රයක් නිකුත් කිරීම පරිසීමා කිරීම**

**38.** යම් රටක නීතියක් ප්‍රකාර යම් තැනැත්තකුට ඔහුට එම රටට ඇතුළු වීම සඳහා අවසර දෙනු ලබන වීසා පත්‍රයක් ඒ තැනැත්තා සන්තකයේ තිබිය යුතු වන අවස්ථාවක, ඒ රටේ නීතිය මගින් නියම කරනු ලැබූ පරිදි ඔහු සන්තකයේ වීසා පත්‍රයක් ඇත්නම් මිස, එකී තැනැත්තාට කිසිදු මාර්ගස්ථ වීසා පත්‍රයක් නිකුත් කරනු නොලැබිය යුතු ය.

**වීසා පත්‍රයක් නිකුත් කිරීම සුරැකුමක් ලබා දීමේ කොන්දේසි මත විය හැකි බව**

**39.** (1) 40 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් නියෝග ආකාරයෙන් නියම කරනු ලැබිය හැකි කොන්දේසිවලට යටත්ව, පාලක ජනරාල්වරයා විසින්, වීසා පත්‍රයක් නිකුත් කිරීම සම්බන්ධයෙන් 20 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට අමතරව වූ කොන්දේසියක් ලෙස පාලක ජනරාල්වරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් මුදල් ප්‍රමාණයක් පාලක ජනරාල්වරයාට තැන්පත් කිරීම මගින් හෝ නියම කරනු ලැබිය හැකි යම් මුදල් ප්‍රමාණයක් ගෙවීම සඳහා සුරැකුමක් ලියා අත්සන් කිරීම මගින් හෝ සුරැකුමක් ලබා දෙන ලෙස වීසා පත්‍රයක ඉල්ලුම්කරුට හෝ පාලක ජනරාල්වරයා විසින් ඔහු වෙනුවෙන් අනුමත කරන ලද තැනැත්තකුට නියම කරනු ලැබිය හැකි ය.

(2) 40 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් නියෝග ආකාරයෙන් නියම කරනු ලැබිය හැකි කොන්දේසිවලට යටත්ව, (1) වන උපවගන්තියේ විධිවිධාන යටතේ සුරැකුමක් ලබා දී ඇත්තේ යම් තැනැත්තකු සඳහා ද, එම තැනැත්තාට නිකුත් කරන ලද යම් වීසා පත්‍රයක යම් නියමයක් හෝ කොන්දේසියක් උල්ලංඝනය කර ඇති හෝ ඉටු කර නොමැති අවස්ථාවක, එකී මුළු සුරැකුමක් ම හෝ ඉන් කොටසක් රජය සන්තක විය යුතු ය.

**නියෝග**

**40.** (1) මේ කොටසේ කාර්යය සහ පහත දැක්වෙන කරුණු සියල්ල හෝ ඉන් කිසිවක් සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි යඃ-

(අ) මේ කොටසේ නියම කරනු ලැබිය යුතු යයි සඳහන් වන හෝ නියම කරන ලද යම් කරුණක්;

(ආ) වීසා පත්‍රයක් සඳහා ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කරනු ලැබිය යුතු ආකෘතිය සහ ආකාරය, එම ඉල්ලුම් පත්‍රවල ආකෘතිය, එම ඉල්ලුම් පත්‍රවලට අමුණනු ලැබිය යුතු ඡායාරූප සහ ජෛවමිතික දත්ත ඇතුළු ලේඛන සහ එකී ඇතුළත් කළ යුතු විස්තර;

(ඇ) වීසා පත්‍රයක් ප්‍රදානය කරනු ලැබිය හැකි හෝ නිකුත් කරනු ලැබිය හැකි බලධරයා;

(ඈ) එම වීසා පත්‍රය ප්‍රදානය කිරීම හෝ නිකුත් කිරීම සහ එම වීසා පත්‍රය ප්‍රතික්ෂේප කිරීම සඳහා වන උපමාන;

(ඉ) යම් තැනැත්තකුට වීසා පත්‍රයක් ප්‍රදානය කිරීමේ හෝ නිකුත් කිරීමේ කාර්යය සඳහා වූ කොන්දේසියක් ලෙස යම් ආකාරයකින් සහ ස්වරූපයකින් යම් මුදල් ප්‍රමාණයක් තැන්පත් කිරීම මගින් හෝ ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී වාණිජ බැංකුවකින් අහෝසි කර ඉල්ලූ විට දිය යුතු ඇපයක් දීම මගින් හෝ ඇපයක් ලබා දීම;

(ඊ) 39 වන වගන්තිය යටතේ ලබා දෙන ලද මුළු ඇපය ම හෝ ඉන් කොටසක් රජය සතු කිරීම;

(උ) අමාත්‍යවරයා විසින්, මහජන යහපත සඳහා අවශ්‍ය යයි සලකනු ලැබිය හැකි නියම සහ කොන්දේසි ඇතුළුව, එකී වීසා පත්‍රය නිකුත් කරනු ලැබිය හැක්කේ යම් නියම සහ කොන්දේසිවලට යටත්ව ද, එම නියම සහ කොන්දේසි;

(ඌ) එකී වීසා පත්‍රය හෝ එහි නිශ්චිතව දක්වා ඇති නියම හෝ කොන්දේසි අවලංගු කිරීම, වෙනස් කිරීම හෝ සංශෝධනය කිරීම, එකී වීසා පත්‍රවල ආකෘතිය සහ එහි ඇතුළත් කළ යුතු විස්තර;

(එ) එකී වීසා පත්‍රය නිකුත් කිරීම සඳහා වූ ගාස්තු නියම කිරීම, අය කර ගැනීම, බැහැර කිරීම හෝ ආපසු ලබා දීම, නියමිත අවස්ථානුගත කරුණුවල දී යම් තැනැත්තකු එකී ගාස්තු ගෙවීමෙන් නිදහස් කිරීම සහ එකී අවස්ථානුගත කරුණුවල දී එකී ගාස්තු ආපසු ලබා දීම;

(ඒ) වීසා පත්‍රයක් ලබා ගැනීම හෝ වීසා පත්‍රයක කාලය දීර්ඝ කිරීම සඳහා ඉල්ලුම්කරු විසින් ලබා දිය යුතු විස්තර, තොරතුරු සහ ලේඛන;

(ඔ) යම් තැනැත්තකුට එකී වීසා පත්‍රය නිකුත් කිරීම සඳහා වූ කොන්දේසියක් ලෙස, ඔහු නතර වී සිටින කාලය සඳහා සෞඛ්‍ය රක්ෂණාවරණයක් ලබා දීම සඳහා සහ එකී සෞඛ්‍ය රක්ෂණාවරණය ලබා දිය යුතු ආකාරය; සහ

(ඕ) මේ කොටසේ සඳහන් කරුණු හෝ විෂයයන් සඳහා ආනුෂංගික වූ හෝ සම්බන්ධ වූ හෝ අදාළ වූ සියලු කරුණු.

IV වන කොටස

## ඇතුළු වීම සහ පිට වීම

IV වන කොටස අදාළ වීම

**41.** I වන කොටස යටතේ කරන ලද තත්කාලයේ බලපවත්නා නියමයක් ප්‍රකාර එකී තැනැත්තා මේ කොටසේ විධිවිධාන අදාළ වීමෙන් නිදහස් කර ඇත්නම් මිස, ශ්‍රී ලංකාවට ඇතුළු වීමට අපේක්ෂා කරන හෝ ඇතුළු වන සෑම තැනැත්තකු සඳහා ම මේ කොටසේ විධිවිධාන අදාළ විය යුතු ය.

ඇතුළු වීමේ අයිතිවාසිකම

**42.** (1) ශ්‍රී ලංකාවේ පුරවැසියකු වීසා පත්‍රයක් නොමැතිව ශ්‍රී ලංකාවට ඇතුළු වීම සඳහා හිමිකම් ලැබිය යුතු ය.

(2) යම් තැනැත්තකු ශ්‍රී ලංකාවේ පුරවැසියකු බව ඔප්පු කිරීමේ භාරය එකී තැනැත්තා සතු විය යුතු ය.

ශ්‍රී ලංකාවේ පුරවැසියකු ඇතුළු වීමේ වරායේ දී ස්වකීය ශ්‍රී ලංකාවේ ගමන් ලේඛනය ඉදිරිපත් කිරීමට අපොහොසත් වූ අවස්ථාවක අනුගමනය කළ යුතු කාර්යපටිපාටිය

**43.** (1) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විසින්, ඔහුගේ ශ්‍රී ලංකාවේ පුරවැසිභාවය පිළිබඳ සාක්ෂියක් වශයෙන්, ඇතුළු වීමේ තොටුපළේ දී ඔහුගේ ශ්‍රී ලංකා ගමන් ලේඛනය ආගාමික නිලධරයකුට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) ස්වකීය ශ්‍රී ලංකා ගමන් ලේඛනය ඉදිරිපත් කිරීමට අපොහොසත් වන ශ්‍රී ලංකාවේ පුරවැසියකු එම තැනැත්තාගේ ශ්‍රී ලංකාවේ පුරවැසිභාවය නිශ්චය කිරීම සඳහා පාලක ජනරාල්වරයා විසින් විමර්ශනය කරනු ලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ සිදු කරනු ලබන විමර්ශනයකින් පසු එකී තැනැත්තාගේ ශ්‍රී ලංකාවේ පුරවැසි තත්ත්වය සම්බන්ධයෙන් පාලක ජනරාල්වරයා සෑහීමට පත් වූ අවස්ථාවක,

පාලක ජනරාල්වරයා විසින්, පාලක ජනරාල්වරයා විසින් සුදුසු යයි සලකනු ලබන පරිදි වූ තාවකාලික ගමන් ලේඛනයක් නිකුත් කිරීම මගින් එම තැනැත්තාට ශ්‍රී ලංකාවට ඇතුළු වීම සඳහා අවසර දෙනු ලැබිය හැකි ය.

ශ්‍රී ලංකාවට ඇතුළු වන සහ ශ්‍රී ලංකාවෙන් පිට වන තැනැත්තන් හඳුනා ගැනීම

**44.** ශ්‍රී ලංකාවට ඇතුළු වන හෝ ශ්‍රී ලංකාවෙන් පිට වන සෑම තැනැත්තකු විසින් ම, එකී තැනැත්තා ශ්‍රී ලංකාවේ පුරවැසියකු ද නැද්ද යන්න නිශ්චය කිරීමේ කාර්යය සඳහා යම් ආගාමික නිලධරයකු විසින් ඉල්ලා සිටිනු ලැබිය හැකි තොරතුරු එකී නිලධරයාට ලබා දෙනු ලැබිය යුතු ය.

අනුමත ඇතුළු වීමේ සහ පිට වීමේ වරාය

**45.** (1) ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, අමාත්‍යවරයා විසින්, මේ පනතේ කාර්ය සඳහා ශ්‍රී ලංකාවේ යම් ස්ථානයක් (මෙහි මින් මතු "අනුමත තොටුපළ" යනුවෙන් සඳහන් කරනු ලබන) අනුමත ඇතුළු වීමේ තොටුපළක් හෝ අනුමත පිට වීමේ තොටුපළක් ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින්, අනුමත තොටුපළක් හෝ අනුමත තොටුපළක යම් කොටසක් සාමාන්‍යයෙන් හෝ යම් දිනයක නියමිත කාලසීමාවක් හෝ නියමිත කාලසීමා සඳහා පමණක් හෝ ඇතුළු වීමේ පිරිසැකසුම් කිරීම සඳහා පමණක් වන අනුමත ස්ථානයක් බව (1) වන උපවගන්තිය යටතේ කරනු ලබන නියමයෙහි නිශ්චිතව දක්වනු ලැබිය හැකි ය.

(3) අමාත්‍යවරයා විසින්, අනුමත තොටුපළක් හෝ අනුමත තොටුපළක යම් කොටසක් සාමාන්‍යයෙන් හෝ යම් දිනයක නියමිත කාලසීමාවක් හෝ නියමිත කාලසීමා සඳහා පමණක් හෝ පිට වීම් පිරිසැකසුම් කිරීම සඳහා පමණක් වන අනුමත ස්ථානයක් බව (1) වන උපවගන්තිය යටතේ කරනු ලබන නියමයෙහි නිශ්චිතව දක්වනු ලැබිය හැකි ය.

(4) හදිසි අවස්ථාවක දී, අමාත්‍යවරයා විසින් (1) වන උපවගන්තිය යටතේ කරනු ලබන නියමයක් මගින් -

(අ) ඇතුළු වීම හෝ පිට වීම පිරිසැකසුම් කිරීම සඳහා හෝ සාමාන්‍යයෙන් ඇතුළු වීම සහ පිට වීම පිරිසැකසුම් කිරීම සඳහා; හෝ

(ආ) යම් නිශ්චිත තැනැත්තකු හෝ තැනැත්තන් පන්තියක් සඳහා වන වෙනම ම වූ සහ අනන්‍ය වූ ඇතුළු වීම සහ පිට වීම පිරිසැකසුම් කිරීම සඳහා පමණක්,

අනුමත තොටුපළක් හෝ අනුමත තොටුපළක කොටසක් අනුමත ස්ථානයක් ලෙස නිශ්චිතව දක්වනු ලැබිය හැකි යː

එසේ වුව ද, අමාත්‍යවරයා විසින් ප්‍රායෝගිකව හැකිතාක් ඉක්මනින් සහ නියමය කිරීමෙන් දින හතලිහකට නොඅඩු කාලයක දී එකී නියමය පාර්ලිමේන්තුවේ අනුමතය සඳහා ඉදිරිපත් කිරීම සහ පාර්ලිමේන්තුවේ එකී අනුමතය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කිරීම කරනු ලැබිය යුතු ය. අනුමත කරනු නොලැබූ එවැනි යම් නියෝගයක් ඒ යටතේ ඉහතින් කරන ලද කිසිවක වලංගුභාවයට අගති විරහිතව එකී අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය. නියමය පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනයක් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

(5) (1) වන, (2) වන, (3) වන හෝ (4) වන උපවගන්තියට අගති විරහිතව, (2) වන, (3) වන හෝ (4) වන උපවගන්තියේ සඳහන් තැනැත්තකු හෝ තැනැත්තන් පන්තියක් සඳහා වෙනම ම වූ සහ අනන්‍ය වූ ඇතුළු වීම් හෝ පිට වීම් පිරිසැකසුම් කිරීමක් සිදු කිරීම සඳහා හෝ සාමාන්‍ය පිරිසැකසුම් කිරීමේ වේලාවන්ගෙන් පිටත දී ඇතුළු වීම් හෝ පිට වීම් පිරිසැකසුම් කිරීමක් සිදු කිරීම සඳහා යම් තැනැත්තකු හෝ රැගෙන යන්නකු විසින් ඉල්ලීමක් කරනු ලැබූ අවස්ථාවක, පාලක ජනරාල්වරයා විසින්, නියෝග මගින් අමාත්‍යවරයා විසින්, නියම කරනු ලැබිය හැකි කාල පරාසයන්හි දී සහ මුදල් ප්‍රමාණ හෝ අනුප්‍රමාණ මත පාලක ජනරාල්වරයාට පරිපාලන ගාස්තුවක් ගෙවන ලෙස එකී ඉල්ලීම කරන තැනැත්තාට හෝ රැගෙන යන්නාට නියම කරනු ලැබිය හැකි ය.

(6) (4) වන උපවගන්තියේ සඳහන් තැනැත්තා හෝ රැගෙන යන්නා විසින්-

(අ) (4) වන උපවගන්තියේ සඳහන් තැනැත්තා හෝ තැනැත්තන් පන්තිය සඳහා වෙනම ම වූ සහ අනන්‍ය වූ ඇතුළු වීම් හෝ පිට වීම් පිරිසැකසුම් කිරීමක් සිදු කිරීමේ කාර්යය සඳහා;

(ආ) සාමාන්‍ය පිරිසැකසුම් කිරීමේ වේලාවන්ගෙන් පිටත දී ඇතුළු වීම් හෝ පිට වීම් පිරිසැකසුම් කිරීම සිදු කිරීම සඳහා; හෝ

(ඇ) එකී ස්ථානයේ දී හෝ එහි කොටසක දී ආගමන නිලධරයන් විසින් ආගමන නිෂ්කාශනය කිරීම සඳහා,

පරිපාලන ගාස්තු ගෙවනු ලැබිය යුතු ය.

ඇතුළු වීම අනුමත වරායක දී පමණක් සිදු කළ යුතු බව

**46.** (1) අනුමත තොටුපළක් නොවන යම් ස්ථානයක දී ශ්‍රී ලංකාවට ඇතුළු වන ශ්‍රී ලංකාවේ පුරවැසියකු ඇතුළුව යම් තැනැත්තකු විසින් වරදක් සිදු කරනු ලබන්නේ ය.

(2) (අ) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන හදිසි අවස්ථා තත්ත්වයක් යටතේ දී ශ්‍රී ලංකාවට ඇතුළු වන යම් තැනැත්තකුට අදාළ නොවිය යුතු ය. එකී තැනැත්තා විසින්, ප්‍රායෝගිකව හැකිතාක් ඉක්මනින්, ආගමන නිලධරයකු හෝ පොලිස් නිලධරයකු වෙත වාර්තා කොට ඇතුළු වීම් පිරිසැකසුම් කිරීමට භාජනය වනු ලැබිය යුතු ය.

(ආ) (අ) ඡේදයේ සඳහන් ආගමන නිලධරයා හෝ පොලිස් නිලධරයා විසින්, එකී තැනැත්තාගෙන් ප්‍රකාශයක් වාර්තාගත කරනු ලැබිය යුතු අතර, එකී පැමිණීම පාලක ජනරාල්වරයා වෙත වාර්තා කොට එකී තැනැත්තා මහෙස්ත්‍රාත්වරයකු වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

ශ්‍රී ලංකාවට ඇතුළු වීම තහනම් කිරීමේ හෝ සීමා කිරීමේ බලය

**47.** (1) (අ) අවස්ථාවෝචිත පරිදි, යම් තැනැත්තකු හෝ තැනැත්තන් පන්තියක් ශ්‍රී ලංකාවට ඇතුළු කර ගැනීමේ කාර්යය සඳහා නුසුදුසු තැනැත්තකු හෝ තැනැත්තන් පන්තියක් බවට නිල මූලාශ්‍ර හෝ රාජ්‍යතාන්ත්‍රික මූලාශ්‍ර මගින් අමාත්‍යවරයා වෙත තොරතුරු ලැබී ඇත්තා වූ ද;

(ආ) යම් තැනැත්තකු විසින්, ශ්‍රී ලංකාවේ සාමයට සහ යහපැවැත්මට හානිකර පරිදි ක්‍රියා කිරීමට ඉඩ ඇති බවට ප්‍රමාණවත් යයි අමාත්‍යවරයා විසින් සලකනු ලබන සාක්ෂි අමාත්‍යවරයා වෙත ලැබී ඇත්තා වූ ද; හෝ

(ඇ) බන්ධනාගාරගත කිරීමේ දඬුවමක් පනවා ඇති, යම් වරදක් සඳහා යම් රටක දී යම් තැනැත්තකු වරදකරු කරනු ලැබ ඇත්තා වූ ද, ඒ වරද සඳහා එම තැනැත්තාට සමාවක් ලබා දී නොමැත්තා වූ ද

බවට ප්‍රමාණවත් යයි අමාත්‍යවරයා විසින් සලකනු ලබන සාක්ෂි අමාත්‍යවරයා වෙත ලැබී ඇත්තා වූ ද,

ඒ හා සම්බන්ධ අවස්ථානුගත කරුණු හේතුවෙන් ද, ජාතික ආරක්ෂාවේ, භෞමික අඛණ්ඩතාවයේ, මහජන ආරක්ෂාවේ යහපත සඳහා හෝ අපරාධ හෝ කැළඹිලි වැළැක්වීම සඳහා හෝ සෞඛ්‍යය හෝ සදාචාරය ආරක්ෂා කිරීම සඳහා හෝ ශ්‍රී ලංකාව තුළ පවතින යම් ආර්ථික, කාර්මික, සමාජයීය, අධ්‍යාපනික හෝ වෙනත් තත්ත්වයන් හේතුවෙන් එම තැනැත්තා ශ්‍රී ලංකාවට ඇතුළු කර ගැනීමට නුසුදුසු තැනැත්තකු බවට අමාත්‍යවරයා විසින් සලකනු ලබන්නා වූ අවස්ථාවක, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, අමාත්‍යවරයා විසින් (2) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති යම් පියවරක් ගනු ලැබිය හැකි යː

එසේ වුව ද, (අ), (ආ) සහ (ඇ) ඡේදවල විධිවිධාන ශ්‍රී ලාංකික පුරවැසියකු සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.

(2) අමාත්‍යවරයා විසින්-

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන යම් තැනැත්තකු හෝ තැනැත්තන් පන්තියක් ශ්‍රී ලංකාවට ඇතුළු වීම හෝ නැවත ඇතුළු වීම හෝ ශ්‍රී ලංකාව තුළ රැඳී සිටීම නිශ්චිතව දක්වා ඇති කාලසීමාවකට හෝ ස්ථිරව ම හෝ තහනම් කිරීම;

(ආ) නියමයේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාව ඇතුළත ශ්‍රී ලංකාවට ඇතුළු විය හැකි, නැවත ඇතුළු විය හැකි හෝ ශ්‍රී ලංකාව තුළ රැඳී සිටිය හැකි, ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන යම් පන්තියකට අයත් තැනැත්තන් සංඛ්‍යාව සීමා කිරීම;

(ඇ) ශ්‍රී ලංකාවට ඇතුළු වන හෝ නැවත ඇතුළු වන, ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන යම් තැනැත්තකු හෝ තැනැත්තන් පන්තියක් විසින් ශ්‍රී ලංකාව තුළ රැඳී සිටිනු ලැබිය හැකි කාලසීමාව සීමා කිරීම;

(ඈ) මේ පනතේ විධිවිධානවලට අනුකූලව කටයුතු කිරීම ප්‍රතික්ෂේප කරන හෝ නොසලකා හරින යම් වාහකයකු

විසින් ශ්‍රී ලංකාවට රැගෙන එනු ලබන ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන මගීන් ශ්‍රී ලංකාවට ඇතුළු වීම අවශ්‍ය යම් කාලයකට තහනම් කිරීම; හෝ

(ඉ) මේ කොටස අදාළ වන ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන යම් තැනැත්තකු හෝ තැනැත්තන් පන්තියක් මේ පනතේ කාර්ය සඳහා තහනම් ආගාමිකයකු හෝ තහනම් ආගන්තුකයකු බවට ප්‍රකාශයට පත් කිරීම,

කරනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තිය යටතේ කරනු ලබන නියමයක් ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත යම් තැනැත්තකු සඳහා අදාළ විය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ කරන ලද නියමයක් උල්ලංඝනය කරමින් ශ්‍රී ලංකාවට ඇතුළු වන හෝ නැවත ඇතුළු වන හෝ ශ්‍රී ලංකාව තුළ රැඳී සිටින යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබූ විට, අවුරුදු දෙකකට නොඅඩු වූ ද අවුරුදු හතරකට නොවැඩි වූ ද කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට ද, එමෙන්ම, රුපියල් මිලියනයක් නොඉක්මවන දඩයකට ද යටත් විය යුතු ය.

(5) යම් තැනැත්තකු විසින්, (1) වන උපවගන්තිය යටතේ ඔහුට විරුද්ධව කරන ලද නියමයේ සඳහන් නමට වෙනස් වූ නමක් දරන විදේශ ගමන් බලපත්‍රයක් හෝ ගමන් ලේඛනයක් භාවිත කිරීම මඟින් (4) වන උපවගන්තිය යටතේ වන වරදක් සිදු කරනු ලැබූ අවස්ථාවක, වරදකරු කරනු ලැබූ විට, ඔහු අවුරුදු දෙකකට නොඅඩු වූ ද අවුරුදු පහකට නොවැඩි වූ ද කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට ද, එමෙන්ම, රුපියල් මිලියනයක් නොඉක්මවන දඩයකට ද යටත් විය යුතු ය.

ඇතුළු වීමේ අවස්ථාවේ දී අවශ්‍ය කරනු ලබන ලේඛන

**48.** (1) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන යම් තැනැත්තකු විසින්, ඔහු සන්තකයේ-

(අ) මේ කොටස යටතේ ආගමන නිලධරයකු විසින් ඔහුට ප්‍රදානය කරන ලද ආකෘතියෙන් වූ පිටසනක් දරන වලංගු විදේශ ගමන් බලපත්‍රයක් හෝ ගමන් ලේඛනයක්; සහ

(ආ) මේ පනත මගින් හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් මගින් අවශ්‍ය කරනු ලබන්නේ නම්, මේ පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් යටතේ ඔහුට ප්‍රදානය කරන ලද වීසා පත්‍රයක්,

ඇත්නම් මිස, ශ්‍රී ලංකාවට ඇතුළු වනු නොලැබිය යුතු ය.

(2) මේ වගන්තියේ සහ 43 වන වගන්තියේ විධිවිධාන පාලක ජනරාල්වරයා විසින් පරීක්ෂණයකින් පසු තීරණය කරනු ලැබූ හදිසි අවස්ථා තත්ත්වයන් යටතේ දී තැනැත්තකුට අදාළ නොවිය යුතු ය.

**පිටසන් සම්බන්ධයෙන් වන නියමයන්**

**49.** (1) සෑම ආගමන නිලධරයකු විසින් ම, ඇතුළු වීමේ හෝ පිට වීමේ ස්ථානයේ දී යම් තැනැත්තකුගේ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ ගමන් ලේඛනය මත අතින් හෝ ඉලෙක්ට්‍රොනික ලෙස පිටසනක් තැබීමේ දී නිසි උද්‍යෝගයෙන් ක්‍රියා කරනු ලැබිය යුතු යඃ

එසේ වුව ද, මේ කොටස අදාළ වන ශ්‍රී ලංකාවට ඇතුළු වීමට සහ ශ්‍රී ලංකාව තුළ රැඳී සිටීමට අපේක්ෂා කරන යම් තැනැත්තකු සඳහා ආගමන නිලධරයකු විසින් මේ කොටස යටතේ වලංගු විදේශ ගමන් බලපත්‍රයක් හෝ ගමන් ලේඛනයක් මත තබන ලද පිටසනක් අවශ්‍ය විය යුතු ය.

(2) මේ කොටස යටතේ ආගමන නිලධරයකු විසින්, යම් තැනැත්තකුට ප්‍රදානය කරනු ලබන සෑම පිටසනක් ම-

(අ) එම නිලධරයා විසින් අතින් හෝ ඉලෙක්ට්‍රොනික ලෙස අත්සන් කර තිබිය යුතු ය;

(ආ) නියම කරනු ලැබූ ආකෘතියෙන් විය යුතු ය; සහ

(ඇ) එම තැනැත්තා වීසා පත්‍රයක් දැරීමෙන් නිදහස් කර ඇත්නම්, එම තැනැත්තා විසින් ශ්‍රී ලංකාවට ඇතුළු විය හැකි නියමයන් සහ කොන්දේසි සහ ශ්‍රී ලංකාව තුළ රැඳී සිටිනු ලැබිය හැකි කාලසීමාව එම පිටසනෙහි නිශ්චිතව දක්වා තිබිය යුතු ය.

(3) (අ) පාලක ජනරාල්වරයා විසින්, ඒ තැනැත්තා සම්බන්ධයෙන් රජය විසින් දරනු ලැබිය හැකි වියදම් ආපසු ගෙවීම සඳහා විශේෂ අවස්ථානුගත කරුණුවල දී නියම කරනු ලැබිය හැකි ආකාරයකින්

යම් මුදල් ප්‍රමාණයක් තැන්පත් කිරීම මගින් සුරැකුමක් ලබා දෙන ලෙස ඇතුළු වීමේ ස්ථානයක දී (1) උපවගන්තියට අදාළව ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන තැනැත්තකුට නියම කරනු ලැබිය හැකි ය.

(ආ) එකී සියලු මුදල් ප්‍රමාණ ශ්‍රී ලංකාවේ වාසික වූ ද, පාලක ජනරාල්වරයා විසින් අනුමත කරනු ලැබූ ද, වෙනත් යම් තැනැත්තකු විසින් මේ උපවගන්තියේ (අ) ඡේදයේ සඳහන් තැනැත්තකු වෙනුවෙන් තැන්පත් කරනු ලැබිය හැකි ය.

(ඇ) මේ උපවගන්තිය යටතේ සුරැකුමක් වශයෙන් තැන්පත් කරන ලද සියලු මුදල් ප්‍රමාණ නියම කරනු ලැබූ ආකාරයෙන් බැහැර කරනු ලැබිය යුතු ය.

(ඈ) අමාත්‍යවරයා විසින්, නියෝග මගින්, සුරැකුමක් වශයෙන් තැන්පත් කළ යුතු උපරිම මුදල් ප්‍රමාණය සහ එම සුරැකුම ලබා දිය හැකි ආකාරය නියම කරනු ලැබිය හැකි ය.

ඇතුළු වීමේ පිටසන ඇතැම් තැනැත්තන්ට ප්‍රදානය නොකළ යුතු බව

**50.** (1) නියම කරනු ලැබිය හැකි අවස්ථානුගත කරුණුවල දී මිස, ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන පහත දැක්වෙන යම් තැනැත්තකුට කිසිදු පිටසනක් ප්‍රදානය කරනු නොලැබිය යුතු යː-

(අ) එවැනි යම් පිටසනක් ප්‍රදානය කිරීමට බලය ඇති බලධරයකුගේ මතය අනුව තමා සහ තම යැපෙන්නන් නඩත්තු කිරීමට නොහැකි තැනැත්තකු;

(ආ) තමාට සහ අන්‍යයන්ට අනතුරුදායක සිහිවිකල් වූ තැනැත්තකු;

(ඇ) නියම කරන ලද වෛද්‍ය නිලධරයකු විසින් වෛද්‍ය හේතු මත ශ්‍රී ලංකාවට ඇතුළු කර ගැනීමට නුසුදුසු තැනැත්තකු බවට සහතික කරන ලද තැනැත්තකු;

(ඈ) අන්තරායදායක ඖෂධ, මාදක ඖෂධ හෝ මනෝ වර්තක, ළමා අපචාර, මිනිස් අවහරණය, මිනිසුන් වෙළෙඳාම් කිරීම හෝ ත්‍රස්තවාදය සම්බන්ධයෙන් වන වැරදිවලට ශ්‍රී ලංකාව තුළ දී හෝ ශ්‍රී ලංකාවෙන් පිටත දී වරදකරු කරනු ලැබ ඇති හෝ අපරාධ නඩු පවරනු ලැබ ඇති තැනැත්තකු;

(ඉ) ශ්‍රී ලංකාවෙහි බලපැවැත්වෙනු ලැබූ හෝ බලපවත්නා උද්ර්පණයට අදාළ යම් නීතියක අර්ථානුකූලව උද්ර්පණීය වරදක් සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත දී දඬුවම් පමුණුවනු ලැබ ඇති තැනැත්තකු;

(ඊ) වෛශ්‍යාවක් වන හෝ කුට්ටනකරුවකු වන හෝ වෙනත් වෛශ්‍යාවන් මත තම ජීවිකාව ගෙන යන තැනැත්තකු;

(උ) මහජන යහපත පිණිස අමාත්‍යවරයා විසින්, තත්කාර්යය සඳහා නිකුත් කරනු ලබන විශේෂ හෝ සාමාන්‍ය උපදෙස් මගින් පනවනු ලැබිය හැකි වෙනත් අවශ්‍යතා සපුරාලීමට අපොහොසත් වන තැනැත්තකු;

(ඌ) මේ පනත යටතේ බලපවත්නා රටින් පිට කිරීමේ නියමයකට හෝ රටින් ඉවත් කිරීමේ නියමයකට යටත් වන තැනැත්තකු;

(එ) ගාස්තු නොගෙවා නැවකින් සැඟවී පලායන තැනැත්තකු;

(ඒ) 47 වන වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් නියම කරන ලද නියමයක් මගින් තහනම් ආගාමිකයකු හෝ තහනම් ආගන්තුකයකු ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබූ ඇති තැනැත්තකු; එකී තැනැත්තා තහනම් ආගාමිකයකු හෝ තහනම් ආගන්තුකයකු නොවන බවට ඔප්පු කිරීමේ භාරය ඒ තැනැත්තා සතු විය යුතු ය;

(ඔ) වලංගු විදේශ ගමන් බලපත්‍රයක් හෝ ගමන් ලේඛනයක් නොදරන තැනැත්තකු;

(ඕ) වීසා පත්‍රයක අවශ්‍යතාවයෙන් නිදහස් කර ඇත්නම් මිස, වලංගු වීසා පත්‍රයක් නොදරන තැනැත්තකු;

(ක) යම් රෝගයකට එරෙහිව එන්නත්කරණය කර නොමැති හෝ 56 වන වගන්තිය යටතේ කරන ලද නියමයක් මගින් නිශ්චිතව දක්වා ඇති වෙනත් යම් අවශ්‍යතාවක් සපුරා නොමැති තැනැත්තකු;

(ග) එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආරක්ෂක සභාවේ අදාළ යෝජනා සම්මතයක් මගින් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ඒකාබද්ධ ලැයිස්තුව යටතේ නම් කරන ලද තැනැත්තකු; හෝ

(ඩ) රටින් පිට කරනු ලැබූ මාර්ගස්ථ තැනැත්තකු හෝ වෙනත් රටකින් පිට කරනු ලැබූ මාර්ගස්ථ තැනැත්තකු.

(2) 19 වන වගන්තිය යටතේ ප්‍රදානය කරන ලද විද්‍යුත් සංචරණ අනුමතයක් සම්බන්ධයෙන් වන විට, එකී අනුමතය-

(අ) එම තැනැත්තා විසින් ලබා දෙන ලද අසත්‍ය තොරතුරුවල ප්‍රතිඵලයක් ලෙස;

(ආ) එම තැනැත්තා විසින් වැදගත් කරුණු අනාවරණය කිරීම පැහැර හැරීමේ ප්‍රතිඵලයක් ලෙස; සහ

(ඇ) ශ්‍රී ලංකාවට පැමිණීමේ අරමුණ ආගමන නිෂ්කාශනයෙහි නිශ්චිතව දක්වා ඇති අරමුණෙන් වෙනස් වීම යන හේතුව මත,

ලබා ගෙන ඇති අවස්ථාවක, එකී විද්‍යුත් සංචරණ අනුමතය අවලංගු කරනු ලැබිය යුතු ය.

(3) මේ වගන්තියේ (1) වන උපවගන්තිය උල්ලංඝනය කරමින් ප්‍රදානය කරන ලද යම් පිටසනක් මේ පනතේ කාර්ය සඳහා ශූන්‍ය සහ බලරහිත ලෙස සලකනු ලැබිය යුතු ය.

අනුමත තොටුපළකින් හැර ශ්‍රී ලංකාවෙන් පිටවීම

**51.** (1) යම් තැනත්තකු විසින්, අනුමත පිට වීමේ තොටුපළක් නොවන යම් ස්ථානයකින් ශ්‍රී ලංකාවෙන් පිට වනු නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරනු ලබන තැනැත්තකු වරදක් කරනු ලබන්නේ ය.

ශ්‍රී ලංකාවෙන් පිට වීම සඳහා අවශ්‍ය විදේශ ගමන් බලපත්‍ර සහ පිටසන්

**52.** (1) මේ කොටස අදාළ වන යම් තැනැත්තකු විසින්-

(අ) ඔහු ශ්‍රී ලංකාවේ පුරවැසියකු වේ නම් ද, මේ කොටස යටතේ ආගමන නිලධරයකු විසින් ඔහුට ප්‍රදානය කරන ලද නියම කරනු ලැබූ ආකෘතියෙන් වූ පිටසනක් දරන වලංගු ශ්‍රී ලංකාවේ ගමන් ලේඛනයක් ඔහු සන්තකයේ ඇත්නම් ද; හෝ

(ආ) ඔහු ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවේ නම් ද, මේ කොටස යටතේ ආගමන නිලධරයකු විසින් ඔහුට ප්‍රදානය කරන ලද නියම කරනු ලැබූ ආකෘතියෙන් වූ පිටසනක් දරන වලංගු වීසා පත්‍රයක් හෝ ගමන් ලේඛනයක් ඔහු සන්තකයේ ඇත්නම් ද,

ශ්‍රී ලංකාවෙන් පිට වනු ලැබිය යුතු ය.

(2) ශ්‍රී ලංකාවෙන් පිට වීම සඳහා අවශ්‍යතා සපුරා ඇති බවට සෑහීමට පත් වූ, ආගමන නිලධරයකු විසින්, යම් අනුමත තොටුපළකින් ශ්‍රී ලංකාවෙන් පිට වන සෑම තැනැත්තකුගේ ම වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ ගමන් ලේඛනය මත, නියම කරනු ලැබිය හැකි පරිදි වූ පිටසනක් තබනු ලැබිය යුතු ය.

**53.** නියම කරනු ලැබිය හැකි අවස්ථානුගත කරුණුවල දී මිස-

(අ) යම් තැනැත්තකු විසින් වලංගු විදේශ ගමන් බලපත්‍රයක් හෝ ගමන් ලේඛනයක් දරනු නොලබන්නේ නම්;

(ආ) 148 වන වගන්තිය යටතේ යම් තැනැත්තකුට එරෙහිව අධිකරණයක් විසින් ගමන් තහනමක් නිකුත් කර ඇත්නම්;

(ඇ) යම් තැනැත්තකු ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන්නේ නම් සහ එකී තැනැත්තා යම් රෝගයකට එරෙහිව එන්නත්කරණය කර නොමැති නම් හෝ මේ පනතේ 56 වන වගන්තිය යටතේ වන යම් අවශ්‍යතාවක් එකී තැනැත්තා විසින් සපුරා නොමැති නම්; හෝ

(ඈ) යම් තැනැත්තකු ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන්නේ නම් සහ 1968 අංක 45 දරන එක්සත් ජාතීන්ගේ සංවිධානය පනත යටතේ සාදන ලද නියෝග යටතේ අධිකරණයක් විසින් එකී තැනැත්තාට එරෙහිව ගමන් තහනමක් නිකුත් කර ඇත්නම්,

එකී තැනැත්තාට කිසිදු පිට වීමේ පිටසනක් ප්‍රදානය කරනු නොලැබිය යුතු ය.

ඇතැම් තැනැත්තන්ට පිට වීමේ පිටසන ප්‍රදානය නොකළ යුතු බව

**54.** (1) ආගමන නිලධරයකු විසින්, ඇතුළු වීමේ පිටසනක් ලබා ගැනීමට අපේක්ෂා කරන යම් තැනැත්තකු පරීක්ෂා කර ඇතුළු වීමේ පිටසන ප්‍රදානය කිරීම හෝ ප්‍රදානය කිරීම ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් තීරණයක් ගනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වන පරීක්ෂණයක දී, ආගමන නිලධරයකු විසින්, එකී තැනැත්තා මේ පනතේ විධිවිධාන හෝ ඒ යටතේ සාදනු ලබන යම් නියමයක් හෝ නියෝගයක් ප්‍රකාර ශ්‍රී ලංකාවට ඇතුළු වීමට සුදුස්සකු බවට වගබලා ගනු ලැබිය යුතු ය.

ඇතුළු වීමේ දී ඇතුළු වීමේ පිටසනක් ප්‍රදානය කිරීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට ආගමන නිලධරයකු සතු බලය

(3) ආගමන නිලධරයකු විසින්, ඇතුළු වීමේ පිටසනක් ප්‍රදානය කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබූ අවස්ථාවක, එකී තැනැත්තා විසින් දරනු ලබන යම් වීසා පත්‍රයක් අවලංගු කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර, එකී තැනැත්තා ශ්‍රී ලංකාවට ඇතුළු වීම ප්‍රතික්ෂේප වන්නේ ය.

පිට වීමේ පිටසනක් ප්‍රදානය කිරීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට ආගමන නිලධරයකු සතු බලය

**55.** (1) ආගමන නිලධරයකු විසින්, පිට වීමේ පිටසනක් ලබා ගැනීමට අපේක්ෂා කරන තැනැත්තකු පරීක්ෂා කර පිට වීමේ පිටසනක් ප්‍රදානය කිරීම හෝ ප්‍රදානය කිරීම ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් තීරණයක් ගනු ලැබිය යුතු අතර, අවශ්‍ය නම්, වලංගු විදේශ ගමන් බලපත්‍රයක් හෝ වලංගු ගමන් ලේඛනයක් හෝ වලංගු වීසා පත්‍රයක් හෝ අවශ්‍ය නම්, ආපසු ඒමේ ප්‍රවේශ පත්‍රය ඇතුළු සියලු ලේඛන ආගමන නිලධරයාට ලබා දීම එකී මගියාගේ කාර්ය විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වන පරීක්ෂණයක දී, ආගමන නිලධරයකු විසින්, එකී තැනැත්තා මේ පනතේ විධිවිධාන හෝ ඒ යටතේ සාදනු ලබන යම් නියමයක් හෝ නියෝගයක් ප්‍රකාර ශ්‍රී ලංකාවෙන් පිට වීම සඳහා සුදුස්සකු බවට වගබලා ගනු ලැබිය යුතු ය.

(3) යම් තැනැත්තකු විසින් ඉදිරිපත් කරන ලද ලේඛනවල යම් අක්‍රමිකතාවක් ඇති බවට ආගමන නිලධරයකු විසින් සොයා දැන ගනු ලැබූ අවස්ථාවක, එකී ආගමන නිලධරයා විසින්, පිට වීමේ පිටසනක් ප්‍රදානය කිරීම ප්‍රතික්ෂේප කර, එකී තැනැත්තා ප්‍රධාන ආගමන නිලධරයා වෙත යොමු කරනු ලැබිය යුතු ය.

(4) ශ්‍රී ලංකාවේ පුරවැසියකු යම් රෝගයකට එරෙහිව එන්නත්කරණය කර නොමැති නම් හෝ 56 වන වගන්තිය යටතේ කරන ලද යම් නියමයක නිශ්චිතව දක්වා ඇති වෙනත් යම් අවශ්‍යතාවක් සපුරා නොමැති නම්, එකී තැනැත්තාට කිසිදු පිටසනක් ප්‍රදානය කරනු නොලැබිය යුතු ය.

(5) (3) වන උපවගන්තියට යටත්ව, පාලක ජනරාල්වරයා විසින්, වැඩිදුර විමර්ශන සිදු කර පිට වීමේ පිටසන ප්‍රදානය කිරීම හෝ ප්‍රදානය කිරීම ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් තීරණයක් ගනු ලැබිය හැකි ය.

සෞඛ්‍ය අවදානම හේතුවෙන් තැනැත්තන් ශ්‍රී ලංකාවෙන් පිට වීම, ශ්‍රී ලංකාවට ඇතුළු වීම හෝ ශ්‍රී ලංකාව තුළ රැඳී සිටීම පරිසීමා කිරීම

**56.** (1) සෞඛ්‍ය විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ ඉල්ලීම මත, අමාත්‍යවරයා විසින්, ශ්‍රී ලංකාවට ඇතුළු වන හෝ ශ්‍රී ලංකාවෙන් පිට වන හෝ වීසා පත්‍රයක් නිකුත් කිරීම හෝ දීර්ඝ කිරීම සඳහා ඉල්ලුම් කරන ලද ශ්‍රී ලංකාවේ පුරවැසියන් නොවන තැනැත්තන් විසින්-

(අ) යම් නිශ්චිත රෝගවලට එරෙහිව එන්නත්කරණය කළ යුතු බවට; හෝ

(ආ) සෞඛ්‍ය අවදානම හේතුවෙන් නියම කරන ලද වෙනත් යම් නියමයකට අනුකූලව කටයුතු කළ යුතු බවට,

නියමයක් මගින් ප්‍රකාශ කරනු ලැබිය හැකි ය.

(2) හදිසි අවස්ථාවක දී, සෞඛ්‍ය විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ ඉල්ලීම මත, අමාත්‍යවරයා විසින්, ශ්‍රී ලංකාවට ඇතුළු වන හෝ ශ්‍රී ලංකාවෙන් පිටවන ශ්‍රී ලාංකික පුරවැසියන් සම්බන්ධයෙන්-

(අ) යම් නිශ්චිත රෝගවලට එරෙහිව එන්නත්කරණය කළ යුතු බවට; හෝ

(ආ) සෞඛ්‍ය අවදානම හේතුවෙන් නියම කරන ලද වෙනත් යම් නියමයකට අනුකූලව කටයුතු කළ යුතු බවට,

නියමයක් මගින් ප්‍රකාශ කරනු ලැබිය හැකි යඃ

එසේ වුව ද, අමාත්‍යවරයා විසින්, ප්‍රායෝගිකව හැකිතාක් ඉක්මනින් එහෙත් එකී නියමය කිරීමෙන් දින හතළිහකට පසු නොවන දිනයක් ඇතුළත එකී නියමය පාර්ලිමේන්තුවේ අනුමතය සඳහා ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, පාර්ලිමේන්තුවේ එකී අනුමතය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය. එසේ අනුමත නොකරන ලද යම් නියමයක් ඒ යටතේ කලින් කරන ලද කිසිවක වලංගුභාවයට අගතියක් නොමැතිව එකී අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය. යම් නියමයක් එසේ පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

ඇතැම් අවස්ථානුගත කරුණුවල දී ඇතුළු වීමේ පිටසනක් ශූන්‍ය බව

**57.** යම් තැනැත්තකු සම්බන්ධයෙන් මේ පනත යටතේ රටින් පිට කිරීමේ නියමයක් හෝ රටින් ඉවත් කිරීමේ නියමයක් කර ඇති අවස්ථාවක, ඒ තැනැත්තාට ප්‍රදානය කරන ලද යම් පිටසනක් හෝ නිකුත් කරන ලද යම් වීසා පත්‍රයක් මේ පනතේ කාර්ය සඳහා ශූන්‍ය සහ බලරහිත ලෙස සලකනු ලැබිය යුතු ය.

ලිපි ඉලෙක්ට්‍රොනික උපකරණ පරීක්ෂා කිරීම

**58.** (1) මේ කොටස අදාළ වන යම් තැනැත්තකු විසින්,-

(අ) ආගමන නිලධරයකු විසින්, ඉල්ලා සිටිනු ලැබූ අවස්ථාවක, ශ්‍රී ලංකාවට ඇතුළු වන හෝ ශ්‍රී ලංකාවෙන් පිට වන අවස්ථාවේ දී, ඔහු යම් ලිඛිත ලියවිල්ලක් හෝ යම් ඉලෙක්ට්‍රොනික උපකරණයක් රැගෙන යන්නේ ද යන්න සම්බන්ධයෙන් වූ ප්‍රකාශයක් ලබා දීම; සහ

(ආ) ආගමන නිලධරයකු විසින්, ඉල්ලා සිටිනු ලැබූ අවස්ථාවක, එකී ලිඛිත ලියවිල්ල හෝ ඉලෙක්ට්‍රොනික උපකරණය ඒ නිලධරයා විසින් පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කිරීම,

කරනු ලැබිය යුතු ය.

(2) ආගමන නිලධරයකු විසින්-

(අ) යම් ලිඛිත ලියවිල්ලක් හෝ ඉලෙක්ට්‍රොනික උපකරණයක් සඳහා එවැනි යම් තැනැත්තකු හෝ ඔහුට අයත් නැතහොත් ඔහුගේ පාලනයේ ඇති යම් ගමන් මල්ලක් සෝදිසි කිරීම;

(ආ) මේ වගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලැබූ හෝ සොයා ගනු ලැබූ යම් ලිඛිත ලියවිල්ලක් හෝ ඉලෙක්ට්‍රොනික උපකරණයක් පරීක්ෂා කිරීම; හෝ

(ඇ) ආගමන නිලධරයා විසින් යම් ලිඛිත ලියවිල්ලක් හෝ ඉලෙක්ට්‍රොනික උපකරණයක් සෝදිසි කිරීම හෝ පරීක්ෂා කිරීම අවසන් කරනු ලබන තෙක් එකී තැනැත්තා රඳවා තබා ගැනීම,

කරනු ලැබිය හැකි ය.

(3) මේ වගන්තියේ කාර්ය සඳහා "ලිඛිත ලියවිල්ල" යන්නට, යම් ලිපියක්, ලිඛිත පණිවිඩයක්, සංදේශයක්, සැලැස්මක්, ඡායාරූපයක් හෝ යම් රූපමය නිරූපණයක් ඇතුළත් වන්නේ ය.

**ශ්‍රී ලංකාවට ඇතුළු වන අවස්ථාව**

**59.** යම් ගුවන් යානයකින් හෝ යාත්‍රාවකින් ශ්‍රී ලංකාවේ යම් අනුමත තොටුපළකට පැමිණෙන යම් තැනැත්තකුට ශ්‍රී ලංකාවට ඇතුළු වීම සඳහා ආගමන නිලධරයකු විසින් පිටසතනක් නිකුත් කරනු ලැබූ විට දී පමණක් මේ පනතේ කාර්ය සඳහා ඒ තැනැත්තා ශ්‍රී ලංකාවට ඇතුළු වනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

**විශේෂ අවස්ථානුගත කරුණුවල දී ඇතුළු වීම සඳහා අවසර දීමේ බලය**

**60.** (1) වෛද්‍යමය හදිසි අවස්ථා තත්ත්වයක් හෝ වෙනත් යම් හදිසි අවස්ථා තත්ත්වයක් ඇති බවට ආගමන නිලධරයකු සෑහීමට පත් වූ අවස්ථාවක, එකී ආගමන නිලධරයා විසින්, මේ පනතේ විධිවිධාන යටතේ යම් තැනැත්තකුට ශ්‍රී ලංකාවට ඇතුළු වීම තහනම් කර තිබුණ ද එකී හදිසි අවස්ථා තත්ත්වය සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා අවශ්‍ය කාලසීමාවකට ශ්‍රී ලංකාවට ඇතුළු වීමට එකී තැනැත්තාට අවසර දෙනු ලැබිය හැකි යඃ

එසේ වුව ද, එකී ඇතුළු වීම සඳහා වූ හේතු අවසන් වූ විට, වහාම එකී තැනැත්තා ශ්‍රී ලංකාවෙන් ඉවත් කරනු ලැබිය යුතු අතර, වෛද්‍ය සහ ආරක්ෂක වියදම් ඇතුළුව එකී තැනැත්තාගේ ඇතුළු වීමට, රැඳී සිටීමට සහ ඉවත් කිරීමට අදාළ සියලු වියදම් එකී තැනැත්තා ශ්‍රී ලංකාවට ප්‍රවාහනය කරනු ලැබූ යාත්‍රාව විසින් දරනු ලැබිය යුතු ය.

(2) වෛද්‍යමය හදිසි අවස්ථා තත්ත්වයක් ඇති බවට ප්‍රකාශ කරනු ලබන තැනැත්තකුගේ එකී ප්‍රකාශය සම්බන්ධයෙන් සැකයක් ඇති අවස්ථාවක, ආගමන නිලධරයකු විසින්, එකී තැනැත්තා නියම කරනු ලැබූ වෛද්‍ය නිලධරයකු විසින්, සිදු කරනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබිය යුතු ය.

**නියෝග**

**61.** (1) මේ කොටසේ හෝ V වන කොටසේ කාර්ය සඳහා පහත දැක්වෙන කාරණා සියල්ල හෝ ඉන් කිසිවක් සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි යඃ-

(අ) මේ කොටසින් හෝ V වන කොටසින්, නියම කරනු ලැබිය යුතු යයි නියමිත යම් කාරණයක්;

(ආ) මේ කොටස හෝ V වන කොටස යටතේ පිටසත් ප්‍රදානය කිරීම, එම පිටසත්වල ආකෘතිය, අමාත්‍යවරයා විසින් මහජන යහපත සඳහා අවශ්‍ය යයි සලකනු ලැබිය හැකි

නියම සහ කොන්දේසි ඇතුළුව පිටසනක් ප්‍රදානය කරනු ලැබිය හැක්කේ යම් නියම සහ කොන්දේසිවලට යටත්ව ද, එම නියම සහ කොන්දේසි, පාලක ජනරාල්වරයාගේ පූර්ණ අභිමතය පරිදි හෝ නිශ්චිතව දක්වා ඇති අවස්ථානුගත කරුණුවල දී එකී පිටසන් හෝ එහි නිශ්චිතව දක්වා ඇති නියම හෝ කොන්දේසි අවලංගු කිරීම, වෙනස් කිරීම හෝ සංශෝධනය කිරීම සහ එකී පිටසනෙහි ඇතුළත් කළ යුතු විස්තර;

(ඈ) 47 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, යම් තැනැත්තන් පන්තියකට හෝ විස්තරයකට අයත් යම් තැනැත්තකු සන්තකයේ වීසා පත්‍රයක් ඇත්නම් මිස, ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන එවැනි යම් තැනැත්තකු ශ්‍රී ලංකාවට ඇතුළු වීම තහනම් කිරීම;

(ඇ) එකී තැනැත්තන් බඳවා ගැනීම, එම බඳවා ගැනීම් පාලනය වන අදාළ යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනුකූලව සිදු කොට ඇත්තේ නම් මිස, ශ්‍රී ලංකාවෙන් පිටත නුපුහුණු ශ්‍රමිකයන් ලෙස රැකියා සඳහා බඳවා ගත් තැනැත්තන් ශ්‍රී ලංකාවෙන් පිට වීම තහනම් කිරීම;

(ඉ) මේ කොටස හෝ V වන කොටස යටතේ තැනැත්තන් විසින් ඉදිරිපත් කළ යුතු වාර්තා සහ ලබා දිය යුතු තොරතුරු;

(ඊ) යම් විධාරක මධ්‍යස්ථානයක් හෝ විධාරක පහසුකමක් පවත්වාගෙන යනු ලැබිය යුතු තත්ත්වයන් සහ එම මධ්‍යස්ථාන පරිපාලනය කරන ආකාරය;

(උ) යම් තොටුපළකට පැමිණෙන අවස්ථාවක දී, තැනැත්තන් වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කිරීම සඳහා වන කාර්යපටිපාටිය;

(ඌ) ගොඩවීමේ සහ ගොඩබැසීමේ ප්‍රවේශ පත්‍රවල ඇතුළත් විය යුතු තොරතුරු; සහ

(එ) මේ වගන්තියේ සඳහන් කාරණාවලට හෝ විෂයයන්ට ආනුෂංගික හෝ සම්බන්ධ සියලු කාරණා.

(2) මේ වගන්තියේ කාර්ය සඳහා, "විදේශීය රාජ්‍ය" යන්නට, ශ්‍රී ලංකාවේ දේශසීමාවෙන් පිටත යම් රටක්, ජනපදයක්, පළාතක් හෝ ජනතාවක් සඳහා හෝ විෂයයෙහි රජයක බලතල ක්‍රියාත්මක කරන හෝ ක්‍රියාත්මක කිරීමට භාර ගත් යම් තැනැත්තකු හෝ තැනැත්තන් ඇතුළත් වන්නේ ය.

V වන කොටස

**ශ්‍රී ලංකාවට පැමිණීමේ දී සහ ශ්‍රී ලංකාවෙන් පිට වීමේ දී කාර්යපටිපාටිය**

මේ කොටස අදාළ වීම

**62.** I වන කොටස යටතේ කරන ලද තත්කාලයෙහි බලපවත්නා යම් නියමයක් ප්‍රකාර මේ කොටසේ විධිවිධානවලින් නිදහස් කර ඇත්නම් මිස, මේ කොටසේ විධිවිධාන ශ්‍රී ලංකාවට ඇතුළු වීමට අපේක්ෂා කරන හෝ ඇතුළු වන සෑම තැනැත්තකු සඳහා ම අදාළ විය යුතු ය.

ආගමන සංඥාව

**63.** (1) ශ්‍රී ලංකාවට පැමිණෙන හෝ ශ්‍රී ලංකාවෙන් පිට වීමට ආසන්නව සිටින සෑම නෞකාවක ම නෞකාධිපතිවරයා විසින්, නියමිත ආගමන සංඥාව ඔසවනු ලැබිය යුතු අතර, ආගමන නිලධරයකු විසින් පහළට ඇදීම සඳහා අවසර දෙනු ලබන තෙක් ඒ සංඥාව ප්‍රදර්ශනය කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන කඩ කරනු ලබන නෞකාවක නෞකාධිපතිවරයකු විසින් වරදක් කරනු ලබන්නේ ය.

ගුවන් යානයක් ශ්‍රී ලංකාවට පැමිණීම හෝ ශ්‍රී ලංකාවෙන් පිට වීම

**64.** (1) ශ්‍රී ලංකාවට පැමිණෙන හෝ ශ්‍රී ලංකාවෙන් පිට වන සෑම ගුවන් යානයක ම කපිතාන්වරයා විසින්, ස්වකීය ගුවන් යානය අනුමත ගුවන් තොටුපළක දී ගොඩ බස්වනු ලැබිය යුතු ය; නැතහොත් අනුමත ගුවන් තොටුපළකින් ගුවන්ගත කරනු ලැබිය යුතු ය.

(2) සාධාරණ හේතුවක් නොමැතිව (1) වන උපවගන්තිය උල්ලංඝනය කරන ගුවන් යානයක කපිතාන්වරයකු වරදක් සිදු කරනු ලබන්නේ ය.

ආගමන සහ විගමන ප්‍රදේශය හෝ කලාපය

**65.** (1) අමාත්‍යවරයා විසින්, අදාළ හිමිකරු හෝ භුක්තිකරු ලෙස 45 වන වගන්තිය යටතේ ප්‍රකාශයට පත් කරන ලද අනුමත තොටුපොළක හිමිකරුට හෝ භුක්තිකරුට පහත දැක්වෙන දෑ කරන ලෙස නියම කරමින් ලිඛිත දැන්වීමක් නිකුත් කරනු ලැබිය හැකි ය:-

(අ) යම් ප්‍රදේශයක් අමාත්‍යවරයා විසින් විධාන කරනු ලබන පරිදි ආගමන ප්‍රදේශයක් හෝ කලාපයක් ලෙස නම් කිරීම;

(ආ) ස්වකීය රාජකාරිය කිරීම සඳහා ආගමන ප්‍රදේශය හෝ කලාපය ඇතුළත හෝ එහි පරිමාපකයෙහි රැඳී සිටිය යුතු ආගමන නිලධරයන්ට පහසුකම් සැපයීම ඇතුළුව ආගමන ප්‍රදේශයේ හෝ කලාපයේ නිසි ආරක්ෂිත සහ කාර්යක්ෂම ක්‍රියාකාරිත්වය සඳහා අවශ්‍ය යයි අමාත්‍යවරයා විසින් සලකනු ලබන පහසුකම් සහ සම්පත් අදාළ හිමිකරුගේ හෝ භුක්තිකරුගේ වියදමින් ආගමන ප්‍රදේශයේ දී හෝ කලාපයේ දී සැපයීම හෝ පවත්වාගෙන යාම; සහ

(ඇ) ආගමන ප්‍රදේශය හෝ කලාපය ඇතුළත ආගමන කාර්යාල සහ පහසුකම් පිහිටුවීමට අවසර දීම.

(2) අමාත්‍යවරයා විසින්—-

(අ) මේ පනතේ විධිවිධානවලට හෝ ඒ යටතේ සාදනු ලබන නියෝගවලට අනුකූලව කටයුතු කිරීම සහතික කිරීම සඳහා; හෝ

(ආ) ආගමන සහ විගමන ප්‍රදේශයේ හෝ කලාපයේ නිසි ආරක්ෂිත සහ කාර්යක්ෂම ක්‍රියාකාරිත්වය සඳහා,

අවශ්‍ය විය හැකි ලිඛිත විධාන අදාළ හිමිකරුට හෝ භුක්තිකරුට නිකුත් කරනු ලැබිය හැකි ය.

(3) අදාළ හිමිකරු හෝ භුක්තිකරු විසින්, (1) වන සහ (2) වන උපවගන්ති යටතේ ඔහු වෙත නිකුත් කරන ලද ලිඛිත දැන්වීමකට හෝ විධානයකට අනුකූලව කටයුතු කරනු ලැබිය යුතු ය.

(4) (3) වන උපවගන්තියට අනුකූලව කටයුතු කිරීම පැහැර හරිනු ලබන යම් අදාළ හිමිකරුවකු හෝ භුක්තිකරුවකු වරදක් සිදු කරනු ලබන අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් ලක්ෂ පහකට නොඅඩු වූ ද රුපියල් මිලියනයකට නොවැඩි වූ ද දඩයකට ද, දිගට ම කරගෙන යන වරදක් සම්බන්ධයෙන් වන විට, වරදකරු කරනු ලැබීමෙන් පසු වරද දිගට ම කරගෙන යනු ලබන්නා වූ එක් එක් දිනයක් හෝ ඉන් කොටසක් සඳහා රුපියල් ලක්ෂයක් නොඉක්මවන වැඩිදුරටත් වූ දඩයකට ද යටත් විය යුතු ය.

(5) (4) වන උපවගන්තිය යටතේ වන වරදක් අවස්ථාවෝචිත පරිදි, සංස්ථාපිත මණ්ඩලයක් හෝ ව්‍යාපාර ආයතනයක් විසින් සිදු කරනු ලැබූ අවස්ථාවක, එකී වරද ඔහුගේ දැනීමෙන් හෝ අනුදැකීමෙන් තොරව සිදු කරනු ලැබූ බව හෝ ඔහුගේ කර්තව්‍යවල සහ සිද්ධියේ අවස්ථානුගත කරුණු සියල්ලේ ස්වභාවය සැලකිල්ලට ගනිමින් ඔහු විසින් කටයුතු කළ යුතුව තිබූ පරිදිම ඒ වරද සිදු කිරීම වැළැක්වීම සඳහා ඔහු විසින් නිසි උද්‍යෝගයෙන් කටයුතු කරනු ලැබූ බව එම තැනැත්තා විසින් ඔප්පු කරනු ලබන්නේ නම් මිස, එම වරද සිදු කරනු ලැබූ අවස්ථාවේ දී, එම සංස්ථාපිත මණ්ඩලයේ හෝ ව්‍යාපාර ආයතනයේ අධ්‍යක්ෂවරයකු, කළමනාකරුවකු, හවුල්කරුවකු හෝ වෙනත් සමාන නිලධරයකු වූ යම් තැනැත්තකු ඒ වරදට වරදකරු ලෙස සලකනු ලැබිය යුතු ය.

(6) යම් පරිශ්‍රයක් හෝ ස්ථානයක් සම්බන්ධයෙන් වන විට, මේ වගන්තියේ "හිමිකරු" යන්නෙන්, එකී පරිශ්‍රය හෝ ස්ථානය විෂයයෙහි යම් බූදලයක් හෝ අයිතියක් ඇත්තා වූ ද, වෙනත් යම් තැනැත්තකු විසින් එකී පරිශ්‍රයට හෝ ස්ථානයට ඇතුළු වීම සඳහා ස්වකීය අවසරය ලබා ගැනීමට අවශ්‍ය වූ ද, යම් තැනැත්තකු අදහස් වේ.

ආගමන ප්‍රදේශයට හෝ කලාපයට ඇතුළු වන මගීන් විසින් අනුගමනය කළ යුතු උපචාරයන්

**66.** (1) පැමිණෙන සියලු ම මගීන් විසින්, ආගමන ප්‍රදේශයට හෝ කලාපයට ඇතුළු වූ පසු නොපමාව ආගමන නිලධරයකු ඉදිරියෙහි පෙනී සිටිනු ලැබිය යුතු ය.

(2) ආගමන ප්‍රදේශයේ හෝ කලාපයේ සිටින සියලු තැනැත්තන් විසින්, ආගමන නිලධරයන්ගේ විධානවලට අනුකූලව කටයුතු කරනු ලැබිය යුතු ය.

ඇතුළු වීමේ අවසරයක් සඳහා ඉල්ලුම් කරන තැනැත්තකු විසින් හඳුනා ගැනීමේ තොරතුරු ලබා ගැනීමට ඉඩදිය යුතු බව

**67.** (1) ඇතුළු වීමේ අවසරයක් සඳහා ඉල්ලුම් කරන තැනැත්තකු විසින්, ඔහුගෙන් හඳුනා ගැනීමේ තොරතුරු ලබා ගැනීමට ඉඩ දෙනු ලැබිය යුතු ය.

(2) පාලක ජනරාල්වරයා හෝ ආගමන නිලධරයකු විසින්, (1) වන උපවගන්තිය යටතේ ලබා ගත් හඳුනා ගැනීමේ තොරතුරු විශ්ලේෂණය කර එකී තැනැත්තාට ශ්‍රී ලංකාවට ඇතුළු වීම සඳහා අවසර දෙනු ලබන්නේ ද නොලබන්නේ ද යන්න තීරණය කරනු ලැබිය හැකි ය.

(3) එකී තැනැත්තා විසින් හඳුනා ගැනීමේ තොරතුරු ලබා ගැනීමට ඉඩ දීම පැහැර හරිනු ලබන්නේ නම්, පාලක ජනරාල්වරයා හෝ ආගමන නිලධරයකු විසින්, එකී තැනැත්තාට ඇතුළු වීමේ අවසරය ප්‍රදානය කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය.

(4) මේ පනත යටතේ සාදනු ලබන නියෝගවලට අනුකූලව හඳුනා ගැනීමේ තොරතුරු ලබා දීමෙන් එකී තැනැත්තා නිදහස් කර ඇත්නම්, (1) වන උපවගන්තියේ නියමය අදාළ නොවිය යුතු ය.

(5) මේ වගන්තිය යටතේ හඳුනා ගැනීමේ තොරතුරු ලබා ගැනීමේ ක්‍රියාවලිය අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබූ පරිදි විය යුතු ය.

ශ්‍රී ලංකාවේ පුරවැසියකු ඇතුළුව ශ්‍රී ලංකාවෙන් පිට වන තැනැත්තකු විසින් හඳුනා ගැනීමේ කාර්යය සඳහා හඳුනා ගැනීමේ තොරතුරු ලබා ගැනීමට ඉඩදිය යුතු බව

**68.** (1) ශ්‍රී ලංකාවේ පුරවැසියකු ඇතුළුව ශ්‍රී ලංකාවෙන් පිට වන තැනැත්තකු විසින්, හඳුනා ගැනීමේ කාර්යය සඳහා ඔහුගෙන් හඳුනා ගැනීමේ තොරතුරු ලබා ගැනීමට ඉඩ දෙනු ලැබිය යුතු ය.

(2) පාලක ජනරාල්වරයා හෝ ආගමන නිලධරයකු විසින්, (1) වන උපවගන්තිය යටතේ ලබා ගත් හඳුනා ගැනීමේ තොරතුරු විශ්ලේෂණය කර එකී තැනැත්තාට ශ්‍රී ලංකාවෙන් පිට වීම සඳහා අවසර දෙනු ලබන්නේ ද නොලබන්නේ ද යන්න තීරණය කරනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තියේ සඳහන් තැනැත්තා, මේ පනත යටතේ සාදනු ලබන නියෝගවලට අනුකූලව හඳුනා ගැනීමේ තොරතුරු ලබා දීමෙන් නිදහස් කර ඇත්නම්, (1) වන උපවගන්තියේ නියමය අදාළ නොවිය යුතු ය.

(4) (1) වන උපවගන්තියේ සඳහන් තැනැත්තා විසින් හඳුනා ගැනීමේ තොරතුරු ලබා ගැනීමට ඉඩ දීම පැහැර හරිනු ලැබුවහොත්, පාලක ජනරාල්වරයා හෝ ආගමන නිලධරයකු විසින්, එකී තැනැත්තාට පිට වීමේ අවසරයක් ප්‍රදානය කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය.

(5) මේ වගන්තිය යටතේ හඳුනා ගැනීමේ තොරතුරු ලබා ගැනීමේ ක්‍රියාවලිය අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබූ පරිදි විය යුතු ය.

**69.** (1) ශ්‍රී ලංකාවට පැමිණීමට හෝ ශ්‍රී ලංකාවෙන් පිට වීමට නියමිත සෑම යාත්‍රාවක ම නෞකාධිපතිවරයා, කපිතාන්වරයා, අයිතිකරු, නියෝජිතයා හෝ කුලියට දෙන්නා විසින්, පාලක ජනරාල්වරයා විසින් සාධාරණ පූර්ව ලිඛිත දැන්වීමක් ලබා දීමෙන් පසු, එකී යාත්‍රාව ශ්‍රී ලංකාවේ අනුමත මුහුදු තොටුපළකට හෝ ගුවන් තොටුපළකට පැමිණෙන හෝ ඉන් පිට වන අවස්ථාවේ දී, එම යාත්‍රාවේ ගමන් කරනු ලබන හෝ ගමන් කරනු ලැබිය හැකි සේවක පිරිස සහ මගීන් සම්බන්ධයෙන් පහත දැක්වෙන තොරතුරුවලින් එක් තොරතුරක් හෝ එම තොරතුරු දෙක ම නියම කරනු ලැබිය හැකි ආකෘතියෙන් සහ ආකාරයෙන් පාලක ජනරාල්වරයාට ලබා දෙනු ලැබිය යුතු යː-

ශ්‍රී ලංකාවට පැමිණීමට හෝ ශ්‍රී ලංකාවෙන් පිට වීමට නියමිත යාත්‍රාවල මගීන් සහ සේවක පිරිස පිළිබඳ තොරතුරු ලබා දීම

(අ) ප්‍රගමන මගී තොරතුරු හෝ අන්තර් ක්‍රියාකාරි ප්‍රගමන මගී තොරතුරු; හෝ

(ආ) මගී නම් වාර්තා පිළිබඳ තොරතුරු.

(2) පාලක ජනරාල්වරයා විසින්, ඕනෑම විටෙක දී, (1) වන උපවගන්තිය යටතේ යාත්‍රාවක නෞකාධිපතිවරයකු, කපිතාන්වරයකු, අයිතිකරුවකු, නියෝජිතයකු හෝ කුලියට දෙන්නකු වෙත ලබා දෙන ලද දැන්වීම ඔහු වෙත ලබා දෙන ලියවිල්ලක් මගින් අහෝසි කරනු ලැබිය හැකි ය.

(3) යාත්‍රාවක් විසින් දත්ත ලබා දීම පැහැර හැර ඇති හෝ ව්‍යාජ දත්ත ලබා දී ඇති අවස්ථාවක, වෙනත් රටක සිට ශ්‍රී ලංකාව වෙත සහ ශ්‍රී ලංකාවේ සිට වෙනත් රටක් වෙත කරනු ලබන එක් ගමන් වාරයක් සඳහා රුපියල් ලක්ෂ හයකට නොඅඩු වූ ද රුපියල් මිලියනයකට නොවැඩි වූ ද දඩයක් ගෙවීමට යාත්‍රාව යටත් විය යුතු ය.

(4) (3) වන උපවගන්තිය මගින්, පාලක ජනරාල්වරයා විසින් (1) වන උපවගන්තියේ විධිවිධානවලින් ජනිත වන බැඳීම් ඉතා බරපතළ ලෙස උල්ලංඝනය කරන යාත්‍රා භාරයට ගැනීම හෝ රඳවා ගැනීම සඳහා ප්‍රවාහන මාධ්‍යය නිශ්චලීකරණය, තහනමට ගැනීම සහ රජය සතු කිරීම වැනි වෙනත් දඬුවම් උපයෙදවීම හෝ පවත්වාගෙන යාම හෝ මෙහෙයුම් බලපත්‍රය තාවකාලික වශයෙන් අත්හිටුවන හෝ අස්කර ගන්නා ලෙස අදාළ බලධරයන්ට නිර්දේශ කිරීම වළක්වනු නොලැබිය යුතු ය.

(5) දඩ පැනවීමේ අරමුණ ඇතිව නඩු පවරනු ලබන්නේ යම් යාත්‍රාවකට විරුද්ධව ද, එම යාත්‍රාවට විත්තිවාචක ඉදිරිපත් කිරීමේ සහ අභියාචනය කිරීමේ බලාත්මක අයිතිවාසිකම් තිබිය යුතු ය.

ප්‍රගමන මගී තොරතුරු, අන්තර් ක්‍රියාකාරී ප්‍රගමන මගී තොරතුරු සහ මගී නම් වාර්තා පිළිබඳ තොරතුරු

**70.** (1) පාලක ජනරාල්වරයා විසින්, 171 වන වගන්තියේ (2) වන උපවගන්තියේ කාර්ය සඳහා, දත්ත ආරක්ෂණයට අදාළ ලිඛිත නීතිවලට අනුකූලව ප්‍රගමන මගී තොරතුරු පද්ධතියක්, අන්තර් ක්‍රියාකාරී ප්‍රගමන මගී තොරතුරු පද්ධතියක් සහ මගී නම් වාර්තා පිළිබඳ තොරතුරු පද්ධතියක් පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

(2) අමාත්‍යවරයා විසින්, නියෝග මගින් දත්ත ආරක්ෂණයට අදාළ වන වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනුකූලව-

(අ) ප්‍රගමන මගී තොරතුරුවලට, අන්තර් ක්‍රියාකාරී ප්‍රගමන මගී තොරතුරුවලට සහ මගී නම් වාර්තා පිළිබඳ තොරතුරුවලට ඇතුළත් විය යුතු දත්ත වර්ග; සහ

(ආ) පාලක ජනරාල්වරයා විසින් ප්‍රගමන මගී තොරතුරු, අන්තර් ක්‍රියාකාරී ප්‍රගමන මගී තොරතුරු සහ මගී නම් වාර්තා පිළිබඳ තොරතුරු රඳවා තබා ගත හැකි කාලසීමාව,

නියම කරනු ලැබිය යුතු ය.

පැමිණි විට පරීක්ෂා කිරීම සහ වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කිරීම

**71.** (1) (අ) IV වන කොටස සහ මේ කොටස අදාළ වන තැනැත්තකු විසින් ශ්‍රී ලංකාවට ඇතුළු වීම සඳහා යම් අනුමත තොටුපළකට ගොඩ බැසීමට අදහස් කරනු ලබන අවස්ථාවක, ඔහු ආගමන නිලධරයකු විසින් පරීක්ෂා කරනු ලැබිය හැකි ය; නැතහොත් නියමිත වෛද්‍ය නිලධරයකු විසින් වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබිය හැකි ය.

(ආ) (අ) ඡේදයේ සඳහන් සෑම පරීක්ෂණයක් ම එකී තැනැත්තා අනුමත තොටුපළකට පැමිණෙන අවස්ථාවේ දී හෝ හැකිතාක් ඉක්මනින් හෝ ඉන්පසු හෝ සිදු කරනු ලැබිය යුතු ය.

(ඇ) (ආ) ඡේදය යටතේ සිදු කරනු ලබන යම් පරීක්ෂණයක කාර්යය සඳහා, යම් තැනැත්තකුට යාත්‍රාවෙන් බැස යම් නිශ්චිතව දක්වා ඇති ස්ථානයක දී තමා ඉදිරියෙහි පෙනී සිටින ලෙස ආගමන නිලධරයකු හෝ නියමිත වෛද්‍ය නිලධරයකු විසින් නියම කරනු ලැබිය හැකි ය.

(ඇ) (අ) ඡේදයේ සඳහන් පරිදි ආගමන නිලධරයකුගේ හෝ නියමිත වෛද්‍ය නිලධරයකුගේ යම් විධානයකට අනුකූලව කටයුතු කිරීමේ කාර්යය සඳහා යාත්‍රාවෙන් බැස ශ්‍රී ලංකාවේ නිශ්චිතව දක්වා ඇති ස්ථානයකට ඇතුළු වන තැනැත්තකු එකී ඇතුළු වීම හේතුවෙන් ම පමණක් මේ පනතේ විධිවිධාන යටතේ යම් වරදක් සිදු කර ඇති ලෙස සලකනු නොලැබිය යුතු ය.

(2) ශ්‍රී ලංකාවේ යම් ස්ථානයකට පැමිණෙන යම් ගුවන් යානයක කපිතාන්වරයා හෝ එවැනි යම් යාත්‍රාවක නෞකාධිපතිවරයා විසින්, IV වන කොටස හෝ මේ කොටස අදාළ වන යම් තැනැත්තකු මේ වගන්තිය යටතේ පරීක්ෂා කරනු ලබන තෙක් හෝ පරීක්ෂා කිරීම සඳහා ගොඩ බසින තෙක් හෝ එකී තැනැත්තා එකී ගුවන් යානය හෝ යාත්‍රාව තුළ රඳවා තබා ගනු ලැබිය යුතු ය.

**අනුමත මුහුදු තොටුපළකට පැමිණෙන තැනැත්තන් පරීක්ෂා කිරීම සඳහා වන කාර්යපටිපාටිය**

**72.** (1) අනුමත මුහුද තොටුපළකින් ශ්‍රී ලංකාවට පැමිණෙන සෑම තැනැත්තකු විසින් ම, ඔහු ශ්‍රී ලංකාවට ඇතුළු වීමට අදහස් කරනු ලබන්නේ වුව ද නොවූව ද, ආගමන නිලධරයකු විසින් විධාන කරනු ලැබිය හැකි යම් වේලාවක දී සහ ස්ථානයක දී පරීක්ෂා කිරීම සඳහා එකී නිලධරයා ඉදිරියෙහි පෙනී සිටිනු ලැබිය යුතු ය.

(2) ආගමන නිලධරයා විසින්, ඔහු විසින් අවශ්‍ය යයි සලකනු ලැබිය හැකි යම් පරීක්ෂණයකින් පසු, ශ්‍රී ලංකාවට ඇතුළු වීමට අදහස් කරන්නා වූ ද, මේ පනතේ විධිවිධාන යටතේ හෝ ඒ යටතේ සාදනු ලබන යම් නියෝගයක් හෝ නියමයක් යටතේ හෝ ශ්‍රී ලංකාවට ඇතුළු වීම තහනම් කර ඇති බවට ඔහු විසින් සලකනු ලබන්නා වූ ද, යම් තැනැත්තකුට ඔහුගේ තීරණය දන්වනු ලැබිය යුතු අතර, එකී තැනැත්තා තවමත් යාත්‍රාවේ නෞකාස්ථව සිටින්නේ නම්, ඔහු විසින් ශ්‍රී ලංකාවේ දී යාත්‍රාවෙන් බසිනු නොලැබිය යුතු අතර, පරීක්ෂණයක කාර්ය සඳහා ඔහු යාත්‍රාවෙන් බැස ඇත්නම්, ඔහු විසින් වහාම යාත්‍රාවට ආපසු ගොස් එහි රැඳී සිටිනු ලැබිය යුතු ය.

(3) ආගමන නිලධරයා විසින්, එවැනි ම ආකාරයෙන් ඔහුගේ තීරණය වහාම යාත්‍රාවේ නෞකාධිපතිවරයාට, අයිතිකරුට, නියෝජිතයාට හෝ කුලියට දෙන්නාට ලිඛිතව දන්වනු ලැබිය යුතු අතර, එකී නෞකාධිපතිවරයා, අයිතිකරු, නියෝජිතයා හෝ කුලියට දෙන්නා විසින්, එකී තැනැත්තාට ශ්‍රී ලංකාවේ දී යාත්‍රාවෙන් බැසීමට අවසර දෙනු නොලැබිය යුතු අතර, පරීක්ෂණයක කාර්යය සඳහා හෝ වෙනත් කාර්යයක් සඳහා හෝ එකී තැනැත්තා යාත්‍රාවෙන්

බැස ඇත්නම්, ඔහු නැවත යාත්‍රාවට නංවා ගෙන එකී යාත්‍රාවෙන් ම හෝ වෙනත් යම් යාත්‍රාවකින් එකී තැනැත්තා ශ්‍රී ලංකාවේ සිට, ඔහු යාත්‍රාවට නැඟින ලද ස්ථානයට, ඔහුගේ උපත් රටට හෝ ඔහු පුරවැසිභාවය දරන රටට හෝ ආගමන නිලධරයා විසින් විධාන කරනු ලැබිය හැකි වෙනත් යම් ස්ථානයකට රැගෙන යනු ලැබිය යුතු ය.

(4) (අ) (1) වන උපවගන්තියෙන් නියම කර ඇති පරිදි ආගමන නිලධරයකු ඉදිරියෙහි පෙනී සිටීම ප්‍රතික්ෂේප කරන හෝ නොසලකා හරින හෝ ඒ නිලධරයාගේ අවසරය නොමැතිව හෝ ඒ නිලධරයාගේ අවසරයට අනුකූල නොවන ආකාරයකින් පරීක්ෂණ ස්ථානයෙන් පිටව යන;

(ආ) ඔහු ශ්‍රී ලංකාවට ඇතුළු වීම තහනම් කර ඇති බව ආගමන නිලධරයකු විසින් දන්වනු ලැබීමෙන් පසු, ශ්‍රී ලංකාවේ දී යාත්‍රාවෙන් බසින හෝ වහාම ඔහුගේ යාත්‍රාවට ආපසු යාම, අවස්ථාවෝචිත පරිදි, ප්‍රතික්ෂේප කරන හෝ නොසලකා හරින; හෝ

(ඇ) යාත්‍රාවක නෞකාධිපතිවරයා, අයිතිකරු, නියෝජිතයා හෝ කුලියට දෙන්නා වශයෙන් යම් තැනැත්තකුට ශ්‍රී ලංකාවේ දී යාත්‍රාවෙන් බැසීමට අවසර දෙන හෝ (3) වන උපවගන්තියට අනුකූලව යම් තැනැත්තකු නැවත යාත්‍රාවට නංවා ගැනීම ප්‍රතික්ෂේප කරන හෝ එකී තැනැත්තා ශ්‍රී ලංකාවෙන් ඉවතට රැගෙන යාම ප්‍රතික්ෂේප කරන හෝ නොසලකා හරින,

යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් ලක්ෂ පහක් නොඉක්මවන දඩයකට හෝ මාස දොළහක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

(5) යම් තැනැත්තකු විසින්, මේ වගන්තිය උල්ලංඝනය කරමින් ශ්‍රී ලංකාවේ දී යාත්‍රාවෙන් බසින අවස්ථාවක හෝ ඔහු යාත්‍රාවට ආපසු යාම හෝ ආගමන නිලධරයකු විසින් විධාන කරනු ලැබිය හැකි පරිදි වෙනත් යම් යාත්‍රාවකට නැඟීම ප්‍රතික්ෂේප කරන හෝ නොසලකා හරින අවස්ථාවක, එකී ආගමන නිලධරයා හෝ යම්

පොලිස් නිලධරයකු විසින්, ඔහුගේ යාත්‍රාවට ආපසු යන ලෙස හෝ වෙනත් යම් යාත්‍රාවකට නගින ලෙස එකී තැනැත්තාට නියම කරනු ලැබිය හැකි ය. තව ද, ඒ තැනැත්තාට, අවස්ථාවෝචිත පරිදි, යාත්‍රාවට ආපසු යාමට හෝ නැඟීමට බල කිරීම සඳහා සාධාරණ ලෙස අවශ්‍ය විය හැකි පරිදි වූ සාධාරණ බලයක් යෙදීම ඇතුළුව යම් පියවර ගනු ලැබිය හැකි ය. අදාළ යාත්‍රාවේ නෞකාධිපතිවරයා, අයිතිකරු, නියෝජිතයා හෝ කුලියට දෙන්නා විසින්, ඒ තැනැත්තා, අවස්ථාවෝචිත පරිදි, යාත්‍රාවට නැවත නංවා ගෙන නැතහොත් නංවා ගෙන ඔහු ශ්‍රී ලංකාවෙන් ඉවතට රැගෙන යනු ලැබිය යුතු ය.

(6) යාත්‍රාවක නෞකාධිපතිවරයා, අයිතිකරු, නියෝජිතයා හෝ කුලියට දෙන්නා විසින්, (3) වන සහ (5) වන උපවගන්තිවල විධිවිධානවලට අනුකූලව කටයුතු කිරීම සඳහා සාධාරණ ලෙස අවශ්‍ය විය හැකි යම් බලයක් යොදනු ලැබිය හැකි ය.

අනුමත ගුවන් තොටුපළකට පැමිණෙන තැනැත්තන් පරීක්ෂා කිරීම සඳහා වන කාර්යපටිපාටිය

**73.** (1) ශ්‍රී ලංකාවේ යම් අනුමත ගුවන් තොටුපළක දී ගුවන් යානයෙන් බසින යම් තැනැත්තකු විසින්, ඔහු ශ්‍රී ලංකාවට ඇතුළු වීමට අදහස් කරනු ලබන්නේ වුව ද, නොවුව ද, ආගමන නිලධරයකු විසින් විධාන කරනු ලැබිය හැකි යම් වේලාවක දී සහ ස්ථානයක දී පරීක්ෂා කිරීම සඳහා එකී ආගමන නිලධරයා ඉදිරියෙහි පෙනී සිටිනු ලැබිය යුතු යː

එසේ වුව ද, ආගමන නිලධරයකුගේ යම් විධානයකට අනුකූලව කටයුතු කිරීමේ කාර්ය සඳහා ගුවන් යානයෙන් බැස ශ්‍රී ලංකාවේ නිශ්චිතව දක්වා ඇති ස්ථානයකට ඇතුළු වන යම් තැනැත්තකු එකී ඇතුළු වීම හේතුවෙන් ම පමණක් මේ පනතේ විධිවිධාන යටතේ වරදක් සිදු කර ඇති ලෙස සලකනු නොලැබිය යුතු ය.

(2) ආගමන නිලධරයා විසින්, ඔහු විසින් අවශ්‍ය යයි සලකනු ලැබිය හැකි යම් පරීක්ෂණයකින් පසු, ශ්‍රී ලංකාවට ඇතුළු වීමට අදහස් කරනු ලබන්නා වූ ද, මේ පනතේ විධිවිධාන යටතේ හෝ ඒ යටතේ සාදනු ලබන යම් නියෝගයක් හෝ නියමයක් යටතේ හෝ ශ්‍රී ලංකාවට ඇතුළු වීම තහනම් කර ඇති බවට ඔහු විසින් සලකනු ලබන්නා වූ ද, යම් තැනැත්තකුට ඔහුගේ තීරණය දන්වනු ලැබිය යුතු ය. එකී තැනැත්තා විසින්, ඒ නිලධරයා විසින් අනුමත කරනු ලැබූ ස්ථානයකට හැර ගුවන් තොටුපළ පරිශ්‍රයෙන් පිටව යනු නොලැබිය යුතු අතර, ඒ නිලධරයාගේ උපදෙස්වලට අනුකූලව හැකි පළමු අවස්ථාවේ දී ම ශ්‍රී ලංකාවෙන් පිටව යාම සහ පිට වීම කරනු ලැබිය යුතු ය.

(3) එකී තැනැත්තා පැමිණි ගුවන් යානයේ කපිතාන්වරයා, අයිතිකරු, නියෝජිතයා හෝ කුලියට දෙන්නා විසින්, ආගමන නිලධරයා විසින් එසේ නියම කරනු ලැබුවහොත්, එකී ගුවන් යානයෙන් ම හෝ වෙනත් ගුවන් යානයකින් එකී තැනැත්තා ශ්‍රී ලංකාවේ සිට, ඔහු ගුවන් යානයට නැඟින ලද ස්ථානයට, ඔහුගේ උපන් රටට හෝ ඔහු පුරවැසිභාවය දරන රටට හෝ ඒ ආගමන නිලධරයා විසින් විධාන කරනු ලැබිය හැකි වෙනත් ස්ථානයකට රැගෙන යනු ලැබිය යුතු ය.

(4) (අ) (1) වන උපවගන්තියෙන් නියම කර ඇති පරිදි ආගමන නිලධරයකු ඉදිරියෙහි පෙනී සිටීම ප්‍රතික්ෂේප කරන හෝ නොසලකා හරින හෝ ඒ නිලධරයගේ අවසරය නොමැතිව හෝ ඒ නිලධරයාගේ අවසරයට අනුකූල නොවන ආකාරයකින් පරීක්ෂණ ස්ථානයෙන් පිටව යන;

(ආ) ඔහු ශ්‍රී ලංකාවට ඇතුළු වීම තහනම් කර ඇති බව ආගමන නිලධරයකු විසින් දන්වනු ලැබීමෙන් පසු, ඒ නිලධරයාගේ අවසරය නොමැතිව ගුවන් තොටුපළක පරිශ්‍රයෙන් පිටව යන හෝ ඒ නිලධරයා විසින් අනුමත කරනු ලැබූ ස්ථානයකට ගමන් කිරීම හෝ රැඳී සිටීම ප්‍රතික්ෂේප කරන හෝ නොසලකා හරින;

(ඇ) (2) වන උපවගන්තිය යටතේ ආගමන නිලධරයකු විසින් ලබා දෙන ලද උපදෙස්වලට අනුකූලව ශ්‍රී ලංකාවෙන් පිටව යාම ප්‍රතික්ෂේප කරන හෝ පැහැර හරින; හෝ

(ඈ) යම් තැනැත්තකු ශ්‍රී ලංකාවට පැමිණි ගුවන් යානයේ කපිතාන්වරයා, අයිතිකරු, නියෝජිතයා හෝ කුලියට දෙන්නා වශයෙන් (3) වන උපවගන්තියට අනුකූලව එකී තැනැත්තා ශ්‍රී ලංකාවෙන් ඉවතට රැගෙන යාම ප්‍රතික්ෂේප කරන හෝ නොසලකා හරින,

යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබන අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් ලක්ෂ පහක් නොඉක්මවන දඩයකට හෝ මාස දොළහක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

(5) යම් තැනැත්තකු විසින්, මේ වගන්තිය උල්ලංඝනය කරමින් අනුමත ගුවන් තොටුපළක පරිශ්‍රයෙන් පිටව යන හෝ (2) වන උපවගන්තිය යටතේ ආගමන නිලධරයකු විසින් ලබා දෙන උපදෙස්වලට අනුකූලව ශ්‍රී ලංකාවෙන් පිටව යාම සහ පිට වීම ප්‍රතික්ෂේප කරන අවස්ථාවක, එකී ආගමන නිලධරයා හෝ යම් පොලිස් නිලධරයකු විසින්, එම තැනැත්තාට, අවස්ථාවෝචිත පරිදි, අනුමත ගුවන් තොටුපළේ පරිශ්‍රයට ආපසු යාමට හෝ එම උපදෙස්වලට අනුකූලව කටයුතු කිරීමට බල කිරීම සඳහා සාධාරණ ලෙස අවශ්‍ය විය හැකි පරිදි වූ බලයක් යෙදීම ඇතුළුව යම් පියවර ගනු ලැබිය හැකි ය. ගුවන් යානයේ කපිතාන්වරයා, අයිතිකරු, නියෝජිතයා හෝ කුලියට දෙන්නා විසින්, ඒ තැනැත්තා, අවස්ථාවෝචිත පරිදි, ගුවන් යානයට නැවත නංවා ගෙන නැතහොත් නංවා ගෙන ඔහු ශ්‍රී ලංකාවෙන් ඉවතට රැගෙන යනු ලැබිය යුතු ය.

(6) ගුවන් යානයේ කපිතාන්වරයා, අයිතිකරු, නියෝජිතයා හෝ කුලියට දෙන්නා විසින්, (3) වන සහ (5) වන උපවගන්තිවල විධිවිධානවලට අනුකූලව කටයුතු කිරීම සඳහා සාධාරණ ලෙස අවශ්‍ය විය හැකි යම් බලයක් යොදනු ලැබිය හැකි ය.

ශ්‍රී ලංකාවට පැමිණීමට නියමිත ගුවන් යානයක කපිතාන්වරයා හෝ එවැනි යාත්‍රාවක නෞකාධිපතිවරයා විසින් සංචරණය කිරීමට පෙරාතුව මගීන්ගේ ගමන් ලේඛන සහ වීසා පත්‍ර පරීක්ෂා කිරීම සඳහා වන නියමය

**74.** (1) ශ්‍රී ලංකාවෙන් පිටත යම් ස්ථානයක සිට ශ්‍රී ලංකාවේ යම් අනුමත ගුවන් තොටුපළකට හෝ අනුමත මුහුදු තොටුපළකට පැමිණීමට අදහස් කරන සෑම ගුවන් යානයක ම කපිතාන්වරයා, අයිතිකරු, නියෝජිතයා හෝ කුලියට දෙන්නා හෝ එවැනි සෑම යාත්‍රාවක ම නෞකාධිපතිවරයා, අයිතිකරු හෝ නියෝජිතයා විසින්, අවස්ථාවෝචිත පරිදි, එකී ගුවන් යානයට හෝ යාත්‍රාවට ගොඩවන සෑම මගියකු විසින් ම ශ්‍රී ලංකාවට සංචරණය කිරීම සඳහා අවශ්‍ය වන්නා වූ-

(අ) වලංගු විදේශ ගමන් බලපත්‍රයක් හෝ ලේඛනයක් සන්තකයේ දරන්නේ ද යන්න; සහ

(ආ) වීසා පත්‍රයක් දරනු ලබන්නේ ද යන්න,

පරීක්ෂා කිරීම සහ ඒ බවට වගබලා ගැනීම කරනු ලැබිය යුතු ය.

(2) ශ්‍රී ලංකාවට සංචරණය කරන යම් මගියකු විසින් (1) වන උපවගන්තියේ (අ) සහ (ආ) ඡේදවල නියමයන්ට අනුකූලව කටයුතු කරනු නොලැබූ බවට සොයා දැන ගනු ලැබූ අවස්ථාවක, එකී තැනැත්තා, එකී ගුවන් යානයට හෝ යාත්‍රාවට ගොඩවීම ප්‍රතික්ෂේප කරනු ලැබිය යුතු ය.

පරීක්ෂා කිරීම අවසන් වන තෙක් තැනැත්තන් විසින් යාත්‍රාවට ගොඩවීම හෝ යාත්‍රාවෙන් පිටව යාම නොකළ යුතු බව

**75.** (1) ආගමන නිලධරයකු විසින් ප්‍රදානය කරන ලද යම් අධිකාරයක් යටතේ හෝ ඊට අනුකූලව මිස-

(අ) වරායේ සිටින යාත්‍රාවක තටාකගත කිරීම සම්බන්ධයෙන් උපදෙස් ලබා දීම සඳහා වගකිව යුතු තැනැත්තා;

(ආ) ස්වකීය රාජකාරිය පිණිස යාත්‍රාවට ගොඩවන යම් රජයේ නිලධරයකු;

(ඇ) යාත්‍රාවේ අයිතිකරු, කුලියට දෙන්නා හෝ නියෝජිතයා; හෝ

(ඈ) යාත්‍රාව අයත් රටේ කොන්සල් නිලධරයකු හෝ එකී රට වෙනුවෙන් පත් කරන ලද බලයලත් නියෝජිතයකු,

නොවන කිසිම තැනැත්තකු විසින්, ආගමන නිලධරයකු විසින් යාත්‍රාව පරීක්ෂා කර ආගමන සංඥාව පහළට අදින තෙක් ශ්‍රී ලංකාවට පැමිණෙන යාත්‍රාවකින් පිටව යාම හෝ ඊට ගොඩවීම කරනු නොලැබිය යුතු අතර, එමෙන්ම, එවැනි යම් තැනැත්තකු රැගෙන යන යාත්‍රාවක සේවක පිරිස නොවන යම් තැනැත්තකු විසින්, එකී යාත්‍රාවේ සිට මීටර් දෙසියයක් ඇතුළත වූ ප්‍රදේශයට ප්‍රවේශ වීමට හෝ ශ්‍රී ලංකාවෙන් පිට වන යාත්‍රාවක් එකී යාත්‍රාව පිට වීමට මොහොතකට පෙර ආගමන නිලධරයකු විසින් පරීක්ෂා කිරීමෙන් පසු එකී යාත්‍රාවට ඉන්පසු ගොඩවීම කරනු නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය උල්ලංඝනය කරන යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබන අතර, ආගමන නිලධරයකු විසින් එසේ නියම කරනු ලැබූ අවස්ථාවක, (1) වන උපවගන්තිය උල්ලංඝනය කරමින් යාත්‍රාවකින් පිටව යන එවැනි සෑම තැනැත්තකු විසින් ම, වහාම යාත්‍රාවට ආපසු ගොස් එහි රැඳී සිටිනු ලැබිය යුතු අතර, යාත්‍රාවේ නෞකාධිපතිවරයා විසින් ඒ තැනැත්තා නැවත යාත්‍රාවට නංවා ගනු ලැබිය යුතු ය.

ආගමන නිලධරයකුගේ අවසරය නොමැතිව යාත්‍රාවලින් බැසීම හෝ යාත්‍රාවලට ගොඩවීම තහනම් බව

**76.** (1) යාත්‍රාවෙන් බැසීම හෝ යාත්‍රාවට ගොඩවීම සඳහා ආගමන නිලධරයකු විසින් අවසර දෙනු ලබන තෙක් 75 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ), (ආ), (ඇ) හෝ (ඈ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති තැනැත්තකු නොවන යම් තැනැත්තකු විසින් එකී යාත්‍රාවෙන් බැසීම හෝ එකී යාත්‍රාවට ගොඩවීම වැළැක්වීම

ශ්‍රී ලංකාවට පැමිණෙන සෑම යාත්‍රාවක ම නෞකාධිපතිවරයාගේ සහ අයිතිකරුගේ හෝ කුලියට දෙන්නාගේ කාර්යය විය යුතු අතර, ඒ කාර්යය සඳහා සාධාරණ ලෙස අවශ්‍ය වූ යම් ක්‍රමයක් භාවිත කරනු ලැබිය හැකි ය.

(2) තත්කාර්ය සඳහා ආගමන නිලධරයකු විසින් අවසර දීමට පෙර යම් තැනැත්තකු විසින් යම් යාත්‍රාවකින් බසිනු ලැබූ හෝ යම් යාත්‍රාවකට ගොඩවනු ලැබූ අවස්ථාවක, ඒ තැනැත්තා, ඒ යාත්‍රාවේ නෞකාධිපතිවරයා සහ අයිතිකරු හෝ කුලියට දෙන්නා මේ වගන්තිය යටතේ වරදක් සිදු කරනු ලබන්නේ ය.

(3) නෞකාධිපතිවරයා, අයිතිකරු හෝ කුලියට දෙන්නා විසින්, එකී තැනැත්තාට යාත්‍රාවෙන් බැසීම හෝ යාත්‍රාවට ගොඩවීම සඳහා අවසර දී නොතිබීම හෝ ඒ සඳහා පහසුකම් සැලසීම සඳහා කිසිවක් කර නොතිබීම මේ වගන්තිය යටතේ වන යම් අපරාධ නඩුවක දී විත්තිවාචකයක් නොවිය යුතු ය.

(4) යාත්‍රාවෙන් බැසීම සඳහා ආගමන නිලධරයකු විසින් අවසර දීමට පෙර යම් තැනැත්තකු විසින් බැස ඇත්තේ යම් යාත්‍රාවකින් ද, එම යාත්‍රාවේ නෞකාධිපතිවරයා විසින් ඒ තැනැත්තා නැවත යාත්‍රාවට නංවා ගනු ලැබිය යුතු අතර, ඒ තැනැත්තා නැවත යාත්‍රාවට නංවා ගැනීම ප්‍රතික්ෂේප කරන නෞකාධිපතිවරයකු වරදක් සිදු කරන්නේ ය.

(5) මේ වගන්තිය යටතේ වරදක් සිදු කරන යම් තැනැත්තකු, වරදකරු කරනු ලැබූ විට, රුපියල් ලක්ෂයක් නොඉක්මවන දඩයකට හෝ මාස දොළහක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

පරීක්ෂා කිරීමකට පෙර ද්‍රව්‍ය ඉවත් කිරීම තහනම් බව

**77.** (1) ආගමන නිලධරයකුගේ අධිකාරිය යටතේ මිස, 75 වන වගන්තිය යටතේ ආගමන නිලධරයකු විසින්, එකී යාත්‍රාව පරීක්ෂා කරනු ලබන තෙක් යම් යාත්‍රාවකින් කිසිදු ද්‍රව්‍යයක්, ලේඛනයක් හෝ දෙයක් ඉවත් කිරීම, ගැනීම හෝ දැමීම කරනු නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය උල්ලංඝනය කරන යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබන අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් ලක්ෂයක් නොඉක්මවන දඩයකට හෝ මාස දොළහක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

යාත්‍රාවකට හෝ ගුවන් යානයකට ඇතුළු වීමේ සහ ගොඩවීමේ බලය

**78.** යම් ආගමන නිලධරයකු, උපපොලිස් පරීක්ෂකවරයකුගේ නිලයට නොඅඩු නිලයක් දරන්නා වූ ද, පොලිස් අධිකාරිවරයකු විසින් බලය දෙන ලද්දා වූ ද, යම් පොලිස් නිලධරයකු හෝ යම් නියම කරනු ලැබූ වෛද්‍ය නිලධරයකු විසින්, අවස්ථාවෝචිත පරිදි, යම් යාත්‍රාවකට හෝ ගුවන් යානයකට ඇතුළු වී හෝ ගොඩ වී ශ්‍රී ලංකාවට පැමිණෙන හෝ ශ්‍රී ලංකාවෙන් පිට වන යම් තැනැත්තකු රඳවා තබා ගැනීම සහ පරීක්ෂා කිරීම සහ යම් ලේඛනයක් ලබා දෙන ලෙස එකී තැනැත්තාට නියම කිරීම කරනු ලැබිය හැකි ය.

පරීක්ෂණයක් හෝ විමර්ශනයක් සඳහා තැනැත්තන් රඳවා තබා ගැනීම

**79.** යම් තැනැත්තකු මේ පනතේ හෝ ඒ යටතේ සාදනු ලබන යම් නියමයක හෝ නියෝගයක විධිවිධාන යටතේ ශ්‍රී ලංකාවට ඇතුළු වීමට හිමිකම් ලබන්නේ ද යන්න තීරණය කිරීම සඳහා වන යම් පරීක්ෂණයක හෝ විමර්ශනයක කාර්ය සඳහා, ආගමන නිලධරයකු විසින්, එකී පරීක්ෂණය හෝ විමර්ශනය සම්පූර්ණ කිරීම සඳහා සාධාරණ ලෙස අවශ්‍ය විය හැකි යම් කාලසීමාවකට අදාළ අනුමත තොටුපළේ යම් ස්ථානයක දී යාත්‍රාවෙන් ගොඩබැස යම් ස්ථානයකට ඇතුළු වන ලෙස යම් තැනැත්තකුට විධාන කරනු ලැබිය හැකි යඃ

එසේ වුව ද, ආගමන නිලධරයකු විසින්, පැය විසිහතරක කාලසීමාවක් ඇතුළත එකී පරීක්ෂණය හෝ විමර්ශනය අවසන් කර මේ පනතේ හෝ ඒ යටතේ සාදනු ලබන යම් නියමයක හෝ නියෝගයක විධිවිධාන යටතේ ශ්‍රී ලංකාවට ඇතුළු වීමට එකී තැනැත්තා හිමිකම් ලබන්නේ ද යන්න තීරණය කිරීම සඳහා ප්‍රයත්න දරනු ලැබිය යුතු ය.

ඇතුළු වීම් සහ පිට වීම් පිරිසැකසුම් කිරීමේ දී ආගමන නිලධරයන් සතු බලය

**80.** මේ පනත යටතේ සෑම ආගමන නිලධරයකුට ම-

(අ) මගීන් යාත්‍රාවට නැගීම සහ යාත්‍රාවෙන් බැසීම පාලනය කිරීම;

(ආ) ආගමන ප්‍රදේශ හෝ කලාප තුළ මගීන් පාලනය කිරීම;

(ඇ) පැමිණීමේ දී මගීන් පරීක්ෂා කිරීම සහ ඇතුළු වීම ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් තීරණ ගැනීම;

(ඈ) ඇතුළු වීම සහ පිට වීම සම්බන්ධයෙන් තීරණ ගැනීම සඳහා මගීන්ගෙන් ප්‍රශ්න කිරීම සහ විමසීම සිදු කිරීම;

(ඉ) ඇතුළු වීම සහ පිට වීම සම්බන්ධයෙන් තීරණ ගැනීම සඳහා විචාරණ සිදු කිරීම සහ අමතර ලේඛන ඉල්ලීම;

(ඊ) මගීන් වෛද්‍ය පරීක්ෂණ සඳහා යොමු කිරීම;

(උ) මගීන් වෙනත් නීතිය බලාත්මක කිරීමේ නියෝජිතායතන වෙත යොමු කිරීම;

(ඌ) නොපමාව ඇතුළු වීමේ අවසරයක් ලබා දිය නොහැකි අවස්ථාවක සහ අමතර තොරතුරු අවශ්‍ය වන අවස්ථාවක මගීන් රඳවා තබා ගැනීම;

(එ) වංචනික, ව්‍යාජීකෘත හෝ ව්‍යාජානුකරණ ගමන් ලේඛන තහනමට ගැනීම;

(ඒ) එකී ගමන් ලේඛනයේ නියම අයිතිකරු පුද්ගලාරූඪණය කරන යම් තැනැත්තකුගේ ගමන් ලේඛන තහනමට ගැනීම;

(ඔ) ඇතුළු වීම ප්‍රතික්ෂේප කරනු ලැබූ යම් තැනැත්තකු ඉවත් කිරීම; හෝ

(ඕ) මේ පනත හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ පවරා ඇති වෙනත් යම් කර්තව්‍යයක් ක්‍රියාත්මක කිරීම,

සඳහා බලය තිබිය යුතු ය.

**මගීන් විචාරණය කිරීමේ බලය**

**81.** (1) ශ්‍රී ලංකාවට පැමිණෙන හෝ ශ්‍රී ලංකාවෙන් පිට වීමට සූදානම්ව සිටින යම් තැනැත්තකු විසින්, මේ පනතේ කාර්ය සඳහා-

(අ) ආගමන නිලධරයකු හෝ මේ පනත යටතේ බලය දෙන ලද වෙනත් යම් නිලධරයකු විසින් ඔහු වෙත යොමු කරන්නා වූ ද, ඔහුගේ අනන්‍යතාව, ජාතිකත්වය හෝ රැකියාව තහවුරු කිරීමට කෙලින්ම හෝ අන්‍යාකාරයකින් නැඹුරුතාවක් දක්වන්නා වූ හෝ මේ පනතේ ඇතුළත් පරිසීමා කිසිවකට අදාළ වන්නා වූ ද, සියලු ම ප්‍රශ්නවලට සහ විමසීම්වලට සම්පූර්ණයෙන් සහ සත්‍ය ලෙස පිළිතුරු දීම; සහ

(ආ) ඉල්ලා සිටිනු ලැබූ විට, ඔහු සන්තකයේ ඇති සියලු ම ලේඛන, ද්‍රව්‍ය හෝ දේ, (අ) ඡේදයේ සඳහන් යම් නිලධරයකු වෙත අනාවරණය කිරීම සහ ඉදිරිපත් කිරීම,

කරනු ලැබිය යුතු ය.

(2) එකී සියලු ම පිළිතුරු, ලේඛන, ද්‍රව්‍ය හෝ දේ ඒවා අනාවරණය කරන හෝ ඉදිරිපත් කරන තැනැත්තාට විරුද්ධව මේ පනත යටතේ පවරනු ලබන යම් නඩු කටයුත්තක දී සාක්ෂි වශයෙන් ආවේශ්‍ය විය යුතු ය.

(3) මේ වගන්තියේ සඳහන් කිසිවකින්, සාමාන්‍යයෙන් එවැනි යම් පිළිතුරක් ආවේශ්‍ය වන්නා වූ වෙනත් යම් නඩු කටයුත්තක දී එම පිළිතුර ආවේශ්‍ය නොවන ලෙස තේරුම් ගනු නොලැබිය යුතු ය.

(4) (අ) (1) වන උපවගන්තිය යටතේ ඔහු වෙත යොමු කරන යම් ප්‍රශ්නයකට හෝ විමසීමකට පිළිතුරු දීම ප්‍රතික්ෂේප කරන;

(ආ) එවැනි යම් ප්‍රශ්නයකට හෝ විමසීමකට දැන දැන ම අසත්‍ය හෝ නොමඟ යවනසුලු පිළිතුරක් ලබා දෙන;

(ඇ) (1) වන උපවගන්තිය යටතේ එසේ කිරීමට නියම කරනු ලැබූ විට, ඔහු සන්තකයේ ඇති යම් ලේඛනයක් හෝ ද්‍රව්‍යයක් ඉදිරිපත් කිරීම ප්‍රතික්ෂේප කරන හෝ පැහැර හරින; හෝ

(ඈ) දැන දැනම යම් අසත්‍ය හෝ නොමඟ යවනසුලු ලේඛනයක් ඉදිරිපත් කරන,

යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබන්නේ ය.

(5) (4) වන උපවගන්තිය යටතේ වරදක් සිදු කරන යම් තැනැත්තකු-

(අ) ඒ උපවගන්තියේ (අ), (ආ) හෝ (ඇ) ඡේදය යටතේ වන වරදක් සම්බන්ධයෙන් වන විට, වරදකරු කරනු ලැබූ විට, රුපියල් ලක්ෂ පහක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත

කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය; හෝ

(ආ) ඒ උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ වන වරදක් සම්බන්ධයෙන් වන විට, වරදකරු කරනු ලැබූ විට, රුපියල් ලක්ෂ පහක් නොඉක්මවන දඩයකට හෝ අවුරුදු දෙකක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

පැමිණෙන හෝ පිට වන මඟීන් වෙනත් නියෝජිතායතනවලට යොමු කිරීමේ බලය

**82.** ආගමන නිලධරයකු විසින්, වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ පිහිටුවන ලද එකී අදාළ නියෝජිතායතනවලින් ඉල්ලීමක් කරනු ලැබූ විට, පාලක ජනරාල්වරයාගේ විධානය අනුව, පැමිණෙන හෝ පිට වන යම් තැනැත්තකු අනුමත තොටුපළකට අනුයුක්ත යම් නීතිය බලාත්මක කිරීමේ නියෝජිතායතනයකට යොමු කරනු ලැබිය යුතු ය.

ගාස්තු නොගෙවා නැවක හෝ ගුවන් යානයක සැඟව පළායන තැනැත්තන්

**83.** (1) සෑම යාත්‍රාවක ම නෞකාධිපතිවරයා, අයිතිකරු, නියෝජිතයා හෝ කුලියට දෙන්නා විසින් හෝ සෑම ගුවන් යානයක ම කපිතාන්වරයා, අයිතිකරු, නියෝජිතයා හෝ කුලියට දෙන්නා විසින්-

(අ) යම් අනුමත තොටුපළකට පැමිණෙන හෝ යම් අනුමත තොටුපළකින් පිට වන හෝ පිට වීමට සූදානම්ව සිටින අවස්ථාවක, එකී යාත්‍රාව හෝ ගුවන් යානය, අවස්ථාවෝචිත පරිදි, එකී අනුමත තොටුපළකට පැමිණීමට හෝ එකී අනුමත තොටුපළෙන් පිට වීමට පෙරාතුව, එකී යාත්‍රාවේ හෝ ගුවන් යානයේ රැඳී සිටින යම් ගාස්තු නොගෙවා නැවක හෝ ගුවන් යානයක සැඟව පළායන තැනැත්තකු සම්බන්ධයෙන් ආගමන නිලධරයකු වෙත වාර්තා කිරීම; හෝ

(ආ) පැමිණීමෙන් පසු හෝ පිට වීමට පෙරාතුව අනුමත තොටුපළක සිටින අතරතුර එකී යාත්‍රාවේ හෝ ගුවන් යානයේ ගාස්තු නොගෙවා නැවක හෝ ගුවන් යානයක සැඟව පළායන තැනැත්තකු සිටින බව දැනගත් අවස්ථාවක, වහාම ඒ සම්බන්ධයෙන් ආගමන නිලධරයකු වෙත වාර්තා කිරීම,

කරනු ලැබිය යුතු ය.

(2) (අ) එකී ගාස්තු නොගෙවා නැවක හෝ ගුවන් යානයක සැඟව පළායන තැනැත්තකු ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන්නේ නම් මිස, ආගමන නිලධරයකු විසින්, යම් ගාස්තු නොගෙවා නැවක හෝ ගුවන් යානයක සැඟව පළායන තැනැත්තකුට ශ්‍රී ලංකාවට ඇතුළු වීම සඳහා අවසර දෙනු නොලැබිය යුතු ය. ගාස්තු නොගෙවා නැවක හෝ ගුවන් යානයක සැඟව පළායන තැනැත්තකු පැමිණි යාත්‍රාවක හෝ ගුවන් යානයක නෞකාධිපතිවරයා හෝ එකී යාත්‍රාව භාරව සිටින වෙනත් යම් තැනැත්තකු විසින්, ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන, ගාස්තු නොගෙවා නැවක හෝ ගුවන් යානයක සැඟව පළායන තැනැත්තකුට ශ්‍රී ලංකාවේ දී යාත්‍රාවෙන් හෝ ගුවන් යානයෙන් බැසීම සඳහා අවසර දෙනු නොලැබිය යුතු අතර, එකී ගාස්තු නොගෙවා නැවක හෝ ගුවන් යානයක සැඟව පළායන තැනැත්තා එකී යාත්‍රාව හෝ ගුවන් යානය තුළ තබා ගනු ලැබිය යුතු ය.

(ආ) සෑම යාත්‍රාවක ම නෞකාධිපතිවරයා, අයිතිකරු, නියෝජිතයා හෝ කුලියට දෙන්නා විසින් හෝ සෑම ගුවන් යානයක ම කපිතාන්වරයා, අයිතිකරු, නියෝජිතයා හෝ කුලියට දෙන්නා විසින් ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන ගාස්තු නොගෙවා නැවක හෝ ගුවන් යානයක සැඟව පළායන සෑම තැනැත්තකු ම ශ්‍රී ලංකාවේ සිට එම යාත්‍රාවෙන් ම හෝ ගුවන් යානයෙන් ම නැතහොත් වෙනත් යාත්‍රාවකින් හෝ ගුවන් යානයකින්, ඔහු යාත්‍රාවට හෝ ගුවන් යානයට නැඟින ලද රටට, ඔහුගේ උපන් රටට හෝ පුරවැසිභාවය දරන රටට හෝ ඒ ආගමන නිලධරයා විසින් විධාන කරනු ලැබිය හැකි වෙනත් යම් ස්ථානයකට රැගෙන යනු ලැබිය යුතු ය.

(3) ගාස්තු නොගෙවා නැවක හෝ ගුවන් යානයක සැඟව පළායන යම් තැනැත්තකු ශ්‍රී ලංකාවේ පුරවැසියකු වේ නම්, ආගමන නිලධරයකු විසින්, එකී ගාස්තු නොගෙවා නැවක හෝ ගුවන් යානයක සැඟව පළායන තැනැත්තාට ශ්‍රී ලංකාවට ඇතුළු වීම සඳහා අවසර දෙනු ලැබිය යුතු ය.

(4) ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන, ගාස්තු නොගෙවා නැවක හෝ ගුවන් යානයක සැඟව පළායන තැනැත්තකුට, (3) වන උපවගන්තිය යටතේ ශ්‍රී ලංකාවට ඇතුළු වීම සඳහා අවසර දෙනු ලැබූ අවස්ථාවක, එකී තැනැත්තා විසින්, මේ පනත යටතේ හෝ මේ පනත යටතේ සාදනු ලබන යම් නියෝගයක් හෝ නියමයක් යටතේ වන නීති විරෝධී පිට වීමට හෝ ඇතුළු වීමට අදාළ විධිවිධානවලට යටත්ව ශ්‍රී ලංකාවට ඇතුළු වනු ලැබිය යුතු ය.

ශ්‍රී ලංකාවට පැමිණෙන, ශ්‍රී ලංකාවෙන් පිට වන හෝ පිට වීමට සූදානම්ව සිටින යාත්‍රාවක නෞකාධිපතිවරයා විසින් මගීන් සහ නාවික පිරිස පිළිබඳ තොරතුරු ලබා දිය යුතු බව

**84.** (1) ශ්‍රී ලංකාවෙන් පිටත ස්ථානයක සිට මුහුදෙන් ශ්‍රී ලංකාවට පැමිණෙන තැනැත්තන් වෙනුවෙන් යම් අනුමත තොටුපළකට පැමිණෙන හෝ ශ්‍රී ලංකාවෙන් පිටත යම් ස්ථානයකට මුහුදෙන් යාම සඳහා ශ්‍රී ලංකාවෙන් පිට වන තැනැත්තන් වෙනුවෙන් යම් අනුමත තොටුපළකින් පිට වන හෝ පිට වීමට සූදානම්ව සිටින සෑම යාත්‍රාවක ම නෞකාධිපතිවරයා, අයිතිකරු, නියෝජිතයා හෝ කුලියට දෙන්නා විසින්,-

(අ) අවස්ථාවෝචිත පරිදි, යාත්‍රාව අනුමත තොටුපළට පැමිණෙන අවස්ථාවේ දී හෝ යාත්‍රාව අනුමත තොටුපළෙන් පිට වන අවස්ථාවේ දී යාත්‍රාවේ නෞකාස්ථව සිටින හෝ සිටිනු ලැබිය හැකි වූ සියලු ම නාවික පිරිස පිළිබඳ සම්පූර්ණ ලැයිස්තුවක්, නියම කරනු ලැබිය හැකි යම් කාලයක දී, යම් ආකෘතියකින් සහ ආකාරයකින් සහ නාවික පිරිස පිළිබඳ යම් විස්තර ද සමඟ ආගමන නිලධරයකුට ලබා දීම;

(ආ) ආගමන නිලධරයකු විසින්, එසේ නියම කරනු ලබන්නේ නම්, ඒ ආගමන නිලධරයා විසින්, සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් විධාන කරනු ලබන පරිදි පරීක්ෂා කිරීම සහ විචාරණය කිරීම සඳහා නාවික පිරිසේ සෑම සාමාජිකයකු ම ඒ ආගමන නිලධරයා වෙත ඉදිරිපත් කිරීම;

(ඇ) නියම කරනු ලැබිය හැකි යම් කාලයක දී සහ යම් ආකෘතියකින් සහ ආකාරයකින් නාවික පිරිසේ එක් එක් සාමාජිකයාගේ අනන්‍යතාව පිළිබඳ සාක්ෂි ඒ ආගමන නිලධරයාට ලබා දීම;

(ඈ) ඔහුගේ යාත්‍රාව, එහි වෙනත් තැනැත්තන් නෞකාස්ථව සිටින්නේ ද නොසිටින්නේ ද යන්න තහවුරු කර ගැනීම සඳහා අවශ්‍ය විය හැකි යම් සෝදිසියකට භාජනය කිරීමට ඉඩ ලබා දීම;

(ඉ) ඔහුගේ යාත්‍රාවේ ලියවිලි ඉදිරිපත් කිරීම; සහ

(ඊ) අවස්ථාවෝචිත පරිදි, යාත්‍රාව අනුමත තොටුපළකට පැමිණීමට හෝ අනුමත තොටුපළෙන් පිට වීමට පෙර, නෞකාස්ථව සිටින ගාස්තු නොගෙවා නැවකින් සැඟව

පළායන යම් තැනැත්තකු හෝ අවසර නොලත් යම් තැනැත්තකු හෝ යම් රාජ්‍යයක හෝ රටක නිසි බලධරයන් විසින් එකී රාජ්‍යයෙන් හෝ රටින් පහ කරනු ලැබූ පසු වෙනත් යම් රාජ්‍යයකට හෝ රටකට ගමන් කරමින් සිටින යම් තැනැත්තකු පිළිබඳ වාර්තා කිරීම,

කරනු ලැබිය යුතු ය.

(2) මගීන් රැගෙන යන යාත්‍රා සම්බන්ධයෙන් වන විට, නෞකාධිපතිවරයා, අයිතිකරු, නියෝජිතයා හෝ කුලියට දෙන්නා විසින්, ඊට අමතරව-

(අ) අවස්ථාවෝචිත පරිදි, යාත්‍රාව අනුමත තොටුපළට පැමිණෙන හෝ අනුමත තොටුපළෙන් පිට වන අවස්ථාවේ දී, යාත්‍රාවේ නෞකාස්ථව සිටින හෝ සිටිනු ලැබිය හැකි වූ සියලු ම මගීන් පිළිබඳ සම්පූර්ණ ලැයිස්තුවක්, නියම කරනු ලැබිය හැකි යම් කාලයක දී, යම් ආකෘතියකින් සහ ආකාරයකින් යම් විස්තර ද සමග ලබා දීම;

(ආ) නියම කරනු ලැබිය හැකි යම් ආකෘතියකින් සහ ආකාරයකින් සහ යම් කාලයක දී, ශ්‍රී ලංකාවේ දී නැවෙන් බසින හෝ නැවට නඟින සෑම මගියකුට ම අදාළ යම් විස්තර ලබා දීම; සහ

(ඇ) ආගමන නිලධරයකු විසින්, එසේ අවශ්‍ය කරනු ලබන්නේ නම්, ඒ ආගමන නිලධරයා විසින් සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් විධාන කරනු ලබන පරිදි පරීක්ෂා කිරීම සහ විචාරණය කිරීම සඳහා සෑම මගියකු ම ඒ ආගමන නිලධරයා වෙත ඉදිරිපත් කිරීම,

කරනු ලැබිය යුතු ය.

(3) ආගමන නිලධරයකු විසින්, පරීක්ෂා කිරීමෙන් පසු, නීතියෙන් නියම කර ඇති පරිදි, මේ පනත යටතේ නාවික පිරිසේ සාමාජික සංඛ්‍යාව පිළිබඳ සහතිකයක් යාත්‍රාවේ නෞකාධිපතිවරයා, අයිතිකරු, නියෝජිතයා හෝ කුලියට දෙන්නා වෙත නිකුත් කරනු ලැබිය හැකි ය.

(4) (1) වන හෝ (2) වන උපවගන්තිය උල්ලංඝනය කරන යාත්‍රාවක නෞකාධිපතිවරයා, අයිතිකරු, නියෝජිතයා හෝ කුලියට දෙන්නා සහ (1) වන උපවගන්තියේ (ඈ) ඡේදය යටතේ යාත්‍රාවක් සෝදිසි කිරීම අවහිර කරන හෝ ඊට බාධා කරන යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබන අතර, වරදකරු කරනු ලැබූ විට, එකී එක් එක් තැනැත්තා රුපියල් ලක්ෂයකට නොඅඩු වූ ද රුපියල් ලක්ෂ පහකට නොවැඩි වූ ද දඩයකට යටත් විය යුතු ය.

(5) (1) වන උපවගන්තියේ (ඊ) ඡේදය යටතේ යාත්‍රාවේ නෞකාස්ථව සිටින බවට වාර්තා කර නොමැති යම් තැනැත්තකු යාත්‍රාවේ නෞකාස්ථව සිටිය දී සොයා ගනු ලැබූ අවස්ථාවක, එකී යාත්‍රාවේ නෞකාධිපතිවරයා, අයිතිකරු, නියෝජිතයා සහ කුලියට දෙන්නා යන එක් එක් තැනැත්තා වරදක් සිදු කරනු ලබන අතර, වරදකරු කරනු ලැබූ විට, එකී එක් එක් තැනැත්තා රුපියල් ලක්ෂයකට නොඅඩු වූ ද රුපියල් ලක්ෂ පහකට නොවැඩි වූ ද දඩයකට යටත් විය යුතු ය.

(6) මේ වගන්තිය යටතේ වන යම් නඩු කටයුත්තක දී, (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ ලබා දෙන ලද හැඳුනුම්පත්වල තොරතුරුවල විස්තරයට අනුරූපී මුළු නාවික පිරිසේ සාමාජිකයන් සංඛ්‍යාවක් ශ්‍රී ලංකාවට පැමිණෙන අවස්ථාවේ දී, එකී යාත්‍රාවෙන් රැගෙන එනු ලැබ ඇති බවට යම් යාත්‍රාවකට නැඟ එකී යාත්‍රාව පරීක්ෂා කළ ආගමන නිලධරයකු විසින් ලබා දෙන ලද ලිඛිත සහතිකය එකී යාත්‍රාව පැමිණෙන අවස්ථාවේ දී එකී නාවික පිරිසේ සාමාජිකයන් සංඛ්‍යාව එකී යාත්‍රාවෙන් රැගෙන එනු ලැබ ඇති බවට වන තීරණාත්මක සාක්ෂියක් විය යුතු ය.

*ශ්‍රී ලංකාවට පැමිණෙන, ශ්‍රී ලංකාවෙන් පිට වන හෝ පිට වීමට සූදානම්ව සිටින ගුවන් යානයක කපිතාන්වරයා විසින් මගීන් සහ නාවික ගුවන් කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු ලබා දිය යුතු බව*

**85.** (1) ශ්‍රී ලංකාවෙන් පිටත ස්ථානයක සිට ශ්‍රී ලංකාවේ යම් අනුමත තොටුපළකට පැමිණෙන හෝ ශ්‍රී ලංකාවේ යම් අනුමත තොටුපළක සිට ශ්‍රී ලංකාවෙන් පිටත ස්ථානයක් බලා පිට වන හෝ පිට වීමට සූදානම්ව සිටින සෑම ගුවන් යානයක ම කපිතාන්වරයා, අයිතිකරු, නියෝජිතයා හෝ කුලියට දෙන්නා විසින්-

(අ) අවස්ථාවෝචිත පරිදි, ගුවන් යානය අනුමත තොටුපළට පැමිණෙන අවස්ථාවේ දී හෝ ගුවන් යානය අනුමත තොටුපළෙන් පිට වන අවස්ථාවේ දී, ගුවන් යානයේ සිටින හෝ සිටිනු ලැබිය හැකි වූ සියලු ම මගීන් පිළිබඳ සම්පූර්ණ ලැයිස්තුවක් නියම කරනු ලැබිය හැකි යම් කාලයක දී, යම් ආකෘතියකින් සහ ආකාරයකින් සහ යම් විස්තර ද සමඟ ආගමන නිලධරයකුට ලබා දීම;

(ආ) නියම කරනු ලැබිය හැකි යම් ආකෘතියකින් සහ ආකාරයකින් සහ යම් කාලයක දී ශ්‍රී ලංකාවට ගොඩ බසින හෝ ශ්‍රී ලංකාවෙන් පිට වන සෑම මගියකුට ම අදාළ යම් විස්තර ඒ ආගමන නිලධරයාට ලබා දීම;

(ඇ) අවස්ථාවෝචිත පරිදි, ගුවන් යානය අනුමත තොටුපළට පැමිණෙන අවස්ථාවේ දී හෝ අනුමත තොටුපළෙන් පිට වන අවස්ථාවේ දී ඔහුගේ ගුවන් යානයේ සිටින හෝ සිටිනු ලැබිය හැකි වූ සියලු ම ගුවන් කාර්ය මණ්ඩලය පිළිබඳ සම්පූර්ණ ලැයිස්තුවක් නියම කරනු ලැබිය හැකි යම් කාලයක දී යම් ආකෘතියකින් සහ ආකාරයකින් සහ සේවක පිරිස පිළිබඳ යම් විස්තර ද සමඟ ඒ ආගමන නිලධරයාට ලබා දීම;

(ඈ) ආගමන නිලධරයකු විසින්, එසේ නියම කරනු ලබන්නේ නම්, ඒ ආගමන නිලධරයා විසින් සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් විධාන කරනු ලබන පරිදි පරීක්ෂා කිරීම සහ විචාරණය කිරීම සඳහා ඒ ගුවන් යානයේ කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයකු ම සහ ඒ ගුවන් යානයේ සෑම මගියකු ම ඒ ආගමන නිලධරයා වෙත ඉදිරිපත් කිරීම;

(ඉ) ඔහුගේ ගුවන් යානය එහි වෙනත් තැනැත්තන් සිටින්නේ ද නොසිටින්නේ ද යන්න තහවුරු කර ගැනීම සඳහා අවශ්‍ය විය හැකි යම් සෝදිසියකට භාජනය කිරීමට ඉඩ ලබා දීම; සහ

(ඊ) අවස්ථාවෝචිත පරිදි, ගුවන් යානය අනුමත තොටුපළට පැමිණීමට හෝ අනුමත තොටුපළෙන් පිට වීමට පෙර, ගුවන් යානයේ සිටින ගාස්තු නොගෙවා නැවක හෝ ගුවන් යානයක සැඟව පළායන යම් තැනැත්තකු හෝ අවසර නොලත් යම් තැනැත්තකු හෝ යම් රාජ්‍යයක හෝ රටක නිසි බලධරයන් විසින් එකී රාජ්‍යයෙන් හෝ රටින් පහ කරනු ලැබූ පසු වෙනත් යම් රාජ්‍යයකට හෝ රටකට ගමන් කරමින් සිටින යම් තැනැත්තකු පිළිබඳ වාර්තා කිරීම,

කරනු ලැබිය යුතු ය.

(2) ආගමන නිලධරයකු විසින්, පරීක්ෂා කිරීමෙන් පසු, මේ පනත යටතේ ගුවන් කාර්ය මණ්ඩලයේ සාමාජික සංඛ්‍යාව පිළිබඳ

සහතිකයක් යාත්‍රාවේ කපිතාන්වරයා, අයිතිකරු, නියෝජිතයා හෝ කුලියට දෙන්නා වෙත නිකුත් කරනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තිය උල්ලංඝනය කරන ගුවන් යානයක කපිතාන්වරයා, අයිතිකරු, නියෝජිතයා හෝ කුලියට දෙන්නා සහ (1) වන උපවගන්තියේ (ඉ) ඡේදය යටතේ ගුවන් යානයක් සෝදිසි කිරීමට අවහිර කරන හෝ ඊට බාධා කරන යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබන අතර, වරදකරු කරනු ලැබූ විට, එකී එක් එක් තැනැත්තා රුපියල් ලක්ෂයකට නොඅඩු වූ ද රුපියල් ලක්ෂ පහකට නොවැඩි වූ ද දඩයකට යටත් විය යුතු ය.

(4) (1) වන උපවගන්තියේ (ඊ) ඡේදය යටතේ ගුවන් යානයේ සිටින බවට වාර්තා කර නොමැති යම් තැනැත්තකු ගුවන් යානයේ සිටිය දී සොයා ගනු ලැබූ අවස්ථාවක, එකී ගුවන් යානයේ කපිතාන්වරයා, අයිතිකරු, නියෝජිතයා සහ කුලියට දෙන්නා වරදක් සිදු කරනු ලබන අතර, වරදකරු කරනු ලැබූ විට, එකී එක් එක් තැනැත්තා රුපියල් ලක්ෂයකට නොඅඩු වූ ද, රුපියල් ලක්ෂ පහකට නොවැඩි වූ ද දඩයකට යටත් විය යුතු ය.

(5) මේ වගන්තිය යටතේ වන යම් නඩු කටයුත්තක දී, (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ ලබා දෙන ලද ලැයිස්තුවේ තොරතුරුවල විස්තරයට අනුරූපී මුළු ගුවන් කාර්ය මණ්ඩල සාමාජිකයන් සංඛ්‍යාවක් ශ්‍රී ලංකාවට පැමිණෙන අවස්ථාවේ දී, එකී ගුවන් යානයේ රැගෙන එනු ලැබ ඇති බවට යම් ගුවන් යානයකට නැඟ එකී ගුවන් යානය පරීක්ෂා කළ ආගමන නිලධරයකු විසින් ලබා දෙන ලද ලිඛිත සහතිකය එකී ගුවන් යානය පැමිණෙන අවස්ථාවේ දී එකී ගුවන් කාර්ය මණ්ඩල සාමාජිකයන් සංඛ්‍යාව එකී ගුවන් යානයෙන් රැගෙන එනු ලැබ ඇති බවට වන තීරණාත්මක සාක්ෂියක් විය යුතු ය.

සේවක පිරිසේ සාමාජිකයන් සේවයෙන් පහ කිරීම පරිසීමා කිරීම

**86.** (1) ගුවන් යානයක හෝ යාත්‍රාවක සේවක පිරිසේ සාමාජිකයකු ශ්‍රී ලංකාවේ දී සේවයෙන් නිදහස් කිරීමට නැතහොත් ගෙවීමක් කර සේවයෙන් නිදහස් කිරීමට නියමිතව සිටින හෝ සේවයෙන් නිදහස් කරනු ලැබූ නැතහොත් ගෙවීමක් කර සේවයෙන් නිදහස් කරනු ලැබූ අවස්ථාවක, එකී ගුවන් යානයේ හෝ යාත්‍රාවේ කපිතාන්වරයා, නෞකාධිපතිවරයා, අයිතිකරු, කුලියට දෙන්නා හෝ නියෝජිතයා විසින් ඒ බව පාලක ජනරාල්වරයා වෙත දැනුම් දෙනු ලැබිය යුතු ය.

(2) සේවයෙන් නිදහස් කරනු ලැබූ හෝ ගෙවීමක් කර සේවයෙන් නිදහස් කරනු ලැබූ සේවක පිරිසේ කිසිම සාමාජිකයකු-

(අ) ඔහු ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන්නේ නම්; හෝ

(ආ) නියෝග මගින් නියම කරනු ලැබූ පරිදි ශ්‍රී ලංකාවට ඇතුළු වීම සඳහා වන වලංගු වීසා පත්‍රයක් ඔහු සන්තකයේ ඇත්නම්,

මිස, ශ්‍රී ලංකාවේ නතර කර යනු නොලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තිය උල්ලංඝනය කර ඇති යම් අවස්ථාවක, අදාළ තැනැත්තා සේවයේ නියුක්තව සිටි යාත්‍රාවේ හෝ ගුවන් යානයේ කපිතාන්වරයා, නෞකාධිපතිවරයා, අයිතිකරු, කුලියට දෙන්නා හෝ නියෝජිතයා ඒ තැනැත්තාගේ නඩත්තුව සඳහා සහ ඒ තැනැත්තා පෙරළා ඔහුගේ උපන් ස්ථානයට නැතහොත් පුරවැසිභාවය දරන ස්ථානයට හෝ කපිතාන්වරයා, නෞකාධිපතිවරයා, අයිතිකරු, කුලියට දෙන්නා හෝ නියෝජිතයා විසින් එසේ තෝරා ගනු ලබන්නේ නම්, පාලක ජනරාල්වරයා විසින් අනුමත කරනු ලැබිය හැකි වෙනත් යම් ස්ථානයකට යැවීමේ පිරිවැය සඳහා වගකිව යුතු ය.

නාවික පිරිසේ සාමාජිකයන්ට වෙරළ අවසර පත්‍ර නිකුත් කිරීම

**87.** (1) අනුමත තොටුපළක දී, ආගමන නිලධරයකු විසින්, එකී අනුමත තොටුපළේ දී යාත්‍රාවක නෞකාධිපතිවරයා, අයිතිකරු, කුලියට දෙන්නා හෝ නියෝජිතයා විසින් කරන ලද ලිඛිත ඉල්ලීමක් මත වෙරළට ඇතුළු වීම සඳහා යම් යාත්‍රාවක නාවික පිරිසේ සාමාජිකයකුට වෙරළ අවසර පත්‍රයක් නිකුත් කරනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින්, වෙරළ අවසර පත්‍රයක ආකාරය සහ ආකෘතිය සහ ඊට ඇතුළත් කළ යුතු තොරතුරු නියම කරනු ලැබිය හැකි ය.

(3) වෙරළ අවසර පත්‍රයක් නිකුත් කර ඇති නාවික පිරිසේ සාමාජිකයකු එකී වෙරළ අවසර පත්‍රයේ නිශ්චිතව දක්වා ඇති

ප්‍රදේශයට යාමට පමණක් අවසර ලැබිය යුතු අතර, වෙරළ අවසර පත්‍රයේ දැක්වෙන නිශ්චිතව දක්වා ඇති ප්‍රදේශයෙන් ඔබ්බට යාමට එකී නාවික පිරිසේ සාමාජිකයා අදහස් කරනු ලබන්නේ නම්, ඔහු විසින්, වලංගු වීසා පත්‍රයක් ලබා ගනු ලැබිය යුතු ය.

(4) නාවික පිරිසේ සාමාජිකයකුට නිකුත් කරන ලද වෙරළ අවසර පත්‍රයක්, එකී වෙරළ අවසර පත්‍රය නිකුත් කිරීම සඳහා වූ ඉල්ලීම කරන ලද යාත්‍රාවේ නෞකාධිපතිවරයාගේ, අයිතිකරුගේ, කුලියට දෙන්නාගේ හෝ නියෝජිතයාගේ වගකීම විය යුතු ය.

නෞකාධිපතිවරයා, කපිතාන්වරයා සහ අයිතිකරු වියදම් සඳහා වගකිව යුතු බව

88. (1) යම් තැනැත්තකු විසින්-

(අ) මේ පනතේ විධිවිධාන හෝ ඒ යටතේ සාදන ලද නියෝග උල්ලංඝනය කරමින්, යම් යාත්‍රාවකින් හෝ ගුවන් යානයකින් ශ්‍රී ලංකාවට ඇතුළු වනු ලබන අවස්ථාවක;

(ආ) 72 වන, 75 වන සහ 76 වන වගන්ති යටතේ ඔහු නැවත නංවා ගෙන ඇත්තේ හෝ ආපසු යවා ඇත්තේ යම් යාත්‍රාවකට ද, එම යාත්‍රාවෙන් බසිනු ලබන අවස්ථාවක; හෝ

(ඇ) 73 වන වගන්තිය යටතේ, යම් ගුවන් යානයකින් ශ්‍රී ලංකාවේ යම් අනුමත තොටුපළකට පැමිණි පසු ශ්‍රී ලංකාවෙන් පිටත් විය යුතු හෝ පිට වනු ලැබිය යුතු වන අවස්ථාවක,

එකී යාත්‍රාවේ හෝ ගුවන් යානයේ කපිතාන්වරයා, නෞකාධිපතිවරයා, අයිතිකරු, කුලියට දෙන්නා සහ නියෝජිතයා, එකී තැනැත්තා තබා ගැනීම, රඳවා තබා ගැනීම සහ නඩත්තු කිරීම සහ ඔහු ශ්‍රී ලංකාවෙන් ඉවත් කිරීම සඳහා රජය විසින් දරනු ලබන සියලු වියදම් සඳහා එක්ව හා වෙන් වෙන් වශයෙන් වගකිව යුතු ය.

(2) එකී වියදම් රජයට අය විය යුතු ණය මුදලක් ලෙස එකී යාත්‍රාවේ හෝ ගුවන් යානයේ කපිතාන්වරයාගෙන්, නෞකාධිපතිවරයාගෙන්, අයිතිකරුගෙන්, කුලියට දෙන්නාගෙන් හෝ නියෝජිතයාගෙන් එක්ව හා වෙන් වෙන් වශයෙන් අය කර ගනු ලැබිය යුතු ය.

නොමිලේ ගමන් කිරීමට අවස්ථාව ලබා දීමේ වගකීම

**89.** (1) මේ පනතේ විධිවිධානවලට හෝ නියෝගවලට පටහැනිව ශ්‍රී ලංකාවට ඇතුළුව ඇති යම් තැනැත්තකු සම්බන්ධයෙන් මේ පනතේ විධිවිධාන යටතේ රටින් ඉවත් කිරීමේ නියමයක් කරනු ලැබූ ද, එකී තැනැත්තා යාත්‍රාවකින් හෝ ගුවන් යානයකින් ශ්‍රී ලංකාවට රැගෙන එනු ලැබ ඇත්තා වූ ද අවස්ථාවක, පාලක ජනරාල්වරයා විසින් ලිඛිතව නියම කරනු ලබන්නේ නම්, එකී යාත්‍රාවේ නෞකාධිපතිවරයා හෝ එකී ගුවන් යානයේ කපිතාන්වරයා සහ එමෙන්ම, එකී අයිතිකරුවන්ට ම අයත් නැතහොත් එකී කුලියට දෙන්නන් විසින් ම කුලියට දෙනු ලැබූ යම් යාත්‍රාවක නෞකාධිපතිවරයා හෝ ගුවන් යානයක කපිතාන්වරයා විසින්, එකී තැනැත්තා ඔහුගේ යාත්‍රාවට හෝ ගුවන් යානයට නංවාගෙන, එකී තැනැත්තා විසින් ශ්‍රී ලංකාවට ඇතුළු වීම සඳහා යාත්‍රාවට ගොඩනඟින ලද තොටුපළ හෝ ස්ථානය දක්වා හෝ පාලක ජනරාල්වරයා විසින් නම් කරනු ලබන වෙනත් යම් තොටුපළක් හෝ ස්ථානයක් දක්වා එකී තැනැත්තාට නොමිලේ ගමන් කිරීමට අවස්ථාව ලබා දීම සහ මුහුදු ගමන හෝ ගුවන් ගමන අතරතුර ඔහුගේ නඩත්තුව සහ සුදුසු නවාතැන් ලබා දීම කරනු ලැබිය යුතු ය.

(2) ආගමන නිලධරකු විසින්, දැන්වීමක් මගින්, මේ කොටස හෝ IV වන කොටස අදාළ වන සහ පිටසනක් ලබා දීම ප්‍රතික්ෂේප වී ඇති හෝ මේ පනතේ විධිවිධාන උල්ලංඝනය කරමින් ශ්‍රී ලංකාවට ඇතුළු වන යම් තැනැත්තකු, එකී තැනැත්තා ශ්‍රී ලංකාවට ගමන් කරන ලද යාත්‍රාවේ නෞකාධිපතිවරයා හෝ ගුවන් යානයේ කපිතාන්වරයා හෝ එකී යාත්‍රාවේ හෝ ගුවන් යානයේ අයිතිකරු හෝ නියෝජිතයා විසින් ශ්‍රී ලංකාවේ සිට, එකී තැනැත්තා පුරවැසියකු වන හෝ එකී තැනැත්තා ශ්‍රී ලංකාවට යාම සඳහා යාත්‍රාවට හෝ ගුවන් යානයට නැගින ලද රටට රැගෙන යනු ලැබිය යුතු බවට විධාන කරනු ලැබිය හැකි ය. යාත්‍රාවේ නෞකාධිපතිවරයා හෝ ගුවන් යානයේ කපිතාන්වරයා විසින් එකී දැන්වීමට අනුකූලව කටයුතු කරනු ලැබිය යුතු ය.

(3) මේ වගන්තියේ විධිවිධානවලට අනුකූලව කටයුතු කිරීම පැහැර හරින, යාත්‍රාවක නෞකාධිපතිවරයකු හෝ ගුවන් යානයක කපිතාන්වරයකු වරදක් සිදු කරනු ලබන අතර, වරදකරු කරනු ලැබූ විට, එකී එක් එක් තැනැත්තා රුපියල් ලක්ෂ පහකට නොඅඩු වූ ද රුපියල් මිලියනයකට නොවැඩි වූ ද දඩයකට යටත් විය යුතු ය.

ස්වකීය ගමනේ දිගටම යෙදීමට අපොහොසත් වන තැනැත්තන් පිළිබඳ වාර්තා

**90.** (1) යම් යාත්‍රාවක හෝ ගුවන් යානයක යම් මාර්ගස්ථ මගියකු හෝ සේවක පිරිසේ යම් සාමාජිකයකු එකී යාත්‍රාවෙන් හෝ ගුවන් යානයෙන් ස්වකීය ගමනේ දිගට ම යෙදීමට අපොහොසත් වන්නා වූ ද, එකී මගියා හෝ සේවක පිරිසේ සාමාජිකයා ශ්‍රී ලංකාව තුළ රැඳී ඇති බව අවස්ථානුගත කරුණු අනුව සාධාරණ ලෙස නිගමනය කළ හැකි වූ ද අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, එකී යාත්‍රාවේ නෞකාධිපතිවරයා හෝ ගුවන් යානයේ කපිතාන්වරයා හෝ එකී යාත්‍රාවේ හෝ ගුවන් යානයේ නියෝජිතයා විසින්, එකී මගියා හෝ සේවක පිරිසේ සාමාජිකයා විසින් ස්වකීය ගමනේ දිගට ම යෙදීමට අපොහොසත් වීම පිළිබඳව ආගමන නිලධරයකුට දැනුම් දෙනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියට අනුකූලව කටයුතු කිරීම පැහැර හරින යාත්‍රාවක නෞකාධිපතිවරයකු හෝ ගුවන් යානයක කපිතාන්වරයකු හෝ යාත්‍රාවක හෝ ගුවන් යානයක නියෝජිතයකු වරදක් සිදු කරනු ලබන අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් ලක්ෂයකට නොඅඩු වූ ද, රුපියල් ලක්ෂ පහකට නොවැඩි වූ ද දඩයකට එක්ව හා වෙන් වෙන් වශයෙන් යටත් විය යුතු ය.

සෘජු මාර්ගස්ථ මගීන් විෂයයෙහිලා පාලනය සම්බන්ධයෙන් වන විධිවිධාන

**91.** (1) ශ්‍රී ලංකාවේ අනුමත තොටුපළකට පැමිණෙන සෑම සෘජු ගුවන් තීර හෝ මුහුදු තීර මාර්ගස්ථ මගියකු ම, මාර්ගස්ථ කාලසීමාව පැය අටක් නොඉක්මවන්නේ නම් හෝ අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන පරිදි, මේ කොටස, III වන කොටස හෝ IV වන කොටස යටතේ වීසා පත්‍රයක් හෝ පිටසනක් සතුවීමේ අවශ්‍යතාවයෙන් නිදහස් වන්නේ ය.

මේ වගන්තියේ කාර්ය සඳහා-

"සෘජු ගුවන් තීර මාර්ගස්ථ මගියා" යන්නෙන්, එක් ගුවන් ටිකට් පතක් හෝ මාර්ග පත්‍රයක් යටතේ, නැවතීමකින් තොරව, එම ගුවන් යානයෙන් ම හෝ එම ගුවන් සේවා නාමයෙන් ම සහ ගුවන් ගමන් අංකයෙන් ම හඳුනා ගනු ලබන වෙනත් ගුවන් යානයකින් කරනු ලබන අඛණ්ඩ ගමනක කොටසක් ලෙස අදාළ ස්ථානයට පැමිණෙන හෝ ඉන් පිට වන (අදාළ ස්ථානයෙන් මාරු වන) මගියකු අදහස් වේ; සහ

"සෘජු මුහුදු තීර මාර්ගස්ථ මගියා" යන්නෙන්, එක් නෞකා ටිකට්පතක් හෝ මාර්ග පත්‍රයක් යටතේ, නැවතීමකින්

තොරව, එම වරායේ ම හෝ එම නෞකා සේවා නාමයෙන් ම සහ යාත්‍රා අංකයෙන් ම හඳුනා ගනු ලබන වෙනත් වරායක අඛණ්ඩ ගමනක කොටසක් ලෙස අදාළ ස්ථානයට පැමිණෙන හෝ ඉන් පිට වන (අදාළ ස්ථානයෙන් මාරු වන) මගියකු අදහස් වේ.

(2) සෑම ඍජු ගුවන් තීර හෝ මුහුදු තීර මාර්ගස්ථ මගියකු සතුව ම ගමන් ලේඛනයක්, ගුවන් ටිකට්පතක් සහ අවසාන ගමනාන්තය ලෙස අපේක්ෂිත රටෙන් හෝ මාර්ගස්ථ යම් රටකින් එකී වීසා පත්‍රය හෝ මාර්ගස්ථ වීසා පත්‍රය ඉල්ලා සිටිනු ලබන්නේ නම්, අවස්ථාවෝචිත පරිදි, වලංගු වීසා පත්‍රයක් හෝ මාර්ගස්ථ වීසා පත්‍රයක් තිබිය යුතු ය.

(3) ඍජු ගුවන් තීර හෝ මුහුදු තීර මාර්ගස්ථ මගීන් විසින්, ඇතුළු වීමේ පිරිසැකසුම් කිරීමකට භාජනය වීමෙන් තොරව මාර්ගස්ථ ප්‍රදේශයෙන් පිටව යනු නොලැබිය යුතු ය.

(4) ඍජු ගුවන් තීර හෝ මුහුදු තීර මාර්ගස්ථ මගීන්, අවශ්‍ය විට දී, ආගමන නිලධරයන් විසින් පරීක්ෂා කිරීමට යටත් විය යුතු ය.

(5) ඇතැම් අවස්ථානුගත කරුණු යටතේ ඍජු ගුවන් තීර හෝ මුහුදු තීර මාර්ගස්ථ මගියකු රටින් ඉවත් කිරීමට අවශ්‍ය වන්නේ නම්, එකී වගකීම සහ වියදම් එකී තැනැත්තා රටට ගෙන ආ ගුවන් යානයේ කපිතාන්වරයා හෝ යාත්‍රාවේ නෞකාධිපතිවරයා විසින් දරනු ලැබිය යුතු ය.

**යාත්‍රාවක් හෝ ගුවන් යානයක් රඳවා තබා ගැනීමේ බලය**

**92.** (1) පාලක ජනරාල්වරයා විසින්, ස්වකීය අත්සන යටතේ වූ ලියවිල්ලක් මගින්, මේ පනත යටතේ වරදක් සිදු කර ඇති බවට හෝ සිදු කිරීමට ආසන්න බවට සාධාරණ ලෙස විශ්වාස කළ හැක්කේ යම් යාත්‍රාවක් හෝ ගුවන් යානයක් සම්බන්ධයෙන් ද, එවැනි යාත්‍රාවක් රඳවා තබා ගැනීම සඳහා වෙළෙඳ නැව් අධ්‍යක්ෂවරයාට ද, එවැනි ගුවන් යානයක් රඳවා තබා ගැනීම සඳහා සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාට ද බලය දෙනු ලැබිය හැකි අතර, ඉන්පසුව, එකී යාත්‍රාව හෝ ගුවන් යානය එය සොයාගනු ලැබූ ස්ථානයේ හෝ එය රැගෙන එනු ලැබිය යුතු බවට පාලක ජනරාල්වරයා විසින් නියම කරනු ලැබිය හැකි යම් ස්ථානයක රඳවා තබා ගනු ලැබිය හැකි ය.

(2) පාලක ජනරාල්වරයා විසින්, යාත්‍රාවේ හෝ ගුවන් යානයේ කපිතාන්වරයාට, නෞකාධිපතිවරයාට, අයිතිකරුට, කුලියට දෙන්නාට හෝ නියෝජිතයාට එකී යාත්‍රාව හෝ ගුවන් යානය රඳවා තබා ගැනීම සම්බන්ධයෙන් දැන්වීමක් ලබා දෙනු ලැබිය යුතු ය.

(3) යාත්‍රාව හෝ ගුවන් යානය රඳවා තබා ගැනීමේ සහ ඒ සම්බන්ධයෙන් වෙනත් නීත්‍යානුකූල ලෙස කටයුතු කිරීමේ කාර්යය සඳහා, වෙළෙඳ නැව් අධ්‍යක්ෂවරයා හෝ සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාට සේවක පිරිස පෙරෙට්ටු කිරීමේ බලය තිබිය යුතු අතර, එසේ කිරීමට අවශ්‍ය යයි ඔහු විසින් සලකනු ලබන්නේ නම්, ඔහු විසින්, යාත්‍රාවට හෝ ගුවන් යානයට පොලිස් ආරක්ෂාවක් යොදවනු ලැබිය හැකි ය.

(4) රඳවා තබා ගැනීම සුරක්ෂිත භාරය සඳහා පමණක් විය යුතු අතර, මේ පනත යටතේ යම් වරදක් හෝ ඒ යටතේ වන පැහැර හැරීමක් සම්බන්ධයෙන් දරන ලද යම් දඩයක්, ගාස්තු, වියදම් හෝ අය කිරීම් ගෙවීම සඳහා යාත්‍රාවේ හෝ ගුවන් යානයේ කපිතාන්වරයා, නෞකාධිපතිවරයා, අයිතිකරු, කුලියට දෙන්නා හෝ නියෝජිතයා විසින් පාලක ජනරාල්වරයා සෑහීමට පත් වන පරිදි ප්‍රමාණවත් ඇපකරුවන් දෙදෙනෙකු සමඟ ඇපයක් ලබා දෙනු ලැබූ විට, එකී රඳවා තබා ගැනීම අවසන් විය යුතු ය.

(5) එවැනි යම් දඩයක්, ගාස්තු, වියදම් හෝ අය කිරීම් ගෙවීම පැහැර හරිනු ලැබූ අවස්ථාවක, වෙළෙඳ නැව් අධ්‍යක්ෂවරයා හෝ සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, යාත්‍රාව හෝ ගුවන් යානය තහනමට ගනු ලැබිය හැකි අතර, නීතිපතිවරයා විසින්, කරන ලද ඉල්ලීමක් මත නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් කරනු ලබන ආඥාවක් මගින් එකී යාත්‍රාව හෝ ගුවන් යානය රජය සතු කරනු ලැබූ ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු ය.

(6) එසේ රජය සතු කරන ලද යම් යාත්‍රාවක් හෝ ගුවන් යානයක් සියලු බැඳීම්වලින් නිදහස්ව විකුණනු ලැබිය යුතු ය.

(7) හිමිකම්පෑම්වල ප්‍රමුඛතාවට අදාළ යම් නීතියක කුමක් සඳහන් වුව ද, මේ වගන්තිය යටතේ යාත්‍රාවක් හෝ ගුවන් යානයක් විකිණීමෙන් ලත් ප්‍රතිෂ්ඨා මුදල් පළමුවෙන් ම මේ පනත යටතේ දරන ලද යම් දඩයක්, ගාස්තු, වියදම් හෝ අය කිරීම් සහ එකී විකිණීම සහ ඊට අදාළ නඩු කටයුතු සඳහා සහ ඒ සම්බන්ධයෙන් දරන ලද වියදම් ගෙවීම සඳහා යොදවනු ලැබිය යුතු අතර, ඉතිරි

මුදල යාත්‍රාවේ හෝ ගුවන් යානයේ අයිතිකරුට හෝ එකී ප්‍රතිෂ්ඨා මුදල් සඳහා නීත්‍යානුකූල ලෙස හිමිකම් ලබන වෙනත් තැනැත්තකුට ගෙවනු ලැබිය යුතු ය.

(8) (අ) 1983 අංක 40 දරන අද්මිරාල්ති අධිකරණ බලය පනතේ 2 වන වගන්තිය මේ පනත යටතේ යාත්‍රාවක අයිතිකරු විසින් දරනු ලබන වගකීමක් සම්බන්ධයෙන් වන යම් හිමිකම්පෑමක් සඳහා ව්‍යාප්ත වන ලෙස තේරුම් ගනු ලැබිය යුතු ය.

(ආ) 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 101 වන වගන්තිය මේ පනත යටතේ ගුවන් යානයක අයිතිකරු විසින් දරනු ලබන වගකීමක් සම්බන්ධයෙන් වන යම් හිමිකම්පෑමක් සඳහා ව්‍යාප්ත වන ලෙස තේරුම් ගනු ලැබිය යුතු ය.

ටොන් දෙසියයට අඩු යාත්‍රා තහනමට ගැනීමේ, රඳවා තබා ගැනීමේ සහ රජය සතු කිරීමේ බලය

**93.** (1) මේ පනත හෝ නියෝග යටතේ යම් වරදක් සිදු කිරීම සඳහා භාවිත කරන ලද බවට හෝ භාවිත කර ඇති බවට හෝ භාවිත කිරීමට සූදානම් බවට සැක කිරීම සඳහා සාධාරණ හේතුවක් ඇති ටොන් දෙසියයට අඩු යම් යාත්‍රාවක්-

(අ) පාලක ජනරාල්වරයා හෝ මේ පනතේ 4 වන වගන්තිය යටතේ පත් කරන ලද්දා වූ ද, පාලක ජනරාල්වරයා විසින් ස්වකීය අත්සන යටතේ වූ ලියවිල්ලක් මගින් තත්කාර්ය සඳහා බලය දෙන ලද්දා වූ ද, යම් නිලධරයකු විසින්; හෝ

(ආ) කුමන හෝ නිලයක් දරන පොලිස් නිලධරයකු හෝ කෝපරල්වරයකුගේ හෝ ප්‍රධාන නාවිකයකුගේ නිලයට නොඅඩු නිලයක් දරන බලයලත් හමුදා සාමාජිකයකු හෝ වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ වෙරළ ආරක්ෂක නිලධරයකු,

විසින් ශ්‍රී ලංකා භූමියේ හෝ දේශීය ජල තීරයේ යම් ස්ථානයක දී තහනමට ගෙන රඳවා තබා ගනු ලැබිය හැකි අතර, එකී සියලු තහනමට ගැනීම් පාලක ජනරාල්වරයා වෙත දැනුම් දෙනු ලැබිය යුතු ය.

(2) තහනමට ගන්නා නිලධරයා විසින් වහාම, තහනමට ගැනීම සහ ඒ සඳහා වූ හේතු පිළිබඳ ලිඛිත දැන්වීමක් එසේ තහනමට ගනු ලැබූ හෝ රඳවා තබා ගනු ලැබූ යාත්‍රාවේ අයිතිකරු, කුලියට

දෙන්නා හෝ නියෝජිතයාට ලබා දෙනු ලැබිය යුතු අතර, ඒ දැන්වීම ලබා දීම ඔහුට එය පෞද්ගලිකව ම භාර දීම මගින් හෝ ඔහුගේ කාර්යාලය හෝ පදිංචි ස්ථානය දන්නේ නම්, එම ස්ථානයට එය තැපැල් මාර්ගයෙන් යැවීම මගින් කරනු ලැබිය යුතු ය.

(3) අවස්ථාවෝචිත පරිදි, වරදකරු හෝ අයිතිකරු හෝ ඔහුගේ නියෝජිතයා ඉදිරිපිට හෝ ඔවුන්ගේ දැනීම ඇතිව තහනමට ගැනීම හෝ රඳවා තබා ගැනීම සිදු කර ඇති අවස්ථාවක, (2) වන උපවගන්තිය යටතේ වන දැන්වීම ලබා දීමට අවශ්‍ය නොවන්නේ ය.

(4) (1) වන උපවගන්තිය යටතේ තහනමට ගැනීමට හෝ රඳවා තබා ගැනීමට යටත් යම් යාත්‍රාවක් රජය සතු කිරීමට යටත් විය යුතු ය.

(5) මේ වගන්තිය යටතේ රජය සතු කිරීමට යටත් යම් යාත්‍රාවක් රජය සතු කිරීම සඳහා හෝ නිදහස් කිරීම සඳහා වන ආඥාවක් කිරීම ඒ සම්බන්ධයෙන් වන අපරාධ නඩු කටයුතු පවත්වනු ලබන්නේ යම් අධිකරණය ඉදිරියෙහි ද, එම අධිකරණය විසින් කරනු ලැබිය යුතු ය.

(6) නීතිපතිවරයා විසින් ඉල්ලීමක් කිරීමෙන් පසු, මේ පනත හෝ නියෝග යටතේ වරදක් සිදු කර ඇති බව ද, එකී වරද සිදු කිරීම සඳහා යාත්‍රාව භාවිත කරනු ලැබ ඇති බව ද අධිකරණය සෑහීමට පත් වන පරිදි ඔප්පු කරනු ලබන්නේ නම්, කිසිම තැනැත්තකු එකී වරද සම්බන්ධයෙන් චෝදනා ලැබ හෝ වරදකරු කරනු ලැබ නොමැති වුව ද, අධිකරණය විසින්, එකී යාත්‍රාව රජය සතු කිරීම සඳහා ආඥාවක් කරනු ලැබිය යුතු ය.

## VI වන කොටස

## ශ්‍රී ලංකාවේ පුරවැසියන් නොවන තැනැත්තන්ගේ ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීම

VI වන කොටස අදාළ වීම

**94.** මේ කොටස-

(අ) ඔහු ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන්නේ නම්; හෝ

(ආ) I වන කොටස යටතේ කරන ලද තත්කාලයේ බලපවත්නා යම් නියමයක් ප්‍රකාර මේ කොටසේ විධිවිධානවලින් ඔහු නිදහස් කර ඇත්නම්,

මිස, සෑම තැනැත්තකුට ම අදාළ විය යුතු ය.

**ස්වේච්ඡාවෙන් පිට වීම**

**95.** (1) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන්නා වූ ද, ඔහුට නිකුත් කර ඇති වීසා පත්‍රයෙන් අවසර දී ඇති කාලසීමාව ඉක්මවා ඇත්තා වූ ද යම් තැනැත්තකු විසින්, වහාම ස්වේච්ඡාවෙන් පිට වීම සඳහා පාලක ජනරාල්වරයා හෝ ආගමන නිලධරයකු ඉදිරියෙහි ස්වේච්ඡාවෙන් පෙනී සිටිනු ලැබිය හැකි ය.

(2) මේ පනත යටතේ යම් දඩයක් වෙතොත්, එම දඩය හෝ නියෝග මගින් අමාත්‍යවරයා විසින්, කලින් කල, නියම කරනු ලබන දඩ ගෙවීමට (1) වන උපවගන්තියේ සඳහන් තැනැත්තන් යටත් විය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ සඳහන් තැනැත්තා විසින් දඩය ගෙවීමෙන් පසු, පාලක ජනරාල්වරයා විසින් නිශ්චය කර දක්වනු ලබන යම් කාලසීමාවක් අවසන් වීමට පෙර ශ්‍රී ලංකාවෙන් පිට වන ලෙස පාලක ජනරාල්වරයා විසින් ඔහුට නියම කරනු ලැබිය හැකි ය.

(4) (1) වන උපවගන්තියේ සඳහන් තැනැත්තා විසින් දඩය ගෙවීම පැහැර හරිනු ලැබූ අවස්ථාවක, පාලක ජනරාල්වරයා විසින්, එකී තැනැත්තා රටින් ඉවත් කිරීම සඳහා ක්‍රියාමාර්ග ගෙන, දඩය ගෙවනු ලබන දිනය තෙක් ඔහු ශ්‍රී ලංකාවට ඇතුළු වීමට එරෙහිව සංචරණ තහනමක් පනවනු ලැබිය යුතු ය.

(5) මේ වගන්තිය යටතේ ස්වේච්ඡාවෙන් පිට වන යම් තැනනැත්කු 124 වන වගන්තිය යටතේ වරදකට යටත් නොවිය යුතු ය.

**නියමයක් මගින් තැනැත්තන් සම්බන්ධයෙන් පරිසීමා පැනවීමේ බලය**

**96.** (1) මහජන යහපත සඳහා එය යෝග්‍ය යයි ඔහු විසින් සලකනු ලබන්නේ නම්, අමාත්‍යවරයා විසින්, නියමයක් මගින්, ඔවුන් ශ්‍රී ලංකාව තුළ රැඳී සිටින කාලය තුළ ගමන් සහ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් පරිසීමා මේ කොටස අයත් වන තැනැත්තන්

සම්බන්ධයෙන් පනවනු ලැබිය හැකි අතර, එකී නියමයෙහි පහත දැක්වෙන කරුණු සියල්ල හෝ ඉන් කිසිවක් සම්බන්ධයෙන් විධිවිධාන සලස්වනු ලැබිය හැකි යඃ-

(අ) එකී තැනැත්තන් විසින් ආගමන නිලධරයන්ට වාර්තා ලබා දීමට අවශ්‍ය කරනු ලැබිය හැකි අවස්ථානුගත කරුණු සහ එහි පරමාර්ථය, එකී වාර්තාවල ආකෘතිය සහ එහි ඇතුළත් කළ යුතු විස්තර;

(ආ) එකී තැනැත්තන් විසින් නියමය යටතේ ලබා දෙන ලද වාර්තාවල නිශ්චිතව දක්වා ඇති විස්තරවල නිරවද්‍යතාවට යම් ආකාරයකින් බලපාන්නා වූ අවස්ථානුගත කරුණු උද්ගත වීම සම්බන්ධයෙන් සැපයිය යුතු තොරතුරු;

(ඇ) නියමය මගින් පදිංචි ස්ථානය, පදිංචි ස්ථානය වෙනස් වීම, සංචරණය සම්බන්ධයෙන් හෝ අන්‍යාකාරයකින් සලස්වනු ලැබිය හැකි විධිවිධානවලට අනුකූලව එකී තැනැත්තන් විසින් කටයුතු කිරීම;

(ඈ) එකී තැනැත්තන්ගේ ක්‍රියාකාරකම් හෝ සමාගමයන් සම්බන්ධයෙන් මහජන යහපත සඳහා අවශ්‍ය යයි අමාත්‍යවරයා විසින් සලකනු ලැබිය හැකි බැඳීම්, නියමයන්, කොන්දේසි හෝ පරිසීමා පැනවීම;

(ඉ) ආගමන නිලධරයන් විසින් තබා ගත යුතු ලේඛනවල ආකෘතිය සහ එහි ඇතුළත් කළ යුතු විස්තර;

(ඊ) ආගමන නිලධරයන් සහ පොලිස් නිලධරයන් විසින් එකී තැනැත්තකු සම්බන්ධයෙන් සිරභාරයට ගැනීමේ, රඳවා තබා ගැනීමේ, පරිශ්‍ර හෝ තැනැත්තන් සෝදිසි කිරීමේ බලය ක්‍රියාත්මක කළ හැකි අවස්ථානුගත කරුණු සහ නියමය සම්පූර්ණ වශයෙන් බලාත්මක කිරීමේ අරමුණ ඇතිව විධිවිධාන සැලැස්වීම සඳහා යෝග්‍ය යයි පෙනී යන වෙනත් ආනුෂංගික කරුණු; සහ

(උ) මේ උපවගන්තියේ සඳහන් කරුණුවලට සහ විෂයයන්ට ආනුෂංගික හෝ සම්බන්ධ සියලු කරුණු.

(2) මේ වගන්තිය යටතේ වන නියමයක් යම් තැනැත්තකු හෝ තැනැත්තන් කණ්ඩායමක් සම්බන්ධයෙන් වන විශේෂ නියමයක්

විය හැකි ය; නැතහොත් යම් තැනැත්තන් පන්තියකට හෝ විස්තරයකට අදාළ වන සාමාන්‍ය නියමයක් විය හැකි ය.

ආගමන නිලධරයන් විසින් තබා ගත යුතු ලේඛන

**97.** (1) සෑම ආගමන නිලධරයකු විසින් ම, මේ පනතේ කාර්යය සඳහා මේ කොටස අදාළ වන තැනැත්තන් පිළිබඳ ලේඛනයක් පවත්වාගෙන යනු ලැබිය යුතු ය. එකී නිලධරයා විසින්, 96 වන වගන්තිය යටතේ කරන ලද නියමයක් මගින් එකී නිලධරයා වෙත වාර්තාවක් ලබා දිය යුතු යයි නියම කර ඇති සෑම තැනැත්තකුට ම අදාළව, එකී තැනැත්තා සම්බන්ධයෙන් එකී ලේඛනයට ඇතුළත් කළ යුතු යයි නියමිත විස්තර එකී ලේඛනයට ඇතුළත් කරනු ලැබිය යුතු ය.

(2) මේ කොටස අදාළ වන යම් තැනැත්තකු විසින්, කලින් එකී නිලධරයා වෙත ලබා දෙන ලද විස්තරවල නිරවද්‍යතාවට යම් ආකාරයකින් බලපෑමක් ඇති වන අවස්ථානුගත කරුණු උද්ගත වීම සම්බන්ධයෙන් ඔහු වෙත දැක් වූ පසු, ඉහත කී ආගමන නිලධරයා විසින් එම තැනැත්තා සම්බන්ධයෙන් ලේඛනයේ ඇති සටහන්වලට ලේඛනයේ නිරවද්‍යතාව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය විය හැකි පරිදි වූ වෙනස් කිරීම් කරනු ලැබිය හැකි ය.

ශ්‍රී ලංකාවේ පුරවැසියන් හැර තැනැත්තන් ශ්‍රී ලංකාවෙන් ඉවත් කිරීමට විධාන කිරීම සඳහා අමාත්‍යවරයා සතු බලය

**98.** (1) මේ කොටස අදාළ වන තැනැත්තකු-

(අ) ඔහු මේ පනතේ III වන, IV වන හෝ V වන කොටසක යම් විධිවිධානයක් හෝ එකී යම් කොටසක් යටතේ සාදනු ලබන යම් නියෝගයක් උල්ලංඝනය කරමින් ශ්‍රී ලංකාවට ඇතුළු වී තිබීම හෝ ශ්‍රී ලංකාව තුළ රැඳී සිට තිබීම; හෝ

(ආ) ඔහු වෙත ප්‍රදානය කරන ලද යම් පිටසනක් හෝ ඔහු වෙත නිකුත් කරන ලද වීසා පත්‍රයක් මගින් ඔහු වෙත පනවන ලද නියම, කොන්දේසි හෝ පරිසීමා කිසිවකට අනුකූලව කටයුතු කිරීම ඔහු විසින් පැහැර හැර තිබීම; හෝ

(ඇ) VI වන කොටස යටතේ කරන ලද නියමයක් මගින් ඔහු වෙත පනවන ලද නියම, කොන්දේසි හෝ පරිසීමා කිසිවකට අනුකූලව කටයුතු කිරීම ඔහු විසින් පැහැර හැර තිබීම,

හේතුවෙන් මේ පනත යටතේ වරදකට වරදකරු කරනු ලැබූ අවස්ථාවක, අමාත්‍යවරයා විසින්, රටින් ඉවත් කිරීමේ නියමයක් මගින්, එසේ වරදකරු කරනු ලැබූ තැනැත්තා සිරභාරයට ගන්නා ලෙස, රඳවා තබා ගන්නා ලෙස සහ ගුවන් යානයකට හෝ යාත්‍රාවකට රැගෙන යන ලෙස නියමිත නිලධරයකුට විධාන කරනු ලැබිය හැකි ය. තව ද, ඒ නියමය මගින් හෝ පසුව කරනු ලබන යම් නියමයක් මගින්, එකී තැනැත්තා ශ්‍රී ලංකාවෙන් ඉවත් කළ යුතු යයි ඒ ගුවන් යානයේ කපිතාන්වරයාට හෝ ඒ යාත්‍රාවේ නෞකාධිපතිවරයාට වැඩිදුරටත් විධාන කරනු ලැබිය හැකි ය.

(2) මේ කොටස අදාළ වන තැනැත්තකු-

(අ) මේ පනතේ III වන, IV වන හෝ V වන කොටසක යම් විධිවිධානයක් හෝ එකී යම් කොටසක් යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ 96 වන වගන්තිය යටතේ කරන ලද යම් නියෝගයක් මගින් එම තැනැත්තා වෙත පනවන ලද යම් පරිසීමාවක් උල්ලංඝනය කරමින් ශ්‍රී ලංකාවට ඇතුළු වූ බවට හෝ ශ්‍රී ලංකාව තුළ රැඳී සිටින බවට; හෝ

(ආ) ඔහුගේ වීසා පත්‍රය හෝ පිටසන අවලංගු වී ඇති බවට; හෝ

(ඇ) වීසා පත්‍රයේ හෝ පිටසනේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාව ඉක්මවා ශ්‍රී ලංකාව තුළ රැඳී සිට ඇති බවට,

අමාත්‍යවරයා සෑහීමට පත් වූ අවස්ථාවක, අමාත්‍යවරයා විසින්, නියමයක් මගින්, එකී තැනැත්තා සිරභාරයට ගන්නා ලෙස, රඳවා තබා ගන්නා ලෙස සහ ගුවන් යානයකට හෝ යාත්‍රාවකට රැගෙන යන ලෙස සහ අවශ්‍ය විට දී රැකවල් යොදා රැගෙන යන ලෙස නියමිත නිලධරයකුට විධාන කරනු ලැබිය හැකි ය. තව ද, ඒ නියමය මගින් හෝ පසුව කරනු ලබන නියමයක් මගින්, එකී තැනැත්තා ශ්‍රී ලංකාවෙන් ඉවත් කළ යුතු යයි ඒ ගුවන් යානයේ කපිතාන්වරයාට හෝ ඒ යාත්‍රාවේ නෞකාධිපතිවරයාට වැඩිදුරටත් විධාන කරනු ලැබිය හැකි ය.

(3) පාලක ජනරාල්වරයා විසින්, ස්වකීය මෙහෙයවීමෙන් ම හෝ අමාත්‍යවරයාගේ විධානය මත හෝ (2) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති කරුණු සම්බන්ධයෙන් විමර්ශනය කර

අමාත්‍යවරයාට ඒ සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(4) අමාත්‍යවරයා විසින්, මේ වගන්තිය යටතේ නියමයක් කරනු ලැබිය හැකි අතර, යම් තැනැත්තකු මේ පනත හෝ වෙනත් යම් නීතියක් යටතේ අධිකරණයක් විසින් පනවන ලද බන්ධනාගාරගත කිරීමේ දඬුවමක් විඳිමින් සිටිය ද, එය නොතකා, එකී නියමය මගින් පිරිනමන ලද බලතල එකී තැනැත්තා සම්බන්ධයෙන් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.

(5) යම් සාම නිලධරයකු විසින්, මේ වගන්තිය යටතේ කරන ලද යම් නියමයක් බලාත්මක කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි සියලු බලය යොදනු ලැබිය හැකි ය.

(6) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126 වන සහ 140 වන ව්‍යවස්ථාවලට යටත්ව, මේ වගන්තිය යටතේ කරන ලද යම් නියමයක් අවසානාත්මක විය යුතු අතර, ශ්‍රී ලංකාවේ කිසිම අධිකරණයක දී එය අභියෝගයට ලක් කරනු නොලැබිය යුතු ය.

(7) (අ) මේ වගන්තිය යටතේ වන නියමයක් මගින් ඒ නියමයේ නිශ්චිතව දක්වා ඇති තැනැත්තකු ශ්‍රී ලංකාවෙන් ඉවත් කරන ලෙස ගුවන් යානයක කපිතාන්වරයකුට හෝ යාත්‍රාවක නෞකාධිපතිවරයකුට විධාන කර ඇත්තා වූ ද, ඒ කපිතාන්වරයා හෝ නෞකාධිපතිවරයා විසින් එසේ කිරීම පැහැර හැර ඇත්තා වූ ද අවස්ථාවක, ඔහු මේ පනත යටතේ වරදක් සිදු කරනු ලබන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් ලක්ෂ පහකට නොඅඩු වූ ද රුපියල් මිලියනයකට නොවැඩි වූ ද දඩයකට යටත් විය යුතු ය.

(ආ) එකී වරද සඳහා ගුවන් යානයේ කපිතාන්වරයාට හෝ යාත්‍රාවේ නෞකාධිපතිවරයාට පනවන ලද දඬුවම දඩයකින් සමන්විත වන්නා වූ ද, නැතහොත් එම දඬුවමට දඩයක් ඇතුළත් වන්නා වූ ද, එකී මුළු දඩය ම හෝ ඉන් කොටසක් ඒ දඩය පැන වූ දින සිට දින හතක් ඇතුළත නොගෙවා ඉතිරිව පවතින්නා වූ ද අවස්ථාවක, ඒ දඩය පනවනු ලැබූ අධිකරණය විසින්, එකී නොගෙවා ඉතිරිව පවතින මුදල ගුවන් යානය හෝ යාත්‍රාව ප්‍රතිග්‍රහණය කර විකිණීම මගින් අය කර ගන්නා ලෙස විධාන කරනු ලැබිය හැකි ය.

(8) ගුවන් යානයක කපිතාන්වරයකුට හෝ යාත්‍රාවක නෞකාධිපතිවරයකුට විරුද්ධව (7) වන උපවගන්තිය යටතේ වරදක් සඳහා යම් අධිකරණයක නඩු පවරා ඇති අවස්ථාවක, එකී නඩු කටයුත්ත අවසන් වන තෙක් හෝ අධිකරණය විසින් පනවන ලද යම් දඩයක් වෙතොත්, එම දඩය ගෙවනු ලබන තෙක් හෝ යාත්‍රාවට හෝ ගුවන් යානයට පිට වීමේ අවසරය නිෂ්කාශනය කිරීම, ප්‍රතික්ෂේප කරන ලෙස අධිකරණය විසින් අදාළ බලධරයන්ට ආඥා කරනු ලැබිය හැකි ය.

(9) අමාත්‍යවරයා විසින්, මේ වගන්තිය යටතේ රටින් ඉවත් කරන ලද තැනැත්තකුට විරුද්ධව ශ්‍රී ලංකාවට ඇතුළු වීම සම්බන්ධයෙන් වූ සීමාසහිත හෝ ස්ථිර සංචරණ තහනමක් පනවනු ලැබිය හැකි ය.

ශ්‍රී ලංකාවේ පුරවැසියන් හැර, තැනැත්තන් ශ්‍රී ලංකාවෙන් පිට කිරීම සඳහා අමාත්‍යවරයා සතු බලය

**99.** (1) අමාත්‍යවරයා විසින්, පාලක ජනරාල්වරයාගේ නිර්දේශය මත, පහත දැක්වෙන අවස්ථානුගත කරුණු කිසිවක දී, මේ කොටස අදාළ වන යම් තැනැත්තකුට ශ්‍රී ලංකාවෙන් පිට වන ලෙස සහ ඉන්පසුව ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටින ලෙස නියම කරමින් මේ පනතේ "රටින් පිට කිරීමේ නියමය" යනුවෙන් සඳහන් කරනු ලබන නියමයක් කරනු ලැබිය හැකි ය-

(අ) අමාත්‍යවරයා විසින්, ප්‍රමාණවත් යයි සලකනු ලැබිය හැකි සාක්ෂි මගින්, ඒ තැනැත්තා:-

(i) තමා සහ තම යැපෙන්නන් නඩත්තු කිරීමට නොහැකි තැනැත්තකු බව;

(ii) තමාට සහ අන්‍යයන්ට අනතුරුදායක වන සිහිවිකල් තැනැත්තකු බව;

(iii) වෛශ්‍යා වෘත්තියේ යෙදීම සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබ ඇති බව හෝ කුට්ටනකරුවකු වන බව හෝ වෛශ්‍යා වෘත්තියේ යෙදෙන අනෙකුන් මත තම ජීවිකාව ගෙන යන තැනැත්තකු බව; හෝ

(iv) වෛද්‍ය හේතු මත ශ්‍රී ලංකාව තුළ රැඳී සිටීමට අවසර ලබා දීම සඳහා නුසුදුසු තැනැත්තකු බව,

පෙන්නුම් කරන අවස්ථාවක;

(ආ) යම් අපරාධ වරදකට, විශේෂයෙන් ම, අන්තරායදායක ඖෂධ, මාදක ඖෂධ හෝ මනෝ වර්තක, ළමා අපචාර, මිනිස් අවහරණය, මිනිසුන් වෙළෙඳාම් කිරීම හෝ ත්‍රස්තවාදයට අදාළ වැරදි සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ දී හෝ වෙනත් යම් රටක දී වරදකරු කරනු ලැබ ඇත්තා වූ ද, බන්ධනාගාරගත කිරීමේ දඬුවමක් පනවා ඇති යම් වරදක් සඳහා පූර්ණ සමාවක් ලැබී නොමැත්තා වූ ද, ඒ හා සම්බන්ධ අවස්ථානුගත කරුණු හේතුවෙන් ඒ තැනැත්තා ශ්‍රී ලංකාව තුළ රැඳී සිටීමට අවසර ලබා දීම සඳහා නුසුදුසු තැනැත්තකු බවට අමාත්‍යවරයා විසින් සලකනු ලබන්නා වූ ද අවස්ථාවක;

(ඇ) ශ්‍රී ලංකාවෙහි බලපැවැත්වෙනු ලැබූ හෝ බලපවත්නා උද්ර්පණයට අදාළ යම් නීතියක අර්ථානුකූලව උද්ර්පණීය වරදක් සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත දී ඒ තැනැත්තාට දඬුවම් පමුණුවනු ලැබ ඇති අවස්ථාවක; හෝ

(ඈ) ඒ තැනැත්තාට එරෙහිව රටින් පිට කිරීමේ නියමයක් කිරීම මහජන යහපතට හිතකර බවට අමාත්‍යවරයා විසින් සලකනු ලබන අවස්ථාවක.

(2) අමාත්‍යවරයා විසින්, රටින් පිට කිරීමේ නියමයක් මගින් එසේ වරදකරු කරනු ලැබූ තැනැත්තා සිරභාරයට ගන්නා ලෙස රඳවා තබා ගන්නා ලෙස සහ ගුවන් යානයකට හෝ යාත්‍රාවකට රැගෙන යන ලෙස සහ අවශ්‍ය විට දී රැකවල් යොදා රැගෙන යන ලෙස නියමිත නිලධරයකුට විධාන කරනු ලැබිය හැකි ය. තව ද, ඒ නියමය මගින් හෝ පසුව කරනු ලබන නියමයක් මගින්, එකී තැනැත්තා ශ්‍රී ලංකාවෙන් පිට කළ යුතු යයි ඒ ගුවන් යානයේ කපිතාන්වරයාට හෝ ඒ යාත්‍රාවේ නෞකාධිපතිවරයාට වැඩිදුරටත් විධාන කරනු ලැබිය හැකි ය.

(3) අමාත්‍යවරයා විසින්, (1) වන උපවගන්තිය යටතේ රටින් පිට කිරීමේ නියමයක් කරනු ලැබූ අවස්ථාවක, පාලක ජනරාල්වරයා විසින්, එකී තැනැත්තා රටින් පිට කිරීම සඳහා අදාළ නීතිවල විධිවිධාන සලස්වා ඇති පරිදි අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබිය යුතු ය.

(4) යම් තැනැත්තකු මේ පනත හෝ වෙනත් යම් නීතියක් යටතේ අධිකරණයක් විසින් පනවන ලද බන්ධනාගාරගත කිරීමේ දඬුවමක් විඳිමින් සිටිය දී, එය නොතකා, මේ වගන්තිය යටතේ

අමාත්‍යවරයා විසින් කරන ලද නියමයක් මගින් පිරිනමන ලද බලතල එකී තැනැත්තා සම්බන්ධයෙන් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.

(5) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126 වන සහ 140 වන ව්‍යවස්ථාවලට යටත්ව, මේ වගන්තිය යටතේ කරන ලද යම් නියමයක් අවසානාත්මක විය යුතු අතර, ශ්‍රී ලංකාවේ කිසිම අධිකරණයක දී එය අභියෝගයට ලක් කරනු නොලැබිය යුතු ය.

(6) රටින් පිට කිරීමේ නියමයක් කර ඇත්තේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද, එවැනි යම් තැනැත්තකු විසින්, එකී නියමයට අනුකූලව ශ්‍රී ලංකාවෙන් පිට වනු ලැබිය යුතු අතර, ඉන්පසු, එකී නියමය බලපවත්නා තාක් කල් ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටිනු ලැබිය යුතු ය.

(7) යම් සාම නිලධරයකු විසින්, මේ වගන්තිය යටතේ කරන ලද යම් නියමයක් බලාත්මක කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි සියලු බලය යොදනු ලැබිය හැකි ය.

(8) අමාත්‍යවරයා විසින්, (1) වන උපවගන්තිය යටතේ රටින් පිට කිරීමේ නියමයක් කරනු ලැබූ අවස්ථාවක, එකී තැනැත්තා අමාත්‍යවරයා විසින් විධාන කරනු ලැබිය හැකි යම් ආකාරයකට රඳවා තබා ගනු ලැබිය හැකි ය.

රටින් පිට කරන ලද හෝ රටින් ඉවත් කරන ලද තැනැත්තන්ගේ මුදල් හෝ දේපළ වියදම් සහ ගාස්තු ගෙවීම සඳහා යොදාගනු ලැබිය හැකි බව

**100.** (1) යම් තැනැත්තකු සම්බන්ධයෙන් රටින් පිට කිරීමේ නියමයක් හෝ රටින් ඉවත් කිරීමේ නියමයක් කර ඇති අවස්ථාවක, අමාත්‍යවරයා විසින්, ඔහු විසින් සුදුසු යයි සලකනු ලබන්නේ නම්, ඒ තැනැත්තා සම්බන්ධයෙන් රජය විසින් දරන ලද සම්පූර්ණ වියදම් සහ ගාස්තු හෝ ඉන් කොටසක් ගෙවීම සඳහා ඒ තැනැත්තාගේ මුදල් හෝ දේපළ යොදාගනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ යොදාගනු ලැබූ මුදලක් (1) වන උපවගන්තිය යටතේ යම් තැනැත්තකු යටත් වන වියදම්වලට අදාළ මුළු මුදල ඉක්මවන අවස්ථාවක, ඉතිරි මුදලක් ආපසු ඔහු වෙත භාර දෙනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ යොදාගනු ලැබූ මුදල (1) වන උපවගන්තිය යටතේ යම් තැනැත්තකු යටත් වන වියදම්වලට අදාළ මුළු මුදලට වඩා අඩු අවස්ථාවක, ඉතිරි මුදල එකී තැනැත්තා විසින් ගෙවිය යුතු ණයක් ලෙස වාර්තා කරනු ලැබිය යුතු ය.

මේ වගන්තිය යටතේ රජයට යම් ණයක් ගෙවිය යුතුව පවතින අතරතුර එකී තැනැත්තාට කිසිදු වීසා පත්‍රයක් ප්‍රදානය කරනු නොලැබිය යුතු ය.

ආරක්ෂක පරිවාරකයන් පිළියෙල කිරීම

**101.** (1) අවශ්‍ය අවස්ථාවල දී, පාලක ජනරාල්වරයා විසින්, මේ පනතේ 4 වන වගන්තිය යටතේ පත් කරන ලද යම් නිලධරයකු හෝ උපපොලිස් පරීක්ෂකවරයකුට නොඅඩු නිලයක් දරන පොලිස් නිලධරයකු, මේ කොටස යටතේ තැනැත්තකු ඉවත් කිරීම හෝ රටින් පිට කිරීම සඳහා ගුවන් යානයක හිමිකරු, නියෝජිතයා හෝ කුලියට දෙන්නකු සමඟ ආරක්ෂක පරිවාරකයකු වශයෙන් පත් කිරීමට කටයුතු පිළියෙල කරනු ලැබිය හැකි ය. එවැනි අවස්ථාවල දී, ඔහු විසින් පහත දැක්වෙන තොරතුරු හැකි තාක් ඉක්මනින්, නමුත් ගුවන් ගමනේ නියමිත වේලාවට පැය විසිහතරකට නොවැඩි කාලයකට පෙර, සපයනු ලැබිය යුතු යː-

(අ) ඉවත් කිරීමේ හෝ පිට කිරීමේ නියමයේ පිටපතක්;

(ආ) පාලක ජනරාල්වරයා විසින් සිවිල් ගුවන් සේවා අධිකාරිය හෝ වෙනත් අදාළ අධිකාරීන් විමසා කරන ලද අවදානම් තක්සේරුවක් සහ ගුවන් ගමනේ ආරක්ෂාවට ඇති අවදානම තක්සේරු කිරීම සඳහා ගුවන් යානා මෙහෙයුම්කරුට උපකාරී විය හැකි වෙනත් යම් අදාළ තොරතුරු; සහ

(ඇ) යම් පරිවාරකයන් සිටී නම්, ඔවුන්ගේ නම් සහ ජාතිකත්වයන්.

(2) පාලක ජනරාල්වරයා විසින්, පිට කිරීම හෝ ඉවත් කිරීම සඳහා තැනැත්තකු ඉදිරිපත් කිරීමේ දී, යම් මාර්ගස්ථ හෝ ගමනාන්ත රාජ්‍යයකින් ඉල්ලා සිටින සියලු නිල ගමන් ලේඛන ගුවන් යානා මෙහෙයුම්කරු වෙත සපයන ලද බවට සහතික විය යුතු ය.

(3) පාලක ජනරාල්වරයා විසින්, තැනැත්තකු පිට කිරීම හෝ පිට කිරීම සඳහා කටයුතු පිළියෙල කිරීමේ දී,-

(i) දී ඇති ගුවන් ගමනේ දී ප්‍රවාහනය කරනු ලැබිය හැකි යම් තැනැත්තන් සංඛ්‍යාව සැලකිල්ලට ගනිමින්, ගුවන් යානා මෙහෙයුම්කරුගේ ප්‍රතිපත්තිය සලකා බලනු ලැබිය හැකි ය; සහ

(ii) ප්‍රායෝගිකව හැකි අවස්ථාවල දී, නැවතුම් රහිත ඍජු ගුවන් ගමන් භාවිත කරනු ලැබිය හැකි ය.

(4) ගුවන් ගමනේ ආරක්ෂාව සහ සුරක්ෂිතතාවට අදාළ සාධාරණ කරුණු ඇති විට, පිට කරන ලද හෝ ඉවත් කරන ලද යම් තැනැත්තකු, යම් නිශ්චිත ගුවන් ගමනක දී ප්‍රවාහනය කිරීම ප්‍රතික්ෂේප කිරීමට ගුවන් යානයේ හිමිකරු, නියෝජිතයා හෝ කුලියට දෙන්නා හෝ ගුවන් යානයේ කපිතාන්වරයා විසින් තීරණය කරනු ලබන්නේ නම්, එම තීරණය පාලක ජනරාල්වරයා වෙත දැනුම් දෙනු ලැබිය යුතු ය.

(5) (4) වන උපවගන්තියේ සඳහන් කරන ලද පරිදි ගුවන් යානයක හිමිකරුගෙන්, නියෝජිතයාගෙන් හෝ කුලියට දෙන්නාගෙන් හෝ ගුවන් යානයේ කපිතාන්වරයාගෙන් තොරතුරු ලැබීමෙන් පසුව, පාලක ජනරාල්වරයා විසින්-

(i) ඉවත් කරනු ලබන හෝ පිට කරනු ලබන තැනැත්තකු භාරව යැමට පහසුකම් සැලැස්වීම සඳහා පියවර ගැනීම; සහ

(ii) අතරමැදි රාජ්‍යයක දී මාර්ගස්ථ නැවතුම් ඇතුළු මාර්ග විස්තරය සැපයීම; සහ

(iii) පැමිණීමට පෙර ම මාර්ගස්ථ ස්ථානයේ දී සම්බන්ධ වූ බලධරයන් සහ ගුවන් යානා මෙහෙයුම්කරු විසින් යෝග්‍ය අතිරේක පිළියෙල කිරීම්වලට එකඟ වී ඇත්තේ නම් මිස, පරිවාරකයා, පිට කරන ලද හෝ ඉවත් කරන ලද පුද්ගලයා සමඟ ඔහුගේ අවසන් ගමනාන්තය තෙක් රැඳී සිටින බව සහතික කිරීම,

කරනු ලැබිය හැකි ය.

VII වන කොටස

**ගමන් ලේඛන**

මේ කොටස අදාළ වීම

**102.** යම් තැනැත්තකු I වන කොටස යටතේ කරන ලද නියමයක් මගින් මේ කොටස අදාළ වීමෙන් නිදහස් කරනු ලබන්නේ නම්

මිස, මේ කොටසේ විධිවිධාන සෑම තැනැත්තකුට ම අදාළ විය යුතු ය.

ශ්‍රී ලංකා ගමන් ලේඛන ශ්‍රී ලංකා රජයේ දේපළක් විය යුතු බව

**103.** (1) මේ පනත යටතේ නිකුත් කරනු ලබන ශ්‍රී ලංකා ගමන් ලේඛනයක් ශ්‍රී ලංකා රජයේ දේපළක් විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ශ්‍රී ලංකා රජය වෙත පැවරී ඇති අයිතිය, ශ්‍රී ලංකා ගමන් ලේඛනයක් දරන්නා විසින් හෝ වෙනත් යම් තැනැත්තකු විසින් එම ශ්‍රී ලංකා ගමන් ලේඛනය විකිණීමක් මගින් හෝ එය සම්බන්ධව දෙන ලද, තබන ලද හෝ පිළිගන්නා ලද යම් ඇපයක්, ඔඩපනයක්, තැන්පතුවක් හෝ පිළිබැඳුමක් මගින් පරාජය කරනු හෝ බලපෑමක් ඇති කරනු නොලැබිය යුතු ය.

(3) කිසිදු තැනැත්තකු විසින්, ශ්‍රී ලංකා ගමන් ලේඛනයක් ඇපයක්, ඔඩපනයක්, තැන්පතුවක් හෝ පිළිබැඳුමක් වශයෙන් දීම, තැබීම හෝ පිළිගැනීම සිදු නොකළ යුතු අතර, අන්‍යාකාරයකින් එම බලය සහිත ගිවිසුමක යම් නියමයක් බලරහිත විය යුතු ය.

ශ්‍රී ලංකා ගමන් ලේඛන නිකුත් කරන බලධරයා

**104.** (1) සෑම ශ්‍රී ලංකා ගමන් ලේඛනයක් ම, ශ්‍රී ලංකා රජය සඳහා සහ ශ්‍රී ලංකා රජය වෙනුවෙන් පාලක ජනරාල්වරයා විසින් නිකුත් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන නොතකා, පාලක ජනරාල්වරයා විසින්, මෙම අධිකාරි බලය, අතිරේක පාලක ජනරාල්වරයාට, පාලකවරයන්, නියෝජ්‍ය පාලකවරයන්, සහකාර පාලකවරයන් වෙත සහ විදේශගත ශ්‍රී ලංකා විදේශීය දූත මණ්ඩලයකට අනුයුක්ත රාජ්‍යතාන්ත්‍රිකයකු හෝ කොන්සල් නිලධරයකු වෙත පවරා දෙනු ලැබිය හැකි ය.

ශ්‍රී ලංකා ගමන් ලේඛනයක් සඳහා ඉල්ලුම් කිරීම

**105.** ශ්‍රී ලංකා ගමන් ලේඛනයක් සඳහා වන ඉල්ලුම් කිරීමක්-

(අ) නියමිත ආකෘතියෙන් සහ ආකාරයෙන් පාලක ජනරාල්වරයා වෙත හෝ ශ්‍රී ලංකා විදේශීය දූත මණ්ඩලයකට අනුයුක්ත කොන්සල් නිලධරයකු වෙත කරනු ලැබිය යුතු ය; සහ

(ආ) ඉල්ලුම්කරුගේ හඳුනා ගැනීමේ තොරතුරු ඇතුළු නියම කරන ලද විස්තර සහ යම් නිශ්චිත අවස්ථාවක දී, පාලක ජනරාල්වරයා හෝ බලය පවරනු ලැබ ඇති වෙනත් යම් බලධරයකු විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි වෙනත් යම් විස්තර, තොරතුරු සහ ලේඛන සමඟ ඉදිරිපත් කරනු ලැබිය යුතු ය; සහ

(ඇ) නියමිත ගාස්තුවක් තිබේ නම්, එම ගාස්තුව සමඟ ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

ශ්‍රී ලංකාවේ පුරවැසියකු ශ්‍රී ලංකා ගමන් ලේඛනයකට හිමිකම් කියනු ලබන බව

**106.** පාලක ජනරාල්වරයා වෙත කරනු ලබන ඉල්ලුම් කිරීමක් මත, මේ පනත හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් යටතේ පාලක ජනරාල්වරයා විසින් ශ්‍රී ලංකා ගමන් ලේඛනයක් නිකුත් කරනු ලැබීමට ශ්‍රී ලංකා පුරවැසියකු හිමිකම් ලබන්නේ ය.

තැනැත්තකුගේ පුරවැසිභාවය සහ අනන්‍යතාවය සම්බන්ධයෙන් පාලක ජනරාල්වරයා සෑහීමකට පත් විය යුතු බව

**107.** (1) යම් තැනැත්තකු වෙත ශ්‍රී ලංකා ගමන් ලේඛනයක් නිකුත් කිරීමට පෙර-

(අ) එකී තැනැත්තා ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන බවට; සහ

(ආ) එම තැනැත්තාගේ අනන්‍යතාවය සම්බන්ධයෙන්,

පාලක ජනරාල්වරයා සෑහීමකට පත් විය යුතු ය.

(2) ඉල්ලුම්කරු විසින්, මේ පනතේ සහ යම් නියෝගයක පුරවැසිභාවයට සහ අනන්‍යතාවය නිශ්චය කිරීම සඳහා කරුණු සැපයීමට අදාළව නිශ්චිතව දක්වා ඇති යම් නියමයන්ට අනුකූලව කටයුතු කරනු ලැබිය යුතු ය.

පාලක ජනරාල්වරයා විසින් හදිසි සහතික සහ අනන්‍යතා සහතික නිකුත් කිරීම

**108.** (1) පාලක ජනරාල්වරයා වෙත කරනු ලබන ඉල්ලුම් කිරීමක් මත, ඉන්දියාවට සහ නේපාලයට හෝ අමාත්‍යවරයා විසින් තත්කාර්යය සඳහා කරන ලද නියමයන් මගින් නිශ්චිතව දක්වනු ලබන වෙනත් යම් රටකට ගමන් කිරීම සඳහා පාලක ජනරාල්වරයා විසින් ශ්‍රී ලංකා හදිසි සහතිකයක් නිකුත් කරනු ලැබීමට ශ්‍රී ලංකා පුරවැසියකු හිමිකම් ලබන්නේ ය.

(2) යම් තැනැත්තකු වෙත, ශ්‍රී ලංකා හදිසි සහතිකයක් නිකුත් කිරීමට පෙර ඒ තැනැත්තා ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන බවට සහ

එම තැනැත්තාගේ අනන්‍යතාවය සම්බන්ධයෙන් පාලක ජනරාල්වරයා සෑහීමකට පත් විය යුතු ය.

(3) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන සහ ශ්‍රී ලංකාව තුළ අදාළ තානාපති කාර්යාලයක් හෝ කොන්සල් කාර්යාලයක් නොපැවතීම හේතුවෙන් සාධාරණ කාලසීමාවක් තුළ යම් හේතුවකට ජාතික විදේශ ගමන් බලපත්‍රයක් ලබා ගැනීමට නොහැකි වන යම් තැනැත්තකු වෙත, එම තැනැත්තා විසින් පාලක ජනරාල්වරයාගෙන් කරනු ලබන ඉල්ලුම් කිරීමක් මත, ඔහුගේ ජාතිකත්ව රට වෙත ආපසු යෑමේ කාර්ය සඳහා පමණක් පාලක ජනරාල්වරයා විසින් අනන්‍යතා සහතිකයක් නිකුත් කරනු ලැබිය හැකි ය.

(4) (3) වන උපවගන්තිය යටතේ යම් තැනැත්තකු වෙත ශ්‍රී ලංකා අනන්‍යතා සහතිකයක් නිකුත් කිරීමට පෙර, එම තැනැත්තාගේ අනන්‍යතාවය සම්බන්ධයෙන් පාලක ජනරාල්වරයා සෑහීමකට පත් විය යුතු ය.

රාජ්‍යතාන්ත්‍රික හෝ නිල විදේශ ගමන් බලපත්‍ර නිකුත් කිරීම සහ ඒවායෙහි වලංගු කාලසීමාව

**109.** (1) රාජ්‍යතාන්ත්‍රික හෝ නිල විදේශ ගමන් බලපත්‍රයක්, අමාත්‍යවරයා විසින් කරන ලද යම් විධානයන්ට අනුකූලව අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද තැනැත්තකු හෝ තැනැත්තන් කාණ්ඩයක් වෙත පමණක් නිකුත් කරනු ලැබිය යුතු ය.

(2) රාජ්‍යතාන්ත්‍රික හෝ නිල විදේශ ගමන් බලපත්‍රයක වලංගු කාලසීමාව අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය යුතු අතර, අමාත්‍යවරයා විසින් තත්කාර්ය සඳහා කරන ලද විධානයන් මගින් අමාත්‍යවරයා විසින් පනවනු ලැබිය හැකි යම් කොන්දේසිවලට යටත් විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ රාජ්‍යතාන්ත්‍රික හෝ නිල විදේශ ගමන් බලපත්‍රයක් සඳහා හිමිකම් තිබෙන තැනැත්තකු, රාජ්‍යතාන්ත්‍රික හෝ නිල විදේශ ගමන් බලපත්‍රයක් නොවන වෙනත් ශ්‍රී ලංකා ගමන් ලේඛනයක් දරමින් සිටින කාලය අතරතුර, පාලක ජනරාල්වරයා විසින් එම තැනැත්තා වෙත රාජ්‍යතාන්ත්‍රික හෝ නිල විදේශ ගමන් බලපත්‍රයක් නිකුත් කරනු ලැබිය හැකි ය.

(4) රාජ්‍යතාන්ත්‍රික හෝ නිල විදේශ ගමන් බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා වන ආකාරය සහ කාර්යපටිපාටි සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් පාලක ජනරාල්වරයා වෙත විධානයන් නිකුත් කරනු ලැබිය හැකි ය.

**110.** ශ්‍රී ලංකා විදේශ ගමන් බලපත්‍රයේ වලංගු කාලසීමාව අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය යුතු ය.

ශ්‍රී ලංකා විදේශ ගමන් බලපත්‍රයේ වලංගු කාලසීමාව

**111.** (1) ශ්‍රී ලංකා ගමන් ලේඛනයක් සඳහා ඉල්ලුම් කරන යම් තැනැත්තකු විසින්, එකී තැනැත්තාගෙන් හඳුනා ගැනීමේ තොරතුරු එකතු කර ගැනීමට ඉඩ දෙනු ලැබිය යුතු ය.

හඳුනා ගැනීමේ තොරතුරු ලබා ගැනීම

(2) පාලක ජනරාල්වරයා විසින්, (1) වන උපවගන්තිය යටතේ එකතු කරන ලද හඳුනා ගැනීමේ තොරතුරු විශ්ලේෂණය කර එකී තැනැත්තා වෙත ශ්‍රී ලංකා ගමන් ලේඛනයක් නිකුත් කරනු ලබන්නේ ද නොලබන්නේ ද යන්න තීරණය කරනු ලැබිය හැකි ය.

(3) එකී තැනැත්තා හඳුනා ගැනීමේ තොරතුරු එකතු කරනු ලැබීමට ඉඩ දීමට අපොහොසත් වන්නේ නම්, පාලක ජනරාල්වරයා විසින්, එකී තැනැත්තා වෙත ශ්‍රී ලංකා ගමන් ලේඛනයක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය.

(4) (1) වන උපවගන්තියේ විධිවිධාන, තත්කාර්ය සඳහා සාදන ලද නියෝගවලට අනුව එකී තොරතුරු සැපයීමෙන් නිදහස් කරනු ලැබ ඇති තැනැත්තකු වෙත අදාළ නොවිය යුතු ය.

(5) හඳුනා ගැනීමේ තොරතුරු එකතු කරනු ලැබිය හැකි තැනැත්තන් අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි ය.

(6) (1) වන උපවගන්තිය යටතේ යම් තැනැත්තකුගේ හඳුනා ගැනීමේ තොරතුරු විශ්ලේෂණය කිරීමෙන් පසුව, හඳුනා ගැනීමේ තොරතුරු වෙනත් යම් තැනැත්තකුට අදාළ විය හැකි බව පාලක ජනරාල්වරයාගේ මතය වන අවස්ථාවක දී, පාලක ජනරාල්වරයා විසින්, 153 වන වගන්තියේ විධිවිධාන යටතේ ඉදිරියට කටයුතු කරගෙන යනු ලැබිය හැකි ය.

**112.** (1) පාලක ජනරාල්වරයා විසින්, ඕනෑම අවස්ථාවක දී, යම් ශ්‍රී ලංකා ගමන් ලේඛනයක් මත පිටසන් කරනු ලැබිය හැකි ය.

ශ්‍රී ලංකා ගමන් ලේඛන පිටසන් කිරීම

(2) පාලක ජනරාල්වරයා විසින්, ඕනෑම අවස්ථාවක දී, (1) වන උපවගන්තිය යටතේ කරන ලද යම් පිටසන් කිරීමක් අවලංගු කරනු ලැබිය හැකි ය.

ශ්‍රී ලංකා ගමන් ලේඛනවල කොන්දේසි

113. පාලක ජනරාල්වරයා විසින්-

(අ) ගමන් ලේඛනය අවලංගු කළ හැකි හෝ අත්හිටුවනු ලැබිය හැකි බව; හෝ

(ආ) ගමන් ලේඛනයේ වලංගු කාලසීමාව සීමා කරනු ලැබිය හැකි බව,

සෑම ශ්‍රී ලංකා ගමන් ලේඛනයක ම කොන්දේසියක් විය යුතු ය.

පාලක ජනරාල්වරයා විසින් ගමන් ලේඛන අවලංගු කිරීම හෝ අත්හිටුවීම

114. (1) (අ) යම් තැනැත්තකු විසින් ඉල්ලුම් කරන අවස්ථාවේ දී, ශ්‍රී ලංකා ගමන් ලේඛනය තවදුරටත් වලංගුව පවතින්නේ නම් හෝ එම තැනැත්තා වෙත රාජ්‍යතාන්ත්‍රික හෝ නිල විදේශ ගමන් බලපත්‍ර හැර වෙනත් වලංගු ශ්‍රී ලංකා ගමන් ලේඛනයක් නිකුත් කරනු ලැබ ඇත්තේ නම්;

(ආ) ශ්‍රී ලංකා ගමන් ලේඛනය නැති වී ඇති බවට හෝ සොරකම් කර ඇති බවට වාර්තා වී ඇත්නම් හෝ පාලක ජනරාල්වරයාගේ මතය අනුව භාවිතයට නුසුදුසු ලෙස හානි වී හෝ කියවීමට නොහැකි තත්ත්වයට පත් වී ඇත්නම්;

(ඇ) ශ්‍රී ලංකා ගමන් ලේඛනය දරන්නා මියගොස් ඇති බවට වාර්තා වී ඇත්නම්;

(ඈ) ශ්‍රී ලංකා ගමන් ලේඛනය දරන්නා ශ්‍රී ලංකාවේ පුරවැසියකු වීම නතර කරනු ලබන්නේ නම්;

(ඉ) අධිකරණය විසින් ශ්‍රී ලංකා ගමන් ලේඛනය අවලංගු කිරීමට නියම කර තිබේ නම්; හෝ

(ඊ) ශ්‍රී ලංකා ගමන් ලේඛනයේ වාර්තා කර ඇති විස්තර වැරදි බව විශ්වාස කිරීමට සාධාරණ හේතු පවතින්නේ නම්,

යම් තැනැත්තකු වෙත නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගමන් ලේඛනයක් පාලක ජනරාල්වරයා විසින් අවලංගු කරනු ලැබිය යුතු ය.

(2) රජය සමඟ බැඳුම්කරයක් හෝ ගිවිසුමක් අත්සන් කර ඇති යම් තැනැත්තකු, අදාළ බැඳුම්කරයේ හෝ ගිවිසුමේ විධිවිධාන යටතේ වන බැඳීම් සපුරාලීමෙන් තොරව රටින් පිට වීමට සූදානම් වන බවට පාලක ජනරාල්වරයා වෙත තොරතුරු ඉදිරිපත් වී ඇති අවස්ථාවක දී, පාලක ජනරාල්වරයා විසින්, නඩු කටයුතු පවරා අදාළ ගමන් ලේඛනය අත්හිටුවීමට ආඥා කරන්නේ ද යන්න අදාළ අධිකරණය විසින් තීරණය කරන තෙක්, එම තැනැත්තාගේ ගමන් ලේඛනය තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය.

පාලක ජනරාල්වරයා විසින් නැති වූ, සොරකම් කරන ලද හෝ සැක සහිත ගමන් ලේඛන පිළිබඳ තොරතුරු බෙදා ගනු ලැබිය හැකි බව

**115.** (1) යම් තැනැත්තකුගේ ශ්‍රී ලංකා ගමන් ලේඛනය,-

(අ) ශ්‍රී ලංකාව තුළ දී නැති වී ඇති අවස්ථාවක දී, එකී තැනැත්තා විසින්, එකී නැති වීම පිළිබඳව වහාම ළඟම පොලිස් ස්ථානයට වාර්තා කරනු ලැබිය යුතු අතර, ඉන්පසුව වහාම තත්කාර්යය සඳහා වන ප්‍රකාශනයක් පාලක ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය; හෝ

(ආ) ශ්‍රී ලංකාවෙන් පිටත දී නැති වී ඇති අවස්ථාවක දී, එකී තැනැත්තා විසින්, එකී නැති වීම පිළිබඳව වහාම එම රටේ අදාළ බලධරයන් වෙත වාර්තා කරනු ලැබිය යුතු අතර, ඉන්පසුව වහාම ශ්‍රී ලංකා ගමන් ලේඛනය නැති වීම පිළිබඳව එම රටේ බලයලත් ශ්‍රී ලංකා කොන්සල් කාර්යාලය හෝ රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩලය වෙත දන්වා තාවකාලික ශ්‍රී ලංකා ගමන් ලේඛනයක් සඳහා ඉල්ලුම් කරනු ලැබිය යුතු ය.

(2) ශ්‍රී ලංකා ගමන් ලේඛනයක් නැතිවීමක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා කොන්සල් කාර්යාලයක් වෙත හෝ රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩලයක් වෙත යම් තොරතුරක් ලැබුණු අවස්ථාවක දී, එකී කොන්සල් කාර්යාලය හෝ රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩලය විසින් ඉන්පසුව වහාම තත්කාර්ය සම්බන්ධයෙන් පාලක ජනරාල්වරයා වෙත දැනුම් දෙනු ලැබිය යුතු ය.

(3) ශ්‍රී ලංකා ගමන් ලේඛනයක් නැතිවීමක් සම්බන්ධයෙන් පාලක ජනරාල්වරයා වෙත යම් තොරතුරක් ලැබුණු අවස්ථාවක දී, පාලක ජනරාල්වරයා විසින්, වහාම එකී ගමන් ලේඛනය අක්‍රීය කරනු ලැබිය යුතු ය.

(4) යම් තැනැත්තකුට, එම තැනැත්තා වෙත නිකුත් කරනු නොලැබූ ශ්‍රී ලංකා ගමන් ලේඛනයක් හමු වූ විටෙක දී, එකී තැනැත්තා විසින් වහාම එකී ගමන් ලේඛනය පාලක ජනරාල්වරයා වෙත හෝ ළඟම පොලිස් ස්ථානය වෙත භාර දෙනු ලැබිය යුතු ය.

(5) පාලක ජනරාල්වරයා විසින්, නැති වූ, සොරකම් කරන ලද හෝ සැක සහිත ශ්‍රී ලංකා ගමන් ලේඛන පිළිබඳ තොරතුරු, දත්ත ආරක්ෂණයට අදාළ ලිඛිත නීතිවලට අනුව යම් තොරතුරු භාවිතය සහ ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් පාලක ජනරාල්වරයා සමඟ ගිවිසුමකට එළඹ ඇති වෙනත් නීතිය බලාත්මක කිරීමේ දේශීය නියෝජිතායතන සමඟ හෝ යම් නීතිය බලාත්මක කිරීමේ ජාත්‍යන්තර නියෝජිතායතන සමඟ බෙදා ගනු ලැබිය හැකි ය.

(6) (1) වන සහ (4) වන උපවගන්තිවල විධිවිධාන උල්ලංඝනය කරන යම් තැනැත්තකු විසින් වරදක් කරනු ලබන්නේ ය.

(7) මේ වගන්තියේ කාර්ය සඳහා නැති වූ ශ්‍රී ලංකා ගමන් ලේඛනය යන්නට, සොරකම් කරන ලද ශ්‍රී ලංකා ගමන් ලේඛන ඇතුළත් විය යුතු ය.

ශ්‍රී ලංකා ගමන් ලේඛනයක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කිරීම සඳහා වන හේතු

**116.** (1) යම් තැනැත්තකු වෙත දැනටමත් ශ්‍රී ලංකා ගමන් ලේඛනයක් නිකුත් කරනු ලැබ ඇති අතර, එම ලේඛනය තවමත් වලංගු වන්නේ නම්, සහ 109 වන වගන්තිය යටතේ රාජ්‍යතාන්ත්‍රික සහ නිල විදේශ ගමන් බලපත්‍ර නිකුත් කිරීමේ දී හැර, එම ශ්‍රී ලංකා ගමන් ලේඛනය අවලංගු කිරීම සඳහා ඉදිරිපත් කර නොමැති නම්, එම තැනැත්තා වෙත ශ්‍රී ලංකා ගමන් ලේඛනයක් නිකුත් කිරීම පාලක ජනරාල්වරයා විසින් ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය.

(2) යම් තැනැත්තකු අවශ්‍ය තොරතුරු සහ අදාළ ලේඛන ලබා නොදෙන්නේ නම්, එම තැනැත්තා වෙත ශ්‍රී ලංකා ගමන් ලේඛනයක් නිකුත් කිරීම පාලක ජනරාල්වරයා විසින් ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය.

(3) මේ වගන්තිය යටතේ පාලක ජනරාල්වරයා විසින් ගමන් ලේඛනයක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කරනු ලබන්නේ නම්, එකී ප්‍රතික්ෂේප කිරීම සඳහා වන හේතු පාලක ජනරාල්වරයා විසින් ඉල්ලුම්කරු වෙත දන්වනු ලැබිය යුතු ය.

**117.** ගමන් ලේඛනයක් අවලංගු කරනු ලබන හෝ අත්හිටුවනු ලබන අවස්ථාවක දී, අනුගමනය කළ යුතු කාර්යපටිපාටිය අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය යුතු ය.

ගමන් ලේඛනයක් අවලංගු කරනු ලබන හෝ අත්හිටුවනු ලබන අවස්ථාවක දී අනුගමනය කළ යුතු කාර්යපටිපාටිය

**118.** සැක සහිත ශ්‍රී ලංකා ගමන් ලේඛනයක් භාර දීම හෝ සැක සහිත ගමන් ලේඛනයක් තහනමට ගැනීම සඳහා ඉල්ලීමක් කරනු ලබන අවස්ථාවක දී, අනුගමනය කළ යුතු කාර්යපටිපාටිය අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය යුතු ය.

සැක සහිත ගමන් ලේඛනයක් භාර දීම හෝ සැක සහිත ගමන් ලේඛනයක් තහනමට ගැනීම සඳහා ඉල්ලීම

**119.** ශ්‍රී ලංකා ගමන් ලේඛනයක වලංගුභාවය,-

(අ) ගමන් ලේඛනයේ නිශ්චිතව දක්වා ඇති දිනය; හෝ

(ආ) මේ කොටස යටතේ අවලංගු කරනු ලබන අවස්ථාව,

යන දිනවලින් කලින් එළඹෙන දිනයේ දී අවසන් වේ.

ශ්‍රී ලංකා ගමන් ලේඛනයක වලංගුභාවය අවසන් වන අවස්ථාව

**120.** (1) ශ්‍රී ලංකාවේ පුරවැසියකුව සිටීම අවසන් කරන යම් තැනැත්තකු, වලංගු ශ්‍රී ලංකා ගමන් ලේඛනයක් දැරීම සඳහා හිමිකම් නොලැබිය යුතු ය.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ දී හෝ ඉන්පසුව, ශ්‍රී ලංකාවේ පුරවැසියකුව සිටීම අවසන් කරන යම් තැනැත්තකු විසින් එකී කාරණය පිළිබඳව වහාම පාලක ජනරාල්වරයා වෙත දැනුම් දෙනු ලැබිය යුතු අතර, ශ්‍රී ලංකාවේ පුරවැසියකුව සිටීම අවසන් කිරීමෙන් මාස හයක් ඇතුළත ශ්‍රී ලංකා ගමන් ලේඛනය අවලංගු කර එය ආපසු දීම සඳහා ඔහු වෙත නිකුත් කරන ලද වලංගු ශ්‍රී ලංකා ගමන් ලේඛනය තවදුරටත් භාවිත කිරීමකින් තොරව පාලක ජනරාල්වරයා වෙත හෝ යම් විදේශීය ශ්‍රී ලංකා රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩලයක් වෙත භාර දෙනු ලැබිය යුතු ය. අවලංගු කිරීම සඳහා වලංගු ශ්‍රී ලංකා ගමන් ලේඛනයක් භාර දීමට අපොහොසත් වන යම් තැනැත්තකු විසින් වරදක් සිදු කරනු ලබන්නේ ය.

ශ්‍රී ලංකාවේ පුරවැසියකුව සිටීම අවසන් කරන තැනැත්තකු විසින් ශ්‍රී ලංකා ගමන් ලේඛනයක් අවලංගු කිරීම සඳහා භාර දීම

(3) ශ්‍රී ලංකාවේ පුරවැසියකුව සිටීම අවසන් කිරීමෙන් පසුව වලංගු ශ්‍රී ලංකා ගමන් ලේඛනයක් භාවිත කරන තැනැත්තකු විසින්, මේ පනත යටතේ වරදක් සිදු කරනු ලබන අතර, රුපියල් ලක්ෂ දෙකකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතු ය.

(4) ශ්‍රී ලංකාවේ පුරවැසියකුව සිටීම අවසන් කරන සහ තම ශ්‍රී ලංකා ගමන් ලේඛනය නැති වී ඇති යම් තැනැත්තකු විසින්, ඉන්පසුව වහාම එකී නැති වීම පිළිබඳව ළඟම ඇති පොලිස් ස්ථානය වෙත සහ ඉන්පසුව පාලක ජනරාල්වරයා වෙත ද, එකී තැනැත්තාගේ ශ්‍රී ලංකා ගමන් ලේඛනය ශ්‍රී ලංකාවෙන් පිටත දී නැති වී ඇති අවස්ථාවක දී, විදේශීය ශ්‍රී ලංකා රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩලය වෙත ද වාර්තා කරනු ලැබිය යුතු ය.

**ශ්‍රී ලංකා ගමන් ලේඛනයක් වංක ලෙස ලබා ගැනීම**

**121** (1) යම් තැනැත්තකු විසින් දැනුම්වත්ව සහ සිතාමතාම වංක සහ වංචනික ආකාරයකින්, ශ්‍රී ලංකා ගමන් ලේඛනයක් ලබා ගන්නේ නම්, එකී තැනැත්තා විසින් වරදක් සිදු කරනු ලබන අතර, වරදකරු කරනු ලැබීමේ දී රුපියල් ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ අවුරුද්දකට නොවැඩි කාලසීමාවක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

(2) මේ වගන්තියේ කාර්ය සඳහා, "ලබා ගැනීම" යන්නට-

(අ) වෙනත් තැනැත්තකු වෙනුවෙන් ලබා ගැනීම; සහ

(ආ) වෙනත් තැනැත්තකු විසින් ලබා ගැනීම සඳහා යමක් කරන ලෙසට තුන්වන පාර්ශ්වයක් පෙලඹවීම,

ඇතුළත් වේ.

(3) තැනැත්තකුගේ හැසිරීම සම්බන්ධයෙන් වන විට "වංක ලෙස" යන්නට, (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ 22 වන වගන්තියේ එයට දී ඇති අර්ථය ම තිබිය යුතු ය.

**විදේශීය ගමන් ලේඛනවලට අදාළ වැරදි**

**122.**(1) (අ) යම් තැනැත්තකු විසින්, ශ්‍රී ලංකාවේ දී ව්‍යාජ විදේශ ගමන් ලේඛනයක් සාදනු ලබන්නේ නම් හෝ ශ්‍රී ලංකාවේ වෙනත් තැනැත්තකු වෙත ව්‍යාජ විදේශ ගමන් ලේඛනයක් ඉදිරිපත් කරනු ලබන්නේ නම්; සහ

(ආ) ව්‍යාජ විදේශ ගමන් ලේඛනය, අව්‍යාජ ගමන් ලේඛනයක් ලෙස භාවිත කරන හෝ පිළිගන්නා වෙනත් තැනැත්තකු හේතුවෙන් එම තැනැත්තා විසින් වංක ලෙස-

(i) ඔහු වෙනුවෙන් හෝ වෙනත් අයකු වෙනුවෙන් වාසි ලබා ගන්නේ නම්;

(ii) වෙනත් තැනැත්තා හෝ වෙනත් අයකු හට පාඩුවක් සිදු කිරීමට කටයුතු සලස්වන්නේ නම්; හෝ

(iii) රාජකාරියක් ක්‍රියාත්මක කිරීමට පොලඹවන්නේ නම්,

එකී තැනැත්තා විසින් වරදක් සිදු කරනු ලබන්නේ ය.

(2) යම් තැනැත්තකු විසින්-

(අ) විදේශ ගමන් ලේඛනය අවලංගු කර ඇති බව සහ විදේශ ගමන් ලේඛනය අවලංගු කර ඇති බව එකී තැනැත්තා විසින් සාධාරණ ලෙස දැන සිටිය යුතු බව; හෝ

(ආ) එම තැනැත්තා වෙත විදේශ ගමන් ලේඛනය නිකුත් කරනු ලැබ නොමැති බව සහ තමන් වෙත විදේශ ගමන් ලේඛනයක් නිකුත් කරනු ලැබ නොමැති බව එකී තැනැත්තා විසින් සාධාරණ ලෙස දැන සිටිය යුතු බව,

දැනුම්වත්ව ම ගමන් කිරීම හෝ හඳුනා ගැනීම සම්බන්ධයෙන් විදේශ ගමන් ලේඛනයක් ශ්‍රී ලංකාවේ දී භාවිත කරන්නේ නම්, එකී තැනැත්තා විසින් වරදක් සිදු කරනු ලබන්නේ ය.

(3) යම් තැනැත්තකු විසින්, ඔහු වෙත නිකුත් කරන ලද විදේශ ගමන් ලේඛනයක් නීත්‍යානුකූල අවසරයකින් තොරව ශ්‍රී ලංකාවේ තවත් තැනැත්තකු වෙත ඉදිරිපත් කර, එම වෙනත් තැනැත්තා විසින් ගමන් කිරීම හෝ හඳුනා ගැනීම සම්බන්ධයෙන් එම ලේඛනය භාවිත කරන්නේ ද යන්න හෝ භාවිත කරනු ඇති ද යන්න පිළිබඳව එකී පළමු තැනැත්තා නොසැලකිලිමත් වන්නේ නම්, එකී පළමු තැනැත්තා විසින් වරදක් සිදු කරනු ලබන්නේ ය.

(4) යම් තැනැත්තකු විසින්, නීත්‍යානුකූල අධිකාරි බලයකින් හෝ සාධාරණ අවසරයකින් තොරව විදේශ ගමන් ලේඛනයක් ශ්‍රී ලංකාව තුළ තබාගෙන ඇත්නම් හෝ සන්තකයේ හෝ පාලනයේ රඳවා තබා ගන්නේ නම් සහ විදේශ ගමන් ලේඛනය ඔහු වෙත නිකුත් කරන ලද්දක් නොවන බව දන්නේ නම්, එම තැනැත්තා විසින් වරදක් සිදු කරනු ලබන්නේ ය.

(5) යම් තැනැත්තකුගේ සන්තකයේ හෝ පාලනයේ ලේඛනයක් තිබේ නම් සහ එය ව්‍යාජ විදේශ ගමන් ලේඛනයක් බව ඔහු දන්නේ නම් හෝ සාධාරණ ලෙස ඔහු දැන සිටිය යුතු වන්නේ නම්, එකී තැනැත්තා විසින් වරදක් සිදු කරන ලබන්නේ ය.

(6) යම් තැනැත්තකු විසින්-

(අ) (i) ශ්‍රී ලංකාව තුළ හෝ වෙනත් ස්ථානයක දී නිකුත් කරන ලද යම් විදේශ ගමන් ලේඛනයක් හෝ එහි යම් වීසා පත්‍රයක් හෝ පිටසනක් කූට ලෙස සකස් කරයි නම්, වෙනස් කරයි නම් හෝ ඊට අනවසර වෙනස්කම් කරයි නම්;

(ii) (i) වන අනුඡේදයේ සඳහන් කරන ලද යම් විදේශ ගමන් ලේඛනයක පිටසන් කර ඇති යම් සහතිකයක් කූට ලෙස සකස් කරයි නම්, වෙනස් කරයි නම් හෝ ඊට අනවසර වෙනස්කම් කරයි නම්; හෝ

(iii) නීත්‍යානුකූල අධිකාරි බලයකින් තොරව, කූට ලෙස සකස් කරන ලද, වෙනස් කරන ලද හෝ අපවේශනය කරන ලද විදේශ ගමන් ලේඛනයක් හෝ කූට ලෙස සකස් කරන ලද, වෙනස් කරන ලද හෝ අනවසර වෙනස්කම් කරන ලද වීසා පත්‍රයක්, පිටසනක් හෝ සහතිකයක් අන්තර්ගත වන විදේශ ගමන් ලේඛනයක් භාවිත කරයි නම් හෝ ඔහුගේ සන්තකයේ තබා ගනියි නම්; හෝ

(ආ) (i) විදේශ ගමන් ලේඛනය කූට ලෙස සකස් කරනු ලැබ, වෙනස් කරනු ලැබ හෝ ඊට අපවේශනය කරනු ලැබ ඇති බව; හෝ

(ii) විදේශ ගමන් ලේඛනයෙහි, කූට ලෙස සකස් කරන ලද වෙනස් කරන ලද හෝ අපවේශනය කරන ලද වීසා පත්‍රයක්, පිටසනක් හෝ සහතිකයක් අන්තර්ගත වන බව,

දන්නේ නම් හෝ සාධාරණ ලෙස දැන සිටිය යුතු වන්නේ නම්,

එකී තැනැත්තා විසින් වරදක් සිදු කරනු ලබන්නේ ය.

(7) යම් තැනැත්තකු විසින්, මේ වගන්තිය යටතේ යම් වරදක් සිදු කිරීමට සහාය දක්වයි නම් හෝ අනුබල දෙයි නම්, එකී තැනැත්තා විසින් වරදක් සිදු කරනු ලබන්නේ ය

(8) මේ වගන්තිය යටතේ වරදක් සිදු කරනු ලබන යම් තැනැත්තකු වරදක් කරනු ලැබීමේ දී රුපියල් ලක්ෂ දෙකකට නොවැඩි දඩයකට හෝ අවුරුදු දෙකකට නොවැඩි කාලසීමාවක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

(9) මේ වගන්තියේ කාර්ය සඳහා, "විදේශ ගමන් ලේඛනය" යන්නෙන්, යම් විදේශ ගමන් බලපත්‍රයක් හෝ ශ්‍රී ලංකාවේ දී හෝ වෙනත් රටක දී විදේශ රජයක් විසින් නිකුත් කරන ලද වෙනත් යම් ගමන් ලේඛනයක් අදහස් වේ.

**නියෝග**

**123.** පහත දැක්වෙන කාරණා සියල්ල ම හෝ යම් කාරණා සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය:-

(අ) මේ කොටසේ නියම කරනු ලැබිය යුතු බවට දක්වා ඇති සියලු කාරණා;

(ආ) ශ්‍රී ලංකා ගමන් ලේඛන නිකුත් කිරීම හෝ අලුත් කිරීම සඳහා ඉල්ලුම් පත්‍ර සකස් කිරීම, එකී ඉල්ලුම් පත්‍රවල ආකෘතිය සහ එයට ඇතුළත් කරනු ලැබිය යුතු විස්තර;

(ඇ) මහජන යහපත පිණිස අමාත්‍යවරයා විසින් අවශ්‍ය යයි සලකනු ලැබිය හැකි යම් නියමයන් සහ කොන්දේසි ඇතුළුව යම් ශ්‍රී ලංකා ගමන් ලේඛනවලට අනුයුක්ත කරනු ලැබිය යුතු නියමයන් සහ කොන්දේසි;

(ඈ) එකී ශ්‍රී ලංකා ගමන් ලේඛනවල ආකෘතිය සහ ඊට ඇතුළත් කරනු ලැබිය යුතු විස්තර;

(ඉ) එකී ශ්‍රී ලංකා ගමන් ලේඛන නිකුත් කිරීමට හෝ අලුත් කිරීමට අදාළ ගාස්තු;

(ඊ) මේ පනත යටතේ වන කාර්යයන් සඳහා හඳුනා ගැනීමේ තොරතුරු භාවිත කිරීමේ ක්‍රියාවලිය; සහ

(උ) මේ කොටසේ සඳහන් කරන ලද කාරණා සහ විෂයයන්ට ආනුෂංගික හෝ සම්බන්ධ සියලු කාරණා.

## VIII වන කොටස

## වැරදි

### I වන පරිච්ඡේදය

### සාමාන්‍ය වැරදි

නීති විරෝධී ලෙස ශ්‍රී ලංකාවට ඇතුළු වීම හෝ ශ්‍රී ලංකාව තුළ රැඳී සිටීම

**124.** (1) (අ) මේ පනතේ යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් උල්ලංඝනය කරමින්, ශ්‍රී ලංකාවට ඇතුළු වන හෝ ශ්‍රී ලංකාව තුළ රැඳී සිටින ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන යම් තැනැත්තකු විසින් වරදක් සිදු කරනු ලබන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබීමේ දී රුපියල් පනස්දහසකට නොවැඩි දඩයකට හෝ මාස හයකට නොවැඩි කාලසීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

(ආ) මේ පනතේ විධිවිධාන හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයකට අනුව ශ්‍රී ලංකාවට ඇතුළු වන, නමුත් මේ පනතේ විධිවිධාන යටතේ ශ්‍රී ලංකාවේ රැඳී සිටීමට බලය ලබා දී ඇති කාලසීමාව ඉකුත් වීමෙන් පසුව ශ්‍රී ලංකාව තුළ රැඳී සිටින ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන යම් තැනැත්තකු විසින් වරදක් සිදු කරනු ලබන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබීමේ දී රුපියල් පනස්දහසකට නොවැඩි දඩයකට හෝ මාස තුනකට නොවැඩි කාලසීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

(2) (අ) (1) වන උපවගන්තිය යටතේ වරදක් සිදු කිරීමට තැත් කරන, ආධාර කරන හෝ අනුබල දෙන; හෝ

(ආ) (1) වන උපවගන්තිය යටතේ වරදක් සිදු කිරීම සඳහා යම් ආරම්භක ක්‍රියාවක් සිදු කරන,

යම් තැනැත්තකු විසින් වරදක් සිදු කරනු ලබන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින්

පසුව වරදකරු කරනු ලැබීමේ දී රුපියල් ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ අවුරුද්දකට නොවැඩි කාලසීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

**ආගමන ක්‍රියාවලියෙන් තොරව ඇතුළු වීම හෝ පිට වීම**

**125.** (1) මෙ පනතේ විධිවිධානවලට පටහැනිව ශ්‍රී ලංකාවට ඇතුළු වන හෝ ශ්‍රී ලංකාවෙන් පිට වන යම් තැනැත්තකු විසින් වරදක් සිදු කරනු ලබන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබීමේ දී රුපියල් පනස්දහසකට නොවැඩි දඩයකට හෝ මාස හයකට නොවැඩි කාලසීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වරදක් සිදු කිරීමට තැත් කරන හෝ වරදක් සිදු කිරීමට ආධාර කරන හෝ අනුබල දෙන යම් තැනැත්තකු විසින්, වරදක් සිදු කරනු ලබන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්නු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබීමේ දී රුපියල් ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ මාස හයකට නොවැඩි කාලසීමාවක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

**තැනැත්තන් ගෙන ඒමේ, සැපයීමේ, සැඟවීමේ, සඟවා තබා ගැනීමේ හෝ සේවයේ යෙදවීමේ වැරදි**

**126.** (1) (අ) වෙනත් තැනැත්තා ශ්‍රී ලංකාවට ඇතුළු වීම මේ පනතේ යම් විධිවිධානයකට හෝ ඒ යටතේ සාදන ලද යම් නියමයකට හෝ නියෝගයකට පටහැනි වන්නේ නම් හෝ පටහැනි විය හැකි බව දැන දැනම වෙනත් තැනැත්තකු කවර හෝ යම් ආකාරයකින් ශ්‍රී ලංකාවට ගෙන එනු ලබන හෝ සපයනු ලබන;

(ආ) වෙනත් තැනැත්තා ශ්‍රී ලංකාවට ඇතුළු වී ඇත්තේ හෝ ශ්‍රී ලංකාව තුළ රැඳී සිටින්නේ මේ පනතේ යම් විධිවිධානයකට හෝ ඒ යටතේ සාදන ලද යම් නියමයකට හෝ නියෝගයකට පටහැනිව බව දැන දැනම, කවර හෝ යම් ස්ථානයක වෙනත් යම් තැනැත්තකු සඟවනු ලබන හෝ රැක වසන් කරන හෝ එම වෙනත් තැනැත්තා කවර හෝ ආකාරයකින්

ප්‍රවාහනය කරනු ලබන හෝ ප්‍රවාහනය කිරීමට කටයුතු සලස්වනු ලබන; හෝ

(ඇ) වෙනත් තැනැත්තා ශ්‍රී ලංකාවට ඇතුළු වී ඇත්තේ හෝ ශ්‍රී ලංකාව තුළ රැඳී සිටින්නේ මේ පනතේ යම් විධිවිධානයකට හෝ ඒ යටතේ සාදන ලද යම් නියමයකට හෝ නියෝගයකට පටහැනිව බව දැන දැනම, වෙනත් යම් තැනැත්තකු සේවයේ යොදවන,

යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ වරදක් කරනු ලබන අතර, වරදකරු කරනු ලැබීමේ දී රුපියල් ලක්ෂ පහකට නොවැඩි දඩයකට හෝ අවුරුදු පහකට නොවැඩි කාලසීමාවක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

(2) (අ) (1) වන උපවගන්තිය යටතේ වරදක් කිරීමට උත්සාහ කරන හෝ වරදක් කිරීමට ආධාර කරන හෝ අනුබල දෙන; හෝ

(ආ) (1) වන උපවගන්තියේ (අ) ඡේදය හෝ (ආ) ඡේදය යටතේ වරදක් කිරීමට මූලික වන යම් ක්‍රියාවක් සිදු කරන,

යම් තැනැත්තකු විසින් වරදක් සිදු කරන ලබන අතර, වරදකරු කරනු ලැබීමේ දී රුපියල් ලක්ෂ පහකට නොවැඩි දඩයකට හෝ අවුරුදු දෙකකට නොඅඩු සහ අවුරුදු පහකට නොවැඩි බරපතළ වැඩ සහිත බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

**සාමාන්‍ය වැරදිවලට සම්බන්ධ ලේඛනගත වැරදි**

**127.** (1) (අ) නීත්‍යානුකූල අධිකාරයකින් තොරව, වීසා පත්‍ර නිකුත් කිරීම සඳහා භාවිත කරනු ලබන යම් ගමන් ලේඛනයක් හෝ එහි කොටසක් හෝ වෙනත් ලේඛනයක් හෝ එහි කොටසක් මුද්‍රණය කරන, පිටපත් කරන, ව්‍යාජ ලෙස සකස් කරන හෝ පිළියෙල කරන;

(ආ) නීත්‍යානුකූල අධිකාරයකින් තොරව, ශ්‍රී ලංකා රජයට හෝ වෙනත් යම් රජයකට අදාළ යම් වීසා පත්‍රයක්

හෝ එහි කොටසක් මුද්‍රණය කරන, පිටපත් කරන, ව්‍යාජ ලෙස සකස් කරන හෝ පිළියෙල කරන;

(ඇ) ශ්‍රී ලංකාවේ දී හෝ වෙනත් ස්ථානයක දී නිකුත් කරන ලද යම් ගමන් ලේඛනයක් හෝ එහි කොටසක් හෝ යම් වීසා පත්‍රයක් හෝ එහි පිටසන් කිරීමක් කූට ලෙස සකස් කරන, වෙනස් කරන හෝ අනවසර වෙනස්කම් කරන;

(ඈ) (අ), (ආ) හෝ (ඇ) ඡේදයක සඳහන් කරන ලද යම් ලේඛනයක පිටසන් කරන ලද යම් සහතිකයක් කූට ලෙස සකස් කරන, වෙනස් කරන හෝ අනවසර වෙනස්කම් කරන;

(ඉ) නීත්‍යනුකූල අධිකාරයකින් තොරව, කූට ලෙස සකස් කරන ලද, වෙනස් කරන ලද හෝ අනවසර වෙනස්කම් කරන ලද ගමන් ලේඛනයක් හෝ එහි කොටසක් හෝ කූට ලෙස සකස් කරන ලද, වෙනස් කරන ලද හෝ අනවසර වෙනස්කම් කරන ලද වීසා පත්‍රයක් හෝ පිටසනක් අන්තර්ගත වන ගමන් ලේඛනයක් භාවිත කරන හෝ සිය සන්තකයේ තබා ගෙන ඇති;

(ඊ) නීත්‍යනුකූල අධිකාරයකින් තොරව, කූට ලෙස සකස් කරන ලද, වෙනස් කරන ලද හෝ අනවසර වෙනස්කම් කරන ලද සහතිකයක් අන්තර්ගත වන කූට ලෙස සකස් කරන ලද, වෙනස් කරන ලද හෝ අනවසර වෙනස්කම් කරන ලද ගමන් ලේඛනයක් හෝ එහි කොටසක් භාවිත කරන හෝ සිය සන්තකයේ තබා ගෙන ඇති;

(උ) නීත්‍යනුකූල අධිකාරයකින් හෝ නීත්‍යනුකූල අවසරයකින් තොරව, වෙනත් තැනැත්තන්ගේ ගමන් ලේඛන සිය සන්තකයේ තබා ගෙන සිටින හෝ යම් ආකාරයකින් ජාවාරම් කරන;

(ඌ) අමාත්‍යවරයා හෝ පාලක ජනරාල්වරයා හෝ යම් බලයලත් නිලධරයකු හෝ මේ පනතේ විධිවිධාන හෝ ඒ යටතේ සාදන ලද යම් නියමයක් හෝ

නියෝගයක් ක්‍රියාත්මක කිරීමේ දී නීත්‍යානුකූලව ක්‍රියා කරන වෙනත් තැනැත්තකු හෝ යම් ගුවන් සේවා නිලධරයකු හෝ යම් බලයලත් ගමන් නියෝජිතයකු වෙත පිළිතුරු වශයෙන් හෝ ඔවුන්ට සම්බන්ධ යම් කාරණාවක දී, යම් සාවද්‍ය වාර්තාවක්, සාවද්‍ය ප්‍රකාශයක් හෝ සාවද්‍ය නියෝජනයක් සිදු කරන හෝ සිදු කරනු ලැබීමට කටයුතු සලස්වන;

(එ) නීත්‍යානුකූල අධිකාරයකින් තොරව යම් ගුවන් ප්‍රවේශ පත්‍රයක්, කාර්ය මණ්ඩල පිරිස මුදා හැරීමේ සහතිකය, ගුවන් යානයට ගොඩවන මගියකුගේ අසුන්පත හෝ එවැනි ස්වභාවයක යම් ලේඛනයක්, යම් ආකාරයකින් මුද්‍රණය කරන, පිටපත් කරන, පිළියෙල කරන හෝ සිය සන්තකයේ තබා ගන්නා, ඉදිරිපත් කරන හෝ භාවිත කරන;

(ඒ) මේ පනත යටතේ හෝ ඒ යටතේ සාදනු ලබන යම් නියෝගයක් හෝ නියමයක් යටතේ ස්වකීය බලතල සහ කාර්යයන් ක්‍රියාත්මක කිරීමේ දී හෝ ඉටු කිරීමේ දී තැනැත්තකුට බාධා කරන හෝ අවහිර කරන;

(ඔ) නීත්‍යානුකූල අධිකාරයකින් තොරව, ඔහු වෙත නිකුත් කර ඇති තත්කාලයේ බලපවත්නා ගමන් ලේඛන එකකට වැඩි ගණනක් සිය සන්තකයේ තබා ගෙන ඇති;

(ඕ) ඔහු වෙත නිකුත් කර ඇති තත්කාලයේ බලපවත්නා වලංගු ගමන් ලේඛනයක් සිය සන්තකයේ තිබෙන අතරතුර, එය බලපවත්නා කාලසීමාව තුළ මේ පනතේ 109 වන වගන්තිය යටතේ නිකුත් කර ඇති රාජකාරී හෝ රාජ්‍යතාන්ත්‍රික ගමන් බලපත්‍රයක් හැර, තවත් ගමන් ලේඛනයක් නිකුත් කිරීම සඳහා ඉල්ලුම් කරන;

(ක) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන සහ නීත්‍යානුකූල අධිකාරයකින් හෝ නීත්‍යානුකූල අවසරයකින් තොරව වලංගු ශ්‍රී ලංකා ගමන් ලේඛනයක් සිය සන්තකයේ තබා ගෙන සිටින;

(ග) 118 වන වගන්තිය යටතේ එම තැනැත්තා වෙත නිකුත් කර ඇති ශ්‍රී ලංකා ගමන් ලේඛනයක් ආපසු භාර දී ඇති අතරතුර, තවත් ගමන් ලේඛනයක් සඳහා ඉල්ලුම් කරන;

(ච) ඔහු වෙනුවෙන් හෝ වෙනත් යම් තැනැත්තකු වෙනුවෙන් වීසා පත්‍රයක් හෝ වෙනත් යම් ගමන් ලේඛනයක් ලබා ගැනීමේ කාර්ය සඳහා, යම් කූට ලෙස සකස් කරන ලද හෝ සාවද්‍ය ලේඛන හෝ සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කරන;

(ජ) ශ්‍රී ලංකා ගමන් ලේඛනයක් විකුණන;

(ට) හිතාමතාම ශ්‍රී ලංකා ගමන් ලේඛනයකට හානි කරන හෝ එය විනාශ කරන;

(ඩ) මේ පනත යටතේ වරදක් කිරීමට වෙනත් තැනැත්තකුව පොලඹවන; හෝ

(ණ) අන්‍යාකාරයකින් මේ පනත යටතේ විධිවිධානවලට පටහැනිව කටයුතු කරන හෝ අනුකූලව කටයුතු කිරීමට අපොහොසත් වන,

යම් තැනැත්තකු විසින් වරදක් සිදු කරනු ලබන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබීමේ දී, රුපියල් ලක්ෂ දෙකකට නොවැඩි දඩයකට හෝ අවුරුදු දෙකකට නොවැඩි කාලසීමාවක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වරදක් සිදු කිරීමට උත්සාහ කරන හෝ වරදක් සිදු කිරීමට මූලික වන යම් ක්‍රියාවක් සිදු කරන හෝ වරදක් සිදු කිරීමට ආධාර කරන හෝ අනුබල දෙන යම් තැනැත්තකු විසින්, මේ පනත යටතේ වරදක් සිදු කරනු ලබන අතර, වරදකරු කරනු ලැබීමේ දී, ඔහු විසින් (1) වන උපවගන්තිය යටතේ වන වරදකට වරදකරු වී වරදකරු කරනු ලැබුවහොත් ලැබෙන දඬුවමට ම යටත් විය යුතු ය.

ශ්‍රී ලංකාව ඇතුළත හෝ ශ්‍රී ලංකාවෙන් පිටත ගමන් ලේඛනයක් තබා ගැනීම, ගෙන යාම, පිටත් කර යැවීම හෝ සම්ප්‍රේෂණය කිරීම සඳහා බලය ලබා දීම

**128.** (1) පාලක ජනරාල්වරයා විසින්-

(අ) විදේශ සේවා නියුක්තිය, විදේශ ගමන් හෝ විදේශ චාරිකා සංවිධානය කිරීමට සම්බන්ධ නීත්‍යානුකූල කටයුත්තක නිරත වන තැනැත්තකු හෝ පුද්ගල මණ්ඩලයක් වෙත යම් ශ්‍රී ලංකා ගමන් ලේඛනයක් ශ්‍රී ලංකාව ඇතුළත තබා ගැනීම හෝ ගෙන යාම සඳහා බලය ලබා දිය හැකි ය;

(ආ) වලංගු ශ්‍රී ලංකා ගමන් ලේඛනයක් දරන්නකු වන ශ්‍රී ලංකාවෙන් පිටත පදිංචි යම් තැනැත්තකුට එකී ගමන් ලේඛනය තැපැල මගින් හෝ වෙනත් තැනැත්තකු හරහා ශ්‍රී ලංකාව තුළ පදිංචි තැනැත්තකු වෙත යැවීම හෝ සම්ප්‍රේෂණය කිරීම සඳහා බලය ලබා දිය හැකි ය;

(ඇ) වලංගු ශ්‍රී ලංකා ගමන් ලේඛනයක් දරන්නකු වන ශ්‍රී ලංකාව තුළ පදිංචි යම් තැනැත්තකුට එකී ගමන් ලේඛනය තැපැල මගින් හෝ වෙනත් තැනැත්තකු හරහා ශ්‍රී ලංකාවෙන් පිටත පදිංචි තැනැත්තකු වෙත යැවීම හෝ සම්ප්‍රේෂණය කිරීම සඳහා බලය ලබා දිය හැකි ය; හෝ

(ඈ) විදේශීය ජාතිකයන් සඳහා ශ්‍රී ලංකාව තුළ ගමන් හෝ සංචාර සංවිධානය කිරීම සම්බන්ධ නීත්‍යානුකූල කටයුත්තක නිරත වන යම් තැනැත්තකුට හෝ පුද්ගල මණ්ඩලයකට ශ්‍රී ලංකාව ඇතුළත යම් විදේශීය ගමන් ලේඛනයක් තබා ගැනීමට හෝ රැගෙන යාමට බලය ලබා දිය හැකි යː

එසේ වුව ද, එවැනි තැනැත්තකු විසින්, පාලක ජනරාල්වරයාගේ පූර්ව ලිඛිත අනුමතයකින් තොරව එවැනි ශ්‍රී ලංකා ගමන් ලේඛනයක් තබා ගැනීම හෝ රැගෙන යාම හෝ යැවීම හෝ සම්ප්‍රේෂණය කිරීම සිදු කරනු නොලැබිය යුතු ය.

(2) (අ) ශ්‍රී ලංකාවෙන් පිටත පදිංචිව සිටින අතරතුර, යම් විදේශීය රජයකින් නිකුත් කරන ලද වලංගු විදේශ ගමන් බලපත්‍රයක් හෝ ගමන් ලේඛනයක් දරන්නකු වන යම් තැනැත්තකු විසින්, එකී විදේශ ගමන් බලපත්‍රය හෝ ගමන් ලේඛනය නිකුත් කරන ලද විදේශීය රජයේ නීත්‍යානුකූල අධිකාරයකින් තොරව, එකී ගමන් ලේඛනය ශ්‍රී ලංකාව තුළ පදිංචි තැනැත්තකු වෙත තැපැල මගින් හෝ වෙනත් තැනැත්තකු හරහා යැවීම හෝ සම්ප්‍රේෂණය කිරීම සිදු කරනු නොලැබිය යුතු ය; හෝ

(ආ) ශ්‍රී ලංකාව තුළ පදංචිව සිටින අතරතුර, යම් විදේශීය රජයකින් නිකුත් කරන ලද වලංගු විදේශ ගමන් බලපත්‍රයකක් හෝ ගමන් ලේඛනයක් දරන්නකු වන යම් තැනැත්තකු විසින්, එකී විදේශ ගමන් බලපත්‍රය හෝ ගමන් ලේඛනය නිකුත් කරන ලද විදේශීය රජයේ නීත්‍යානුකූල අධිකාරයකින් තොරව, එකී ගමන් ලේඛනය ශ්‍රී ලංකාවෙන් පිටත පදිංචි තැනැත්තකු වෙත තැපැල මගින් හෝ වෙනත් තැනැත්තකු හරහා යැවීම හෝ සම්ප්‍රේෂණය කිරීම සිදු කරනු නොලැබිය යුතු ය.

(3) (1) වන හෝ (2) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරන යම් තැනැත්තකු විසින් වරදක් කරනු ලබන අතර, මහේස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබීමේ දී රුපියල් ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ මාස හයකට නොවැඩි කාලසීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

මේ පනත යටතේ වරදක් සිදු කිරීමෙන් ලබා ගන්නා ලද දේපළවල සන්තකය

**129.** (1) යම් මුදලක් හෝ දේපළක් සම්පූර්ණයෙන් ම හෝ එහි කොටසක්, මේ පනත යටතේ වන වරදක් සිදු කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් ලැබුණු බව හෝ ව්‍යුත්පන්න වූ බව දැනුම්වත්ව ම එකී මුදල හෝ දේපළ සන්තකයේ තබා ගන්නා යම් තැනැත්තකු විසින් වරදක් සිදු කරනු ලබන්නේ ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වරදක් සිදු කරන යම් තැනැත්තකු, අධිචෝදනාවක් මත මහාධිකරණය විසින් වරදකරු කරනු ලැබීමේ දී, අවුරුදු විස්සකට නොවැඩි කාලසීමාවක් සඳහා

දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් ලක්ෂ පහකට නොවැඩි දඩයකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

(3) මේ වගන්තිය යටතේ යම් තැනැත්තකු වරදකරු කරනු ලබන අවස්ථාවක දී, අධිකරණය විසින්, එම වරද සඳහා දඬුවම් නියම කිරීමට අමතරව, වරද සිදු කිරීමට සම්බන්ධ යම් දේපළක් රජය සතු කරන ලෙසට ආඥාවක් කරනු ලැබිය හැකි ය.

(4) මේ වගන්තියේ කාර්ය සඳහා, වරද සිදු කිරීමට සම්බන්ධ දේපළට, (1) වන උපවගන්තියේ සඳහන් කරන ලද මුදල් හෝ දේපළ, යම් වාහනයක්, යාත්‍රාවක්, ව්‍යවහාර මුදලක් හෝ මේ පනත යටතේ යම් වරදක් සිදු කිරීම සම්බන්ධයෙන් භාවිත කරන ලද වෙනත් යම් වස්තුවක් හෝ දෙයක් ඇතුළත් විය හැකි ය.

රාජ්‍ය නිලධරයන් හෝ වෙනත් යම් තැනැත්තකු විසින් සිදු කරනු ලබන වැරදි

**130.** (1) (අ) දැන දැනම මේ පනතේ විධිවිධානවලට පටහැනිව යම් සාවද්‍ය ලේඛන සාදන හෝ නිකුත් කරන;

(ආ) යම් පිටසන් කිරීමක් මේ පනතේ විධිවිධානවලට පටහැනි බව දැන දැනම ශ්‍රී ලංකා ගමන් ලේඛනයක් එසේ පිටසනක් කරන;

(ඇ) මේ පනත මගින් ඔහු වෙත පවරා ඇති යම් කාර්යයක් හෝ කර්තව්‍යයක් කිරීම හෝ ඉටු කිරීම සම්බන්ධයෙන් දැන දැනම සාවද්‍ය ප්‍රකාශයක් සිදු කරන හෝ නිකුත් කරන;

(ඈ) මේ පනත මගින් ඔහු වෙත පවරා ඇති යම් කාර්යයක් හෝ කර්තව්‍යයක් කිරීම හෝ ඉටු කිරීම දැන දැනම පැහැර හරින;

(ඉ) මේ පනත යටතේ ඔහු වෙත නියම කරන ලද යම් ක්‍රියාවක් කිරීමට හෝ නොකිරීමට, අල්ලසක් ලබා ගන්නා හෝ ලබා ගැනීමට එකඟ වන හෝ ඉල්ලා සිටින;

(ඊ) අන්‍යාකාරයකින් යම් විධිවිධානයක් උල්ලංඝනය කරන හෝ යම් විධිවිධානයකට අනුකූලව කටයුතු කිරීම පැහැර හරින හෝ මේ පනත යටතේ වරදක් සිදු කරන;

(උ) (අ), (ආ), (ඇ) හෝ (ඈ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති යම් ක්‍රියාවක් සිදු කිරීමට වෙනත් යම් තැනැත්තකුට සහාය වන හෝ අනුබල දෙන; හෝ

(ඌ) දැන දැනම මේ පනත යටතේ වරදක් සිදු කිරීමට වෙනත් තැනැත්තකුව පොලඹවන,

රාජ්‍ය නිලධරයකු ඇතුළු යම් තැනැත්තකු විසින් වරදක් සිදු කරනු ලබන්නේ යඃ

එසේ වුව ද, එම වරද සිදු කරන ලද්දේ තමාගේ දැනුම නොමැතිව බව හෝ එම වරද සිදු කිරීම වැළැක්වීම සඳහා තමා සියලු නිසි උද්‍යෝගයෙන් ක්‍රියා කළ බව එම තැනැත්තා විසින් ඔප්පු කරනු ලැබුවහොත්, එම තැනැත්තා එම වරද සම්බන්ධයෙන් වරදකරු වන්නේ යයි සලකනු නොලැබිය යුතු ය.

(2) අධිචෝදනාවත් මත මහාධිකරණය විසින්, (1) වන උපවගන්තිය යටතේ වරදකට වරදකරු කරනු ලැබූ යම් තැනැත්තකු, අවුරුදු දෙකකට නොවැඩි කාලසීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් ලක්ෂ දෙකකට නොවැඩි දඩයකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

**රජයේ නිලධරයන් වශයෙන් පෙනී සිටීම**

**131.** මේ පනතේ කාර්ය සඳහා, රජයේ නිලධරයකු වශයෙන් පෙනී සිටින හෝ යම් ක්‍රියාවක් කිරීමකින් හෝ නොකර හැරීමකින් එකී තැනැත්තා රජයේ නිලධරයකු වන බව වෙනත් යම් තැනැත්තකුට විශ්වාස කිරීමට සලස්වන යම් තැනැත්තකු විසින් වරදක් සිදු කරනු ලබන අතර, අධිචෝදනාවක් මත මහාධිකරණය විසින් වරදකරු කරනු ලැබීමේ දී අවුරුදු පහකට නොවැඩි කාලසීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් ලක්ෂ පහකට නොවැඩි දඩයකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

**පුද්ගල මණ්ඩලයක් විසින් සිදු කරනු ලබන වැරදි**

**132.** පුද්ගල මණ්ඩලයක් විසින් මේ පනත යටතේ වරදක් කරනු ලබන අවස්ථාවක දී, එම පුද්ගල මණ්ඩලය-

(අ) සංස්ථාවක් නම්, එම සංස්ථාවේ සෑම අධ්‍යක්ෂවරයකු ම සහ නිලධරයකු ම;

(ආ) ව්‍යාපාර ආයතනයක් නම්, එම ව්‍යාපාර ආයතනයේ සෑම හවුල්කරුවකු ම; හෝ

(ඇ) ව්‍යාපාර ආයතනයක් නොවන සංස්ථාපිත නොකළ මණ්ඩලයක් නම්, එහි කළමනාකාරිත්වය සහ පාලනය සඳහා වගකිව යුතු එම මණ්ඩලයේ සෑම නිලධරයකු ම,

එකී වරද සඳහා වරදකරුවකු ලෙස සලකනු ලැබිය යුතු යः

එසේ වුව ද, එම වරද සිදු කරන ලද්දේ තමාගේ දැනුම නොමැතිව බව හෝ එම වරද සිදු කිරීම වැළැක්වීම සඳහා තමා සියලු නිසි උද්‍යෝගයෙන් ක්‍රියා කළ බව එම තැනැත්තා විසින් ඔප්පු කරනු ලැබුවහොත්, එම තැනැත්තා එම වරද සම්බන්ධයෙන් වරදකරු වන්නේ යයි සලකනු නොලැබිය යුතු ය.

කිසිදු නිශ්චිත විධිවිධාන සලස්වා නොමැති උල්ලංඝනය කිරීම් සඳහා වන දණ්ඩන

**133.** යම් තැනැත්තකු විසින්, මේ පනතේ විධිවිධානයක් හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ නියමයක් උල්ලංඝනය කරනු ලබන සහ එකී උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් පනත යටතේ කිසිදු දණ්ඩනයක් නිශ්චිතව දක්වනු ලැබ නොමැති අවස්ථාවක දී, එකී තැනැත්තා, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ විධිවිධානවලට අනුව, මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබීමේ දී, රුපියල් පනස්දහසකට නොවැඩි දඩයකට හෝ මාස හයකට නොවැඩි කාලසීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

සංඥෙය විය යුතු වැරදි, අධිකරණ බලය සහ නඩු පැවරීම

**134.** (1) මේ පනත යටතේ වන සියලු වැරදි, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ පළමු උපලේඛනයේ කුමක් අන්තර්ගත වුව ද, එම පනතේ විධිවිධාන අදාළ කර ගැනීමේ කාර්ය සඳහා සංඥෙය වැරදි විය යුතු ය.

(2) අධිචෝදනාවක් මත මහාධිකරණය විසින් විභාග කර සහ නිශ්චය කරනු ලැබීමට මේ පනත මගින් ප්‍රකාශිතව පවරා ඇති වැරදි හැර, සියලු වැරදි, මහෙස්ත්‍රාත්වරයකු විසින් ලඝු කාර්යපටිපාටිය අනුව විභාග කරනු ලැබිය හැකි විය යුතු අතර, එකී මහෙස්ත්‍රාත්වරයා විසින් මේ පනත මගින් නියම කර ඇති යම් දඬුවමක්, එකී දඬුවම ඔහුගේ සාමාන්‍ය අධිකරණ බලයේ බලතල ඉක්මවා යන්නේ වුව ද, පනවනු ලැබීම නීත්‍යනුකූල වන්නේ ය.

(3) මේ පනත යටතේ වන වරදක් සඳහා, අවස්ථාවෝචිත පරිදි, පාලක ජනරාල්වරයා විසින් හෝ සහකාර පොලිස් අධිකාරි නිලයට නොඅඩු නිලයක් දරන පොලිස් නිලධරයකු විසින් හෝ පාලක ජනරාල්වරයා හෝ සහකාර පොලිස් අධිකාරි නිලයට නොඅඩු නිලයක් දරන පොලිස් නිලධරයකු විසින් දෙන ලද ලිඛිත අවසරයක් සහිත වෙනත් යම් ආගමන නිලධරයකු හෝ පොලිස් නිලධරයකු විසින් හැර, කිසිදු නඩු පැවරීමක් සිදු කරනු නොලැබිය යුතු ය.

**ඇප ලබා දීම**

**135.** (1) වෙනත් යම් නීතියක කවරක් සඳහන් වුව ද, 136, 137, 138 හෝ 139 යන වගන්තිය යටතේ වන සෑම වරදක් ම ඇප දිය නොහැකි වරදක් විය යුතු අතර, එවැනි වරදකට චෝදනා ලබන තැනැත්තකු ඇප සඳහා පිළිගනු නොලැබිය යුතු ය.

(2) 136, 137, 138 හෝ 139 යන වගන්තිය යටතේ වන වරදකට චෝදනා ලැබ ඇති තැනැත්තකු ව්‍යතිරේක අවස්ථානුගත කරුණු සම්බන්ධයෙන් ඔප්පු කිරීමෙන් පසුව මහාධිකරණය විසින් ඇප මත මුදාහරිනු ලැබිය හැකි ය.

(3) මේ පනත යටතේ වන වරදක් සඳහා ඇප ලබා දීම සම්බන්ධයෙන් කිසිදු ප්‍රකාශිත විධිවිධානයක් සලස්වා නොමැති අවස්ථාවක දී, මහෙස්ත්‍රාත් අධිකරණය විසින් ඇප දෙනු ලැබිය යුතු ය.

## II වන පරිච්ඡේදය

## මිනිස් අවහරණය

**ශ්‍රී ලංකාව වෙත මිනිස් අවහරණය**

**136.** (1) කෙලින්ම හෝ අන්‍යාකාරයකින් මූල්‍යමය හෝ ද්‍රව්‍යමය ප්‍රතිලාභයක් හෝ වෙනත් යම් ප්‍රතිෂ්ඨාවක් ලබා ගැනීම පිණිස,-

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන තැනැත්තකුට නීති විරෝධී ලෙස ශ්‍රී ලංකාවට ඇතුළු වීමට සලස්වන;

(ආ) වෙනත් යම් තැනැත්තකු ශ්‍රී ලංකාවට ඇතුළු වීම මේ පනතේ විධිවිධාන උල්ලංඝනය කිරීමක් බව දැන දැනම යම් මාර්ගයකින් එම වෙනත් තැනැත්තා ශ්‍රී ලංකාවට ගෙන එන හෝ ඔහුට ශ්‍රී ලංකාවට ඇතුළු වීමට සලස්වන;

(ඇ) වෙනත් යම් තැනැත්තකු මේ පනතේ විධිවිධාන උල්ලංඝනය කරමින් ශ්‍රී ලංකාවට ඇතුළු වී ඇති බව හෝ ශ්‍රී ලංකාව තුළ රැඳී සිටින බව දැන දැනම යම් ආකාරයකින් එකී වෙනත් තැනැත්තා යම් ස්ථානයක සඟවා තබන හෝ එවැනි තැනැත්තකු රැක වසන් කරන හෝ එකී වෙනත් යම් තැනැත්තා ප්‍රවාහනය කරන හෝ එකී වෙනත් යම් තැනැත්තා ප්‍රවාහනය කරනු ලැබීමට කටයුතු කරන; හෝ

(ඈ) වෙනත් යම් තැනැත්තකු මේ පනතේ විධිවිධාන උල්ලංඝනය කරමින් ශ්‍රී ලංකාවට ඇතුළු වී ඇති බව හෝ ශ්‍රී ලංකාවේ රැඳී සිටින බව සහ එකී යම් තැනැත්තා මේ පනතේ විධිවිධාන උල්ලංඝනය කිරීම වෙනුවෙන් නීතිය මගින් වරදකරු කරනු ලැබ නොමැති බව දැන දැනම එම වෙනත් තැනැත්තා සේවයේ නියුක්ත කරවන,

යම් තැනැත්තකු විසින් මිනිස් අවහරණය පිළිබඳ වරදක් සිදු කරනු ලබන අතර, ඔහු වරදකරු කරනු ලැබීමේ දී අවුරුදු පහකට නොඅඩු සහ අවුරුදු විස්සකට නොවැඩි කාලසීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට සහ රුපියල් මිලියනයකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය.

(2) (අ) (1) වන උපවගන්තිය යටතේ වන යම් වරදක් සිදු කිරීමට තැත් කරන හෝ එම වරද කිරීමට සහාය දක්වන හෝ අනුබල දෙන; හෝ

(ආ) (1) වන උපවගන්තිය යටතේ වන යම් වරදක් සිදු කිරීම සඳහා යම් ආරම්භක ක්‍රියාවක් සිදු කරන,

යම් තැනැත්තකු විසින් මිනිස් අවහරණය පිළිබඳ වරදක් සිදු කරනු ලබන අතර, ඔහු වරදකරු කරනු ලැබීමේ දී අවුරුදු පහකට නොවැඩි කාලසීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට සහ රුපියල් ලක්ෂ පහකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය.

(3) සැක දුරු කිරීම සඳහා, මේ වගන්තියේ විධිවිධානවලින් මිනිස් අවහරණකරුවන් හඳුනා ගෙන දඬුවම් කිරීමට පමණක් අදහස් කරනු ලබන අතර, අවහරණයට ලක් වී ඇති හෝ අවහරණයට

ලක් වෙමින් සිටින තැනැත්තන්ට දඬුවම් කිරීමට අදහස් කරනු නොලබන බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

ශ්‍රී ලංකාවෙන් මිනිස් අවහරණය කිරීම

**137.** (1) කෙලින්ම හෝ අන්‍යාකාරයකින් මූල්‍යමය හෝ ද්‍රව්‍යමය ප්‍රතිලාභ හෝ වෙනත් යම් ප්‍රතිෂ්ඨාවන් ලබා ගැනීම පිණිස, වෙනත් තැනැත්තකුව-

(අ) විදේශ රටක නීති උල්ලංඝනය කරමින් එම රටට ඇතුළු වීම පිණිස, මේ පනතේ විධිවිධාන උල්ලංඝනය කරමින් ශ්‍රී ලංකාවෙන් පිට වීමට;

(ආ) ශ්‍රී ලංකාවේ නීතිවලට අනුකූලව ශ්‍රී ලංකාවෙන් පිට වී වෙනත් යම් විදේශ රටක නීතිවලට අනුකූලව එම රටට ඇතුළු වීමට සහ ඉන්පසුව තුන්වන රටකට එම තුන්වන රටේ නීති උල්ලංඝනය කරමින් නීති විරෝධී ලෙස ඇතුළු වීමට;

(ඇ) යම් විදේශ රටක නීති උල්ලංඝනය කරමින් එම රටට ඇතුළු වීම පිණිස ශ්‍රී ලංකාවේ නීතිවලට අනුකූලව ශ්‍රී ලංකාවෙන් පිට වීමට; හෝ

(ඈ) විදේශ රටක නීතිවලට අනුකූලව එම රටට ඇතුළු වීම පිණිස මේ පනතේ විධිවිධාන උල්ලංඝනය කරමින් ශ්‍රී ලංකාවෙන් පිට වීමට,

සංවිධානය කරන යම් තැනැත්තකු විසින් මිනිස් අවහරණය පිළිබඳ වරදක් සිදු කරනු ලැබේ.

(2) (1) වන උපවගන්තියේ කාර්ය සඳහා, "සංවිධානය කරනු ලැබේ." යන යෙදුමට,-

(අ) ශ්‍රී ලංකාවෙන් පිට වී වෙනත් රටකට යාමට තැනැත්තන් පෙලඹවීමේ අභිප්‍රාය ඇතිව සාවද්‍ය පොරොන්දු දෙමින් හෝ නොමඟ යවන සුලු තොරතුරු ප්‍රචාරණය කරමින් කෙලින්ම හෝ අන්‍යාකාරයකින් මූල්‍යමය හෝ ද්‍රව්‍යමය ප්‍රතිලාභ ලබා ගැනීම පිණිස තැනැත්තන් බඳවා ගැනීම;

(අ) ඡේදයේ කාර්ය සඳහා, සාවද්‍ය පොරොන්දු හෝ නොමඟ යවන සුලු තොරතුරු යන්නට, සේවා නියුක්තිය, අධ්‍යාපනය හෝ වඩා හොඳ ජීවන තත්ත්වයකට අදාළ පොරොන්දු හෝ තොරතුරු ඇතුළත් වේ;

(ආ) තැනැත්තන්ගෙන්, උපලබ්ධි වුව ද, නොවූව ද, මුදල් ප්‍රතිලාභ ඉල්ලා සිටීම;

(ඇ) තත්කාර්ය සඳහා බලපත්‍රයක් හෝ අවසරයක් ලබා ගැනීමෙන් තොරව ගුවනින්, මුහුදෙන් හෝ භූමියෙන් හෝ වෙනත් යම් මාර්ගයකින් තැනැත්තන් ප්‍රවාහනය කිරීම; හෝ

(ඈ) ශ්‍රී ලංකාව තුළ හෝ විදේශ රටක තැනැත්තන් භාර ගැනීම සහ ඔවුනට රැකවරණය සැලසීම,

ඇතුළත් වේ.

(3) (1) වන උපවගන්තිය යටතේ වන වරදක් සිදු කිරීමට තැත් කරන හෝ එවැනි වරදක් සිදු කිරීමට ආරම්භක යම් ක්‍රියාවක් කරන හෝ වරද සිදු කිරීමට සහාය දක්වන හෝ අනුබල දෙන යම් තැනැත්තකු විසින් වරදක් සිදු කරනු ලබන්නේ ය.

(4) (1) වන හෝ (3) වන උපවගන්තිය යටතේ වන වරදක් සිදු කරන යම් තැනැත්තකු, මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබීමේ දී, අවුරුදු පහකට නොඅඩු සහ අවුරුදු දහයකට නොවැඩි කාලසීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට සහ රුපියල් මිලියනයකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය.

(5) සැක දුරු කිරීම සඳහා, මේ වගන්තියේ විධිවිධානවලින් මිනිස් අවහරණකරුවන් හඳුනා ගෙන දඬුවම් කිරීම පමණක් අදහස් කරනු ලබන අතර, අවහරණයට ලක් වී ඇති හෝ අවහරණයට ලක් වෙමින් සිටින තැනැත්තන්ට දඬුවම් කිරීමට අදහස් කරනු නොලබන බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

උග්‍ර මිනිස් අවහරණ වැරදි

**138.** (1) මේ පනතේ 136 වන සහ 137 වන වගන්ති යටතේ මිනිස් අවහරණය පිළිබඳ වරදක් සිදු කරනු ලැබ ඇති යම් තැනැත්තකු විසින් 136 හෝ 137 වන වගන්තිය යටතේ වරදක් සිදු කරන අතරතුර-

(අ) අවහරණයට ලක් වූ හෝ අවහරණයට ලක් වෙමින් සිටින තැනැත්තන්ගේ ජීවිත හෝ සුරක්ෂිතභාවය අනතුරට ලක්

කර ඇත්තේ නම් හෝ අනතුරට ලක් කර තිබීමට ඉඩ ඇත්තේ නම්;

(ආ) අමානුෂික සහ අවමන් සහගත තත්ත්ව යටතේ වෙනත් තැනැත්තන් අවහරණය කරන ලද්දේ නම්;

(ඇ) අවහරණයට ලක් වූ හෝ අවහරණයට ලක් වෙමින් සිටින තැනැත්තන්ගෙන් නීති විරෝධී ප්‍රතිෂ්ඨාවක් ඉල්ලා සිටින ලද්දේ හෝ ප්‍රතිෂ්ඨාවක් අයැද සිටින ලද්දේ නම්;

(ඈ) අවහරණය ලක් වූ හෝ අවහරණයට ලක් වෙමින් සිටින තැනැත්තන් යම් ආකාරයකින් අපයෝජනය කරනු ලැබ ඇත්තේ නම්;

(ඉ) (18 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ 360ඇ වන වගන්තිය යටතේ වන වරදක් සිදු කරනු ලැබ ඇත්තේ නම්; හෝ

(ඊ) වෙනත් යම් නීතියක් යටතේ බරපතළ වරදක් සංස්ථාපනය වන වෙනත් යම් ක්‍රියාවක් සිදු කරනු ලැබ ඇත්තේ නම්,

එකී තැනැත්තා විසින් මේ කොටස යටතේ උග්‍ර මිනිස් අවහරණ වරදක් සිදු කරනු ලැබේ.

මේ වගන්තියේ (ඊ) ඡේදයේ කාර්ය සඳහා, බරපතළ වරදක් යන්නෙන්, වෙනත් යම් නීතියක් යටතේ සංඥෙය, ඇප දිය නොහැකි, සමථයට පත් කළ නොහැකි සහ අධිචෝදනා ගොනු කළ හැකි වරදක් අදහස් වේ.

(2) (1) වන උපවගන්තිය යටතේ වරදකට වරදකරු වන තැනැත්තකු, වරදකරු කරනු ලැබීමේ දී අවුරුදු පහකට නොඅඩු සහ අවුරුදු විස්සකට නොවැඩි කාලසීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට සහ රුපියල් ලක්ෂ පහළොවකට නොවැඩි දඩයකට යටත් විය යුතු අතර, එකී වරද ළමයකු සම්බන්ධයෙන් සිදු කරනු ලැබ ඇති අවස්ථාවක දී, අවුරුදු අටකට නොඅඩු සහ අවුරුදු විස්සකට නොවැඩි කාලසීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට සහ රුපියල් මිලියන දෙකකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය.

**139.** (1) (අ) නීත්‍යානුකූල අධිකාරයකින් තොරව, ශ්‍රී ලංකා රජයට හෝ වෙනත් යම් විදේශීය රජයකට අදාළ, යම් ගමන් ලේඛනයක් හෝ එහි කොටසක් හෝ එවැනි යම් රජයක් විසින් වීසා පත්‍ර නිකුත් කිරීම සඳහා භාවිත කරන ලද යම් ලේඛනයක් හෝ එහි කොටසක් මුද්‍රණය කරන, පිටපත් කරන, සාවද්‍ය ලෙස සලකන හෝ පිළියෙල කරන; මිනිස් අවහරණයට සම්බන්ධ ලේඛනගත වැරදි

(ආ) ශ්‍රී ලංකාවේ දී හෝ වෙනත් ස්ථානයක දී නිකුත් කරන ලද, යම් ගමන් ලේඛනයක් හෝ එහි ඇතුළත් යම් වීසා පත්‍රයක් හෝ එහි පිටසනක් කූට ලෙස සකස් කරන, වෙනස් කරන හෝ අපවේශනය කරන;

(ඇ) (අ) හෝ (ආ) ඡේදයේ සඳහන් කරන ලද යම් ලේඛනයක පිටසන් කරන ලද යම් සහතිකයක් කූට ලෙස සකස් කරන, වෙනස් කරන හෝ අපවේශනය කරන;

(ඈ) නීත්‍යානුකූල අධිකාරයකින් තොරව, කූට ලෙස සකස් කරන ලද, වෙනස් කරන ලද හෝ අපවේශනය කරන ලද ගමන් ලේඛනයක් හෝ කූට ලෙස සකස් කරන ලද, වෙනස් කරන ලද, අපවේශනය කරන ලද වීසා පත්‍රයක් හෝ පිටසනක් අන්තර්ගත වන ගමන් ලේඛනයක් භාවිත කරන හෝ තම සන්තකයේ තබා ගන්නා;

(ඉ) නීත්‍යානුකූල අධිකාරයකින් තොරව, යම් කූට ලෙස සකස් කරන ලද, වෙනස් කරන ලද හෝ අපවේශනය කරන ලද සහතිකයක් අන්තර්ගත වන කූට ලෙස සකස් කරන ලද, වෙනස් කරන ලද හෝ අපවේශනය කරන ලද ගමන් ලේඛනයක් භාවිත කරන හෝ තම සන්තකයේ තබා ගන්නා;

(ඊ) නීත්‍යානුකූල අධිකාරයකින් හෝ නීත්‍යානුකූල අවසරයකින් තොරව, වෙනත් තැනැත්තන්ගේ ගමන් ලේඛන, යම් ආකාරයකින් තම සන්තකයේ තබා ගන්නා හෝ ජාවාරම් කරන;

(ඌ) මේ පනතේ විධිවිධාන හෝ ඒ යටතේ සාදන ලද යම් නියමයක් හෝ නියෝගයක් ක්‍රියාත්මක කිරීමේ දී නීත්‍යානුකූලව කටයුතු කරන්නා වූ අමාත්‍යවරයාට හෝ පාලක ජනරාල්වරයාට හෝ යම් ගුවන් ප්‍රවාහන සමාගම් නිලධරයකුට හෝ යම් බලයලත් ගමන් නියෝජිතයකුට පිළිතුරු වශයෙන් හෝ ඔවුන්ට සම්බන්ධ යම් කාරණයක දී යම් සාවද්‍ය වාර්තා, සාවද්‍ය ප්‍රකාශ හෝ සාවද්‍ය නියෝජනයක් ඉදිරිපත් කරන හෝ ඉදිරිපත් කරනු ලැබීමට කටයුතු සලස්වන;

(ඌඉ) නීත්‍යානුකූල අධිකාරියකින් තොරව, යම් ගුවන් ප්‍රවේශ පත්‍රයක්, කාර්ය මණ්ඩල පිරිස මුදා හැරීමේ සහතිකයක්, ගුවන් යානයට ගොඩවීමේ අවසර පත්‍රයක් හෝ ඒ හා සමාන ස්වභාවයක යම් ලේඛනයක් මුද්‍රණය කරන, පිටපත් කරන, සකස් කරන හෝ යම් ආකාරයකින් තම සන්තකයේ තබා ගන්නා, ඉදිරිපත් කරන හෝ භාවිත කරන;

(එ) ශ්‍රී ලංකාව තුළට හෝ විදේශීය රටකට නීති විරෝධී ලෙස ඇතුළු වීම, පිටත් වීම හෝ වාසය කිරීම සඳහා පහසුකම් සැලැස්වීමේ කාර්ය සඳහා වංචනික ලේඛන සපයන;

(ඒ) මේ පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ නියමයක් යටතේ යම් තැනැත්තකු විසින් තම බලතල සහ කාර්යන් ක්‍රියාත්මක කිරීමේ දී හෝ ඉටු කිරීමේ දී ඊට බාධා කරන හෝ එය වළක්වන;

(ඔ) වලංගු ගමන් ලේඛනයක් හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රයක් දරමින් ශ්‍රී ලංකාවෙන් පිටත පදිංචිව සිටින අතරතුර, අවස්ථාවෝචිත පරිදි, පාලක ජනරාල්වරයාගේ පූර්ව ලිඛිත අනුමතයකින් හෝ විදේශීය රජයක නීත්‍යානුකූල අධිකාරයකින් හෝ නීත්‍යානුකූල අවසරයකින් තොරව තැපැල මගින් හෝ වෙනත් තැනැත්තකු හරහා එකී ගමන් ලේඛනය හෝ විදේශීය ගමන් බලපත්‍රය ශ්‍රී ලංකාව තුළ පදිංචි තැනැත්තකු වෙත යවන හෝ සම්ප්‍රේෂණය කරන;

(ඕ) ශ්‍රී ලංකාවේ පදිංචිව සිටින අතරතුර, අවස්ථාවෝචිත පරිදි, පාලක ජනරාල්වරයාගේ පූර්ව ලිඛිත අනුමතයකින් හෝ විදේශීය රජයක නීත්‍යානුකූල අධිකාරයෙන් හෝ නීත්‍යානුකූල අවසරයෙන් තොරව තැපැල මගින් හෝ වෙනත් තැනැත්තකු හරහා ගමන් ලේඛනයක් ශ්‍රී ලංකාවෙන් පිටත යම් රටක පදිංචිව සිටින යම් තැනැත්තකු වෙත යවන හෝ සම්ප්‍රේෂණය කරන;

(ක) නීත්‍යානුකූල අධිකාරයකින් තොරව, ඔහු වෙත නිකුත් කරනු ලැබ ඇති තත්කාලයේ බලපවත්නා ගමන් ලේඛන එකකට වැඩි ගණනක් තම සන්තකයේ තිබෙන;

(ග) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන සහ වලංගු ශ්‍රී ලංකා ගමන් ලේඛනයක් තම සන්තකයේ තිබෙන; හෝ

(ච) තමන් වෙනුවෙන් හෝ වෙනත් යම් තැනැත්තකු වෙනුවෙන් විදේශ ගමන් බලපත්‍රයක්, වීසා පත්‍රයක් හෝ වෙනත් යම් ගමන් ලේඛනයක් ලබා ගැනීමේ කාර්ය සඳහා, යම් කූට ලෙස සකස් කරන ලද හෝ සාවද්‍ය ලේඛන හෝ සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කරන,

යම් තැනැත්තකු විසින් වරදක් සිදු කරනු ලබන්නේ ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වන වරදක් සිදු කරන්නා වූ යම් තැනැත්තකු, මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබීමේ දී,

(අ) (අ), (ආ), (ඇ), (ඈ), (ඉ), (ඊ), (උ), (ඌ) හෝ (එ) ඡේදය යටතේ වන වරදක් සම්බන්ධයෙන් වන විට දී, අවුරුදු පහකට නොවැඩි කාලසීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට සහ රුපියල් ලක්ෂ දෙකකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය; සහ

(ආ) (ඒ), (ඔ), (ඕ), (ක), (ග) හෝ (ච) ඡේදය යටතේ වන වරදක් සම්බන්ධයෙන් වන විට දී, අවුරුදු දෙකකට

නොවැඩි කාලසීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට සහ රුපියල් ලක්ෂ දෙකකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ වන වරදක් සිදු කිරීමට තැත් කරන හෝ එම වරද සිදු කිරීම සඳහා යම් ආරම්භක ක්‍රියාවක් සිදු කරන හෝ එම වරද කිරීමට සහාය දක්වන හෝ අනුබල දෙන යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ වරදක් සිදු කරනු ලබන අතර, වරදකරු කරනු ලැබීමේ දී, ඔහු (1) වන උපවගන්තිය යටතේ වන වරදකට වරදකරු වී වරදකරු කරනු ලැබූ පරිදි එම දඬුවමට ම යටත් විය යුතු ය.

(4) යම් වෙනත් තැනැත්තකු, යම් විදේශ රටකට ඇතුළු වීම, එම රටට ඇතුළු වීම සඳහා වන එම රටේ නීතිය යටතේ වන නියමයන්ට අනුකූල නොවන අවස්ථාවක දී, එම වෙනත් තැනැත්තාට ශ්‍රී ලංකාවට හෝ විදේශ රටකට ඇතුළු වීමට පහසුකම් සැලැස්වීම සඳහා, (1) වන උපවගන්තිය යටතේ වරදක් සිදු කරනු ලබන යම් තැනැත්තකු වරදකරු කරනු ලැබීමේ දී අවුරුදු පහකට නොවැඩි කාලසීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට සහ රුපියල් ලක්ෂ පහකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය.

(5) මේ වගන්තියේ විධිවිධාන, යම් තැනැත්තකු 136, 137 සහ 138 වන වගන්තිවල සඳහන් කරන ලද මිනිස් අවහරණ වැරදිවලට අදාළ වන්නේ නම් සහ එසේ වන්නේ නම් පමණක් එකී තැනැත්තකු වෙත අදාළ විය යුතු ය.

## III වන පරිච්ඡේදය

## කාර්ය පටිපාටිය

වැරදි සමථයට පත් කිරීම

**140.** 33 වන, 117 වන, 118 වන වගන්ති, 127 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඟ) සහ (ච) ඡේද, 128 වන වගන්තිය සහ 133 වන වගන්තිය යටතේ වන වරදක් සිදු කර ඇති බවට චෝදනා ලද හෝ සිදු කරනු ලැබ ඇති බවට සාධාරණ ලෙස සැක කරනු ලබන තැනැත්තාගෙන්, එම වරද සඳහා එවැනි තැනැත්තකු මත මේ පනත යටතේ පනවනු ලැබීමට යටත් විය යුතු උපරිම දඩයේ මුදල් ප්‍රමාණයෙන් අඩකට නොවැඩි මුදලක් භාර ගැනීමෙන් පාලක

ජනරාල්වරයා විසින්, එම වැරදිවලින් යම් වරදක් සමථයකට පත් කරනු ලැබිය හැකි ය.

*රඳවා ගනු ලැබූ තැනැත්තන් නීතියේ භාරයේ සිටිය යුතු යයි සලකනු ලැබිය යුතු බව*

**141.** මේ පනත මගින් හෝ මේ පනත යටතේ පනවා ඇති යම් බලතල ක්‍රියාත්මක කිරීමේ දී රඳවා තබා ගනු ලබන යම් තැනැත්තකු එසේ රඳවා තබා ගනු ලබන තෙක්, නීතිය භාරයේ සිටින බවට සලකනු ලැබිය යුතු ය.

*රඳවා ගැනීමේ මධ්‍යස්ථාන පිහිටුවීම*

**142.** (1) මේ පනත යටතේ රඳවා තබා ගැනීමට නියම කර ඇති හෝ බලය ලබා දී ඇති තැනැත්තන් රඳවා ගැනීමේ කාර්ය සඳහා, අමාත්‍යවරයා විසින්, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් එකී කාර්ය සඳහා උචිත වන සුදුසු ස්ථානවල රඳවා ගැනීමේ මධ්‍යස්ථාන පිහිටුවනු ලැබිය යුතු ය.

(2) රඳවා ගැනීමේ මධ්‍යස්ථානයක පවත්වාගෙන යනු ලැබිය යුතු තත්ත්වයන් සහ එවැනි මධ්‍යස්ථාන පරිපාලනය කිරීමේ ආකාරය, නියම කරනු ලබන පරිදි විය යුතු ය.

(3) රඳවා ගැනීමේ නියමයක් උල්ලංඝනය කර රඳවා ගැනීමේ මධ්‍යස්ථානයෙන් පළා යන යම් තැනැත්තකු, මේ පනත යටතේ වරදක් සිදු කරනු ලබන අතර, පරිග්‍රහණය කර ගැනීමෙන් පසුව, රටේ පොදු නීතියට යටත් විය යුතු ය.

*රැඳවුම් පහසුකම පිහිටුවීම*

**143.** (1) මේ පනත යටතේ රඳවා තබා ගනු ලැබීමට නියම කර ඇති හෝ බලය ලබා දී ඇති තැනැත්තන් තාවකාලිකව තබා ගැනීමේ කාර්යය සඳහා අමාත්‍යවරයා විසින්, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, එකී කාර්යය සඳහා උචිත වන සුදුසු ස්ථානවල, අදාළ නියෝජ්‍යායතන වෙත රැඳවුම්කරු භාර දෙනු ලබන තෙක්, තබා ගැනීම සඳහා වරායක් හෝ ගුවන් තොටුපළක් ඇතුළත තාවකාලික රැඳවුම් පහසුකම් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) එවැනි රැඳවුම් පහසුකම්වල පවත්වාගෙන යනු ලැබිය යුතු තත්ත්වයන් සහ එකී රැඳවුම් පහසුකම්වල පරිපාලනය කිරීමේ ආකාරය නියම කරනු ලබන පරිදි විය යුතු ය.

(3) රැඳවුම් පහසුකමෙන් පළා යන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදක් සිදු කරනු ලබන අතර, පරිග්‍රහණය කර ගැනීමෙන් පසුව, රටේ පොදු නීතියට යටත් විය යුතු ය.

ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන තැනැත්තකුගේ භාරය පිළිබඳ කාර්යපටිපාටිය සහ බලතල

**144.** (1) ත්‍රිවිධ හමුදාවේ යම් බලයලත් සාමාජිකයකු හෝ වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ යම් බලයලත් වෙරළ ආරක්ෂක නිලධරයකු විසින්, වරෙන්තුවකින් තොරව, 47, 136, 137, 138, 139, 142 හෝ 143 වන වගන්තිය යටතේ වන යම් වරදක් සිදු කිරීම සම්බන්ධයෙන් සැක කරනු ලබන යම් තැනැත්තකු සිරභාරයට ගනු ලැබිය හැකි අතර, එකී තැනැත්තා වහාම ළඟම පොලිස් ස්ථානය වෙත භාර දෙනු ලැබිය යුතු ය.

(2) පොලිස් ස්ථානාධිපතිවරයා විසින් පැය විසිහතරක් ඇතුළත එකී තැනැත්තා අධිකරණ බලය සහිත මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, පොලිස් අධිකාරිවරයකුගේ නිලයට නොඅඩු නිලයක පොලිස් නිලධරයකු විසින්, විමර්ශන කටයුතු සිදු කිරීමේ කාර්ය සඳහා එකී තැනැත්තා සිරභාරයේ රඳවා තබා ගැනීම අවශ්‍ය බවට සහතිකයක් ගොනු කරනු ලැබීමෙන් පසුව, මහෙස්ත්‍රාත්වරයා විසින්, තවදුරටත් පැය හතලිස්අටකට නොවැඩි කාලසීමාවක් සඳහා එකී තැනැත්තා රඳවා තබා ගැනීමට ආඥා කරනු ලැබිය හැකි ය.

124 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ වරදක් සිදු කිරීම සඳහා සැක කරනු ලබන හෝ චෝදනා ලබා ඇති තැනැත්තන් රඳවා ගැනීම

**145.** (1) ආගමන නිලධරයකු හෝ පොලිස් නිලධරයකු විසින්, මේ පනතේ 124 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ වරදක් සිදු කිරීම පිළිබඳ සැක කරනු ලබන, ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන තැනැත්තකු අත්අඩංගුවට ගනු ලැබිය හැකි ය.

(2) වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, පාලක ජනරාල්වරයා හෝ සහකාර පොලිස් අධිකාරිවරයකුගේ නිලයට නොඅඩු නිලයක යම් පොලිස් නිලධරයකු විසින්, (1) වන උපවගන්තිය යටතේ අත්අඩංගුවට ගන්නා ලද තැනැත්තකු, එම තැනැත්තා විසින් තම නිර්දෝෂීභාවය තහවුරු කරන තෙක් හෝ 98 වන හෝ 99 වන වගන්තිය යටතේ එම තැනැත්තාට එරෙහිව අමාත්‍යවරයා විසින් නියමයක් කරනු ලබන තෙක්, 142 හෝ 143 වන වගන්තිය යටතේ පිහිටුවනු ලබන යම් ස්ථානයක රඳවා ගැනීමට ලිඛිතව බලය දෙනු ලැබිය හැකි ය:

එසේ වුව ද, එකී තැනැත්තා පළමුවෙන් ම රඳවා ගනු ලැබූ දින සිට සති දෙකක කාලසීමාවක් ඉකුත් වන විට ඔහු රැඳවුම් භාරයේ සිටින්නේ නම්, එකී තැනැත්තා වහාම යම් උචිත ආඥාවක් කිරීම සඳහා මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

විදේශීය ජාතිකයකු භාරයට ගැනීම පිළිබඳ පාලක ජනරාල්වරයාට දැනුම් දිය යුතු බව

**146.** මේ පනත යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ විදේශීය ජාතිකයකු භාරයට ගනු ලබන යම් පොලිස් නිලධරයකු, හමුදාවල බලයලත් සාමාජිකයකු, වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුවේ බලයලත් වෙරළාරක්ෂක නිලධරයකු හෝ නීතිය ක්‍රියාත්මක කිරීමේ අධිකාරයක වෙනත් යම් සාමාජිකයකු, නොපමාව පාලක ජනරාල්වරයාට ඒ පිළිබඳ දැනුම් දිය යුතු ය.

ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන යම් තැනැත්තකුට විරුද්ධව නඩු පවරනු ලබන, දඬුවම් නියම කරනු ලබන හෝ නිදහස් කිරීමට නියමිත අවස්ථාවක දී පාලක ජනරාල්වරයා වෙත දැනුම් දෙනු ලැබිය යුතු බව

**147.** (1) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන යම් තැනැත්තකුට විරුද්ධව අධිකරණය විසින් නඩු පවරනු ලබන හෝ දඬුවම් නියම කරනු ලබන අවස්ථාවක දී, එකී තොරතුරු, අදාළ අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විසින් අධිකරණයේ නඩු කටයුතුවල සහතික කළ පිටපතක් සමඟ පාලක ජනරාල්වරයා වෙත යොමු කරනු ලැබිය යුතු ය.

(2) අධිකරණය විසින්, බන්ධනාගාරගත කරනු ලැබ ඇති ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන තැනැත්තකු නිදහස් කිරීමට නියමිත අවස්ථාවක දී, එකී තොරතුරු, එකී නිදහස් කිරීමට සති දෙකකට පෙර අදාළ බන්ධනාගාර අධිකාරිවරයා විසින් එකී නිශ්චය කිරීමේ අදාළ පිටපත සමඟ පාලක ජනරාල්වරයා වෙත යොමු කරනු ලැබිය යුතු ය.

චූදිතයකුගේ, සැකකරුවකුගේ හෝ වරෙන්තුවක් භාර දෙනු ලැබ ඇති සාක්ෂිකරුවකුගේ පැමිණීම ලබා ගැනීම සඳහා අධිකරණය විසින් ගමන් ලේඛනය පරිරෝධනය කිරීම හෝ ගමන් තහනමක් පැනවීම කරනු ලැබිය හැකි බව

**148.** (1) යම් නීතියක් යටතේ යම් වරදක් සම්බන්ධයෙන් වන යම් නඩු කටයුතුවල දී, චූදිතයකුගේ හෝ සැකකරුවකුගේ පැමිණීම හෝ සාක්ෂිකරුවකු විභාග කිරීම අවශ්‍ය බව අධිකරණයට පෙනී යන අවස්ථාවක දී, අධිකරණය විසින්-

(අ) අවස්ථාවෝචිත පරිදි, එකී චූදිතයා, සැකකරු හෝ සාක්ෂිකරු වෙත නිකුත් කරන ලද යම් ගමන් ලේඛනයක්, වරෙන්තුවක් නිකුත් කරනු ලැබ ඇති එකී චූදිතයා, සැකකරු හෝ සාක්ෂිකරුගේ පැමිණීම ලබා ගැනීම අවශ්‍ය යයි සලකනු ලැබිය හැකි යම් කාලසීමාවක් සඳහා පරිරෝධනය කරනු ලැබිය හැකි ය; හෝ

(ආ) එකී තැනැත්තා ගමන් ලේඛනය භාවිත කරමින් රට හැර යාමෙන් හෝ ජාත්‍යන්තරව ගමන් කිරීමෙන් වළක්වන ලෙස පාලක ජනරාල්වරයාට ආඥා කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් තැනැත්තකුට එරෙහිව මේ වගන්තිය යටතේ ආඥාවක් කරමින් අධිකරණයක් විසින් එකී ආඥාවේ පිටපතක් පාලක ජනරාල්වරයා වෙත යවනු ලැබීමට කටයුතු සැලැස්විය යුතු ය.

**149.** (1) යම් ගමන් ලේඛනයක්-

රේගු නිලධරයන් විසින් සැක සහිත ගමන් ලේඛන තහනමට ගැනීම

(අ) යම් පුද්ගලයකුගේ සන්තකයේ හෝ පාලනයේ තිබේ නම් හෝ නොමැති නම්; සහ

(ආ) බහාලුමක් තුළ තිබේ නම් සහ බහාලුම යම් පුද්ගලයකුගේ සන්තකයේ හෝ පාලනයේ තිබේ ද යන්න නොසලකා, රේගු නිලධරයා විසින් එකී ලේඛනය බහාලුම තුළ තිබේ ද යන්න නිශ්චය කර ගැනීමේ කාර්ය සඳහා බහාලුම සෝදිසි කරනු ලැබිය හැකි අතර,

රේගු නිලධරයකු විසින්, ගමන් ලේඛනය තහනමට ගනු ලැබිය හැකි ය.

(2) යම් තැනැත්තකු විසින්, මේ පනත යටතේ පාලක ජනරාල්වරයාගේ අවසරයකින් තොරව වෙනත් තැනැත්තකු වෙත නිකුත් කරන ලද ගමන් ලේඛනයක් දරන්නේ නම්, රේගු නිලධරයකු විසින් ගමන් ලේඛනය තහනමට ගෙන එම තැනැත්තා අත්අඩංගුවට ගනු ලැබිය හැකි ය.

(3) රේගු නිලධරයා විසින් (1) වන සහ (2) වන උපවගන්ති යටතේ තහනමට ගනු ලැබූ ගමන් ලේඛනය සහ අත්අඩංගුවට ගනු ලැබූ තැනැත්තා වහාම පාලක ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(4) අන්‍යාකාරයකින් ඇතුළු වීම සඳහා රේගු නිලධරයකු වෙත බලය ලබා දී නොමැති යම් පරිශ්‍රයකට ඇතුළු වීම සඳහා මේ පනත මගින් එකී නිලධරයා වෙත බලය දෙනු නොලැබේ.

(5) මේ වගන්තියේ කාර්ය සඳහා-

(අ) "බහාලුම" යන්නට, ගමන් බෑගයක්, ලැබිය හැකි තැපැල් මල්ලක් සහ භාණ්ඩ ප්‍රවාහනය සඳහා භාවිත කරනු

ලැබිය හැකි එම කාර්ය සඳහා නිර්මාණය කරන ලද හෝ එසේ නොවන වෙනත් යම් දෙයක් ඇතුළත් වේ; සහ

(ආ) "රේගු නිලධරයා" යන්නෙන්, (235 වන අධිකාරය වූ) රේගු ආඥාපනතේ අර්ථානුකූලව නිලධරයකු අදහස් වේ.

ඔප්පු කිරීමේ භාරය

**150.** මේ පනත යටතේ යම් නඩු කටයුතු සම්බන්ධයෙන් හෝ මේ පනත යටතේ කරන ලද හෝ කරන ලදැයි කියනු ලබන යම් දෙයක් සම්බන්ධයෙන් වන අවස්ථාවක දී, යම් තැනැත්තකු,-

(අ) ඔහු ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන බවට;

(ආ) ඔහු ශ්‍රී ලංකාවේ පුරවැසියන් නොවන යම් විශේෂ පන්තියකට හෝ තැනැත්තන් වර්ගයකට අයත් වන බවට;

(ඇ) ඔහු ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන බවට;

(ඈ) ඔහු ශ්‍රී ලංකාවේ පුරවැසියන් වන යම් විශේෂ පන්තියකට හෝ තැනැත්තන් වර්ගයකට අයත් වන බවට;

(ඉ) ඔහු යම් නිශ්චිත රටක ජාතිකයකු වන බවට; හෝ

(ඊ) ඔහු ශ්‍රී ලංකාවේ එක් ස්ථානයක සිට තවත් ස්ථානයකට ගමන් කරමින් සිටි බවට,

ස්ථිර ලෙස කියා සිටිනු ලබන්නේ නම්, (14 වන අධිකාරය වූ) සාක්ෂි ආඥාපනතේ පටහැනිව කුමක් සඳහන් වුව ද, එම කරුණ ඔප්පු කිරීමේ භාරය එම තැනැත්තා සතු විය යුතු ය.

අත්අඩංගුවට ගැනීම හෝ තහනමට ගැනීම සඳහා යම් යාත්‍රාවකට හෝ පරිශ්‍රයකට ඇතුළු වී සෝදිසි කිරීම සඳහා බලය

**151.** (1) (අ) යම් පොලිස් නිලධරයකු හෝ හමුදාවල කෝපරල් හෝ නායක නැව් නිලයන්ට නොඅඩු නිලයක යම් බලයලත් සාමාජිකයකු හෝ වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ බලයලත් නිලධරයකු හෝ ආගමන නිලධරයකු හෝ විසින්, ශ්‍රී ලංකාවේ දේශීය ජල තීරයේ හෝ ආසන්න කලාපයේ ඇති ගුවන් යානාවක් නොවන යම් යාත්‍රාවකට ඇතුළු වී සෝදිසි කරනු ලැබිය හැකි අතර, මේ පනතේ 46, 47, 51, 124, 126, 136, 137, 138 හෝ 139 යන වගන්තිය යටතේ යම් වරදක් සිදු කිරීම සම්බන්ධයෙන් සැක

කරනු ලබන එකී යාත්‍රාවේ සිටින යම් තැනැත්තකු අත්අඩංගුවට ගෙන සිරභාරයට ගනු ලැබිය හැකි ය.

(ආ) (අ) ඡේදයේ කාර්ය සඳහා, ආසන්න කලාපය යන්නෙන්, 1976 අංක 22 දරන සමුද්‍රීය කලාප නීතිය යටතේ කරන ලද ප්‍රකාශනයේ නිශ්චිතව දක්වා ඇති ආසන්න කලාපය අදහස් වේ.

(2) යම් ආගමන නිලධරයකු හෝ පොලිස් නිලධරයකු හෝ හමුදාවේ කෝප්‍රල් හෝ නාවික නැව් නිලයට නොඅඩු නිලයක යම් බලයලත් සාමාජිකයකු හෝ වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ බලයලත් සාමාජිකයකු හෝ විසින්, මේ පනතේ 46, 47, 51, 124, 126, 136, 137, 138 හෝ 139 යන වගන්තියක සඳහන් යම් වරදක් සිදු කිරීම සඳහා හෝ සිදු කිරීම සම්බන්ධයෙන් වාහනයක්, යාත්‍රාවක් හෝ වෙනත් ප්‍රවාහන මාධ්‍යයක් භාවිත කරනු ලැබ ඇති බවට විශ්වාස කිරීමට එකී නිලධරයාට හේතු පවතින අවස්ථාවක දී, වහාම එකී වාහනය, යාත්‍රාව හෝ වෙනත් ප්‍රවාහන මාධ්‍යය, එහි යම් උපකරණ සහ අතිරේක උපකරණ සමග තහනමට ගෙන රඳවා ගනු ලැබිය හැකි ය.

(3) යම් ආගමන නිලධරයකු හෝ සහකාර පොලිස් අධිකාරි නිලයට නොඅඩු නිලයක නිලධරයකු විසින් බලය ලබා දෙන ලද පොලිස් නිලධරයකු විසින්, මේ පනත යටතේ වන යම් වරදක් සිදු කිරීම සම්බන්ධයෙන් යම් පරිශ්‍රයක් භාවිත කරනු ලැබ ඇති බවට විශ්වාස කිරීමට ඔවුන්ට හේතු පවතින අවස්ථාවක දී, එකී පරිශ්‍රයට ඇතුළු වී සෝදිසි කරනු ලැබිය හැකි අතර, මේ පනත යටතේ යම් වරදක් සිදු කිරීමට සම්බන්ධ හෝ සම්බන්ධ වූ බවට සාධාරණ ලෙස සැක කරනු ලබන, එහි සිටින යම් තැනැත්තකු අත්අඩංගුවට ගෙන සිරභාරයට ගැනීම සහ යම් යන්ත්‍රෝපකරණ, ලේඛන, උපකරණ හෝ දෙයක් සිය භාරයට ගැනීම සිදු කරනු ලැබිය හැකි ය.

(4) (2) වන හෝ (3) වන උපවගන්තිය යටතේ තහනමට ගන්නා ලද යම් වාහනයක්, යාත්‍රාවක් හෝ වෙනත් ප්‍රවාහන මාධ්‍යයක්, උපකරණයක් හෝ අතිරේක උපකරණ හෝ යම් යන්ත්‍රෝපකරණ, ලේඛන හෝ දෙයක්, තහනමට ගැනීම සිදු කරන නිලධරයා, හමුදාවල බලයලත් සාමාජිකයකු, වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ බලයලත් නිලධරයකු වන අවස්ථාවක දී, එකී නිලධරයා විසින් හෝ යම් පොලිස් නිලධරයකු විසින් හැකි තාක් ඉක්මණින්, නිසි අධිකරණ බලය සහිත මහෙස්ත්‍රාත්වරයකු විසින්

පරීක්ෂා කරනු ලැබීම සඳහා ඉදිරිපත් කිරීම හෝ මහෙස්ත්‍රාත්වරයා වෙත ලබා දීම සිදු කරනු ලැබිය යුතු අතර, ඉන්පසුව අධිකරණය විසින්, එසේ තහනමට ගන්නා ලද වාහනයක, යාත්‍රාවක හෝ වෙනත් ප්‍රවාහන මාධ්‍යයක, උපකරණයක, අතිරේක උපකරණයක හෝ යම් යන්ත්‍රෝපකරණයක, ලේඛනයක හෝ දෙයක භාරයට අදාළව, (5) වන උපවගන්තිය යටතේ ඒවා නිදහස් කිරීම සිදු කරන තෙක් යෝග්‍ය යයි සලකනු ලැබිය හැකි යම් ආඥාවක් කරනු ලැබිය හැකි ය.

(5) (2) වන හෝ (3) වන උපවගන්තිය යටතේ යම් තැනැත්තකුගේ සන්තකයෙන් තහනමට ගන්නා ලද යම් වාහනයක්, යාත්‍රාවක් හෝ වෙනත් ප්‍රවාහන මාධ්‍යයක්, උපකරණයක්, අතිරේක උපකරණයක්, යම් යන්ත්‍රෝපකරණයක්, ලේඛනයක් හෝ දෙයක්-

(අ) තහනමට ගැනීමෙන් පසුව සති හයක කාලසීමාවක් ඉකුත්වීමෙන් පසුව, එම කාලසීමාව අවසාන වීමට පෙර ස්ථිරව කියා සිටිනු ලබන වරදක් සඳහා නඩු පවරනු ලබන්නේ නම් මිස, වහාම එම තැනැත්තා වෙත ආපසු භාර දෙනු ලැබිය යුතු ය; හෝ

(ආ) නඩුවේ අවසාන තීන්දුවෙන් පසුව රජය වෙත සතු කරනු ලැබීමට නිසි පරිදි ප්‍රකාශ කරනු ලබන්නේ හෝ (6) වන උපවගන්තිය යටතේ විනාශ කරනු ලැබීමට ආඥා කරනු ලබන්නේ නම් මිස, වහාම එම තැනැත්තා වෙත ආපසු භාර දෙනු ලැබිය යුතු ය.

(6) (4) වන උපවගන්තිය යටතේ මහෙස්ත්‍රාත්වරයා විසින් පරීක්ෂා කරනු ලැබීමට ඉදිරිපත් කරන ලද හෝ ලබා දෙන ලද යම් වාහනයක්, යාත්‍රාවක් හෝ වෙනත් ප්‍රවාහන මාධ්‍යයක්, උපකරණයක්, අතිරේක උපකරණ හෝ යම් යන්ත්‍රෝපකරණ, ලේඛන හෝ දෙයක් මේ පනත යටතේ වන වරදක් සිදු කිරීමේ දී හෝ සිදු කිරීම සම්බන්ධයෙන් භාවිත කරනු ලැබ ඇති බව ඔප්පු කරනු ලබන අවස්ථාවක දී, අධිකරණය විසින් අවස්ථාවෝචිත පරිදි, එකී සියලු කාරණා හෝ දේවල් රජය වෙත සතු කිරීම සඳහා හෝ විනාශ කිරීම සඳහා ආඥාවක් කරනු ලැබිය යුතු ය.

පාලක ජනරාල්වරයා විසින් විමර්ශනය කිරීමේ බලය

**152.** (1) පාලක ජනරාල්වරයා විසින්, මේ පනත යටතේ වීසා පත්‍රයක් නිකුත් කිරීමට හෝ දීර්ඝ කිරීමට පෙර, වීසා පත්‍රයක් සඳහා වන ඉල්ලුම් කිරීමේ දී සිදු කර ඇති යම් ප්‍රකාශයක් සත්‍ය බවට ඔහු විසින් සෑහීමකට පත් වීම සඳහා අවශ්‍ය යයි ඔහු සිතන යම් පරීක්ෂණ සිදු කිරීම, යම් සාක්ෂි ඉදිරිපත් කරන ලෙස නියම කිරීම හෝ යම් විමර්ශන පැවැත්වීම සිදු කරනු ලැබිය හැකි ය.

(2) පාලක ජනරාල්වරයා විසින්, මේ පනත යටතේ ශ්‍රී ලංකා ගමන් ලේඛනයක් නිකුත් කිරීමට පෙර, ගමන් ලේඛනයක් සඳහා වන ඉල්ලුම් කිරීමේ දී සිදු කර ඇති යම් ප්‍රකාශයක් සත්‍ය බවට ඔහු විසින් සෑහීමකට පත් වීම සඳහා අවශ්‍ය යයි ඔහු සිතන යම් පරීක්ෂණ සිදු කිරීම, යම් සාක්ෂි ඉදිරිපත් කරන ලෙස නියම කිරීම හෝ යම් විමර්ශන පැවැත්වීම සිදු කරනු ලැබිය හැකි ය.

(3) පාලක ජනරාල්වරයා විසින්, මේ පනත උල්ලංඝනය කරමින් යම් තැනැත්තකු විසින් කරන ලද හෝ කර ඇති බවට විශ්වාස කරන යම් වරදකට එරෙහිව යම් විමර්ශනයක් පැවැත්වීමට, මේ පනතේ 5 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ ආගමන නිලධරයකු වෙත බලය දෙනු ලැබිය හැකි ය.

(4) (1) වන, (2) වන හෝ (3) වන උපවගන්තිය යටතේ පවත්වනු ලබන යම් පරීක්ෂණයක හෝ යම් විමර්ශනයක කාර්ය සඳහා, පාලක ජනරාල්වරයාට හෝ වෙනත් යම් බලයලත් නිලධරයකුට,-

(අ) සාක්ෂිකරුවන් කැඳවීමට හෝ සාක්ෂිකරුවන්ට පැමිණීමට බල කිරීම සඳහා;

(ආ) ගමන් ලේඛන හෝ වෙනත් යම් ලේඛන ඉදිරිපත් කිරීමට බල කිරීම සඳහා;

(ඇ) සාක්ෂිකරුවන්ගේ යම් දිවුරුමක් හෝ ප්‍රතිඥාවක් ගැනීම සඳහා; සහ

(ඈ) ගමන් ලේඛන හෝ වෙනත් යම් ලේඛනයක් තහනමට ගැනීම සඳහා,

බලය තිබිය යුතු ය.

(5) (1) වන හෝ (2) වන උපවගන්තිය යටතේ සාක්ෂිකරුවකු ලෙස කැඳවනු ලැබූ, සාධාරණ හේතුවකින් තොරව, සිතාසිවල සඳහන් වේලාවට සහ ස්ථානයට පැමිණීම පැහැර හරින හෝ පැමිණ සිට නීත්‍යානුකූල වශයෙන් ඔහුගෙන් අසනු ලැබිය හැකි යම් ප්‍රශ්නයකට පිළිතුරු දීම හෝ ඉදිරිපත් කිරීමේ බලය ඔහු සතු වන

යම් ලේඛනයක් ඉදිරිපත් කිරීම ප්‍රතික්ෂේප කරන යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ වරදක් සිදු කරනු ලබන්නේ ය.

*සාමාන්‍යයෙන් මේ පනතේ විධිවිධාන සලස්වා නොමැති තොරතුරු ඇතුළුව, තැනැත්තන්ගෙන් තොරතුරු විමසීමට, කැඳවීමට හෝ ඉල්ලා සිටීමට පාලක ජනරාල්වරයාට ඇති බලය*

**153.** (1) පාලක ජනරාල්වරයා විසින්-

(අ) පහත දැක්වෙන කාර්යයන් සඳහා අවශ්‍ය වන තොරතුරු, යම් විධානයක සඳහන් කරනු ලබන වෙනත් යම් තැනැත්තකුට අදාළව පාලක ජනරාල්වරයා විසින් ඔහුගේ දැනීම මත එකී තොරතුරු සහිතව එසේ නිශ්චිතව දක්වනු ලැබිය යුතු පරිදි යම් විධානයක නිශ්චිතව දක්වනු ලැබිය යුතු යම් කාලසීමාවක් ඇතුළත, සපයන ලෙසට යම් තැනැත්තකුට විධාන කරනු ලැබිය හැකි ය:-

(i) එකී වෙනත් තැනැත්තා විසින් මේ පනත යටතේ කරන ලද යම් ඉල්ලීමක් බැහැර කිරීම;

(ii) එකී යම් ඉල්ලීමක නිශ්චිතව දක්වන ලද යම් විස්තරවල නිරවද්‍ය බව සත්‍යායනය කිරීම සඳහා; හෝ

(iii) මේ පනත යටතේ එකී වෙනත් තැනැත්තා විසින් කරන ලද හෝ සපයන ලද යම් වාර්තාවක් හෝ තොරතුරු සම්බන්ධයෙන්; සහ

(ආ) කලින් කලට, මේ පනත යටතේ එකී යම් කාර්යයක් සඳහා අවශ්‍ය යයි ඔහු විසින් සලසනු ලබන සියලු යම් පරීක්ෂණ පවත්වනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පවත්වනු ලබන යම් පරීක්ෂණයක කාර්ය සඳහා, පාලක ජනරාල්වරයාට හෝ පාලක ජනරාල්වරයා විසින් බලය ලබා දෙන ලද වෙනත් යම් නිලධරයකුට-

(අ) සාක්ෂිකරුවන් කැඳවීමට හෝ සාක්ෂිකරුවන්ට පැමිණීමට බල කිරීම සඳහා;

(ආ) ලේඛන ඉදිරිපත් කිරීමට බල කිරීම සඳහා; හෝ

(ඇ) සාක්ෂිකරුවන්ගේ යම් දිවුරුමක් හෝ ප්‍රතිඥාවක් ලබා ගැනීමක් සඳහා,

බලය තිබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ සාක්ෂිකරුවකු ලෙස කැඳවනු ලැබූ, සාධාරණ හේතුවකින් තොරව සිතාසිවල සඳහන් වේලාවට සහ ස්ථානයට පැමිණීම පැහැර හරින හෝ පැමිණ සිට නීත්‍යානුකූල වශයෙන් ඔහුගෙන් අසනු ලැබිය හැකි යම් ප්‍රශ්නයකට පිළිතුරු දීම හෝ ඉදිරිපත් කිරීමේ බලය ඔහු සතු වන යම් ලේඛනයක් ඉදිරිපත් කිරීම ප්‍රතික්ෂේප කරන යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ වරදක් සිදු කරනු ලබන්නේ ය.

ආගමන නිලධරයන්ට සහාය වීම සහ ඔවුන්ගේ නියමය ක්‍රියාත්මක කිරීම පොලිස් නිලධරයන්ගේ කාර්යය විය යුතු බව

**154.** මේ පනත උල්ලංඝනය කරමින් ක්‍රියා කරන යම් තැනැත්තකු අත්අඩංගුවට ගැනීම හෝ මේ පනතේ විධිවිධාන යටතේ යම් තැනැත්තකු රඳවා ගැනීම හෝ ඉවත් කිරීම සඳහා පාලක ජනරාල්වරයා විසින් කරනු ලබන යම් ලිඛිත නියමයක් ලබා ගැනීම සහ එහි භාවයට අනුව ක්‍රියාත්මක කිරීම කරන ලෙසට යම් ආගමන නිලධරයකු විසින් ඉල්ලා සිටින අවස්ථාවක දී, සෑම පොලිස් නිලධරයකු විසින් ම එසේ කරනු ලැබිය යුතු ය.

ඇතැම් සහතිකවලට අදාළ පූර්වානුමතය

**155.** මේ පනතේ යම් විධිවිධානයක් උල්ලංඝනය කරමින් යම් තැනැත්තකු ශ්‍රී ලංකාවට ඇතුළු වීම හෝ ශ්‍රී ලංකාව තුළ රැඳී සිටීම හෝ ශ්‍රී ලංකාවෙන් පිට වීම සම්බන්ධයෙන්, සහකාර පොලිස් අධිකාරිවරයකුගේ නිලයට නොඅඩු නිලයක පොලිස් නිලධරයකු හෝ සහකාර ආගමන පාලකවරයකුගේ නිලයට නොඅඩු නිලයක නිලධරයකු විසින් නිකුත් කරනු ලබන සහතිකයක්, එය චූදිතයා විසින් සපයනු ලබන්නේ නම් මිස, එසේ නම් කරන ලද තැනැත්තා-

(අ) මේ පනතේ III වන, IV වන, V වන සහ VI වන කොටස් අදාළ නොවන හෝ මේ පනතේ යම් විධිවිධානවලවලින් නිදහස් කරනු ලැබ ඇති තැනැත්තකු වන බවට;

(ආ) අවස්ථාවෝචිත පරිදි, ශ්‍රී ලංකාවට ඇතුළු වූයේ හෝ ශ්‍රී ලංකාව තුළ රැඳී සිටියේ හෝ ශ්‍රී ලංකාවෙන් පිට වූයේ මේ පනතේ විධිවිධානවලට අනුකූලව වන බවට; හෝ

(ඇ) මේ පනතේ 3 වන වගන්තිය යටතේ නිදහස් කරන ලද තැනැතත්කු වන බවට,

එකී කාරණය පිළිබඳ බැලූබැල්මට පෙනෙන සාක්ෂි වශයෙන් උපකල්පනය කරනු ලැබිය යුතු ය.

අමාත්‍යවරයා හෝ විදේශීය රාජ්‍යතාන්ත්‍රිකයන් විසින් සාදන ලද හෝ නිකුත් කරන ලද සාධන පත්‍ර පිළිබඳ ඔප්පු කිරීම

**156.** (1) නියමිත පරිදි, අවස්ථාවෝචිත පරිදි, අමාත්‍යවරයා, පාලක ජනරාල්වරයා හෝ විදේශීය රජයක බලයලත් අනුයෝජිතයකු හෝ නිසි ආගමන අධිකාරයක් විසින් නිසි පරිදි අත්සන් කර සහ නිකුත් කරන ලද සෑම ලේඛනයක් ම එහි කිසිදු අත්සනක් ඔප්පු කිරීමෙන් තොරව සහ එකී නිලධරයන් සාක්ෂිකරුවන් ලෙස කැඳවීමෙන් තොරව සාක්ෂි ලෙස ආවේශ්‍ය විය යුතු අතර, ප්‍රතිකූලතාව ඔප්පු කරනු ලබන තෙක් එහි දක්වා ඇති කරුණු සම්බන්ධයෙන් ප්‍රමාණවත් සාක්ෂි විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් කරන ලද ලේඛනයක් ව්‍යාජ ලේඛනයක් බවට යම් තැනැත්තකු විසින් ස්ථිර ලෙස කියා සිටිනු ලබන අවස්ථාවක දී, එය ව්‍යාජ ලේඛනයක් බව ඔප්පු කිරීමේ භාරය එම තැනැත්තා සතු විය යුතු ය.

(3) මේ වගන්තියේ කාර්ය සඳහා, ලේඛනය යන්නට, නියමයක්, විධානයක්, උපදෙසක්, අවසරයක්, වාර්තාවක් හෝ සමාන ස්වභාවයක වෙනත් යම් අදාළ දෙයක් ඇතුළත් වේ.

ශ්‍රී ලංකාවෙන් පිට වීමට සිටින තැනැත්තකුගේ ඇතැම් වැරදි හා සම්බන්ධ සාක්ෂි

**157.** (1) ශ්‍රී ලංකාවෙන් පිට වීමට සිටින තැනැත්තකු මේ පනතේ 46, 47, 51, 124, 126, 136, 137, 138 හෝ 139 යන වගන්තිය යටතේ වන වරදක් සිදු කර ඇති බවට චෝදනා ලැබ සිටින යම් තැනැත්තකු සම්බන්ධයෙන් දිවුරන ලද හෝ ප්‍රතිඥා මත ප්‍රකාශයක් සිදු කිරීමට අපේක්ෂා කරන්නේ නම්, එම තැනැත්තා විසින් එසේ කරනු ලැබිය හැකි යඃ

එසේ වුව ද, එකී ප්‍රකාශය, වරදක් සිදු කර ඇති බවට චෝදනා ලද තැනැත්තා ඉදිරියේ දී සිදු කරනු ලැබිය යුතු අතර, එකී ප්‍රකාශය සාමදාන විනිශ්චයකාරවරයකු හෝ සහකාර පොලිස් අධිකාරිවරයකුගේ නිලයට නොඅඩු නිලයක පොලිස් නිලධරයකු ඉදිරියේ දී සිදු කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ප්‍රකාශය සිදු කරනු ලබන්නේ කවර සාමදාන විනිශ්චයකාරවරයකු හෝ පොලිස් නිලධරයකු ඉදිරියේ දී ද, එම සාමදාන විනිශ්චයකාරවරයා හෝ පොලිස් නිලධරයා විසින්-

(අ) එකී ප්‍රකාශය ලිඛිතව හෝ ඉලෙක්ට්‍රොනිකව වාර්තා කිරීම;

(ආ) වරදක් සිදු කර ඇති බවට චෝදනා ලද තැනැත්තා ඉදිරියේ දී ප්‍රකාශය සිදු කරනු ලබන තැනැත්තා වෙත එකී ප්‍රකාශය කියවීම;

(ඈ) වරදක් සිදු කර ඇති බවට චෝදනා ලද තැනැත්තා වෙත ප්‍රකාශය පැහැදිලි කිරීම;

(ඇ) ප්‍රකාශය සිදු කරන තැනැත්තාගෙන් ප්‍රකාශයට අදාළ යම් ප්‍රශ්නයක් ඇසීමේ සම්පූර්ණ අවස්ථාව වරදක් සිදු කර ඇති බවට චෝදනා ලද තැනැත්තාට ලබා දීම;

(ඉ) එහි ප්‍රශ්න, ප්‍රකාශය සිදු කරන තැනැත්තා විසින් දෙන ලද පිළිතුරු සමඟ වාර්තා කිරීම;

(ඊ) ප්‍රකාශය සිදු කරන තැනැත්තාගේ අත්සන මගින් ප්‍රකාශය පිළිබඳ වාර්තාවට සහතික කර ගැනීම; සහ

(උ) මේ උපවගන්තියේ නියමයන්ට අනුකූලව කටයුතු කිරීම සම්බන්ධයෙන් වන්නේ නම්, එසේ කටයුතු කර ඇති බව සහතික කිරීම,

කරනු ලැබිය යුතු ය.

(3) සෑම සාමදාන විනිශ්චයකාරවරයකුට ම සහ සහකාර පොලිස් අධිකාරිවරයකුගේ නිලයට නොඅඩු නිලයක පොලිස් නිලධරයකුට ම-

(අ) (17 වන අධිකාරය වූ) දිවුරුම් සහ ප්‍රතිඥා ආඥාපනත යටතේ සාක්ෂිකරුවන් සඳහා බලය ලබා දී ඇති ආකාරයෙන් මේ වගන්තියට අනුකූලව ප්‍රකාශයක් සිදු කිරීමට අපේක්ෂා කරන යම් තැනැත්තකු දිවුරවීම හෝ එවැනි යම් තැනැත්තකුගේ ප්‍රතිඥා ගැනීම; සහ

(ආ) ඉන්පසුව, (2) වන උපවගන්තියේ විධිවිධාන යටතේ කටයුතු මෙහෙය වීම,

සඳහා මෙයින් බලාත්මක කර නියම කරනු ලැබේ.

(4) වෙනත් යම් නීතියක විධිවිධානයක කුමක් වුව ද, මේ වගන්තිය යටතේ සිදු කරන්නේ යයි කියනු ලබන ප්‍රකාශයක්, අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබීම සහ 46, 47, 51, 124, 126, 136, 137, 138 හෝ 139 යන වගන්තිය යටතේ යම් වරදක් සම්බන්ධයෙන් චෝදනා ලද යම් තැනැත්තකුට එරෙහිව සාක්ෂි වශයෙන් දීම කරනු ලැබිය හැකි අතර, එහි දක්වා ඇති බැලූබැල්මට පෙනෙන සාක්ෂියක් විය යුතු ය.

පනත යටතේ වන නඩු කටයුතුවලට අධිකරණයේ දී ප්‍රමුඛතාව හිමිවිය යුතු බව

**158.** (1) මේ පනත යටතේ යම් තැනැත්තකු විසින් සිදු කරනු ලැබ ඇති බවට චෝදනා ලද යම් වරදක් සම්බන්ධයෙන් යම් අධිකරණයක පවතින නඩු කටයුතුවලට, වෙනත් යම් කටයුතු කලින් අවසන් කරනු ලැබීමට අවශ්‍ය වන අවස්ථානුගත කරුණුවල දී හැර, එම අධිකරණයේ වෙනත් සියලු කටයුතුවලට වඩා ප්‍රමුඛත්වය ලැබිය යුතු ය.

(2) මේ පනත යටතේ වන වරදක් සම්බන්ධයෙන් චෝදනා ලද තැනැත්තකුගේ නඩු විභාගය ආරම්භ කරන ලද දිනයේ අවසන් කරනු ලැබිය නොහැකි වන අවස්ථාවක දී, එකී නඩු විභාගය ඉක්බිතිව ම එළඹෙන වැඩ කරන දිනයේ දී අඛණ්ඩව කරගෙන යාම ප්‍රායෝගිකව නොහැකි වන හෝ ඉක්බිතිව ම එළඹෙන වැඩ කරන දිනයේ දී වෙනත් කටයුත්තක් අවසන් කරනු ලැබීමට අවශ්‍ය වන අවස්ථානුගත කරුණුවල දී හැර, ඉක්බිතිව ම එළඹෙන වැඩ කරන දිනයේ දී අඛණ්ඩව කරගෙන යනු ලැබිය යුතු ය.

මේ පනත යටතේ කර්තව්‍ය ඉටු කිරීමට භාවිත කරනු ලබන ක්‍රමවේද සහ ශිල්පීය ක්‍රම

**159.** (1) අමාත්‍යවරයා විසින් පාලක ජනරාල්වරයා විමසා, මේ පනත යටතේ කර්තව්‍ය ඉටු කිරීම සඳහා භාවිත කරනු ලැබිය යුතු ක්‍රමවේද සහ ශිල්පීය ක්‍රම සම්බන්ධයෙන් විධාන නිකුත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ කිසිවක් අනුමත නොකරන ලද ක්‍රමවේද හෝ ශිල්පීය ක්‍රම මේ පනත යටතේ කර්තව්‍ය ඉටු කිරීම සඳහා භාවිත කරනු නොලැබිය යුතු බව ගම්‍ය වන පරිදි, තේරුම් ගනු නොලැබිය යුතු ය.

(3) එකී ක්‍රමවේද හෝ ශිල්පීය ක්‍රම භාවිත කිරීමේ ක්‍රියාවලිය නියෝග මගින් නියම කරනු ලැබිය යුතු ය.

ආරක්ෂාවට හෝ සාපරාධී පැවැත්මට අදාළ වර්ග කරන ලද තොරතුරු මත තීරණ ගැනීමේ දී විශ්වාසය තබනු ලැබිය හැකි බව සහ එකී තොරතුරු අනාවරණය කරනු ලැබිය නොහැකි බව

**160.** (1) වර්ග කරන ලද තොරතුරු ආරක්ෂාව හෝ සාපරාධී පැවැත්ම සම්බන්ධ කරුණුවලට අදාළ වන බව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන්නේ නම්, මේ පනත යටතේ තීරණ ගැනීමේ දී හෝ ක්‍රියාමාර්ග නිශ්චය කිරීමේ දී වර්ග කරන ලද තොරතුරු මත විශ්වාසය තබනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන අදාළ වන අවස්ථාවක දී, අමාත්‍යවරයා විසින්-

(අ) වීසා පත්‍ර නිකුත් කිරීම;

(ආ) පැමිණීමේ සහ පිට වීමේ පිරිසැකසුම්;

(ඇ) ඉවත් කිරීමේ සහ පිට කිරීමේ ක්‍රියාවලිය; සහ

(ඈ) ශ්‍රී ලංකාවේ පුරවැසියන් නොවන තැනැත්තන් ශ්‍රී ලංකාවේ සිටින අතරතුර ඔවුන්ගේ කටයුතු අධීක්ෂණය කිරීම,

පිළිබඳ තීරණ ගැනීම සඳහා තොරතුරු මත විශ්වාසය තැබීමට පාලක ජනරාල්වරයාට බලය දෙනු ලැබිය හැකි ය.

(3) මේ පනත යටතේ යම් තීරණයක් ගැනීමේ හෝ යම් ක්‍රියාමාර්ගයක් නිශ්චය කිරීමේ කාර්යය සඳහා විශ්වාසය තබන ලද, වර්ග කරන ලද තොරතුරු රහසිගතව තබා ගනු ලැබිය යුතු අතර, අනාවරණය කරනු නොලැබිය යුතු ය.

(4) එකී සියලු වර්ග කරන ලද තොරතුරු ආරක්ෂිතව වාර්තා කර පාලක ජනරාල්වරයාගේ භාරය යටතේ පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

(5) (අ) ප්‍රකාශිතව ම විධිවිධාන සලසා ඇති පරිදි හැර-

(i) තොරතුරු (ආ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති වර්ගයක තොරතුරු වීම; සහ

(ii) තොරතුරු අනාවරණය කිරීම (ඇ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති වර්ගයක අනාවරණය කිරීමක් විය හැකි වීම,

හේතුවෙන් මේ පනතේ කාර්ය සඳහා "වර්ග කරන ලද තොරතුරු" යන්නෙන්, මේ පනතේ විධිවිධාන යටතේ යම් තොරතුරු අනාවරණය කරනු ලැබිය නොහැකි බව අදාළ නියෝජිතායතනයක ප්‍රධානියා විසින් ලිඛිතව සහතික කරන තොරතුරු අදහස් වේ.

(ආ) (i) එම තොරතුරු මගින්, තොරතුරු මූලාශ්‍රය, තොරතුරුවල ස්වභාවය, අන්තර්ගතය හෝ විෂයපථය හෝ අදාළ නියෝජිතායතනයේ පවතින උපකාරක හෝ මෙහෙයුම් ක්‍රමවේදවල ස්වභාවය හෝ වර්ගය හඳුනා ගැනීමට හෝ ඒ පිළිබඳ විස්තර සැපයීමට මඟපෙන්විය හැකි වන්නේ නම්;

(ii) එය අදාළ නියෝජිතායතනයේ යම් කර්තව්‍යයකට අනුව, ආරම්භ කර ඇති හෝ ආරම්භ කරමින්

සිටින හෝ ආරම්භ කිරීමට යෝජිත විශේෂිත මෙහෙයුම් පිළිබඳව වන්නේ නම්; හෝ

(iii) වෙනත් රටක රජයක්, වෙනත් රටක රජයක නියෝජිතායතනයක් හෝ ජාත්‍යන්තර සංවිධානය විසින් අදාළ නියෝජිතායතනය වෙත තොරතුරු සපයනු ලැබ තිබේ නම් සහ තොරතුරු සපයන රජය, නියෝජිතායතනය හෝ සංවිධානය එම තොරතුරු අනාවරණය කිරීම සම්බන්ධයෙන් එකඟ නොවන බැවින් අදාළ නියේජිතායතනය විසින් මෙම තොරතුරු අනාවරණය කරනු ලැබිය හැකි නොවන විට,

එම තොරතුරු මෙම උපවගන්තිය යටතට ගැනේ.

(ඇ) තොරතුරු අනාවරණය කිරීමක්-

(i) ශ්‍රී ලංකාවේ ජාතික සුරක්ෂිතභාවයට හෝ ආරක්ෂාවට හෝ ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර සබඳතාවලට අගතියක් කිරීමට;

(ii) වෙනත් රටක රජයක්, වෙනත් රටක රජයක නියෝජිතායතනයක් හෝ ජාත්‍යන්තර සංවිධානයක් විසින් විශ්වාසය පදනම මත ශ්‍රී ලංකා රජය වෙත තොරතුරු  භාර දීම සම්බන්ධයෙන් අගතියක් කිරීමට;

(iii) වැරදි වැළැක්වීම, විමර්ශනය කිරීම සහ අනාවරණය කර ගැනීම සහ සාධාරණ නඩු විභාගයක් පැවැත්වීමේ අයිතිය ඇතුළුව නීතිය පවත්වා ගෙන යාමට අගතියක් කිරීමට; හෝ

(iv) යම් තැනැත්තකුගේ සුරක්ෂිතභාවයට අනතුරක් කිරීමට,

ඉඩ ඇති අනාවරණය කිරීමක් වන්නේ නම්, එම අනාවරණයක් මෙම උපවගන්තිය යටතට ගැනේ.

IX වන කොටස

**අන්තර්ජාතික නඩු කටයුතු**

බහිර්දේශීය අධිකරණ බලය

**161.** (1) යම් තැනැත්තකු විසින් ශ්‍රී ලංකාවේ දේශසීමාවෙන් පිටත යම් ස්ථානයක දී මේ පනත යටතේ වන වරදක් සිදු කරන අවස්ථාවක දී, එකී වරද සම්බන්ධයෙන් වන නඩු කටයුතු ශ්‍රී ලංකාවේ මහාධිකරණයේ පවරනු ලැබිය හැකි ය.

(2) කොළඹ පිහිටි ශ්‍රී ලංකා මහාධිකරණයට හෝ 1996 අංක 10 දරන පළාත්බද මහාධිකරණ (විශේෂ විධිවිධාන) පනත සමඟ කියවිය යුතු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග වන ව්‍යවස්ථාව මගින් පිහිටුවන ලද මහාධිකරණයට (1) වන උපවගන්තියේ සඳහන් කරන ලද වැරදි විභාග කිරීම සහ නිශ්චය කිරීම සඳහා අධිකරණ බලය තිබිය යුතු ය.

උද්ර්පණ පිළියෙල කිරීම්වලට අදාළ විධිවිධාන සැලැස්වීම

**162.** ශ්‍රී ලංකා ආණ්ඩුව සහ වෙනත් යම් රාජ්‍යයක ආණ්ඩුව අතර උද්ර්පණ පිළියෙල කිරීමක් බලාත්මකව පවතින අවස්ථාවක දී, එකී පිළියෙල කිරීම, 1977 අංක 8 දරන උද්ර්පණ නීතියේ කාර්ය සඳහා, මේ පනත යටතේ වරදක් සම්බන්ධයෙන් සහ එවැනි වරදක් සිදු කිරීමට උත්සාහ කිරීම හෝ කුමන්ත්‍රණය කිරීම හෝ එවැනි වරදක් සිදු කිරීම සඳහා සහාය ලබා දීම හෝ අනුබල දීම සම්බන්ධයෙන් උද්ර්පණය සඳහා විධිවිධාන ඇතුළත් කිරීම සඳහා සලකනු ලැබිය යුතු ය.

1977 අංක 8 දරන උද්ර්පණ නීතිය සංශෝධනය කිරීම

**163.** 1977 අංක 8 දරන උද්ර්පණ නීතියේ උපලේඛනයේ ආ කොටසට පෙරාතුව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන් එම උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"() ......... අංක .......... දරන ආගමන පනතේ
අර්ථානුකූලව වන වරදක්".

උද්ර්පණ නීතියට අදාළව අර්ථ නිරූපණය

**164.** 1977 අංක 8 දරන උද්ර්පණ නීතියේ කුමක් අන්තර්ගත වුව ද, මේ පනත ප්‍රකාර වරදක්, එම නීතිය යටතේ උද්ර්පණ කාර්ය සඳහා පමණක්, පිස්කල් වරදක් හෝ දේශපාලන ස්වරූපයක වරදක් හෝ දේශපාලන වරදකට හෝ දේශපාලන උසිගැන්වීම් මගින් සිදු කිරීමට පොලඹවන ලද වරදක් නොවන බවට සලකනු ලැබිය යුතු ය.

*උද්ර්පණ ඉල්ලීමක් කර ඇත්තේ කවර තැනැත්තන්ට එරෙහිව ද එම තැනැත්තන් සම්බන්ධයෙන් ගෙන ඇති පියවර පිළිබඳ ඉල්ලා සිටින රාජ්‍යය වෙත දැනුම් දීම අමාත්‍යවරයාගේ කාර්යය වන බව*

**165.** මේ පනත යටතේ වන වරදක් සිදු කිරීම සම්බන්ධයෙන් චෝදනා ලද හෝ වරදකරු කරනු ලැබූ යම් තැනැත්තකු උද්ර්පණය සඳහා වෙනත් රටක ආණ්ඩුවක් විසින් හෝ වෙනුවෙන් ශ්‍රී ලංකා ආණ්ඩුව වෙත ඉල්ලීමක් කරනු ලබන අවස්ථාවක දී, ශ්‍රී ලංකා ආණ්ඩුව වෙනුවෙන්, අමාත්‍යවරයා විසින්, එම වරද සඳහා එම තැනැත්තාට නඩු පැවරීම හෝ එම තැනැත්තාව උද්ර්පණය කිරීම සඳහා ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් ගෙන ඇති හෝ ගැනීමට යෝජනා කරන පියවර පිළිබඳ ඉල්ලා සිටින රාජ්‍යයේ ආණ්ඩුව වෙත වහාම දැනුම් දෙනු ලැබිය යුතු ය.

*මේ පනත යටතේ අත්අඩංගුවට ගෙන ඇති ශ්‍රී ලංකාවේ පුරවැසියන් නොවන තැනැත්තන්ගේ අයිතීන්*

**166.** මේ පනත යටතේ වන වරදක් සඳහා ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන යම් තැනැත්තකු අත්අඩංගුවට ගනු ලබන අවස්ථාවක දී, එකී තැනැත්තා-

(අ) ඔහු ජාතිකයකු වන හෝ අන්‍යාකරයකින් ඔහුගේ අයිතීන් ආරක්ෂා කිරීමට හිමිකම් ඇති රාජ්‍යයේ ආසන්නතම උචිත අනුයෝජිතයා හෝ ඔහු රාජ්‍යයක් අහිමි තැනැත්තකු වන්නේ නම්, ඔහු පරිමිත වශයෙන් වාසිකයකු වූ දේශසීමාවේ රාජ්‍යයේ ආසන්නතම උචිත අනුයෝජිතයා වෙත ප්‍රමාදයකින් තොරව දැනුම් දීමට; සහ

(ආ) එම රාජ්‍යයේ අනුයෝජිතයකු හමුවීමට,

හිමිකම් ලැබිය යුතු ය.

*වෙනත් රාජ්‍යයන්ට සහයෝගය ලබා දීම ආණ්ඩුවේ කාර්ය වන බව*

**167.** ආණ්ඩුව විසින් එය සතුව ඇති යම් අදාළ සාක්ෂි ඇතුළුව මේ පනත යටතේ වන වරදකට අනුරූපී වන යම් විදේශීය රාජ්‍යයක නීතියක් යටතේ වන වරදක් සම්බන්ධයෙන්, යම් තැනැත්තකුට එරෙහිව එම රාජ්‍යය තුළ දී පවරන ලද අපරාධ නඩු කටයුතු සම්බන්ධයෙන් අවශ්‍ය විය හැකි යම් සහයෝගයක්, එම විදේශීය රාජ්‍යයේ අදාළ බලධරයන් වෙත ලබා දෙනු ලැබිය යුතු ය.

## X වන කොටස

### සාමාන්‍ය

*නියෝග*

**168.** (1) අමාත්‍යවරයා විසින්, මේ පනත යටතේ නියෝග සාදනු ලැබීමට නියම කරනු ලබන හෝ බලය පවරනු ලබන සියලු කාරණා සම්බන්ධයෙන් සහ මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ හෝ මූලධර්ම බලාත්මක කිරීමේ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) විශේෂයෙන් ම සහ (1) වන උපවගන්තිය මගින් පවරා ඇති බලතලවලට අගතියක් නොවන පරිදි, අමාත්‍යවරයා විසින්, පහත දැක්වෙන කාරණා සියල්ල ම හෝ යම් කාරණා සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි යː-

(අ) නියම කරනු ලැබීම සඳහා මේ පනතේ දක්වා ඇති සියලු කාරණා;

(ආ) මේ පනතේ කාර්ය සඳහා යම් තැනැත්තකු විභාග කිරීම සහ යම් ලේඛනයක් ඉදිරිපත් කිරීම, පරීක්ෂා කිරීම සහ එයට මුද්‍රාව තැබීම;

(ඇ) මේ පනතේ කාර්ය සඳහා යම් තැනැත්තකුගෙන් හෝ යම් පන්තියක හෝ වර්ගයක තැනැත්තන්ගෙන් හඳුනා ගැනීමේ තොරතුරු ලබා ගැනීම;

(ඈ) යම් ආකාරයක තාවකාලික ගමන් ලේඛනයක් නිකුත් කිරීම; සහ

(ඉ) ශ්‍රී ලංකාවේ පුරවැසියන් නොවන තැනැත්තන් රඳවා ගැනීම සඳහා රඳවා ගැනීමේ මධ්‍යස්ථාන සහ රැඳවුම් පහසුකම් සහ එවැනි රැඳවුම් මධ්‍යස්ථාන සහ පහසුකම්වල කාර්යපටිපාටි සහ පහසුකම් පිහිටුවීම.

(3) එකී සෑම නියෝගයක් ම, ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසුව, හැකි පහසු ඉක්මණින්, අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලබන එවැනි යම් නියෝගයක් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට අගතියක් නොවන පරිදි, එකී අනනුමතයේ දින සිට අවලංගු කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) නියෝගයක් අවලංගු කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

වාර්තා සහ ලේඛන ඉලෙක්ට්‍රොනික ආකාරයෙන් පවත්වාගෙන යාම සහ පරිරක්ෂණය කිරීම

**169.** (1) පාලක ජනරාල්වරයා විසින්-

(අ) වීසා පත්‍ර;

(ආ) ඇතුළු වීමේ සහ පිට වීමේ ක්‍රියාවලිය;

(ඇ) රටින් ඉවත් කිරීම සහ පිට කිරීම;

(ඇ) මේ පනතේ කාර්ය සඳහා ශ්‍රී ලංකාවේ පුරවැසියන් නොවන තැනැත්තන් ශ්‍රී ලංකාව තුළ සිටින කාලය අතරතුර එකී තැනැත්තන්ගේ ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීම සහ විමර්ශනය කිරීම;

(ඉ) ශ්‍රී ලංකා ගමන් ලේඛන; සහ

(ඊ) මේ පනත මගින් හෝ යටතේ පනවන ලද හෝ පවරන ලද පරිදි ආගමනයට සම්බන්ධ වෙනත් යම් කාර්ය හෝ කර්තව්‍යවලට,

අදාළ වාර්තා සහ ලේඛන ඉලෙක්ට්‍රොනික ආකාරයෙන් පවත්වාගෙන යාම සහ පරිරක්ෂණය කිරීම කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් කරන ලද සෑම වාර්තාවක් ම හෝ ලේඛනයක් ම 2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනතේ විධිවිධානවලට හෝ වෙනත් යම් අදාළ නීතියකට අනුව පවත්වාගෙන යාම සහ පරිරක්ෂණය කිරීම කරනු ලැබිය යුතු ය. එවැනි වාර්තා හෝ ලේඛන (1) වන උපවගන්තියේ සඳහන් කර්තව්‍යයක බැලූබැල්මට පෙනෙන සාක්ෂියක් ලෙස පිළිගනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ සඳහන් කර්තව්‍යයකට අදාළව පාලක ජනරාල්වරයා විසින් දරනු ලබන වාර්තා සහ ලේඛනවල දෘඪ පිටපත්, එකී වාර්තා හෝ ලේඛන පාලක ජනරාල්වරයා විසින් සත්‍යතාව සහතික කරනු ලැබ සහ සහතික කරනු ලැබ ඇත්තේ නම්, කිසිදු ඉලෙක්ට්‍රොනික වාර්තාවක් හෝ ලේඛනයක් තබා ගෙන නොමැති අවස්ථාවක් සම්බන්ධයෙන් වන විට දී, බැලූබැල්මට පෙනෙන සාක්ෂියක් ලෙස පිළිගනු ලැබිය යුතු ය.

හඳුනාගැනීමේ තොරතුරු එකතු කිරීම, භාවිත කිරීම, පිරිසැකසුම් කිරීම සහ ගබඩා කිරීම නීත්‍යානුකූල බව

**170.** (1) මේ පනතේ කාර්ය සඳහා පාලක ජනරාල්වරයා විසින් 4 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද සහ බලය ලබා දෙන ලද යම් නිලධරයකු විසින්,-

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන යම් තැනැත්තකු; හෝ

(ආ) මේ පනත යටතේ වන වරදක් සිදු කර ඇති බවට සැක කරනු ලැබූ හෝ චෝදනා ලැබූ යම් තැනැත්තකු,

පිළිබඳ යම් හඳුනා ගැනීමේ තොරතුරු එකතු කිරීම, එකවර භාවිත කිරීම, පිරිසැකසුම් කිරීම සහ ගබඩා කිරීම සඳහා සාධාරණ ලෙස අවශ්‍ය විය හැකි සියලු යම් පියවර ගනු ලැබීම නීත්‍යානුකූල වන්නේ ය.

(2) මේ පනතේ කාර්ය සඳහා, පොලිස් සැරයන්වරයකුගේ නිලයට නොඅඩු නිලයක පොලිස් නිලධරයකු හෝ කෝප්‍රල්වරයකුගේ නිලයට නොඅඩු නිලයක බලයලත් හමුදා සාමාජිකයකු, නායක නැවියකු හෝ වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ වෙරළ ආරක්ෂක නිලධරයකු විසින්,-

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන යම් තැනැත්තකු; හෝ

(ආ) මේ පනත යටතේ වන වරදක් සිදු කර ඇති බවට සැක කරනු ලැබූ හෝ චෝදනා ලැබූ යම් තැනැත්තකු,

පිළිබඳ ඡායාරූප, මිනුම්, ඇඟිලි සලකුණු සහ වෙනත් යම් හඳුනා ගැනීමේ තොරතුරු ලබා ගැනීම සඳහා සාධාරණ ලෙස අවශ්‍ය විය හැකි සියලු යම් පියවර ගනු ලැබීම නීත්‍යනුකූල වන්නේ ය.

(3) මේ පනත යටතේ එකතු කරන ලද සියලු පුද්ගලික තොරතුරු පිරිසැකසුම් කිරීමේ සහ ගබඩා කිරීමේ කාර්ය සඳහා වහාම පාලක ජනරාල්වරයා වෙත යවනු ලැබිය යුතු ය.

මේ පනත යටතේ එකතු කරන ලද හඳුනාගැනීමේ තොරතුරු භාවිත කිරීමේ විෂය පථය

**171.** (1) මේ පනත යටතේ එකතු කරන ලද හඳුනා ගැනීමේ තොරතුරු,-

(අ) ශ්‍රී ලංකා ගමන් ලේඛනයක් සඳහා ඉල්ලුම්පතක් ඉදිරිපත් කරන යම් ඉල්ලුම්කරුවකු හෝ ශ්‍රී ලංකා ගමන් ලේඛනයක් දරන්නකු පිළිබඳ හඳුනා ගැනීමේ දී සහාය වීම සහ අනන්‍යතාව පිළිබඳ සත්‍යතාව සහතික කිරීම;

(ආ) ශ්‍රී ලංකා ගමන් ලේඛනයක් නිකුත් කරනු ලැබ ඇති තැනැත්තකුගේ ජාත්‍යන්තර ගමන් සඳහා පහසුකම් සැලැස්වීම හෝ අන්‍යාකාරයකින් සහාය වීම;

(ඇ) ශ්‍රී ලංකා වීසා පත්‍රයක් සඳහා ඉල්ලුම්කරුවකු හෝ ශ්‍රී ලංකා වීසා පත්‍රයක් දරන්නකු හඳුනා ගැනීමේ දී සහාය වීම සහ එවැන්නකුගේ අනන්‍යතාවය පිළිබඳ සත්‍යතාව සහතික කිරීම;

(ඈ) ශ්‍රී ලංකාව වෙත ගමන් කිරීමේ කාර්ය සඳහා යාත්‍රාවකට හෝ ගුවන් යානයකට ගොඩවීමට යෝජනා කරන යම් තැනැත්තකු හඳුනා ගැනීමේ දී සහාය වීම සහ එවැන්නකුගේ අනන්‍යතාව පිළිබඳ සත්‍යතාව සහතික කිරීම;

(ඉ) ශ්‍රී ලංකාවට ඇතුළු වීම සඳහා අවසරය ලබා ගැනීමට ඉල්ලුම් කරන යම් තැනැත්තකු හඳුනාගැනීමේ දී සහාය වීම සහ එවැන්නකුගේ අනන්‍යතාව පිළිබඳ සත්‍යතාව සහතික කිරීම;

(ඊ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු ඇතුළුව ශ්‍රී ලංකාවෙන් පිට වන යම් තැනැත්තකු හඳුනාගැනීමේ දී සහාය වීම සහ එවැන්නකුගේ අනන්‍යතාව පිළිබඳ සත්‍යතාව සහතික කිරීම;

(උ) ශ්‍රී ලංකාවෙන් ඉවත් කිරීමට හෝ පිට කිරීමට නියමිත යම් තැනැත්තකු හඳුනාගැනීමේ දී සහාය වීම සහ එවැන්නකුගේ අනන්‍යතාවය පිළිබඳ සත්‍යතාව සහතික කිරීම;

(ඌ) මේ පනත යටතේ වරදක් සිදු කර ඇති යම් තැනැත්තකු හඳුනාගැනීමේ දී සහාය වීම සහ එවැන්නකුගේ අනන්‍යතාවය පිළිබඳ සත්‍යතාව සහතික කිරීම;

(එ) අපරාධ හෝ ත්‍රස්ත ක්‍රියාකාරකම් හෝ ශ්‍රී ලංකාවේ හෝ එහි යම් කොටසක ආරක්ෂාවට හෝ මහජන යථා පැවැත්ම හෝ අත්‍යවශ්‍ය සේවා පවත්වාගෙන යාමට අගතිගාමී විය හැකි ක්‍රියාකාරකම් වැළැක්වීම, අනාවරණය කර ගැනීම හෝ විමර්ශනය කිරීම;

(ඒ) යම් නීතියකට එරෙහි වරදක් සඳහා තැනැත්තකු විමර්ශනය කිරීම හෝ එම තැනැත්තාට නඩු පැවරීම ඇතුළුව, ලිඛිත නීතිය බලාත්මක කිරීම;

(ඔ) ආගමන කාරණාවල දී ලේඛන සහ අනන්‍යතාව පිළිබඳ වංචාවලට එරෙහිව සටන් කිරීම;

(ඕ) හඳුනාගැනීමේ තොරතුරු පාලනය කිරීම හෝ කළමනාකරණය කිරීම;

(ක) වෙනත් හඳුනාගැනීමේ තොරතුරු සමඟ සසඳනු ලැබීමට හැකියාව ලබා දීම සඳහා හෝ දෝෂ නිවැරදි කිරීම පිණිස හෝ උචිත තත්ත්වයන් සමඟ අනුකූලතාව සහතික කිරීම සඳහා හඳුනා ගැනීමේ තොරතුරු යාවත්කාලීන කිරීම;

(ග) ශ්‍රී ලංකාවේ ජාතික ආරක්ෂාවට තර්ජනයක් විය හැකි හෝ අපරාධමය ස්වභාවයේ ක්‍රියාකාරකම්වලට සම්බන්ධ වී සිටින සහ මහජන ආරක්ෂාව, සාමය සහ යථා පැවැත්ම පිළිබඳ සුබසිද්ධිය පිණිස රඳවා ගනු ලැබීම හෝ අධීක්ෂණය කරනු ලැබීම අවශ්‍ය විය හැකි තැනැත්තන් හඳුනාගැනීම;

(ච) වෙනත් යම් ලිඛිත නීතියක් මගින් හෝ යටතේ භාවිත කිරීමට නියම කර ඇති හෝ බලය ලබා දී ඇති වෙනත් යම් කාර්යයක්; සහ

(ඡ) මේ පනත යටතේ හෝ මේ පනත යටතේ සාදන ලද නියෝග යටතේ තීරණ ගැනීම,

පිළිබඳ කාර්යයන් සඳහා භාවිත කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් කාර්යයන් සඳහා හඳුනා ගැනීමේ තොරතුරු භාවිත කරනු ලැබීමට නියමිත බලයලත් ආයතන අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය යුතු ය.

හඳුනාගැනීමේ තොරතුරු අනාවරණය කිරීම හෝ එම තොරතුරු වෙත ප්‍රවේශ වීම සඳහා බලය ලබා දීම

**172.** (1) අමාත්‍යවරයා විසින්, ලිඛිත නියමයක් මගින්,-

(අ) දත්ත ආරක්ෂණයට අදාළ යම් ලිඛිත නීතියකට අනුකූලව නියමයේ නිශ්චිතව දක්වා ඇති හඳුනාගැනීමේ තොරතුරු වෙත ප්‍රවේශ වීමට; හෝ

(ආ) ශ්‍රී ලංකාවේ දත්ත ආරක්ෂණයට අදාළ යම් ලිඛිත නීතියකට අනුකූලව අමාත්‍යවරයාගේ නියමයේ නිශ්චිතව දක්වා ඇති කාර්යය හෝ කාර්යයන් සඳහා, අමාත්‍යවරයාගේ නියමයේ නිශ්චිතව දක්වා ඇති ආකාරයේ හඳුනාගැනීමේ තොරතුරු, ලිඛිත ඉල්ලීමක් මත 171 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ බලයලත් වෙනත් ආයතනයක් වෙත අනාවරණය කිරීමට,

නිශ්චිත අධිකාරියකට බලයක් පවරනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින්, පහත දැක්වෙන කාර්යයන් එකක් හෝ වැඩි ගණනක්, ශ්‍රී ලංකාවේ දත්ත ආරක්ෂණයට අදාළ යම් ලිඛිත නීතියකට අනුකූලව ප්‍රවේශ වීමට හෝ අනාවරණය කිරීමට බලය ලබා දෙනු ලබන කාර්යය හෝ කාර්යයක් වශයෙන්, මේ වගන්තිය යටතේ කරනු ලබන නියමයේ නිශ්චිතව දක්වනු ලැබිය හැකි යː-

(අ) ශ්‍රී ලංකා ගමන් ලේඛනයක් සඳහා ඉල්ලුම් කරන යම් ඉල්ලුම්කරුවකු හෝ ශ්‍රී ලංකා ගමන් ලේඛනයක් දරන්නකු හඳුනා ගැනීමේ දී සහාය වීම සහ එවැන්නකුගේ අනන්‍යතාව පිළිබඳ සත්‍යතාව සහතික කිරීම;

(ආ) ශ්‍රී ලංකා ගමන් ලේඛනයක් නිකුත් කරනු ලැබ ඇති තැනැත්තකුගේ ජාත්‍යන්තර ගමන් සඳහා පහසුකම් සැලැස්වීම හෝ අන්‍යාකාරයකින් සහාය වීම;

(ඇ) යම් නීතියකට එරෙහි යම් වරදක් සඳහා තැනැත්තකු විමර්ශනය කිරීම හෝ එම තැනැත්තාට නඩු පැවරීම ඇතුළුව ලිඛිත නීතිය බලාත්මක කිරීම;

(ඈ) ආගමන කාරණාවල දී ලේඛන සහ අනන්‍යතාව පිළිබඳ වංචාවලට එරෙහිව සටන් කිරීම;

(ඉ) හඳුනාගැනීමේ තොරතුරු ගබඩා කිරීම පාලනය කිරීම හෝ කළමනාකරණය කිරීම;

(ඊ) වෙනත් හඳුනාගැනීමේ තොරතුරු සමඟ සසඳනු ලැබීමට හැකියාව ලබා දීම සඳහා හෝ දෝෂ නිවැරදි කිරීම පිණිස හෝ උචිත තත්ත්වයන් සමඟ අනුකූලතාව සහතික කිරීම සඳහා හඳුනාගැනීමේ තොරතුරු යාවත්කාලීන කිරීම;

(උ) ශ්‍රී ලංකාවේ ජාතික ආරක්ෂාවට තර්ජනයක් විය හැකි හෝ අපරාධමය ස්වභාවයේ ක්‍රියාකාරකම්වලට සම්බන්ධ වී සිටින සහ මහජන ආරක්ෂාව, සාමය සහ යථා පැවැත්ම පිළිබඳ සුබසිද්ධිය පිණිස රඳවා ගනු ලැබීම හෝ අධීක්ෂණය කරනු ලැබීම අවශ්‍ය විය හැකි තැනැත්තන් හඳුනාගැනීම;

(ඌ) යම් ලිඛිත නීතියක් මගින් අනාවරණය කිරීමට නියම කර ඇති හෝ බලය ලබා දී ඇති වෙනත් යම් කාර්යයක්;

(එ) අපරාධ හෝ ත්‍රස්ත ක්‍රියාකාරකම් හෝ ශ්‍රී ලංකාවේ හෝ එහි යම් කොටසක ආරක්ෂාවට හෝ මහජන යථා පැවැත්ම හෝ අත්‍යවශ්‍ය සේවා පවත්වාගෙන යාමට අගතිගාමී විය හැකි ක්‍රියාකාරකම් විමර්ශනය කිරීම, අනාවරණය කර ගැනීම හෝ වැළැක්වීම; සහ

(ඒ) මේ පනත යටතේ හෝ මේ පනත යටතේ සාදන ලද නියෝග යටතේ තීරණ ගැනීම.

(3) (1) වන උපවගන්තියේ කාර්යයන් සඳහා, හඳුනා ගැනීමේ තොරතුරු අනාවරණය කරනු ලැබිය හැකි නිශ්චිත අධිකාරයට, පොලිසිය, යම් නීතිය බලාත්මක කිරීමේ ආයතනයක්, විදේශ රටක සීමා පාලනය කිරීමේ ආයතනයක් හෝ වෙනත් එවැනි ආයතනයක් ඇතුළත් විය හැකි ය.

පාලක ජනරාල්වරයා විසින් වෙනත් දේශීය හෝ ජාත්‍යන්තර නීතිය බලාත්මක කිරීමේ නියෝජිතායතන සමඟ තොරතුරු බෙදා ගනු ලැබිය හැකි බව

**173.** පාලක ජනරාල්වරයා විසින්, හඳුනාගැනීමේ තොරතුරු හෝ වෙනත් යම් තොරතුරු, ශ්‍රී ලංකාවේ පුද්ගලික දත්ත ආරක්ෂණයට අදාළ යම් ලිඛිත නීතියකට අනුකූලව හඳුනාගැනීමේ තොරතුරු හෝ වෙනත් යම් තොරතුරු භාවිතය, බෙදා ගැනීමේ ක්‍රමවේදය සහ එකී හඳුනා ගැනීමේ තොරතුරු හෝ වෙනත් යම් තොරතුරු ආරක්ෂණය සම්බන්ධයෙන් පාලක ජනරාල්වරයා සමඟ යම් ද්විපාර්ශ්වික ගිවිසුමකට එළඹ ඇති වෙනත් දේශීය හෝ ජාත්‍යන්තර නීතිය බලාත්මක කිරීමේ නියෝජිතායතන සමඟ බෙදා ගනු ලැබිය හැකි ය.

මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ස්වයංක්‍රීය තීරණ ගැනීම

**174.** මේ පනතේ යම් කොටසකට අදාළව ඉල්ලුම් පත්‍රයක් පිරිසැකසුම් කිරීම හෝ යම් මෙහෙයුමක් ක්‍රියාවට නැංවීම සඳහා, පාලක ජනරාල්වරයා විසින්, අමාත්‍යවරයාගේ විධිවිධානවලට අනුකූලව පූර්ව නිශ්චිත නිර්ණායක අදාළ වන ස්වයංක්‍රීය ඉලෙක්ට්‍රොනික පද්ධතියක් භාවිත කරනු ලැබිය හැකි ය.

ආගමන නිලධරයන්ගේ ත්‍යාග අරමුදල

**175.** (1) (මේ පනතේ "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) ආගමන නිලධරයන්ගේ ත්‍යාග අරමුදල යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) මේ පනත සහ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් යටතේ වීසා පත්‍ර ගාස්තු හෝ සංචරණය සඳහා වූ විද්‍යුත් අනුමතය සඳහා වූ ගාස්තු වශයෙන් පාලක ජනරාල්වරයා වෙත බැර වන මුදලින් සියයට එකකට සමාන මුදලක් අරමුදල වෙත ගෙවනු ලැබිය යුතු ය.

(3) (අ) නියම කරනු ලැබිය හැකි පරිදි එකී ආගමන නිලධරයන් වෙත ත්‍යාග වශයෙන් ලබා දී ඇති සියලු ගෙවීම්; සහ

(ආ) අරමුදල පරිපාලනය කිරීමේ දී දරන ලද යම් වියදමක්,

අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

(4) අරමුදලේ පරිපාලනය සම්බන්ධයෙන් පාලක ජනරාල්වරයා වගකිව යුතු ය.

(5) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන අරමුදලේ ගිණුම් විගණනය සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(6) අමාත්‍යවරයා විසින්-

(අ) අරමුදල පරිපාලනය කරනු ලැබිය යුතු ආකාරය නියම කරමින්; සහ

(ආ) නියම කරනු ලැබීමට අවශ්‍ය කාරණා සම්බන්ධයෙන්,

නියෝග සාදනු ලැබිය හැකි ය.

පාලක ජනරාල්වරයා සහ නිලධරයන් සාම නිලධරයන් ලෙස සලකනු ලැබිය යුතු බව

**176.** (1) පාලක ජනරාල්වරයා, අතිරේක පාලක ජනරාල්වරයා, ආගමන පාලකවරයකු, නියෝජ්‍ය ආගමන පාලකවරයකු, සහකාර ආගමන පාලකවරයකු, ප්‍රධාන ආගමන නිලධරයකු සහ ආගමන නිලධරයකු, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ අර්ථානුකූලව එම පනත මගින් සාම නිලධරයකු වෙත පවරා ඇති යම් බලතල ක්‍රියාත්මක කිරීමේ කාර්ය සඳහා සාම නිලධරයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) අමාත්‍යවරයා විසින්, විශේෂ අවස්ථානුගත කරුණුවල දී, සාම නිලධරයකු වශයෙන් කාර්ය ඉටු කිරීමේ අවශ්‍යතා සහ අවදානම් තත්ත්වයන් සැලකිල්ලට ගනිමින්, ආරක්ෂක අමාත්‍යාංශය විසින් ලැබී ඇති අදාළ අවසර පත්‍රවලින් සන්නද්ධ වන ලෙසට ඉහත සඳහන් කරන ලද සාම නිලධරයන්ට විධාන කරනු ලැබිය හැකි ය.

දිවුරුම් ලබා ගැනීම සඳහා ඇති බලය

**177.** පාලක ජනරාල්වරයාට, අතිරේක පාලක ජනරාල්වරයාට, සෑම ආගමන පාලකවරයකුටම, සෑම නියෝජ්‍ය ආගමන පාලකවරයකුට ම, සෑම සහකාර ආගමන පාලකවරයකුට ම, සෑම ප්‍රධාන ආගමන නිලධරයකුට ම සහ සෑම ආගමන නිලධරයකුට ම, මේ පනතේ කාර්ය සඳහා (17 වන අධිකාරය වූ) දිවුරුම් සහ ප්‍රතිඥා ආඥාපනතේ විධිවිධානවලට අනුව දිවුරුම් ලබා ගැනීම සඳහා බලය තිබිය යුත්තේ ය.

දැන්වීම් භාර දීමේ ආකාරය

**178.** මේ පනත මගින් හෝ යටතේ යම් තැනැත්තකු වෙත භාර දෙනු ලැබීමට නියම කර ඇති යම් දැන්වීමක්, එම තැනැත්තා විසින් සපයා ඇති ලිපිනයට ලියාපදිංචි ලිපියක් මගින්, තැපෑලෙන් හෝ ඉලෙක්ට්‍රොනිකව භාර දෙනු ලබන්නේ නම්, එකී දැන්වීම එම තැනැත්තා වෙත නිසි පරිදි භාර දී ඇති ලෙසට සලකනු ලැබිය යුතු ය.

පනත පරිපාලනය කිරීමේ වියදම්

**179.** මේ පනත පරිපාලනය කිරීමේ දී දරනු ලබන සියලු වියදම්, මේ පනත මගින් හෝ යටතේ සපයා ඇති පරිදි වියදම් දරනු ලබන තාක් දුරට හැර, ඒකාබද්ධ අරමුදල මත ගාස්තුවක් විය යුතු ය.

සිවිල් හෝ අපරාධ නඩු පැවරීමෙන් ආරක්ෂා කිරීම

**180.** (1) මේ පනත යටතේ පවරන ලද හෝ පනවන ලද යම් කර්තව්‍යයක් හෝ බලතල ඉටු කිරීමේ දී හෝ ක්‍රියාත්මක කිරීමේ දී සද්භාවයෙන් කරන ලද යම් දෙයක් සඳහා පාලක ජනරාල්වරයාට, අතිරේක පාලක ජනරාල්වරයාට, ආගමන පාලකවරයකුට, නියෝජ්‍ය ආගමන පාලකවරයකුට, සහකාර ආගමන පාලකවරයකුට, ප්‍රධාන ආගමන නිලධරයකුට, ආගමන නිලධරයකුට, පොලිස් නිලධරයකුට, හමුදාවේ යම් බලයලත් සාමාජිකයකුට හෝ වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ වෙරළ ආරක්ෂක නිලධරයකුට එරෙහිව කිසිදු සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් කරන ලද තැනැත්තකු විසින්, මේ පනත යටතේ කරන ලද හෝ කරන ලද්දේ යයි කියනු ලබන යම් ක්‍රියාවක් සද්භාවයෙන් යුතුව කරන ලද බව අධිකරණය විසින් තීරණය කරනු ලබන්නේ නම්, එම ක්‍රියාව සම්බන්ධයෙන් ඔහුට එරෙහිව යම් අධිකරණයක් ඉදිරියේ පවරන ලද සිවිල් හෝ අපරාධ නඩුවක දී ඔහු විසින් දරනු ලබන වියදම්, එකී සිවිල් හෝ අපරාධ නඩුවේ දී එකී වියදම් ආවරණය කරනු ලබන්නේ නම් මිස, ඒකාබද්ධ අරමුදලෙන් ගෙවනු ලැබිය යුතු ය.

ශ්‍රී ලංකාවේ ස්ථාන අතර සංචාරවල දී පනත අදාළ නොවිය යුතු බව

**181.** අවස්ථාවෝචිත පරිදි, යාත්‍රාවකින් හෝ ගුවන් යානයකින්, ශ්‍රී ලංකාවේ යම් ස්ථානයක් වෙත ඇතුළු වීමක් හෝ යම් ස්ථානයකින් පිට වීමක් හෝ තම සංචාරය පුරාවට එම යාත්‍රාව හෝ ගුවන් යානය ශ්‍රී ලංකාවෙන් පිටත යම් ස්ථානයකට පැමිණ නොමැති හෝ පැමිණීමට නියමිත නොවන්නේ නම්, යාත්‍රාවෙන් හෝ ගුවන් යානයෙන් ශ්‍රී ලංකාවේ වෙනත් යම් ස්ථානයක සිට හෝ වෙනත් යම් ස්ථානයක් වෙත සංචාරයක යෙදෙන යම් තැනැත්තකු, මේ පනතේ හෝ මේ පනත යටතේ සාදන ලද හෝ නිකුත් කරන ලද යම් නියෝගයක, නියමයක, විධානයක, උපදේශයක හෝ වෙනත් සාධන පත්‍රයක ඇති කිසිවකින්, කිසිදු ආකාරයකින් තහනමට ලක් කරන හෝ සීමා කරන ලෙස සැලකීම හෝ තේරුම් ගැනීම නොකරනු ලැබිය යුතු ය.

පනත සන්දර්භනය කිරීම

**182.** මේ පනතේ විධිවිධාන, ශ්‍රී ලංකාව වෙත තැනැත්තන් ඇතුළු වීමට සහ ශ්‍රී ලංකාවෙන් තැනැත්තන් පිට වීමට අදාළව, (235 වන අධිකාරය වූ) රේගු ආඥාපනතේ සහ (222 වන අධිකාරය වූ) නිරෝධායනය සහ රෝග වැළැක්වීමේ ආඥාපනතේ විධිවිධානවලට

අමතරව සහ එම විධිවිධානවලට හානියක් නොවන පරිදි විය යුතු යː

එසේ වුව ද, මේ පනතේ සහ එවැනි යම් ආඥාපනතක විධිවිධාන අතර යම් ගැටුමක් හෝ අනනුකූලතාවක් ඇති වන අවස්ථාවක දී, මේ පනතේ විධිවිධාන බලාත්මක විය යුතු ය.

**183.** මේ පනතේ සහ ඒ යටතේ සාදන ලද නියෝගවල පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස- අර්ථ නිරූපණය

"උසස් මගී තොරතුරු" යන්නෙන්, ගුවන් යානා පැමිණීමට සහ පිටත් වීමට පෙරාතුව එකතු කර ඉලෙක්ට්‍රොනික සන්නිවේදන පද්ධතියක් හරහා දේශසීමා පාලන නියෝජිතායතන වෙත යවනු ලබන සහ ඇතුළු වීමේ හෝ පිටත් වීමේ තොටුපළේ ප්‍රාථමික පෙළෙහි පවතින දත්ත පිළිබඳ මූලාංග අදහස් වේ;

"සහාය දීම සහ අනුබල දීම" යන්නට, (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ 101 වන වගන්තියේ දී ඇති අර්ථය ම තිබිය යුතු ය;

"අනුමත තොටුපළ" යන්නෙන්, මේ පනතේ 45 වන වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් අනුමත ඇතුළු වීමේ තොටුපළක් හෝ පිටත් වීමේ තොටුපළක් වශයෙන් ප්‍රකාශයට පත් කරන ලද වරායක් හෝ ගුවන් තොටුපළක් අදහස් වේ;

"අනුමත ඇතුළු වීමේ ස්ථානය" සහ "අනුමත පිටත් වීමේ ස්ථානය" යන්නෙන්, 45 වන වගන්තිය යටතේ එසේ ප්‍රකාශයට පත් කරන ලද අනුමත ගුවන් තොටුපළක් හෝ වරායක් අදහස් වේ;

"ජෛවමිතික" යන්නෙන්, ඇඟිලි සලකුණු ඇතුළුව තැනැත්තකුට විශේෂිත අනන්‍ය ජෛවවිද්‍යාත්මක දත්ත අදහස් වේ;

"දේශසීමාව" යන්නෙන්, ශ්‍රී ලංකාවේ දේශීය ජල තීරයෙන් සහ වා අවකාශයෙන් සමන්විත වේ;

"ළමයා" යන්නෙන්, වයස අවුරුදු දහඅටට අඩු තැනැත්තකු අදහස් වේ;

ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන යම් තැනැත්තකු සම්බන්ධයෙන්, "පිරිවැය සහ ගාස්තු" යන්නෙන්, එවැනි

තැනැත්තකු එම ස්ථානයෙන් පිටත් වීම සහතික කිරීම හෝ ඊට පහසුකම් සැලැස්වීම සඳහා මහජන අරමුදලින් වියදම් කරන ලද යම් මුදලක් අදහස් වන අතර, එයට-

(අ) ඔහුගේ සහනය, නඩත්තුව, රැකවරණය හෝ සත්කාරය සඳහා මහජන අරමුදලින් වියදම් කරන ලද යම් මුදලක්; සහ

(ආ) යම් රෝහලක හෝ මහජන අරමුදලෙන් හෝ රජය දායක වන යම් පුණ්‍යායතනයක් මගින් පවත්වාගෙන යනු ලබන රෝගී හෝ අසරණ තැනැත්තන්ට සහන සැලසීම සඳහා වන වෙනත් ආයතනයක එවැනි යම් සහන සැලසීමක්, නඩත්තු කිරීමක් රැකවරණය ලබා දීමක් හෝ සත්කාරයක් සඳහා වන වියදම්,

ඇතුළත් වේ;

"ගුවන් යානයක කපිතාන්වරයා" යන්නෙන්, තත්කාලය සඳහා එම ගුවන් යානයේ මෙහෙයවීම හෝ පාලනය භාර තැනැත්තා අදහස් වේ;

"රැගෙන යන්නා" යන්නෙන්, ජලයෙන් හෝ ගුවනින් මගීන් ප්‍රවාහනය කිරීමේ කටයුතුවල නිරතව සිටින තැනැත්තකු අදහස් වන අතර, එයට ගුවන් යානයේ හෝ නැවේ හිමිකාරිත්වය දරන හෝ අධිකාරය දරන සංස්ථාපිත හෝ සංස්ථාපිත නොවන යම් තැනැත්තන්ගේ සංගමයක් ද ඇතුළත් වේ;

"සිවිල් ගුවන් සේවා අධිකාරිය" යන්නෙන්, 2002 අංක 34 දරන සිවිල් ගුවන් සේවා අධිකාරිය පනතේ 2 වන වගන්තිය මගින් පිහිටුවන ලද සිවිල් ගුවන් සේවා අධිකාරිය අදහස් වේ;

" අපරාධ නඩු විධාන සංග්‍රහය පනත" යන්නෙන්, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත අදහස් වේ;

"කාර්ය මණ්ඩලය" යන්නෙන්, යාත්‍රාවක හෝ ගුවන් යානයක කටයුතුවල හෝ සේවයේ නියුක්තව සිටින තැනැත්තන් කණ්ඩායම අදහස් වේ;

"අන්තරායදායක ඖෂධ" යන්නෙන්, (218 වන අධිකාරය වූ) විෂ වර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ ආඥාපනත යටතට ගැනෙන හෝ ඒ වෙනුවට බලාත්මක කර ඇති යම් නීතියක ඇතුළත් කර ඇති යම් ඖෂධයක් අදහස් වේ;

"යැපෙන්නා" යන්නෙන්, නඩත්තුව සහ සහාය සඳහා වෙනත් යම් තැනැත්තකු මත සම්පූර්ණයෙන් ම සහ ඍජුව ම යැපෙන යම් තැනැත්තකු අදහස් වන අතර, එකී වෙනත් තැනැත්තා,-

(අ) ඔහුගේ කලත්‍රයා;

(ආ) ඔහුගේ හෝ ඔහුගේ කලත්‍රයාගේ දෙමව්පියකු හෝ ආච්චි හෝ සීයා;

(ඇ) ඔහුගේ හෝ ඔහුගේ කලත්‍රයාගේ අවිවාහක හෝ වැන්දඹු හෝ දික්කසාද වූ දියණිය, මිණිපිරිය, සහෝදරිය හෝ ලේලිය; හෝ

(ඈ) ඔහුගේ හෝ ඔහුගේ කලත්‍රයාගේ වයස අවුරුදු විසි එකට අඩු හෝ එම වයසට වැඩි සදාකාලිකව ම ආබාධිත හෝ තම වැඩ කටයුතු කර ගැනීමට හැකියාවක් නොමැති පුතා, මුණුපුරා, සහෝදරයා හෝ බෑණා,

වන විට දී අදාළ වේ;

"පිටකිරීම" යන්නෙන්, නියමය බලාත්මකව පවතින තාක් කාලයක් ශ්‍රී ලංකාවෙන් පිටව සිටීම සඳහා අමාත්‍යවරයා විසින් නිකුත් කරනු ලබන නියමයක් මගින් ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන තැනැත්තකු ශ්‍රී ලංකාවෙන් බලෙන් පිටත් කිරීම අදහස් වේ;

"වෙළෙඳ නැව් අධ්‍යක්ෂවරයා" යන්නෙන්, 1971 අංක 52 දරන වෙළෙඳ නැව් පනතේ 3 වන වගන්තිය යටතේ පත් කරන ලද වෙළෙඳ නැව් අධ්‍යක්ෂවරයා අදහස් වේ;

"සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා" යන්නෙන්, 2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය පනතේ 11 වන වගන්තිය යටතේ පත් කරන

ලද සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා අදහස් වේ;

"ඍජු මාර්ගස්ථ මගියා" යන්නෙන්, ගුවන් යානයකින් ශ්‍රී ලංකාවේ අනුමත ගුවන් තොටුපළක් වෙත පැමිණ ශ්‍රී ලංකාවට ඇතුළු වීමෙන් තොරව තවත් රටකට ගමන් කරන අතරමග දී එකී අනුමත ගුවන් තොටුපළ පසු කරන මගියකු අදහස් වේ;

"අනාවරණය කිරීම" යන්නට, හඳුනාගැනීමේ තොරතුරු වෙත ප්‍රවේශය සැපයීම ඇතුළත් වේ;

"ලේඛන" යන්නට,-

(අ) යම් පිටසනක්;

(ආ) ලියවිල්ලක් සහිත අවස්ථාවක දී යම් කඩදාසියක් හෝ වෙනත් ද්‍රව්‍යයක්;

(ඇ) (i) සලකුණු, ඉලක්කම්, සංකේත හෝ සිදුරු කිරීම් පරිවර්තනය කිරීමට සුදුසුකම්ලත් තැනැත්තන් විසින් අර්ථයක් දීමේ හැකියාවක් ඇති; හෝ

(ii) සලකුණු, ඉලක්කම්, සංකේත හෝ සිදුරු කිරීම් සහිත අවස්ථාවක දී, පරිගණකයක්, යන්ත්‍රයක් හෝ ඉලෙක්ට්‍රොනික උපාංගයක් මගින් ප්‍රතිචාර දක්වනු ලැබීමේ හැකියාවක් ඇති,යම් කඩදාසියක් හෝ වෙනත් ද්‍රව්‍යයක්;

(ඈ) වෙනත් යම් උපකරණයක් හෝ උපාංගයක සහාය ඇතිව හෝ නැතිව තොරතුරු නැවත උත්පාදනය කරනු ලැබීමේ හැකියාව සහිත යම් උපකරණයක් හෝ ද්‍රව්‍යයක්;

(ඉ) යම් ඉලෙක්ට්‍රොනික වාර්තාවක්; හෝ

(ඊ) යම් දෙයක් හෝ යම් උපකරණයක්,

ඇතුළත් වේ;

"ඉලෙක්ට්‍රොනික උපාංගය" යන්නෙන්, ඉලෙක්ට්‍රොනික ආකෘතියෙන් පවතින ලිඛිත ලේඛනයක් සඳහන් කරන

ලද යම් ලේඛනයක් අන්තර්ගත විය හැකි යම් ඉලෙක්ට්‍රොනික උපාංගයක් අදහස් වේ;

"පිටසන" යන්නෙන්, මේ පනතේ III වන, IV වන, V වන හෝ VII වන කොටසක් යටතේ ලබා දෙන ලද පිටසනක් අදහස් වේ;

"ඇතුළු වීම" යන්නෙන්,-

(අ) මුහුදෙන් පැමිණෙන තැනැත්තකු සම්බන්ධයෙන් වන විට දී, ඔහු පැමිණෙන යාත්‍රාවෙන් ශ්‍රී ලංකාවට ගොඩ බැසීම;

(ආ) යම් ගුවන් යානයකින් ශ්‍රී ලංකාවේ යම් ගුවන් තොටුපොළකට පැමිණෙන තැනැත්තකු සම්බන්ධයෙන් වන විට, එම තැනැත්තා එම ගුවන් යානයෙන් ම එම ගුවන් තොටුපොළෙන් පිට වන තෙක් ඔහු මේ පනතේ කාර්ය සඳහා ශ්‍රී ලංකාවට ඇතුළු වූ ලෙස හෝ ශ්‍රී ලංකාවට රැගෙන එනු ලැබූ ලෙස සලකනු නොලැබිය යුතු ය;

(ඇ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන ශ්‍රී ලංකාවේ උපන් දරුවකු සම්බන්ධයෙන් වන විට දී, ශ්‍රී ලංකාව තුළ දී ඔහුගේ උපත; සහ

(ඈ) වෙනත් යම් අවස්ථාවක් සම්බන්ධයෙන් වන විට දී, මුහුදෙන් හෝ ගුවනින්, ශ්‍රී ලංකාව වෙත යම් ඇතුළු වීමක් අදහස් වන නමුත්, මේ පනතට අනුකූලව කටයුතු කිරීමේ කාර්ය සඳහා කරන ලද යම් ඇතුළු වීමක් හෝ මේ පනතේ විධිවිධාන යටතේ යම් විමර්ශනයක් හෝ රඳවා ගැනීමේ කාර්ය සඳහා ආගමන නිලධරයකු විසින් ප්‍රකාශිතව හෝ ගම්‍යමාන ලෙස අවසර දී ඇති ඇතුළු වීමක් සිදුවන යම් අවස්ථාවක් ඇතුළත් නොවිය යුතු බව,

අදහස් වේ;

යම් වීසා පත්‍රයක් සම්බන්ධයෙන් "දරන්නා" යන්නෙන්, එකී වීසා පත්‍රය නිකුත් කරනු ලැබ ඇත්තේ කවර තැනැත්තකු වෙත ද, එම තැනැත්තා අදහස් වේ;

"රඳවා තබා ගැනීමේ මධ්‍යස්ථානය" යන්නෙන්, මේ පනත යටතේ රඳවා ගනු ලැබීමට නියම කර ඇති හෝ බලය දී ඇති තැනැත්තන් සඳහා ගුවන් තොටුපළක් හෝ වරායක් නොවන යම් ස්ථානයක පිහිටුවා ඇති තාවකාලික රැඳවුම් මධ්‍යස්ථානයක් අදහස් වේ;

"හඳුනාගැනීමේ තොරතුරු" යන්නෙන්,-

(අ) යම් ජෛවමිතික තොරතුරු;

(ආ) යම් ජෛවමිතික තොරතුරකින් ව්‍යුත්පන්න වන යම් අර්ථවත් හඳුන්වනයක්;

(ඇ) යම් ජෛවමිතික තොරතුරක් හෝ ජෛවමිතික තොරතුරකින් ව්‍යුත්පන්න වන අර්ථවත් හඳුන්වනයක් විශ්ලේෂණය කිරීමේ ප්‍රතිඵලයක් පිළිබඳ යම් වාර්තාවක්;

(ඈ) නිශ්චිත තැනැත්තකුගේ අනන්‍යතාවය සොයා ගැනීමට හෝ නිශ්චිත තැනැත්තකු පිළිබඳ තොරතුරු ලබා ගැනීමට භාවිත කරනු ලැබිය හැකි, යම් ජෛවමිතික තොරතුරකින් හෝ යම් ජෛවමිතික තොරතුරකින් ව්‍යුත්පන්න වන අර්ථවත් හඳුන්වනයකින් හෝ (ඇ) ඡේදයේ සඳහන් කරන ලද ආකාරයක යම් වාර්තාවකින් ව්‍යුත්පන්න වන වෙනත් යම් තොරතුරු; හෝ

(ඉ) නිශ්චිත තැනැත්තකු හඳුනා ගැනීම සඳහා පහසුකම් සලස්වන වෙනත් යම් තොරතුරු,

අදහස් වේ;

"ආගමනය" යන්නට, ආගමනය සහ විගමනය ඇතුළත් වේ;

"ආගමන ප්‍රදේශය හෝ කලාපය" යන්නෙන්, තැනැත්තන් ශ්‍රී ලංකාව වෙත ඇතුළු වීමට හෝ ශ්‍රී ලංකාවෙන් පිටත් වීමට අදාළව මේ පනත මගින් හෝ මේ පනත යටතේ පනවා ඇති හෝ පවරා ඇති බලතල, කාර්ය හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම හෝ ඉටු කිරීම සඳහා භාවිත කිරීමට නියමිත අනුමත තොටුපළක් තුළ නම් කළ ප්‍රදේශයක් හෝ කලාපයක් අදහස් වේ;

යම් තැනැත්තකු සම්බන්ධයෙන් "ආගමන නිෂ්කාශනය" යන්නට, යම් තැනැත්තකු ශ්‍රී ලංකාව වෙත ඇතුළු වීම හෝ ශ්‍රී ලංකාවෙන් පිට වීම සඳහා අවසර ලබා දීම, පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම ඇතුළත් වේ;

"ආගමන සංඥාව" යන්නෙන්, ශ්‍රී ලංකාවට පැමිණෙන යාත්‍රා සඳහා නියම කරනු ලැබිය හැකි යම් සංඥාවක් අදහස් වේ;

"අන්තර් ක්‍රියාකාරී උසස් මගී තොරතුරු" යනු දේශසීමා ආරක්ෂාව වැඩි කිරීමේ සහ රැගෙන යන්නකු විසින් එකතු කරන ලද උසස් මගී තොරතුරු දත්ත මත පදනම්ව ක්ෂණික ප්‍රතිචාරයක් සන්නිවේදනය කිරීමට දේශසීමා පාලන අධිකාරීන්ට ඉඩ ලබා දෙන අතිරේක ක්‍රමයක් වේ. දේශසීමා පාලන අධිකාරයේ ක්ෂණික ප්‍රතිචාරයේ ප්‍රතිඵලයක් වශයෙන්, මගියාට ගුවන් යානයට හෝ නැවට ගොඩවීම සඳහා ඉඩ දීම හෝ එය වැළැක්වීම රැගෙන යන්නකු තීරණය කළ හැකි ය;

"පිට වීම" යන්නෙන්,-

(අ) මුහුදෙන් ශ්‍රී ලංකාවෙන් පිට වන තැනැත්තකු සම්බන්ධයෙන් වන විට දී, ශ්‍රී ලංකාවෙන් පිට වීමට ආසන්න යාත්‍රාවකට ශ්‍රී ලංකාවේ දී ගොඩවීම සහ එකී යාත්‍රාව ශ්‍රී ලංකාවෙන් පිටත යම් ස්ථානයක් සඳහා පිටව යන අවස්ථාවේ දී එහි නෞකාස්ථව සිටීම;

(ආ) ගුවනින් ශ්‍රී ලංකාවෙන් පිට වන තැනැත්තකු සම්බන්ධයෙන් වන විට දී, ශ්‍රී ලංකාවෙන් පිට වීමට ආසන්න ශ්‍රී ලංකාවේ ඇති ගුවන් යානයකට ගොඩ වීම;

(ඇ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන තැනැත්තකුගේ ශ්‍රී ලංකාවේ දී සිදුවන මිය යාමක් සම්බන්ධයෙන් වන විට දී, ශ්‍රී ලංකාවේ දී ඔහුගේ මිය යාම;

(ඈ) අවස්ථාවෝචිත පරිදි, මුහුදෙන් හෝ ගුවනින් ශ්‍රී ලංකාවෙන් පිට වන යාත්‍රාවක් හෝ ගුවන්

යානයක් සම්බන්ධයෙන් වන විට දී, ශ්‍රී ලංකාවේ යම් අනුමත වරායක සිට මුහුදෙන් හෝ ශ්‍රී ලංකාවේ යම් අනුමත ගුවන් තොටුපළක සිට ගුවනින්, ශ්‍රී ලංකාවෙන් පිටත යම් ස්ථානයක් වෙත පිටත් වීම;

අදහස් වේ;

"යාත්‍රාවේ ප්‍රධානියා" යන්නෙන්, තත්කාලය සඳහා, එම යාත්‍රාවේ මෙහෙයවීම හෝ පාලනය භාර තැනැත්තා අදහස් වේ;

යාත්‍රාවකට හෝ ගුවන් යානයකට අදාළව "කාර්ය මණ්ඩලයේ සාමාජිකයා" යන්නෙන්, අවස්ථාවෝචිත පරිදි, එම යාත්‍රාවේ හෝ ගුවන් යානයේ කටයුතුවල හෝ සේවයේ නියුක්තව සිටින යම් තැනැත්තකු අදහස් වේ;

"බාලවයස්කරු" යන්නෙන්, වයස අවුරුදු දහඅටට එළඹ නොමැති තැනැත්තකු අදහස් වේ;

"මාදක ඖෂධ" යන්නට, 2008 අංක 1 දරන මාදක ඖෂධ සහ මනෝ වර්තක නීති විරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි සම්මුති පනතේ තුන්වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ඖෂධ ඇතුළත් වේ;

"විදේශීය පෙර ශ්‍රී ලාංකිකයා" යන්නෙන්, 34 වන වගන්තිය යටතේ විදේශීය පෙර ශ්‍රී ලාංකිකයකු වශයෙන් ලියාපදිංචි තැනැත්තකු අදහස් වේ;

"මගියා" යන්නෙන්, යාත්‍රාවක හෝ ගුවන් යානයක ගමන් කරන හෝ ගමන් කිරීමට අපේක්ෂා කරන එම යාත්‍රාවේ හෝ ගුවන් යානයේ කාර්ය මණ්ඩලයේ සාමාජිකයකු නොවන යම් තැනැත්තකු අදහස් වේ;

"මාර්ගස්ථ මගියා" යන්නෙන්, ගුවන් යානයකින් හෝ යාත්‍රාවකින් ශ්‍රී ලංකාවේ අනුමත තොටුපළක් වෙත පැමිණ වෙනත් රටකට ගමන් කරන අතරමඟ එකී අනුමත තොටුපළ පසුකරගෙන යන මගියකු අදහස් වන අතර, "මාර්ගස්ථ වීසා පත්‍රය" යන පදය ඒ අනුව තේරුම් ගනු ලැබිය යුතු ය;

"මගීන්ගේ නම් පිළිබඳ වාර්තාගත තොරතුරු" යනු ගුවන් යානයේ හෝ නැවේ ප්‍රවේශ පත්‍ර වෙන් කරගත් මගියා විසින් සපයන ලද තොරතුරු මත පදනම්ව එක් එක් ගුවන් යානය හෝ නැව සඳහා වූ රැගෙන යන්නන් විසින් නිර්මාණය කරන ලද වාර්තාවලට දී ඇති වර්ග නාමය වන අතර, වාර්තාවට මගියාගේ නම, ගමන් වාර සටහන, ප්‍රවේශ පත්‍ර තොරතුර, සම්බන්ධ කර ගැනීමේ විස්තර, ගෙවීම් ක්‍රම පිළිබඳ ආකාර යනාදිය වැනි තොරතුරු අන්තර්ගත වන්නේ ය;

"සාම නිලධරයා" යන්නට, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ දී ඇති අර්ථය ම තිබෙන්නේ ය;

"පූර්ණ වයසට එළඹ ඇති තැනැත්තකු" යන්නෙන්, වයස අවුරුදු දහඅටට එළඹ ඇති තැනැත්තකු අදහස් වේ;

"නියම කරන ලද" යන්නෙන්, නියෝග මගින් නියම කරන ලද යන්න අදහස් වේ;

"නියමිත වෛද්‍ය නිලධරයා" යන්නෙන්, මේ පනතේ කාර්ය සඳහා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පත් කරන ලද වෛද්‍ය නිලධරයකු අදහස් වේ;

"ජාත්‍යන්තර වශයෙන් ගමන් කිරීමෙන් වැළැක්වීම" යන්නට,-

(අ) ශ්‍රී ලංකාවේ රැඳී සිටීමට නියම කරනු ලැබීම;

(ආ) ශ්‍රී ලංකා විදේශ ගමන් බලපත්‍රයක් හෝ ශ්‍රී ලංකා ගමන් ලේඛනයක් ආපසු භාර දෙන ලෙස නියම කරනු ලැබීම;

(ඇ) ශ්‍රී ලංකා විදේශ ගමන් බලපත්‍රයක් හෝ ශ්‍රී ලංකා ගමන් ලේඛනයක් සඳහා ඉල්ලුම් කිරීමට අවසර දෙනු නොලැබීම; හෝ

(ඈ) ශ්‍රී ලංකා විදේශ ගමන් බලපත්‍රයක් හෝ ශ්‍රී ලංකා ගමන් ලේඛනයක් ලබා ගැනීමට අවසර දෙනු නොලැබීම,

ඇතුළත් වේ;

"මනෝ වර්තක" යන්නට, 2008 අංක 1 දරන මාදක ඖෂධ සහ මනෝ වර්තක නීති විරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි සම්මුති පනතේ හතරවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ද්‍රව්‍ය ඇතුළත් වන්නේ ය;

"ඉවත් කිරීම" යන්නෙන්, 98 වන වගන්තියේ (1) වන සහ (2) වන උපවගන්තිවල නිශ්චිතව දක්වා ඇති පරිදි ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන තැනැත්තකු බලෙන් පිටත් කිරීම සාක්ෂාත් කර ගැනීම සඳහා ආගමන නිලධරයන් විසින් ආරම්භ කරනු ලබන බල කිරීමේ ක්‍රියාවලියක් අදහස් වේ;

"නැවියා" යන්නෙන්, යාත්‍රාවේ ප්‍රධානියා හැර, යාත්‍රාවේ නෞකාස්ථ හෝ යාත්‍රාවේ කටයුතුවල යම් තත්ත්වයකින් සේවයේ නියුක්තව සිටින හෝ සම්බන්ධ වී ඇති තැනැත්තකු අදහස් වේ;

"වෙන් වූ සහ බහිෂ්කාර ආගමන නිෂ්කාශනය" යන්නට, නිශ්චිත තැනැත්තකු හෝ තැනැත්තන් පන්තියක් සඳහා එක් දිනයක දී නිශ්චිත කාලසීමාවක් හෝ කාලසීමාවන් අතරතුර දී පමණක් සිදු කරනු ලබන ආගමන නිෂ්කාශනයක් ඇතුළත් වේ;

"වෙරළ අවසර පත්‍රය" යන්නෙන්, කාර්ය මණ්ඩල සාමාජිකයකුට ඔවුන්ගේ යාත්‍රාව යම් වරායක තිබෙන තාක්කල් වරායේ නගරයට ඇතුළු වීමට අවසර දෙන අවසර පත්‍රයක් අදහස් වේ;

"ශ්‍රී ලංකාව" යන්නට, ශ්‍රී ලංකාවේ දේශීය ජල තීරය ඇතුළත් වේ;

"ශ්‍රී ලංකා විදේශ ගමන් බලපත්‍රය" යන්නෙන්, මේ පනත හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් යටතේ නිකුත් කරන ලද විදේශ ගමන් බලපත්‍රයක් අදහස් වේ;

"ශ්‍රී ලංකා ගමන් ලේඛනය" යන්නෙන්, මේ පනත හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් යටතේ නිකුත් කරන ලද පාලක ජනරාල්වරයා හෝ ශ්‍රී ලාංකීය විදේශ දූත මණ්ඩලයක් විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකාවට ඇතුළු වීම හෝ ශ්‍රී ලංකාවෙන් පිට වීම සඳහා

තැනැත්තකු වෙත අවසර ලබා දෙන ශ්‍රී ලංකා විදේශ ගමන් බලපත්‍රයක්, හදිසි අවස්ථා සහතිකයක්, හඳුනා ගැනීමේ සහතිකයක් හෝ වෙනත් යම් තාවකාලික ගමන් ලේඛනයක් අදහස් වේ;

"ගාස්තු නොගෙවා නැවක හෝ ගුවන් යානයක සැඟව පළායන තැනැත්තා" යන්නෙන්, යාත්‍රාවේ හෝ ගුවන් යානයේ ප්‍රධානියාගේ හෝ යාත්‍රාව හෝ ගුවන් යානය භාර වෙනත් තැනැත්තාගේ කැමත්තකින් තොරව යාත්‍රාවක හෝ ගුවන් යානයක සැඟව සිටින තැනැත්තකු අදහස් වන අතර, යාත්‍රාවේ හෝ ගුවන් යානයේ ප්‍රධානියාගේ හෝ යාත්‍රාව හෝ ගුවන් යානය භාර වෙනත් තැනැත්තාගේ කැමත්තකින් තොරව යම් යාත්‍රාවකින් හෝ ගුවන් යානයකින් ශ්‍රී ලංකාව වෙත පැමිණෙන හෝ ශ්‍රී ලංකාවෙන් පිටත් වන යම් තැනැත්තකු ඇතුළත් වේ;

"ශ්‍රී ලංකාවේ ජල තීරය" යන්නට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ එයට දී ඇති අර්ථය ම තිබිය යුතු ය;

"ගමන් ලේඛනය" යන්නෙන්, මේ පනත යටතේ නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගමන් ලේඛනයක් හෝ යම් ගමන් ලේඛනයක්, විදේශ ගමන් බලපත්‍රයක් හෝ ශ්‍රී ලංකාවේ රජය හෝ එක්සත් ජාතීන් විසින් පිළිගනු ලබන ගමන් බලපත්‍රයක් ඇතුළුව රටවල් දෙකක් අතර තැනැත්තන්ගේ ගමන් කිරීම් සඳහා පහසුකම් සලස්වන සෑම ලේඛනයක් ම අදහස් වේ;

"වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ ගමන් ලේඛනය" යන්නෙන්,-

(අ) ශ්‍රී ලංකා රජය හෝ ශ්‍රී ලංකා රජය විසින් පිළිගත් යම් රජයක් විසින් හෝ වෙනුවෙන් යම් තැනැත්තකු වෙත නිකුත් කරනු ලැබූ;

(ආ) විදේශ ගමන් බලපත්‍රය දරන්නා හඳුනා ගැනීමට ප්‍රමාණවත් පුද්ගලික තොරතුරු අන්තර්ගත වන සහ එයට ඔහුගේ ඡායාරූපයක් අමුණා ඇති; සහ

(ඇ) තත්කාලයේ බලපවත්නා,

විදේශ ගමන් බලපත්‍රයක් හෝ විදේශ ගමන් බලපත්‍රයක ලක්ෂණ සහිත වෙනත් අනන්‍යතා ලේඛනයක් අදහස් වන අතර, එයට ගමන් ලේඛනයක් ද ඇතුළු වේ;

"යාත්‍රාව" යන්නෙන්, රජය විසින් හිමිකාරිත්වය දරනු ලබන හෝ මෙහෙයවනු ලබන සහ තත්කාලයේ දී, රජයේ වාණිජමය නොවන වාණිජ සේවා සඳහා පමණක් භාවිත කරනු ලබන යුද නැව්, නාවුක උපකාරක හෝ වෙනත් යාත්‍රා හැර, ජලය මත ප්‍රවාහන මාධ්‍යයක් ලෙස භාවිත කරනු ලබන හෝ භාවිත කරනු ලැබීමේ හැකියාව ඇති, ජලෝත්පීඩක නොවන නැව් සහ ජල ගගන යාත්‍රා ඇතුළුව යම් ආකාරයක ජල යාත්‍රාවක් අදහස් වේ;

"වීසා පත්‍රය" යන්නට, ශ්‍රී ලංකා රජය විසින් මේ පනත යටතේ ප්‍රදානය කරන ලද වීසා පත්‍රයක් හෝ ශ්‍රී ලංකා රජය විසින් පිළිගත් වෙනත් යම් රජයක් විසින් ප්‍රදානය කරන ලද වීසා පත්‍රයක් ඇතුළත් වේ;

"ස්වේච්ඡාවෙන් පිට වීම" යන්නෙන්, වත්මන් වලංගු වීසා පත්‍රයක් නොමැති ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන තැනැත්තකු, ආගමන නිලධරයන් විසින් ආරම්භ කරන ලද බල කිරීමේ ක්‍රියාවලියකින් තොරව, ස්වේච්ඡාවෙන් පිට වීම අදහස් වේ.

**184.** (1) (351 වන අධිකාරය වූ) ආගාමික සහ විගාමික පනත සහ 1971 අංක 53 දරන ගමන් බලපත්‍ර (විධිමත් කිරීමේ) හා පිටවීමේ අවසර පත්‍ර පනත මෙයින් ඉවත් කරනු ලැබේ.

**ඉවත් කිරීම සහ ඉතිරි කිරීම**

(2) (මෙහි මින් මතු "ඉවත් කරන ලද පනත්" යනුවෙන් සඳහන් කරනු ලබන) (351 වන අධිකාරය වූ) ආගාමික සහ විගාමික පනත සහ 1971 අංක 53 දරන ගමන් බලපත්‍ර (විධිමත් කිරීමේ) හා පිටවීමේ අවසර පත්‍ර පනත ඉවත් කිරීම නොතකා-

(අ) ඉවත් කරන ලද පනත් යටතේ යම් අධිකරණයක හෝ වෙනත් යම් ආයතනයක පනවා ඇති සියලු නඩු කාරණා හෝ නඩු කටයුතු; සහ

(ආ) ඉවත් කරන ලද පනත් යටතේ කරන ලද සහ මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව වූ දිනයේ දී පවතින නියම හෝ තීන්දු සම්බන්ධයෙන් වන සියලු අභියාචනා,

එම පනත් ඉවත් කරනු නොලැබූ ලෙස සලකා සියලු ආකාරයෙන් ම ඉවත් කරන ලද පනත් යටතේ විභාග කොට බැහැර කරනු ලැබිය යුතු ය.

(3) ඉවත් කරන ලද පනත් යටතේ නිකුත් කරන ලද සහ මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව වූ දිනයේ දී පවත්නා සියලු සහතික, බලපත්‍ර, වීසා පත්‍ර, විදේශ ගමන් බලපත්‍ර, ගමන් ලේඛන සහ වෙනත් ලේඛන මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ සිට බලාත්මක වන පරිදි මේ පනත යටතේ නිකුත් කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව තේරුම් ගනු ලැබිය යුතු ය.

(4) ඉවත් කරන ලද පනත් යටතේ සාදන ලද සහ නියමිත දිනයේ දී බලාත්මකව පවතින සහ මේ පනතේ විධිවිධාන සමඟ අනනුකූල නොවන සියලු උපකාරක නීති, මේ පනත යටතේ සාදනු ලබන උපකාරක නීතියක් මගින් ඉවත් කරනු ලබන හෝ අවලංගු කරනු ලබන තෙක් ඒවා මේ පනත යටතේ සාදන ලද උපකාරක නීති ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) (අ) ස්ථිර වාස අවසර පත්‍ර සහ තාවකාලික වාස අවසර පත්‍රවලට අදාළව නීතියේ යම් විධිවිධාන ඉවත් කිරීම, අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම නොතකා 1955 ජුනි මස 6 වන දිනට පෙර නිකුත් කරන ලද සහ එම දිනට පෙරාතුව ම වූ දිනයේ දී බලපවත්නා එවැනි යම් අවසර පත්‍රයක් එකී අවසර පත්‍රයේ කාලසීමාව සඳහා එම දිනයෙන් පසුව අඛණ්ඩව බලාත්මකව පැවතිය යුතු අතර, ඉන්පසුව බලාත්මකව පැවතීම නතර වන්නේ ය; තව ද, එකී දිනයට පෙර එකී අවසර පත්‍රවලට අදාළ වූ නීතියේ විධිවිධාන එම දිනයට පෙර එකී අවසර පත්‍රවලට ඒවා අදාළ වූ ආකාරයෙන් ම, එම දිනයෙන් පසුව එම අවසර පත්‍රවල වලංගු කාලසීමාව තුළ එම අවසර පත්‍රවලට අදාළ විය යුතු ය.

(ආ) (2 වන අධිකාරය වූ) අර්ථ නිරූපණ ආඥාපනතේ 6 වන වගන්තියේ (3) වන උපවගන්තිය, එම උපවගන්තිය යම් ඉවත් කිරීමක් සම්බන්ධයෙන් අදාළ වන ආකාරයෙන් ම, ස්ථිර වාස අවසර පත්‍ර සහ තාවකාලික වාස අවසර පත්‍රවලට අදාළ නීතියේ යම් විධිවිධාන අත්හැරීමේ බලපෑම සහිත යම් සංශෝධනයක් සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**185.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.